Advance, *v. a. to approach*, අභිමුඛවෙනවා, සමීපවෙනවා, ඉදිරිපත්වෙනවා, ඉස්සරහට එනවා, ළඟාවෙනවා; *to proceed forward*, ඉස්සරහට යනවා; *as, I cannot advance a foot farther*, එකඅඩියක් ඉස්සරහට යන්ඩ මට බැරිය; *to promote, whom virtue advanced envy pulled down*, ගුණනාවෙන් උසස්වූ අය වෛරයෙන් පහළවැටුනා, උසස්කරනවා; *to improve, as in learning*, ඉගෙනීමෙ වැඩිදියුණුකරනවා; *to give before hand*, අත්පිටදෙනවා

Advancement, *s. approach*, අභිමුඛවීම, ඉදිරිපත්වීම, සමීපවීම, ළඟාවීම, උසස්වීම; *attainments in learning*, ඉගෙනීම වැඩිදියුණුවීම

Advancer, *s.* අභිමුඛවෙන්නා, ළඟාවෙන්නා, උසස්කරන්නා

Advantage, *s.* ලාභය, ප්‍රයෝජනය

Advantage, *v. a.* ලාභකරනවා, ප්‍ර

යෝජනාකරනවා, ඵලදෙනවා

Advantageous, *a.* ලාභවූ, ප්‍රයෝජනවූ, ඵලදෙන්නාවූ

Advantageously, *ad.* ලාභශාවයෙන්, ප්‍රයෝජනභාවයෙ, ඵලදෙනභාවයේ

Advantageousness, *s.* ලාභභාවය, ප්‍රයෝජනභාවය

Advene, *v. n.* වැඩිවෙනවා

Advent, *s. coming*, පැමිණවීම; *one of the Christian festivals*, ශාලවූ ක්තාරයානාන්වහන්සේගෙ පැමිණවීම

Adventitious, *a.* උන්මෙවන්නාවූ, වැඩිවෙන්නාවූ

Adventure, *s. accident*, හදිස්සිය, අහඹුය; *hazard*, විභ්‍රාන්තය, උපද්‍රවය නොසලකාක්‍රියාකරම; *enterprize*, ජාබ්බිතවූ ක්‍රියාවක්

Adventure, *v. n.* විභ්‍රාන්තවෙනවා, උපද්‍රව නොසලකා ක්‍රියාකරනවා, ආනන්‍ගාකරනවා, වාසනාව සොයනවා; *see the noun*

Adventurer, *s.* විභ්‍රාන්තවෙනනා, ජාබ්බිතවූ, දුෂ්කරවූ

Adverb, *s.* නිපාත

Adversable, *a.* විරුඬව, ඊදිරිව

Adversary, *s.* හතුරා, සතුරා, විරුඬකාරයා, ඊදිරිකාරයා, වෛරකාරයා

Adverse, *a. contrary*, සතුරුවූ, විරුඬවූ, වෛරවූ; *calamitious*, අවාසනාවූනාවූ, දුක්ඛිතවූ, විපත්වූ, පත්මඳවූ

Adversity, *s.* අවාසනාවන්තභාවය, දුක්ඛිතභාවය; විපත, පත්මඳකම

Advert, *v. a. to attend to, to regard*, සලකනවා; *to consider or to refer to any thing*, සිහිකරගනනවා, *or* කල්පනාකරගන්නවා; *during his discourse he adverted to many of the prevailing vices of the age*, උන්නාන්සේගෙ කතාවඅතරෙදී ඒප්‍රස්තාවට ඝීබෙනදුෂ්ටකම්ගැන කල්පනාකලය

Advertence, advertency, *s.* සැලකීම, ප්‍රවිසම්වීම

Advertise, *v. a.* ප්‍රකාසකරනවා, ප්‍රසිඬකරනවා, එළිදරවූකරනවා, දන්වනවා

Advertisement, *s.* ප්‍රකාසකිරීම, ප්‍රසිඬකිරීම, එළිදරවුකිරීම, දන්වීම, ප්‍රසිඬපත්‍රය

Advertiser, *s.* ප්‍රකාසකරන්නා, ප්‍රසිඬකරන්නා, එළිදරවූකරනනා, දන්වන්නා

Advice, *s. counsel*, අනුශාසනාකිරීම, අවවාදය, නුවනදීම, දනුමැතිකම; *news*, ආරන්චි, දන්වීම

Advise, *v. a.* අනුශාසනාකරනවා, අවවාදදෙනවා, නුවණදෙනවා, දනුමැතිකම්දෙනවා; *see the noun.*

Adviseably, adviseable, *a. proper to be advised*, අවවාදදියයුතුවූ, දනුමුතුකම්දියයුතුවූ; *proper to be done*, කලමනාවූ,

කාර්‍ය්‍යඥවූ. යුතුවූ. සුදුසුවූ

Adviseably, *a.* අවවාදලෙස, දනුමැතිලෙස, නුවණැතිලෙස

Advised, *a.* බුද්ධිවන්තවූ, ඥානවන්තවූ, දනුමැතිවූ

Adviser, *s.* අවවාදකරන්නා, දනුමැතිකම්දෙන්නා, නුවණදෙන්නා

Adulation, *s.* චාටු ස්තුතිකිරීම, බොරුප්‍රසංසාව, රැවටිලිප්‍රසංසාව

Adulator, *s.* චාටුස්තුතිකරන්නා, බොරුප්‍රසංසාකරන්නා, රැවටිලිප්‍රසංසාකරන්නා

Adulatory, *a.* චාටුස්තුතිකරන්නාවූ

Adult, *a.* යොවුන්වූ, යෞවනවූ, තරුණවූ, වැඩිවියපැමිණියාවූ

Adult, *n.* යොවුනා, යෞවනයා, තරුණයා; වැඩිවයසැමිණියා

Adulter, *v. a. to commit adultery,* පරදාරකම් කරනවා, කාමමිථ්‍යාචාරයකරනවා, අනාචාරයෙහි හැසිරෙනවා, වෙශ්‍යාකම්කරනවා

Adulterate, *v. a.* මිශ්‍රකරනවා, නරක්කරනවා

Adulteration, *s.* මිශ්‍රකිරීම, හවුල්කිරීමෙන් නරක්කිරීම

Adulterer, *s.* පරදාරකම්කරන්නා, කාමමිථ්‍යාචාරයකරන්නා, අනාචාරයෙහි හැසිරෙන්නා

Adulteress, *s.* පරදාරකාරි, වෙශ්‍යාව

Adulterous, *a.* පරදාරිකවූ, කාමමිථ්‍යාචාරිකවූ

Adultery, *s.* පරදාරකම්මය, කාමමිථ්‍යාචාරය

Adumbrate, *v. a.* ඡායාකරනවා, හෙවනකරනවා, ප්‍රතිබිම්බ වශන්කරනවා

Advocate, *s.* මැදහත්කාරයා, මැදිවෙන්නා, යමෙක්වෙනුවට කථාකරන්නා; *the word in common use is the Portuguse,* අද්වොකාත්

Adure, *v. n.* භස්මකරනවා, දවනවා, දලායනවා

Adust, adusted, *a.* භස්මවූ, දවූ, දලාගිය

Aerial, *s.* අවකාසයටඅයිතිවූ, ගුවන්වූ, *or* ගුවනටඅයිති

Afar, *a.* දුර, ඈත, එපිට, බැහැර

Affability, *s.* ගුණවත්කම, දයාවන්තකම, ආචාරවන්තභාවය

Affable, *a.* ගුණවත්වූ, දයාවන්තවූ, ආචාරවන්තවූ

Affableness, *s.* ගුණය, දයාවන්තකම, ආචාරවන්තකම

Affably, *ad.* ගුණවත්ලෙස, දයාවන්තලෙස, ආචාරවන්තභාවයෙ

Affair, *s.* කටයුත්ත, කාරනාව, කාරිය

To affect, *v. a. act upon the mind as by a sermon or discourse of any kind,* ලොමුදැහැගනවා; *to take effect,* ගුණඅල්ලනවා; *the mind,* හිතමුදුකරනවා; *to imi-*

tate unnaturally, සද්‍රිසංවෙනවා, හරිහරියටකරනවා

Affectation, *s. an unnatural imitation*, හරිහරියටකිරීම; *an artificial appearance*, වංචාපෙනීම, උඩඟුකම්කිරීම

Affected, *a. as with ostentation*, වංචාපෙනීමවූ, උඩඟුසිත්වූ; *affected by or with*, ලොමුදැගැනගත්තාවූ, ගුණඅංලෙවූ; *to be affected at*, මුදුසිත්වූ, කනගාටුවූ

Affectedly, *ad.* ආඩම්බරකලෙසින්

Affection, *s.* දයාව, ප්‍රෙමය, සෙනහය, ආදරය

Affectionate, *a.* දයාවනතවූ, ආදරවූ, ප්‍රෙමවූ, සෙනහවත්වූ

Affiance, *s. marriage contract*, විවාහයට බැඳීම; *trust*, ඇදහීම, විශ්වාසය

Affiance, *v. a.* විවාහයට බඳිනවා, සහතිකකරදෙනවා; *see the noun*,

Affidavit, *s.* දිවුරුම, දිවිරිල්ල, දිවුරුම්පටකීම, දිවුරලාකීම, දිවුරුම්කොටකීම

Affined, *a.* නෑකම්ඇතුව

Affinity, *s. alliance*, සම්බන්ධකම, නෑකම, ඥාතිකම; *likeness*, සද්‍රිසය, සමානකමය, ඒකාකාරය.

Affirm, *v. a. to declare*, සත්‍යතිකලෙසින්කියනවා, ඇත්තකියනවා; *ratify*, සථිරකරනවා, සවිකරනවා

Affirmation, *s.* සත්‍යකරකීම, සත්‍ය[illegible]කරකීම, ශබ්දකරකීම

Affirmative, *a.* සත්‍යවූකීම, ඇත්තකීම, සථිරවූකීම; *see the verb*

Affirmatively, *ad.* සත්‍යවූකීමලෙසින්, ඇත්තකියනලෙසින්, සථිරවූකීමලෙසින්

Affirmer, *s.* ඇත්තකියනනා, සත්‍යකලෙස කියනනා, සථිරලෙසකියනනා

Affix, *v. a.* යාකරනවා, පාඩනවා, පුරැදුනවා, එකතුකරනවා, අලවනවා

Afflation, *s.* පිඹීම

Afflict, *v. a. put to pain*, හින්සාකරනවා, වේදනාකරනවා, රිදුම්කරනවා, පීඩාකරනවා; *to grieve*, කාන්සාකරනවා, කනගාටුකරනවා, සෝකකරනවා

Affliction, *s.* හින්සාව, දුක, වේදනාව, රිදුම, කාන්සාව, කනගාටුව, සෝකය; *see the verb*

Afflictive, *a.* දුක්ඛිතවූ, වේදනාවූ, රිදුම්වූ, කාන්සාවූ, කනගාටුවූ, සෝකවූ; *see the verb*

Affluence, affluency, *s.* පොහොසත්කම, ධනවත්කම, සම්පත්කම

Affluent, *a.* පොහොසත්

Afflux, *s.* ගැලීම

Afford, *v. a. to yield*, උපදිනවා, හටගන්නවා; *to grant, to confer*, දෙනවා

Affranchise, *v. a.* ඉටවන්කරඅරිනවා, නිදහස්කරනවා

Affray, v. a. බියකරනවා, භයකරනවා

Affray, s. කෝලාහලය, දබරය, පෙරලිය

Affriction, s. සැටීම, උරච්චකිරීම, ඉලීම

To affright, v. a. භීතකරනවා, භීතැස්සිකරනවා, තැතිගන්වනවා, බියකරනවා, භයකරනවා

Affright, s. තැතිගැන්ම, භයවීම

To affront, v. a. නින්දාකරනවා, අපහාසකරනවා, අවනම්බුකරනවා, බනිනවා, නිසරුකරනවා

Affront, s. අපහාසය, නින්දාව, බැනීම, අවනම්බුව, නිසරුව

Affronting, a. අපහාසකරන්නාවූ, නින්දාකරනනාවූ, නිසරුකරනනාවූ

Afloat, *ad* පාවී, මතුවී, ඉල්පී

Afoot, *ad. on foot*, පාදයෙන්, පයින්; *in action*, හැසිරීමෙන්, *or* කරමින්; *a design is on foot*, එකකාරනාවක් කරමින් තිබෙනවා

Aforegoing, *a.* ඉස්සරහට

Aforehand, *ad.* ඉස්සරම, පලමුවෙන්

Aforemention, *a.* ඉහත සදහන් කර, පලමුකිවූ

Aforenamed, *a.* ඉහත නම්කොට පලමුකී

Aforesaid, *a.* මතුකී

Aforetime, *ad.* අතීතකාලය, පූර්වකාලය, පසුගියඅවස්ථාව

Afraid, *part. a.* භයවූ; *to make afraid*, භයකරනවා

Afresh, *ad. new*, අභිනව, අළුත්; *again*, නැවත

Afront, *ad. in front*, ඉදිරිපිටට, ඉස්සරහට, පෙරට; *in opposition*, එදිරිව

After, *prep.* අනතුරුව, පසු, පස්සෙ; *Christ was seen by many after his resurrection*, ක්‍රිස්තුස්වහන්සේගේ නැගිටීමට අනතුරුව බොහෝදෙනා උන්වහන්සේ දුටුවෝය; *and many went after him*, උන්වහන්සේට පසු බොහෝදෙනා ගියෝය; *it was about half an hour after three o'clock.* පැය තුනට බාගයකට පමනපසු; *according to*, පරිද්දෙන්, ලෙස, හැටියෙ; *make this after the same model*, මේකත් ඒ පරිද්දෙන්ම කරව; *he called him after his own name*, ඔහුගේ නාමයේ හැටියටම ඔහුට නම තැබුවා; *after that manner*, එලෙසම, *or* එප්‍රකාරම

After. *ad. in pursuit of, or in search of*, සොයනවා; *will he not go after that which was lost*, නැතිවුණු එක සොයා ඔහු යන්නේ නැද්ද

Afterages, *ad.* අනාගතකාලය, මතුවන කාලය

Afterall, *ad.* අන්තිමෙයි

Afterbirth, *s.* වැදමහ

Afterclaps, *s*, අනතුරු

Aftercost, *s.* පසුවියදම
Aftercrop, *s.* තිරී
Afternoon, *s.* පස්වරු, සවස්වරු
Afterthought, *s.* පසුකල්පනාව, දෙවෙනුකල්පනාව
Afterward, *ad.* ඉන්පසු
Again, *ad.* දෙවෙනු, ආයෙම, නැවත
Against, *prep. in opposition to any person or thing,* විරුඩව, එදිරිව; *opposite to,* ඉස්සරහට, ඉදිරිපටට
Agast, *a.* විස්මපත්වූ, පුදුම්වූ
Agaze, *v. a.* විස්මපත්කරනවා, පුදුමකරවනවා
Age, *s. any period of time in which any man or number of men lived,* අවදිය, ප්‍රස්තාව, කාලය; *of a person,* ආයුෂය, වයස; *one of the ages of the world,* ලෝකයාගේ යුගයක්; *generation,* පරම්පරාව, ගෝත්‍රය,
Aged, *a.* වුඩ, නාකි, මහලු; *underage,* බාලවයස, තරුණවයස, හැටවරවයස; *old age,* වුඩවයස, මහලුවයස; *an aged tree,* පරනගස
Agency, *s.* උපසම්බන්, ක්‍රියාව
Agent, *a.* ක්‍රියාකරනනාවූ
Agent, *s.* කාරියකාරයා, කාරනාකාරයා, කලමනාකාරයා
Agglutinate, *v. a.* අලවනවා
Aggrandize, *v. to make great,* මහත්කරනවා, ලොකුකරනවා; *to exalt,* උතුම්කරනවා, උසස්කරනවා
Aggrandizement, *s.* උසස්කිරීම, මහත්කිරීම, උතුම්කිරීම; *see the verb*
Aggrandizer, *s.* උසස්කරනනා, මහත්කරනනා, උතුම්කරන්නා
Aggravate, *v. to make heavy either really or metaphorically,* බරකරනවා, *as the increase of witnesses aggravated the accusation, brought against the prisoner,* අපරාධකාරයාට එදිරිව නාත්ත්වූ සාක්ෂිකාරයන් වැඩිවීම, චෝදනාව බරකරවනවා; *to provoke,* කෝපකරනවා, තරහකරවනවා; *to exaggerate,* වැඩිකරනවා
Aggravation, *s.* බරකිරීම, වැඩිකිරීම; *see the verb*
Aggregate, *a.* එක්කාසුවීම, සමූහ, ගොඩ, සියලු
Aggregate, *v. a.* එක්කාසුකරනවා, *or* එක්කාසුකරවනවා, සමූහකරනවා
Aggress, *v. n.* දබරයට ආරම්භකරවනවා, කලහයට ආරම්භකරනවා
Aggression, *s.* දබරයෙහි ආරම්භය
Aggressor, *s.* දබරයට ආරම්භකලඅය
Aggrievance, *s. an act of wrong or injustice,* අනායය, අනාදරය; *vexation,* දුක්කිරීම
Aggrieve, *v. a. to give sorrow,* දුක්කරනවා; *to injure,* අනාථකරනවා, අනාදරකරනවා

Aghast, a භයගැස්සවූ

Agile, a. දක්ෂවූ, බුහුටිවූ, සැඩිසරවූ

Agility, s බුහුටිකම, සැඩිසරකම

Agitate, v. a. *to put in motion*, හොලවනවා, චංචලකරනවා; *to discuss, to debate*, විවාදකරනවා, තර්කකථාකරනවා

Agitation, s. හෙලවීම, චංචලය

Agnation, s. පොකඩවපැවැත්වීම

Ago, ad පෙරම, පූර්වයෙහි, ඉස්සර; *long ago*, බොහෝකාලයකට ඉස්සර; *ten days ago*, දසදවසකට පෙරම

Agoing, ad. ගැසීකරමින්, යමින්

Agone, ad. පසුගිය

Agonize, v. n. බලවත්වේදනාව විඳිනවා

Agony, *violent pain*, බලවත්වේදනාව; *pains of death*, මරණවේදනාව

Agree, v. n. *to be in a state of concord*, එකඟවෙනවා, එක්සිත්වෙනවා, එකමුතුවෙනවා; *to settle any thing by stipulation*, ගිවිසුම්වෙනවා, පොරොන්දුවෙනවා; *to resemble*, සදෘශවෙනවා, සමානවෙනවා; *agree with thine adversary quickly*, තාගේ විරුද්ධකාරයාගේ අප්‍රමාදව එකඟවෙව; *they do not agree together*, ඔවුන් එක්සිත්ව නොවසන්නාහුය; *your words and actions do not agree*, උඹේ ක්‍රියාවත් වචනත් එකමුතුවෙනෝනැත; *we agreed to set out the next day*, පසුවදා පිටත්වෙන්නට අපි ගිවිසගත්තෝ, නොහොත් පොරොන්දුවුණෝ; *and to this agree the words of the prophets*, අනාගතවක්තෘන්ගේ වාක්‍යයෝද මීට සදෘශයි, නොහොත් සමානවෙති

Agreeable, a. *pleasing*, ප්‍රියවූ, ප්‍රසන්නවූ; *convenient*, සෑහෙන්නාවූ

Agreeableness, s ප්‍රියභාවය, සෑහෙන්නාවූගතිය

Agreeably, ad. ප්‍රියලෙස, ප්‍රසන්නලෙස, සෑහෙනලෙස

Agreement, s. එකමුතුවීම, එකඟකම, එක්සිත්වීම, සදෘශවීම, සමානකම, ගිවිසීම; *see the verb*

Agricultural, a. ගොවිකර්මාන්තවූ

Agriculture, s. ගොවිකර්මාන්තය

Agriculturist, s. ගොවියෙක්, ගොවිකර්මාන්තකාරයා

Aground, ad බිම්ඇනෙන, ගොඩඇනෙන; *to run aground*, ගොඩබිම ඇනෙනවා

Ague, s. ජ්වරය, කම්පජ්වරය, වෙවුලුම්උණ

Aguish, a. ජ්වරවූ, කම්පජ්වරවූ

Ah, *inter.* අඃ, අඃ, අයියෝ

Ahead, ad. ඉස්සරහින්

Ahight, ad. ඉහළ, උඩ

Aid, *v. n.* උදවුවෙනවා, උපකාරවෙනවා, පිහිටවෙනවා

Aid, *a.* උදවුව, උපකාරය, පිහිට

Aider, *s.* උදවුවෙන්නා, උපකාරවෙන්නා, පිහිටවෙන්නා

Ail, *a.* පීඩිතවෙනනාවූ, අපසුවෙනනාවූ, ලෙඩවෙනනාවූ; *what ails you,* කුමක අපාසුවත්ද, කවර පීඩාවත්ද

Ailing, *part.* පීඩාවීම, අපහසුවීම, ලෙඩවීම; *ever ailing,* න්තරම්ලෙඩින්

Ailment, *s.* ලෙඩ, රෝගය, පීඩාව

Aim, *s.* කුරුමානන්බැලීම, එල්ලකිරීම; *intention,* කල්පනාව

Aim, *v. a.* (*as with a gun,*) කුරුමානම්කරනවා, එල්ලකරනවා; *having an intention to do any thing,* කල්පනාකරනවා

Air, *s. the element encompassing the earth,* අවකාසය, භුවනා, ගුවනා; *a gentle breeze,* පවනා; *a tune,* වෘතතය, තාලය; *the gesture, or manner of a person,* ආකාරය, අන්දම; *an ambitious mein,* උඩඟුආකාර, අහංකාරයකතිය

Air, *v. a. to expose to the air for the purpose of drying.* පවනෙහි විසලනවා; *to take the air, as for health,* සුලන්ගැහෙගෙඩ ඇවිදිනවා; *to warm gently,* උණුහුම්කරනවා

Airy, airiness, *a.* ගුවනාවූ, වාතවූ; *the airy region,* ලෝකකාශරේ, ගුවන්මඩල; *airy notions,* සැහැල්ලු කල්පනාවල්; *see the noun*

Airgun, *s.* සුලන්තුවක්කුව

Airhole, *s.* සුලංකවුළුව

Airing, *s.* සෙල්ලන් පිණිස යන එළිපැගමන

Aisle, *s.* මඩුපයෙහි වීථිය

Ake, *v. n.* වේදනාවෙනවා, රිදෙනවා, කකියනවා, රුදාවෙනවා

Akin, *a.* නෑකම්ඇති

Alabaster, *s.* කිරිගරුඬ.සුභ්‍රශෛලය

Alacrity, *s. cheerfulness,* ප්‍රීතිය; *sprightliness,* දක්ෂකම, බුහුටිකම, සුරුකම, පඩිසරකම

Alamode, *ad.* භාවිතාලෙස, පුරුදුලෙස, සිරිත්ලෙස

Alarm, *s. tumult,* කෝලාහලය, කෝලාහලය; *notice of danger,* භයදැන්වීම

Alarm, *v. a.* භයදනවනවා, භයපත්කරනවා

Alarming, *part. a.* භයපත්වූ, භයානකවූ

Alas, *interj.* අයියෝ, අනේ, අපොයි, අඃ

Albeit, *ad.* නමුත්

Alcoran, *s.* කුරාන්

Alcove, *s.* සයනාගාරය, තිරයෙන්මුවාකරනලද උකුම්මඩම

Alderman, *s.* විනිශ්චයාදියා, විචාරකයා

Alength, *ad.* කොළින්

Alert, *a.* ප්‍රවේසම්ව, සාඩසරව, බ්‍රහුවට, සුරුව

Alertness, *s.* ප්‍රවේසම්කම, බ්‍රහුව් කම, සුරුකම

Algebra, *s.* වර්ගයක ගණිත ශාස්ත්‍රයක්

Alias, *ad.* එක්කෝ, නොහොත්

Alien, *s.* අනාත්වූ, අාගන්තුකවූ

Alien, *s.* පරදේශියා, අනාත්දේශියා, අාගන්තුකයා, පිටරටයා

Alienate, *v. a. to estrange or withdraw any thing from another but particularly the affections,* අනාත්කරවනාවා; *to transfer any thing from one to another,* පවරාකරනාවා, වෙන්කරනාවා

Alienation, *s.* අනාත්වීම, පරාකිරිම, වෙන්කිරීම; *see the verb*

Alight, *v. a.* බහිනවා

Alike, *ad.* සද්‍රිස, සමාන

Aliment, *s.* අහාරය, සාත්තුව

Alimentary, *a.* අහාරවූ, සාත්තුවූ

Alive, *a.* පනපිටින්, ජීවත්

All, *a.* සකල, සව්, සියළු, සෑම, සේරම; *he now commandeth all men to repent,* දැන්වනාහි උන්වහන්සේ සියළු මනුෂ්‍යයන්ටම පස්චාත්තාපවෙඩ අනාඥාපනේය; *the Lord is good unto all men,* ස්වාමිවහන්සේ සෑම, *or* සේරාමදෙනාට යහපත්සේක; *go ye into all the world and preach the gospel to every creature,* තෙපි ලොවමුළුල්ලෙහි සකල් ජනයින් එව මංගලවුත්තාන්තය ඉගැන්වූනාය කරවූ: *almighty God,* සර්වපරාක්‍රමවූ දෙවියන්වහන්සේ

All, *ad.* සගමුව්ත්ම, මුළුමනින්ම

All hail, *s* සියළුශුපවේවා

Allay, *a. to repress, to pacify,* සංසිදුවනාවා, අඩුකරනාවා

Allegation, *s.* යමක් සත්‍යලෙස කීම, සිවරද්වේවනාපිණිස කියනාකම

Allege, *v. a.* සවිකරනාවා, සත්‍යකාලෙස කියනාවා

Allegiance, *s.* කීකරුකම, පක්ෂකම, විස්වාසකමීම, භක්තිය, යටහත්කම.

Allegiant, *a.* පක්ෂවූ, කීකරුවූ, විස්වාසවූ, භක්තිවූ, යටහත්වූ

Allegoric, *a.* උපමාවකනා, ලකුනුවූ

Allegorically, *ad.* උපමාවකනාලෙසින්

Allegorize, *v. a.* සාද්‍රිසකොට කියනාවා, උපමාකරලා කියනාවා, උපමාකරලාතේරනාවා, ලකුනුකරකියනාවා

Allegory, *s.* උපමාව, ලකුන

Alleluyah, *s.* දෙවියන්වහන්සේට ස්තුතිකාරව

Alleviate, *v. a.* මුදුකරනාවා, ලේසිකරනාවා, පහසුකරනාවා

Alleviation, *s.* මුදුකිරීම, ලේසිකිරීම, පහසුකිරීම

Alley, *s.* සුළුමඟ, සැල්ලි මාවත

Alliance, *a. a state of connection or a league of any kind,* සම්බන්ධ වීම, සංගහ වීම, සම්බන්ධ වීම, සම්බන්ධවීම; *relation by marriage,* විවාහයෙන්නෑකම, සරණවීමෙන්නෑකම; *kindred or family relation,* නෑකම

Alligate, *v. a.* බඳිනවා, අැඳනවා

Alligation, *s.* බැඳීම

Alligator, *s.* කිඹුලා

Allison, *s.* ගැටේම

Allocution, *s.* කථාකිරීම

Alloo, *v. a.* කුපිපවනවා, උසිගන්වනවා

Allot, *v. a.* කොටස් බෙදනවා, නියමකරදෙනවා

Allotment, *s.* කොටස් බෙදුදීම

Allow, *v. a. to admit,* එත්තුගන්නවා, පිළිගන්නවා; *to grant,* අවසරදෙනවා, දෙනවා; *to yield to,* මනාපවෙනවා

Allowable, *a.* පිළිගතහැකි වූ, අවසරදියහැකිවූ, සුදුසුවූ

Allowance, *s. licence, permission,* අවසරදීම; *wages,* බැල; *excuse,* ක්ෂමාවීම

Alloy, *s.* මාත්තුවෙන් අඩුකරන්නා වූදේ; *abatement,* අඩුවීම

Allude, *v. a.* සඟඥාකර කථාකරනවා, අඟවනවා

Allure, *v. a.* පරීක්ෂාකරනවා, පොළඹවනවා, ආශාඋපදවනවා, තණ්හාවෙන් ගන්නවා

Allurement, *s.* තණ්හාව උපදවනනාවූදෙයක්, තණ්හාවෙන් ගැනීම, පොළඹවීම, පරීක්ෂාකිරීම

Allurer, *s.* පොළඹවන්නා, තණ්හාව උපදවන්නා, තණ්හාවෙන් ගන්නා

Alluringly, *ad.* තණ්හාව උපදවනා අන්දමකින්

Alluringness, *s.* ආකර්ෂණය කරවනාගුණය

Allusion, *s.* අභිප්‍රාව, සඟඥාකර කථාකිරීම, අඟවාකථාකිරීම

Allusive, *a.* අභිප්‍රාවූ, සඟඥාකර කථාකරන්නාවූ

Allusively, *ad.* අභිප්‍රාවූලෙසින්, සඟඥාකර කථාකරනලෙස

Alluvion, *s.* රොන්ම, රොන්වෙයනදේ

Ally, *v. a. to unite by any league or confederacy,* සඋපකාරකරනවා, සංගහකරනවා, සම්බන්ධකරනවා, සමගිකරනවා, එකතුකරනවා; *by marriage,* විවාහකරනවා, සරණකරනවා

Ally, *s.* මිත්‍රයෙක්, නෑයෙක්, සිවිටුකාරයෙක්, සම්බන්ධකාරයෙක්; *see alliance,*

Almanac, *s.* ලිත

Almightiness, *s.* සර්වපරාක්‍රමකම, සර්වබලසම්පන්නකම

Almighty, *a.* සර්වපරාක්‍රමවූ, සර්වබලසම්පන්නවූ

Almond, *s.* අමන්දල; *Portuguese,* කොට්ටම්බා වර්ගයක්

Almoner, *s.* දනායදෙන්නා

Almonry, *s.* දන්හල

Almost, *ad.* ප්‍රාය, අඩාල, වතාත් අඩු, ලන්වූ, සිටවූ

Alms, *s.* දනන්

Almsdeed, *s.* දනායදීම

Almsgiver, *s.* දනන්දෙන්නා

Almshouse, *s.* අසරනායන්ට, *or* දිලිදුන්ට අදුසටතාරණ්ණුඩම

Aloes, *s.* අගරු, රත්හඳුම

Aloft, *ad.* ඉහල, උඩ

Aloft, *prep.* උඩින්

Alone, *a.* තනියම, තනි

Along, *ad.* දිගට; *with,* සමඟ, තැටුව

Aloof, *ad.* දුරව

Aloud, *ad.* මහත්හඩින්

Alphabet, *s.* හෝඩිය

Alphabetical, *s.* හෝඩියෙහි පිළිවෙල

Alphabetically, *a.* හෝඩියෙහි පිළිවෙලලෙසින්

Already, *ad.* මෙවිට, වුනු, දැනම

Also, *ad.* ත්, තවද, හා, ද; *the house and the garden also,* ගෙයිහා වතුත; *he is come also,* ඔහුද ඇවිත් සිටිනාවා; *I also,* මමත්

Altar, *s.* පූජාසනත්

Altarcloth, *s.* පූජාසනයෙහිවස්ත්‍ර

Alter, *v. a.* වෙනස්කරනාවා, වෙන්කරනාවා

Alterable, *a.* වෙනස්කලහැකි වූ, වෙන්වෙන්වපුළුවන්වූ

Alterably, *ad.* වෙනස්වෙන්ට පුළුවන්වූලෙසින්

Alterant, *a.* වෙනස්කරන්නාවූ

Alteration, *s.* වෙනස්කිරිම, වෙන්කිරිම

Alterative, *a.* මනාවගෙන්නාලූබෙ හෙතාවූ අදුසට

Altercation, *s.* වචාදෙ, කරකෙහ

Alter, *a.* වරින්වරවූ, මාරුමාරුවූ

Alternacy, *s.* වරින්වරට තෙකෙර තාවූ වැඩ

Alternate, *a.* වරින්වරවූ, මාරුමාරුවූ

Alternately, *ad.* දෙ මාරුවෙන්මාරුව වට, වරින්වරට

Alternative, *s.* දෙකින්එකක්ගන්ට දෙනඅවසරය

Alternatively, *ad.* මාරුවෙන්මාරුවට, වරින්වරට

Alternity, *s.* වරින්වර

Although, *conj.* නුමුත්; *although he is young,* ඔහු බාලවයසෙහි සිටියනුමුත්

Altitude, *s.* උස්බව

Altogether, *s.* මුළුමනින්ම, සේරම; *altogether false,* මුළුමනින්ම බොරුයි; *they altogether,* ඔහුන්සේරම

Alum, *s.* සවන්ධවලුණු

Always, *ad.* නිතර, නිලාකාලයෙන්ම, නිලතුරුවම, නිතරම, නිබඳවම, සෑමවෙලෙහිම, සදාකල්

Am, ඉන්නාවා, සිටිනාවා; *I am here,* මම මෙහිසිටිනාවා, *or* ඉන්නාවා; *I am sick,* මම ලෙඩින් ඉන්නාවා, *or* සිටිනාවා

Amability, *s.* සෞහාභය, පෙම්වී

Amain, *ad.* වෙගයකින්, වීර්යෙන්, බලවත්කමින්

Amandation, *s.* පණිවිඩඇරීම

Amanuensis, *s.* කියන වචන ලියන අය

Amaranth, *s.* තම්පලා

Amass, *v. a.* රැස්කරනවා, ගොඩකරනවා, එක්කරනවා

Amateur, *s.* ශාස්ත්‍රයට සෙනෙහෙවන්නයා, සිල්පයට සෙනෙහ ඇත්තා

Amaze, *v. a.* විස්මපත්කරනවා, පුදුමකරනවා, මවිතකරනවා

Amaze, *s.* විස්මපත්කම, පුදුමකම, මවිතකම

Amazedly, *ad.* විස්මපත්වූලෙසින්

Amazement, amazedness, *s.* විස්මපත්කිරීම, පුදුමකිරීම, තිගැස්සීම, භයාණිතවීම

Amazing, *part.* විස්මපත්කරමින් පුදුමකරමින්

Amazingly, *ad.* ආශ්චර්යවූලෙසින්, විස්මපත්වූලෙසින්

Ambassador, *s.* තානාපතියා, රාජපනිවිඩකාරයා

Ambassage, *s.* තානාපතිකම

Amber, *s.* තිරිසල්, අම්බර *Port.*

Ambidexter, *s.* අත්හරි

Ambient, *a.* හාත්පසින්, වටකර

Ambiguity, *s.* වියාකූලවූකථාව, උභයාර්ථවූකථාව, අනුමාන අර්ථ

Ambiguous, *a.* අනුමානවූ අර්ථය

Ambition, *s.* උසස්වූහිත, උඩඟුකම, ආඩම්බරකම

Ambitious, *a.* උසස්වූ, උඩඟුවූ

Amble, *v. n.* පියවිගමනින්යනවා

Amble, *s.* පියවිගමන

Ambrosial, *a.* අමෘතවූ

Ambulation, *s.* ඇවිදීම

Ambulatory, *a.* ඇවිදින

Ambuscade, *s.* ගුහාව, රැක්මපළ

Ambush, *s.* රැක්මපලෙහිසිටීම

Ambushed, *a.* රැක්මපලෙහි

Ambushment, *s.* රැක්ම

Ambustion, *s.* දැවෙන්වූවණ

Amen, *s.* සාධු, ආමෙන්, නොහොත් එසේවේවා

Amenable, *a.* උත්තරදීමටසුදුසු

Amenance, *s.* ක්‍රියාව

Amend, *v. a.* හරිගස්සනවා, ගුණවෙනවා, හොඳකරනවා, ගුණවත්කරනවා

Amendment, *s.* ගුණවීම, ගුණවත්වීම, හරිගැස්වීම

Amender, *s.* ගුණවත්කරන්නා, හරිගස්සන්නා

Amends, *s.* විපාකදීම, ප්‍රතිඵලදීම, ප්‍රතිදානය

Amerce, *v. a.* දඩගහනවා

Amercer, *s.* දඩගහන්නා

Amercement, *s.* දඩ

Amethyst, *s.* සෙවුවන්දි; *the common word is,* අඹතෙයත්

Amiable, *a.* සෝභනවූ, ප්‍රියවූ, හොඳහිත්වූ, හොඳ ගුණඇති

Amiableness, *s.* මනෝහර, සෝභන, ප්‍රිය, ආදරණීය

Amiably, *ad.* මිත්‍රභාවයෙන්, මිත්‍රවසයෙන්, ප්‍රියවසයෙන්

Amicable, *a.* සාධුසාමීචිවූ මිත්‍රවූ
Amicableness, *s.* සාධුසාමීචිය, මිත්‍රකම
Amicably, *ad.* සාධුසාමීචිලෙස, මිත්‍රලෙස
Amice, *s.* පොරවන, කඩ
Amid, amidst, *prep.* මධ්‍යයෙ, මැදි, අතුරෙහි, අතර
Amiss, *ad.* වරද්දලෙස, නරකකොට; *if I do ever so little amiss,* මම කොපමන ස්වල්පවැරද්දක් කලත්මුත්; *do not take it amiss,* ඒක වැරද්දකටගන්නට එපා
Amission, *s.* නැතිවීම
Amit, *v. a.* නැතිකරනවා
Amity, *s.* මිත්‍රභාවය, මිත්‍රකම
Ammunition, *s.* යුධඋපකරන
Amnesty, *s.* සාමාන්‍යක්ෂමාව ප්‍රකාශකිරීම
Among, amongst, *prep.* අතරෙ, අතරෙහි, අස්සෙ
Amorist, *s.* කාමුකයා
Amorous, *a.* කාමුකවූ
Amorously, *ad.* කාමුකලෙස
Amorousness, *s.* කාමුකකම
Amort, *ad.* මූර්ඡාලෙස
Amount, *s.* ගනන, මුළුගනන; *the amount is ten pagodas,* පගොඩි දහයකට ගනන තිබෙනවා; *all his speech amounts to this,* ඔහුගෙමුළුකථාවෙ ගිම අදහස මේකයි
Amour, *s.* කාමුක ක්‍රියාව
Amphibious, *a.* දියෙහාගොඩදෙක්හිම වසන
Amphibology, *s.* අර්ථාන්තර කථාව, දෙඅර්ථකථාව
Amphisbaena, *s.* දෙහිස්නයා
Amphitheatre, *s.* වටකාරනෙක් තැන් රඟශාලාව
Ample, *a. extended,* පළලවූ, විසාලවූ; *great in bulk,* මහත්වූ; *diffusive,* බහුලවූ, බොහොවූ
Ampliate, *v. a.* විසාලකරනවා
Ampliation, *s.* විසාලකිරීම, දික්කිරීම
Amplificate, *v. a.* බහුලකරනවා, අධිකකරනවා, බෝකරනවා
Amplification, *s.* බහුලකිරීම, අධිකකිරීම, බෝකිරීම
Amplifier, *s.* බහුලකරන්නා, අධිකකරන්නා, බෝකරන්නා
Amplify, *v. a.* විසාලකරනවා, දික්කරනවා, බෝකරනවා
Amplitude, *s. greatness,* මහත්කම, ලොකුකම; *abundance,* අධිකවීම, බෝවීම
Amply, *ad.* අධිකලෙස, බෝලෙස
Amputate, *v. a.* ගාත්‍රසිඳගන්නවා
Amputation, *s.* ගාත්‍රසිඳීම
Amulet, *s.* යන්ත්‍රය
Amuse, *v. a.* සැනහෙනවා, සෙල්ලම්කරනවා
Amusement, *s.* සැනසීම, සෙල්ලම
Amuser, *s.* සැනහෙන්නා, සෙල්ලම්කරන්නා
Amusive, *ad.* සැනසිලිවූ, සෙල්ලම්වූ
An, *article.* එක, ක්; *an inch,* එක අඟලක්; *an eye,* ඇසක්

Anachorite, *s.* තාපසයා

Analogical, *a.* සදෘශ, උපමා වූ, සමවූ

Analogize, *v. a.* සමානපරීක්ෂාකින් උදාහරණකරනවා

Analogous, *a.* සමානත්වය ඇති නාවූ

Analogy, *s.* සමානත්වය

Analysis, *s* වෙන්වෙන්කිරීම

Analyze, *v. a.* ප්‍රභේදකරනවා, වෙන්වෙන්කරනවා

Anarchy, *s.* අරාජකත්වය, ආඥානැතිබව

Anasarca, *s.* දියලුදරවර්ගයක්

Anathema, *s.* අඩුව, ඇවිම, සාපය, නපුරුසාපය

Anathematize, *v a.* නපුරුසාපදෙනවා, අවනවා

Anatomist, *s.* ශල්‍යවෛද්‍ය, සල්ලෙවෙද

Anatomize, *v. a.* සැත්කමකරනවා

Anatomy, *s* සල්ලවිධිය

Ancestor, *s.* වැඩිමාමලා

Ancestry, *s* පූර්වජත්වය

Anchor. *s.* නැංගුරම

Anchor, *v. n.* නැංගුරන්දමනවා

Anchorage, *s.* නැංගුරම්දමනස්ථානය

Anchoret, anchorite, *s.* තාපසයා

Ancient, *a former*, පුරාතන ; *old* පරණ, මහළු

Ancient, *s* පුරාතනයා

Anciently, *ad.* පුරාතනයෙ, ආදි, පළමු ; *see the adj.*

And, *conj.* සහ, ද, ත් ; *clouds and darkness are round about him, righteousness and judgment are the habitation of his throne,* උන් වහන්සේ හාත්පසින් වළාව ද, ඝන අන්ධකාරයද වෙ, ධර්මිෂ්ඨකම, ත්, විනිශ්චය ත්, උන්වහන්සේගේ සිංහාසන ස්ථානය වෙද; *sometimes this word is rendered, by* එලෙස්, තවද, එනමුත්, *but principally at the beginning of sentences; and the Lord spake unto Moses,* එලෙස්, *or* තවද, ස්වාමි න්වහන්සේ මෝසෙස්හට කිවූ සේක, *or* දෙවියන්වහන්සේ වදාළේ, මෝසෙස්හට කියමින් ; *also by*, ඉක්බිතිතෙන්, එවිට ; *as* ඉක්බිතෙන්, දෙවියන් වහන්සේ නෝඅද හාවෙහි ඔහු හා සමග සියළු ජන්තූන් ද, සියලු සත්ත්වයන් ද, දෙවියන්වහන්සේ පොළොව මත්තෙහි සුළඟක් හමන්ට සැලැස්වූ සේක, එවිට, ජලයෝ බැස ගියේය ; *and God remembered Noah, and every living thing, and all the cattle that were with him in the ark; and God made a wind to pass over the earth, and the waters asswaged*

And so forth, යනාදි

Anecdote, *s.* කථාන්තරය, සඳෙශය

Anew, *ad. over again or another time,* නැවත, අලුත්, තවවර ; *fresh,* අලුතින්

Angel, s. දේවදූතයා: *Port.* ආන්ජු
Angel shot, අංදාපු මුඩ
Angelical, a. දෙවදූතිකාවූ
Angelicalness, s. දෙවදූතිකභාවය
Angelic, a. දේවදූතිකා
Anger, s. ක්‍රොධය, වෛරය, උදහස, තරහ, කෝපය, රොස්සතිය
Anger, v. a. ක්‍රොධකරනවා, කොපකරනවා, තරහකරනවා
Angerly, ad. උදහස්ලෙසින්
Angle, s. කොණ
Angle, s. *for fishing*, බිලිය
Angle, v. a. බිලිබානවා
Angle rod, බිලිපිතන
Angler, s. අංමෙදුම්හාමිනා
Angrily, ad. කෝපලෙසින්
Angry, a. ක්‍රොධවූ, වෛරවූ, උදහස්වූ, තරහවූ, කොපවූ
Anguish, s. බලවත්වේදනාව
Anguished, a. බලවත් වේදනා නරව
Angular, a. කොණෙත්වූ
Angularly, ad. කොණෙත්යුක්තවූ
Angulous, a. *see angular,*
Anhelation, s. හුස්මහැරීම
Aniented, a. බාධාවූ, නොභූසට වීම
Anights, ad. රාත්‍රියේ
Animadversion, s. අපවාදලෙස; තරවටුකා කියීරීම
Animadvert, v. n. අපවාදකරනවා, තරවටුකරනවා
Animadverter, s. අපවාද කරන්නා, තරවටුකරන්නා
Animal, s. ශරීරයා, සතා, සත්වයා: *in opposition to things spiritual*, ශාරීරිකාවූ
Animal, a. *in opposition to any thing spiritual*, ශාරීරිකාවූ
Animalcule, s. ක්ෂුද්‍රසතා
Animate, v. a. *to quicken*, ප්‍රාණවත්කරනවා; *to encourage*, ධෛර්යදෙනවා, ජීවත්වනාකරනවා
Animated, a. ප්‍රාණවත්වූ, දිත්සවූ, ජීවත්වන්නාවූ
Animation, s. ප්‍රාණවත්කම, දිත්ගතකම, ජීවත්වන්නාකම
Animator, s. ප්‍රාණවත්කරන්නා
Animose, a. වීර්‍යවන්ත, සූර
Animosity, s. ක්‍රෝධ, වෛර
Anise, s. ජීරක, අනිස්; *Eng.*
Ankle, s. වලලුකර
Anklebone, s. ඇස්ඇට
Annalist, s. පුවත්තිලියන්නා
Annals, s. පුවත්, පුරාන
Annex, v. a. එක්කාසුකරනවා, සම්බන්ධකරනවා, අයිතිකරනවා
Annexation, s. සම්බන්ධකිරීම
Annihilate, v. a. විනාසකරනවා, නාස්තිකරනවා, නැතිකරනවා
Annihilable, a. විනාසකළහැකිවූ, නාස්තිකලහැකිවූ, නැතිකලහැකිවූ
Annihilation, s. විධ්වංසනය, විධ්වංසනයකිරීම, විනාසකිරීම, නාස්තිකිරීම, නැතිකිරීම
Anniversary, s. අවුරුද්දක්පතා එන්දවස
Annotation, s. *note*, ලකුණු සටහන

න්කිරීම ; *explanation*, විස්තර කිරීම

Annotator, *s.* ලකුණු සටහන්කරන්නා, විස්තරකරන්නා

Announce, *v. a.* ඝොසනායකරනවා, ප්‍රසිඩකරනවා, දන්වනවා, ප්‍රකාශකරනවා

Annoy, *v. a.* පීඩාකරනවා, කනගාටුකරනවා

Annoyance, *s.* පීඩාව, කනගාටුව, කන්ස්සලය

Annoyer, *s.* පීඩකයා

Annual, *a.* අවුරුද්දපතා

Annually, *ad.* අවුරුද්දෙන් අවුරුද්ද

Annuitant, *s.* අවුරුද්දපතා යම්මුදලක්ලබන්නා

Annuity, *s.* අවුරුද්දපතා ලබන මුදල

Annul, *v. a.* නිරර්ථකකරනවා, භංගකරනවා, විනාසකරනවා, නිෂ්ඵලකරනවා

Annular, *a.* වලාකාර

Annulet, *s.* කුඩාමුද්දත්

Annumerate, *v. a.* වැඩිගනනට එකතුකරනවා

Annumeration, *s.* වැඩිගනනට එකතුකිරීම

Annunciate, *v. a.* දන්වනවා, ආරන්චිදෙනවා

Annunciation day, *s.* කන්‍යාමරියාවහන්සේට දෙවදූතයෙක් විසින් දෙවියන්ගේ දූතය දුන්නු දවස

Anoint, *v. a.* ආලේපකරනවා, වකනවා, ගානවා, තවරනවා

Anointer, *s.* ආලේපකරන්නා, තවරන්නා, ගාන්නා

Anomaly, *s.* නියම්විධියෙන් වෙනදවීම

Anon, *ad.* එකෙනෙහිම

Anonymous, *a.* නිර්නාමක, නාම්නැති

Anonymously, *ad.* නිර්නාමික ලෙස, නාම්නැතිලෙස

Anorexy, *s.* අරුචිය

Another, *a.* අන්‍ය, අන්, තව, අනික්, වෙන, වෙනාස්, වෙනින් ; *God, said she, hath appointed me another seed*, දෙවියන්වහන්සේ, අන්‍ය, බීජයක් මට නියමකලසේකැයි කියාමෙසේ කීවාය ; *and she said, the Lord shall add to me another son*, ඕතොමෙතොද ස්වාමිවහන්සේ, අන්, පුත්‍රයෙක් මට දෙනසේකැයි කීවාය; *one misfortune comes after another*, එක අවාසනාවක් කම්මුතුවෙනවිට, තව අවාසනාවක් එනවා; *one is bigger than another*, එකකට වඩා අනික් එකා ලොකුයි; *you will be of another mind after you have seen her*, තමුසේ ඈව දුටුවාම තමුසේගේහිත, වෙනා, or වෙනාස්, or වෙනින්, පිනක්වේවි; *they differ one from another*, ඒවා එකකට එකක්, වෙනාසය; *they contend one with another*, ඔවුන් එකෙකුට එකෙක් විවාදකරනවා; *it is one thing to promise, and another*

to perform, පොරොන්දුවෙනවා එකය ඉෂ්ටකාරනවා එකාය්

Answer, *v. n. to reply to any question,* උත්තරදෙනවා, පිළිතුරුකියනවා; *a letter,* ලියුමකට උත්තරදෙනවා; *the same words are used in becoming responsible for a thing, as, I'll answer for that,* මම ඒකට උත්තරදෙමි; *when it means to have a resemblance to, or a correspondence with,* සදෘශ වෙනවා, සමාන වෙනවා; *are used; as, this answers to that exactly,* මේක ඒකට හරියාකාරම සදෘශය, *or* සමානය; *to excuse,* කාරනා පෙන්නවා; *you never can properly answer for such a fault,* උඹට කවදාවත් මෙවැනි අපරාධයකට කාරනාදෙන්ඩබැරිය; *to be suitable to,* සැලසෙනවා, සුදුසුවෙනවා; *this answers several purposes,* මේක කාරනා කීපයකටම සැලසෙය; *to be equivalent to, or satisfy any claim,* වන්දිදෙනවා, ප්‍රතිඵලදෙනවා; *it answers all the labour that was bestowed upon it,* ඒක පිට වෙහෙස වුනාවූ සියළු මහන්සියට ප්‍රතිඵල නොහොත් විපාකදෙනවා

Answerable, *a.* උත්තරදියහැකිවූ, උත්තරදියයුතුවූ; *see the verb.*

Answerably, *ad.* සැලසෙනලෙස, සුදුසු පරිද්දෙන්; *see the verb*

Answerer, *s.* උත්තරදෙන්නා, පිළිතුරුකියන්නා

Ant, *s.* කූඹියා, කුහුඹියා

Ant hill, *s* තුඹස

Antagonist, *s.* විරුද්ධකාරයා, විවාදකාරයා

Antagonize, *v. n.* විරුද්ධවකාරනවා, *or* විවාදකාරනවා

Antasthmatic, *a.* කැස්ස රෝගයට ප්‍රතිකාරවූ

Antecede, *v. a.* පෙරටුවයනවා

Antecedence, *s.* පෙරටුවයාම, පෙරටුවසිටිනාබව

Antecedent, *s.* පෙරටුවයන්නා

Antecedent, *a.* පෙරටු

Antecedently, *ad.* පෙරටුලෙස

Antechamber, *s.* පිටත්තෙ කාමරය

Antedate, *v. a.* පෙරටුව වකාව දවල්ලියනවා

Antediluvian, *a.* ජලප්‍රවාහයට පළමුවසූ

Antelope, *s.* වලිගයක මුවෙක්

Antemeridian, *a.* පූර්වාන්හකාලෙ

Antemetic, *a.* වමනය නවතන

Antepast, *s.* අනාගතරසය

Antepenult, *s.* දෙකඅරු අන්තිම පදය

Anteriority, *s.* පසුගියතාව

Anterior, *a.* පෙරගිය

Anthelminthic, *a.* ක්‍රිමිනාසක

Anthem, *s.* ගීතකාවක්, ඉස්තුති කවි, ඉස්තුතිගීය

Anthology, *s. collection of prayers* යාච්ඤාවලිය; *poems,* ගීතකාවලිය

Antichristian, *a.* ක්‍රිස්තුවිරුද්ධ

Anticipate, *v. a.* අනාගතකාර්‍ය්‍යය කායකරනවා, අනාගතකාර්‍ය්‍යයන් මුලින්කරනවා, අනාගතකාර්‍ය්‍ය කාසිඩකරනවා; *to hope for or expect*, ප්‍රාර්ථනාකරනවා, බලාපොරොත්තුව සිටිනවා

Anticipation, *s.* කලයෙදපහසුඩ දැලමු සදනම්, ප්‍රාර්ථනාව, බලාසිටීම.

Antic, *a.* සිනාවට සුදුසුවූ

Anticly, *ad.* සරදම් සිනාවට සුදුසුවූ

Antidotal, *a.* විසමරන්නාවූ

Antidote, *s.* විසමැරුම

Antimonarchical, *a.* එකාම රජෙක් නොකැමැත්තාවූ

Antimony, *s.* අඳුන, අඳුන්, සන් ඩාදු

Antinomy, *s.* අජනාම, අනාජ්ඥාවෙ, ආඥාවෙහි පූර්වාපරවිරුද්ධබව

Antiparalytic, *a.* පක්ෂඝාතරෝගය සුවකරනාවූ

Antipathy, *s.* අරුචිය, අප්‍රියාව, විරුද්ධය

Antipodes, *s.* පොළවයටපැත්තේ වසනාඅය

Antiquary, *s.* පුරාවෙත්තදන්නා

Antiquate, *v. a.* භාවිතාවෙන් නැරන්ඩලෙසකරනවා, පූර්වයෙහිමෙන්කරනවා

Antiquatedness, *s.* භාවිතාවෙන් නැරන්ඩබව, පුරාණබව

Antique, *s.* පුරාතනවස්තුව

Antique, *a.* පොරණ, පුරාතන

Antiquity, *s.* පුරාණබව, පූර්වකාලෙ

Antler, *s.* මුවඟ

Anvil, *s.* කිණිහිර

Anxiety, *a* උත්කණ්ඨා, සැලවිකාරය, කාන්සිය, ලතාව, කාන්සාව

Anxious, *a.* උත්කණ්ඨාවූ, සැලවිකාරවූ, භයසොම්නස්දෙකින් සැලවුව

Anxiously, *ad* උත්කණ්ඨාලෙස, සැලවිකාරලෙස, භයසොම්නස්දෙකින් සැලවන්නාමෙන්

Anxiousness, *s.* භයක්‍රස්තභාවය, අභිලාෂත්වය

Any, *a.* යම්, කිසි, කවුරුවත්, කාවත්; *do you know any one who understands that matter*, ඒකාරණාව තේරෙන, යම්, කෙනෙක් අඳුනවා උඹිදන්නවාද; *I know not any one of them* ඔවුන්ගෙන් කිසිකෙනෙක් මම දන්නේනැත; *is there any one who will undertake that affair*, ඒකාර්‍ය්‍ය කරන්ට බැඳින්නාවූ කවුරුවත් ඇද්ද; *any man can do that*, ඒක කාටත් කරන්ට පුළුවනි; *any where*, කොතනකත්නම්වත්; *he must be there if he be any where*, ඔහු යම්තැනක ඉන්නවානම් එතන හිටිය යුතුය; *let me know what you want, without any more ado*, උඹ වදනොකර උඹට ඕනෑදේ මට කියාපන්; *will you go any farther*, වැඩිදුර, *or* මීට වැඩිදුර

උඹිගෙනාවාද; *he denied that he had any farther order*, ඔහුට තව අනාගුවක් ලැබුණා නා කියා ඔහු කීවා; *any more, any longer*, වැඩිපුරට, තවත් දුරට; *take any*, මොනාවයත් අරගනින්

Apace, *ad.* ඉක්මනින්, වේගයින්, සැඩිනාපින්, සැඩියාකමින්

Apart, *ad.* වෙනම, වෙනස්කොට, වෙනාස්කොට

Apartment, *s.* ආවාසය

Apathy, *s.* නොහැඟෙනකම

Ape, *s. there are two kinds of apes or monkeys common in the southern part of Ceylon; the* වඳුරා, *which is of a dark colour with a bushy white beard, and very harmless; the* රිළවා, *is of a brown colour exceedingly active, and generally very mischievous; an imitator,* කවටයා

Ape, *v. a. to mimick,* සද්‍රිසකරනවා, හරිහරියටකරනවා

Aperient, *a.* පාචනකාරවන

Aperture, *s.* විවරය, විවුරුතැන, හැරිම

Aphilanthropy, *s.* මිනුස්සයන් කෙරෙහි අදයාවන්තබව

Aphorism, *s.* විශේෂොපදේශය, සූත්‍රපදයන්, ප්‍රඥප්තී, වචන

Apiece, *ad.* එකක් එකක් පාසා

Apish, *a. having the qualities of an ape,* රිලාගේ අගතනාවූ; *fond of mimicry,* හරිහාරිසටකරන්නාවූ, ආඩම්බරවූ

Apupat, *ad* වහාවස්ථාවලයෙන්

Apocalypse, *s.* ප්‍රකාශය

Apocrypha, *s.* අප්‍රකාශය, බයිබලයේ අප්‍රකාශවූ එක්කාසුවෙන්

Apologize, *v. n. it is difficult to get a word among the Singhalese exactly corresponding to this, they commonly use, in cases of real or supposed misdemeanour,* සමාවඉල්ලනවා; *but in instances of explaining or accounting for a thing they use* කාරනාපෙන්නවනවා *or* කාරනා දෙනවා

Apology, *s.* සමාවඉල්ලවීම, කාරනාපෙන්වීම, කාරනාදක්වීම: *see the verb.*

Apophlegmatic, *a.* සෙම්හරින

Apophthegm, *s.* සුභාෂිතය

Apoplectic, *a* පක්ෂඝාතන

Apoplexy, *s.* පක්ෂඝාතරෝගය, අඩසන

Apostacy, *s* අනාද්‍රිෂ්ටිය

Apostate, *s.* අනාද්‍රිෂ්ටිකායා, සුධර්මනාශිකයා

Apostatical, *a.* අනාද්‍රිෂ්ටික, සුධර්මනාශක

Apostatize, *a.* සුධර්මයනාශකරනවා

Aposteme, *s.* වාත්‍යගෙඩිය

Apostle, *s.* ප්‍රේරිතයා, *the word* අපෝස්තලු *is generally understood,*

Apostolical, *a.* ප්‍රේරිතවූ

Apostleship, *s.* ප්‍රේරිතකම

Apostolically, *ad.* ප්‍රේරිතයන්ගේසේන්

Apostolic, *s.* ප්‍රේරිත

Apostrophe, *s.* අක්ෂරලොපක්කිරි මට දමනා ලකුණක්

Apostume, *s.* ඉදුණුගෙඩි

Apothecary, *s.* බෙහෙත් වෙළෙන්ද

Appal, *v. a.* භයින් මවිජාකර නාවා, තිගැස්සිකරනාවා

Apparatus, *s.* උපකරණ

Apparel, *s.* වස්ත්‍ර, ඇඳුම්

Apparel, *v. a.* වස්ත්‍රධරනාවා, ඇඳුම් අඳිනාවා, අඳවනාවා

Apparent, *a.* දෘශ්‍යමානව, පෙනෙන්නාවූ, පැහැදිලිවූ

Apparently, *ad.* දෘශ්‍යමාන පරිද්දෙන්, පෙනෙනාපරිද්දෙන්, පැහැදිලිලෙස

Apparition, *s. visibility,* දිස්වීම; *spectre,* භූතය, හැවැන්ම

Appeach, *v. a.* වරදකබනාවා, තරවටුකරනාවා

Appeachment, *s.* වරදපිහිටවීම

Appeal, *s. judicial,* දෙවෙනු විනිස්චයපැතීම; *in this instance the English word* ඇපෑල්; *with,* ඉලනාවා *is commonly used; an address,* කථාකිරීම

Appeal, *v. n.* දෙවෙනුවිනිස්චය පතනාවා; *see the noun*

Appear, *v. n. to become visible,* දර්ශනයවෙනාවා, පෙනෙනාවා; *to appear before a court,* අභිමුඛයෙහි සිටිනාවා; *to make appear,* දර්ශනයකරනාවා, පෙන්වනාවා; *so it appears,* එලෙස පෙනෙනාවා

Appearance, *s.* පෙනීම, දර්ශනය; *at first appearance,* පළමු දර්ශනයෙහි; *appearance in court,* උසාවිය අභිමුඛයෙහි; *a small appearance,* ස්වල්ප පෙනීමක්

Appearer, *s.* පෙනෙන්නා

Appeasable, *a.* නාවත්තන්ට හැකිවූ, සංසිඳුවනාදා

Appease, *v. a. to mitigate,* මඳකරනාවා; *to pacify,* නලවනාවා; *to quiet,* නිස්චලකරනාවා, නවත්තනාවා; *to reconcile,* හාදකරනාවා

Appeaser, *s.* නවත්තන්නා

Appellation, නාම, නාමය

Appellative, *s.* සාමාන්‍යනාම

Append, *v. a.* සම්බන්ධකරනාවා, සමගිකරනාවා

Appendage, *s.* සම්බන්ධවූදේ, සම්ගිකිරීම

Appendant, *s.* බැඳිවූ, බැඳුණ

Appendicate, *v. a.* ...කරනාවා

Appendix, *s.* සම්බන්ධවීම, සමගිකිරීම

Appertain, *v. n.* අයිතිවෙනාවා, අඩංගුව තිබෙනාවා

Appertinance, *s.* සම්බන්ධ අයිති, ද්‍රව්‍ය, කාලයිරාත

Appertinent, *a.* අයත්වූ, අඩංගුවූ, වැදගත්වූ

Appetite, *s. violent longing, desire of sensual pleasures,* අභිලාසය; *natural desire,* රාගය; *keenness of stomach,* කෑමතෘෂ්ණාව

Applaud, *v. a.* ප්‍රසංසා කරනවා, පාරට්ටු කරනවා

Applauder, *s.* ප්‍රසංසා කරන්නා, පාරට්ටු කරන්නා

Applause, *s.* පසංසාව, පාරට්ටුව

Apple, *s* දඹ, පඹු

Appliance, *s.* ඉල්ලීම, අදාල

Applicability, *s.* අදාලවියහැකි කැනා, සුදුසුකම

Applicable, *a.* ගැලපෙඩහැකිවූ, අයිතිවෙඩපුළුවන්වූ, අදාල වෙඩපුළුවන්වූ

Applicableness, *s* ගැලපෙනකම

Applicably, *ad.* අදාලවියහැකි පරිද්දෙන්, ගැලපෙනපරිද්දෙන්

Application, *s. the act of applying one thing to another,* සම්බන්ධ කිරීම, අදාලකිරීම; *the thing applied,* සම්බන්ධවූවය; *petition,* ඉල්ලීම, යාඥාව; *study,* දිවෙඩ්ත් සාහෙන්, භාවිතාව, විභාගය

Apply, *v. a. one thing to another,* සම්බන්ධකරනවා, අදාලකරනවා, නියුක්තවෙනවා, තබනවා, දමනවා; *to ask for any thing,* යාඥාවෙනවා, ඉල්ලනවා; *to apply a plaster,* ආලේපයක් තබනවා; *to apply to one,* යමෙක් කාව යාඥාවෙනවා; *to apply one's mind to learning,* ශාස්ත්‍ර ඉගෙන්මෙහි නියුක්තවෙනවා; *to apply one's self to something,* යම්දෙයක්හි නියුක්තවෙනවා

Appoint, *v. a.* නියෝගකරනවා, පත්කරනවා, නියමකරනවා

Appointer, *s.* නියෝගකරන්නා, පත්කරන්නා, නියමකරන්නා

Appointment, *s.* නියෝගකිරීම, පත්කිරීම, නියමකිරීම

Apportion, *v. n.* සමභාගකරනවා, කොටස්දෙනවා

Appose, *v. a.* විචාරනවා

Apposite, *s.* අනුරූපවූ, සුදුසු

Appositely, *ad.* අනුරූප පරිද්දෙන්, සුදුසුලෙස

Appraise, *v. a.* මිලකරනවා

Appraiser, *s.* මිලතබන්නා, අගය තබන්නා

Appreciate, *v. a.* අගයකරනවා, වටිනාකම්කරනවා, *or* සිහිපටගනනවා

Apprehend, *v. a. to seize,* අල්ලනවා; *to fear,* භයවෙනවා; *comprehend,* හැඟෙනවා, තේරෙනවා, දැනගන්නවා

Apprehender, *s.* අල්ලන්නා

Apprehensible, *a.* අල්ලන්ට හැකිවූ, තේරෙඩපුළුවන්වූ

Apprehension, *s. seizure,* අල්ලීම; *fearfulness,* භයවීම; *comprehension, conception,* හැඟීම, තේරුන්වීම, දැනගැනීම; *opinion,* කල්පනාව

Apprehensive, *a.* තත්ක්ෂණ විජානවූ; *fearful,* භයවූ; *quick in conception,* ඉක්තෙරෙනාවූ

Apprehensively, *ad.* යමොක්තානි

හා පරිද්දෙන්, භේරෙහා ලෙස

Apprehensiveness, *s.* යකෘර්:ස්තාන, ශංකෙන් යුක්තබව

Apprentice, *s.* සිල්පයක් ඉගෙනගන්නා, සිල්පයක් ඉගනීමට පොරොන්දුවෙන් බැඳුණාය

Apprentice, *v. a.* පරාදීනව සිල් පොත්ග්‍රහණය කරනපිනිස උත්තරනාවා, සිල්පයක් උගනනාපිනිසපොරොන්දුවෙන් බැදෙනාවා

Apprize, *v. a.* දැන්වනාවා

Approach, *v. n.* සමීපවෙනාවා, ලන්වෙනාවා, ලඟාවෙනාවා, කිට්ටුවෙනාවා

Approacher, *s.* සමීපවෙන්නා, ලන්වෙනනා, කිට්ටුවෙන්නා, ලඟාවෙන්නා

Approachment, *s.* සමීපවීම, ලඟාවීම, කිට්ටුවීම

Approbation, *s.* ඒත්තුගැනීම, මනාපවීම, කැමතිවීම

Appropriable, *a.* වෙදීයගැනිවූ

Appropriate, *v. a.* නියමකරනාවා, අයිතිකරගන්නාවා

Appropriate, *a.* නියමකලාවූ, අනුරූපවූ, සුදුසුවූ, යුතුවූ

Appropriation, *s.* නියමකරගැනීම, නියමකරගැනීම

Approveable, *a.* ප්‍රසන්නකලහැකිවූ, සතුටුකලහැකිවූ, ඒත්තුගතයුතුවූ

Approval, *s.* අනුදැනීම, මනාපවීම, සතුටුවීම, ඒත්තුගැනීම

Approver, *s.* අනුදන්වන්නා, ඒත්තුගන්නා

Approve, *v. a.* ඒත්තුගන්නාවා, අනුදන්නාවා, මනාපවෙනාවා

Approximate, *v. n.* සමීපවෙනාවා, ලඟාවෙනාවා, ලන්වෙනාවා, කිට්ටුවෙනාවා

Approximate, *a.* ලඟා, කිට්ටු

Approximation, *s.* සමීපවීම, ලන්වීම, කිට්ටුවීම

Apulse, *s.* ගැසීම

Apricot, *s.* විශේෂයක ඵල

April, *s.* බක්මස

Apron, *s.* ඉදිරිපටබඳින වස්ත්‍ර ඛාණ්ඩ

Apt, *a. tending to,* සුරුවූ, *or* යොමුකරන්නාවූ; *habituated to,* හාවිතාකරන්නාවූ; *clever,* සූරුවූ, දක්ෂවූ, සමර්ථවූ, හපන්වූ

Aptitude, *s.* යුතුකම, සුදුසුකම

Aptly, *ad.* සුදුසුපරිද්දෙන්, දක්ෂලෙස, සමර්ථලෙස

Aptness, *s.* සුරුබව, දක්ෂකම, සමර්ථකම, සුදුසුකම

Aqua-marina, *s.* ලසුනීලමාණික්‍යය, අගුමරීනා; *Portug.*

Aquatic, *a. animal,* ජලචරවූ, දියෙහිවසනාවූ

Aqueduct, *s.* ප්‍රනාලි, දියදුවනා සොරොවුව, කානුව; *Portuguese*

Arable, *a.* ගොවිකම්කලහැකිව සුදුසු, ගොයිකටයුතුවූ

Araneous, *a.* මකුළුදැලක් සමාන, මකුළුදැලින් පිරුණු

Aration, *s.* සීසෑම

Aratory, *a.* සීසෑමට අදාලවූ

Arabalist, s. හරස්දුනන

Arbiter, s. මධ්‍යස්ත විනිශ්චය කාරයා, විනිශ්චයකාරයා

Arbitrable, a. තන්හාශාවෙදෙන්නා වූ, හිතුවක්වූ, ස්තුතිවත්කාර

Arbitrarily, ad. හිතුවක්කලෙයින්, බලත්කාරලෙස

Arbitrary, a. බලත්කාරවූ, හිතුවක්වූ

Arbitrate, v. a. to judge of, ගුරුතාන්තර විනිශ්චයකරනවා, ගුරුවනයකොට විනිශ්චයකරනවා; to decide a judicial case between two parties, මධ්‍යස්තකයෙහි විනිශ්චයට පත්කරනවා, අතරතුරෙහි නඩුතීන්දුකරනවා; to decide, to determine, නියමකරනවා, තීන්දුකරනවා

Arbitration, s. ගුරුතාන්තර විනිශ්චයකිරීම, ගුරුවනයකොට විනිශ්චයකිරීම, මධ්‍යස්තකයෙහි විනිශ්චයට පත්කිරීම, අතරතුරෙහි නඩුතීන්දුකිරීම; see the verb

Arbitrator, s. ගුරුතාන්තර විනිශ්චයකරන්නා, ගුරුවනයකොට විනිශ්චයකරන්නා, මධ්‍යස්තකයෙහි විනිශ්චයට පත්කරන්නා, අතරතුරෙහි නඩුතීන්දුකරන්නා; see the verb

Arbour, s. වංකුමනා, අතුලතා රිත් පැවසුනත් ඉඩම, අතු වැසිවිචිකම

Arch, s. අඩිකැවය; the word in common use is the Portuguese, ආක්කුව; chief, ප්‍රධානියා

Arch, v. a. අඩමඬුලුකරනවා, ආක්කුසාදනවා; see the noun

Arched, s. දුනුහැඩ, අඩිවූනා කාරෙ, ආක්කුලෙස

Archangel, s. ප්‍රධානදෙවදූතයා

Archbishop, s. ප්‍රධාන පරිදෂිකයා

Archdeacon, s. අනුපරිදෂිකයා

Archer, s. වැද්දා, දුනුකාරයා

Archery, s. දුනුශිල්පය, විදුම්ශාස්ත්‍රය

Archetype, s. මූලාරූපය, මූලාදර්ශය

Archepelago, s. කොදෙව්වූ සමූහය

Architect, s. ගෘහකර්මශාස්ත්‍රකාරයා

Architecture, s. ගෘහකර්මශාස්ත්‍රය

Archives, s. පුරාණලියවිලි ආදී තබන ස්ථානය

Archwise, s. අඩිවූනාකාර

Archiic, a. අඩිවූනා, වක්කා

Ardency, ardour, s. heat, සම්බ, ශ්‍රියම, ලෝභනා, රස්නාය, දැඩය, දැඩ; fervour of mind, සැල් කිඩිය, තද්‍රඩතා; fervour of affection, තදසෙනෙහෙය

Ardent, a. සම්බ, ශ්‍රියම්වූ, ලෝභනාවූ, රස්නෙවූ, දිගවූ, සවලුතසිත්වූ, තදසිත්වූ, තදසෙනෙහෙවූ; see the noun

Ardently, adj. ශ්‍රියම්ලෙස, ලෝභනාලෙස, රස්නෙන්ලෙස, දැඩලෙස, සවලුතසිත්ලෙස, තද

සිත්ලෙස, තද ෙසනාශලෙස ; *see the noun*

Arduous, *s.* වෙෙහස, මාන්සි, අපහසු, අමාරු, අසීරු

Are, *persons*, ඉන්නවා, ඉන්නවා; *things*, තිෙබනවා, තියෙනවා

Arefy, *v. a.* සුස්කකරනවා, වියලනවා

Argil, *s.* කුඹල්මැටි

Argue, *v. a.* විවාදකරනවා, කාරනාපෙන්වනවා, තර්කකරනවා, තරගකථාකරනවා

Arguer, *s.* විවාදකාරයන්නා, තර්කකරන්නා, තරග කථාකරන්නා

Argument, *s.* විවාදය, තර්කය, තරගකථාකිරීම

Argumentation, *s.* විවාදකිරීම, තර්කෙය, තරගය

Argumentative, *a.* විවාදවූ, තර්කෙයන් සම්බන්ධ

Argute, *a.* තියුණු

Arid, *a.* සුස්ක, වියලි

Aridity, *s.* සුස්කභාවය, වියලිභාවය

Aries, *s.* මේෂරාසිය

Aright, *ad.* යුතුපරිද්දෙන්

Arise, *v. n.* නැඟිටිනවා, නඟිනවා

Arithmetical, *a.* ගණිතශාස්ත්‍රය අයිති

Arithmetically, *ad.* ගණිතශාස්ත්‍රපරිද්දෙන්

Arithmetician, *s.* ගණිතයා

Arithmetic, *s* ගණිතශාස්ත්‍රය

Ark, *s. the sacred depository of the covenant of God with the Jews is called*, ගිවිසුම්පෙට්ටිය ; *a ship or any large floating vessel is*, නැව

Arm, *s.* බාහුව, හස්තය

Arm, *v. a.* සන්නාහසන්නද්ධකරනවා

Armed, *a.* සන්නාහසන්නද්ධ, යුද්ධායුධයෙන් ශරසුනාවූ

Arm, *v. n.* ආවුදගන්නවා

Armade, armament, *s.* යුද්ධසමූහයක්

Armhole, *s.* කිහිල්ල

Armillated, *a.* වළලුපැලඳි

Armistice, *v.* යුද්ධනවත්වන්නා, *or* සුළුසමාදාන

Armorer, *s.* ආයුධසාදන්නා, ආයුධප්‍රෙවිසන්කරන්නා

Armory, *s.* ආයුධතිබනස්ථානෙය්

Armour, *s. coat of*, සන්නාහය ; *defensive weapons in general*, ආයුධවල්, අවි

Armour-bearer, *s.* ආයුධගෙනයන්නා

Armpit, *s.* කිහිල්ල

Arms, *s.* ආයුධවල් ; *to be in arms*, යුද්ධය සූදානම්වසිටිනවා

Army, *s.* සිඳුරහසේනාව, යුද්ධසේනාව

Aromatics, *s.* සුගන්ධද්‍රව්‍යයන්

Arose, නැඟුටුනා

Around, *ad.* හාත්පසින්, වටේ

Arouse, *v. a.* ප්‍රබුද්ධකරනවා, කුබුද්දන්ට

Arow, *ad* පෙළ, පටපාටිය, පිළිවෙල

Arrack, *s.* අරක්කු

Arraign, *v. to set in order,* පිළිවෙළකරනවා; *to place a prisoner in the presence of the judge,* විනිස්චයකාරයා අභිමුඛයට පත්කරනවා, නඩුකාරයා ඉදිරිපිටට ගෙනෙනවා; *to accuse or charge with faults,* දොෂාරොපනය කරනවා, වරදතබනවා

Arraignment, *s.* පිළිවෙලකිරීම, විනිස්චයකාරයා අභිමුඛයට පත්කිරීම, නඩුකාරයා ඉදිරිපිට ගෙනයෑම, දොෂාරොපනයකිරීම, වරදතැබීම; *see the verb*

Arrange, *v. a.* අස්කරනවා, පිළිවෙලකරනවා, පිරියටතබනවා, සූදානම්කරනවා

Arrangement, *s.* අස්කිරීම, පිළිවෙලකිරීම

Arrant, *a.* නපුරු, දුෂ්ට, ඉතානපුරු

Arrantly, *a.* දුෂ්ටලෙස, නපුරුලෙස, ඉතානපුරුලෙස

Array, *s. dress,* හැරසීම, අලන්කාරවූවස්ත්‍ර; *order of battle,* යුද්ධයට සැරසීම

Array, *v. n. to dress,* සරසනවා, පලඳිනවා; *to put in order,* පිළිවෙලකරනවා

Arrear, *s.* අවශේෂ, ණයකාරහිඟ

Arreptitious, *a.* උදුරාගන්නාවූ *or* බලෙන්ගන්නාවූ, රහස්භාවයෙන් අවුත්

Arrest, *v. a. to seize by law,* හිරකරනවා, අල්ලනවා; *to hinder,* තහනම්කරනවා

Arrival, *s.* සම්ප්‍රාප්තවීම, පැමිණීම, ලඟාවීම

Arrive, *v. n.* සම්ප්‍රාප්තවෙනවා, පැමිණෙනවා, ලඟාවෙනවා

Arrogance, *s.* උඩඟුකම, ආඩම්බරකම, අහංකාරකම

Arrogant, *a.* අහංකාරවූ, උඩඟුවූ, ආඩම්බරවූ

Arrogantly, *ad.* උඩඟුමෙන්, ආඩම්බරමෙන්, අහංකාරමෙන්

Arrogate, *v. a.* උඩඟුකම්ගන්නවා, ආඩම්බරගන්නවා, අහංකාරකම්ගන්නවා

Arrogation, *s.* උඩඟුවීම, ආඩම්බරවීම, අහංකාරවීම

Arrow, *s.* සර, බාණ, ශී, නාදර, අඩසඳ, මුවද, බප, මොටල, ඊගහ, අඩ, ඊය

Arrowhead, *s.* රට දූලන් කීරිය

Arsenal, *s.* ආයුධතිබෙන සාලගෙ

Arsenic, *s.* ශ්‍රීංගී, පාසානන්

Art, *s.* සිල්ප, ශාස්ත්‍ර, සම්මානකම

Arterial, *a.* මහනාහරයගැන

Artery, *s.* ධමනි, සිරාජාල, මහනාහරය, මූලනාහරය

Artful, *a. dexterous,* සමර්ථවූ; *cunning,* ප්‍රයෝගවූ

Artfully, *ad.* සමර්ථමෙන්, ප්‍රයෝගයෙන්

Artfulness, *s.* සමර්ථකම, ප්‍රයෝගකම

Articboke, *s.* යෙඩිජතියක්, *or* එලජතියක්

Artic, *a.* උතුරට, දකුණුදිශට

Article, *s. in grammar,* උපසර්ග; *in general,* ද්‍රව්‍ය, දෙවල්; *article of a covenant,* පොරොන්දුපත්‍රේ වචනක්තිය; *articles in a list of things,* සම්පූ උපකාරනාවල ලියමනාකදේවල්; *in the article of danger,* සම් උපද්‍රවයක කාරණා; *to article,* පොරොන්දුපතුයක් සාදන්ට

Articular, *a.* සන්දිගත

Articulate, *a.* වෙන්ව, මහිරිහඩ

Articulate, *v. a.* මහිරිහඩකරනවා, *or* මහිරිව කථාකරනවා

Articulately, *ad.* මහිරිහඩමෙන්

Articulateness, *s.* මහිරිහඩකම

Articulation, *s. in singing,* සන්දිය; *grammatically,* මහිරි හඩය; *in botany,* බද

Artifice, *s.* ප්‍රයෝගයක්, උපාවක්; *trade,* කම්මාන්තයක්

Atificer, *s.* කම්මාන්තකාරයා

Artificial, *a.* හස්තකම්මාන්තවූ

Artificially, *ad.* හස්තකම්මාන්තමෙන්

Artificialness, *s.* හස්තකම්මාන්තකම

Artillery, *s.* කාලතුවක්කු

Artisan, *s.* කම්මාන්තකාරයෙක්

Artist, *s.* කම්කරු

Artlessly, *ad.* අප්‍රයෝගලෙස, අවංකලෙස, උපායනැත්ලෙස

Artless, *adj. sincere, without fraud,* අප්‍රයෝගවූ, අවංකවූ, උපායනැත්වූ

Artuate, *v. a.* හාතුනවෙන්කරන්ට

As, *conj. when it signifies according to, such, as such like, and all terms expressive of comparison, the following particles are used and attached as terminations to the sentences with which they are connected, as may be seen in the examples,* පරිදෙන්, ප්‍රකාර, ආකාර, මෙන, බදු, වැනි, ලෙස, සේව, උපාගෙ; *as I was informed,* මට දැනගත්පරිදෙන්; *this is as the other,* මේක අනික් ප්‍රකාරයට තිබෙන්නා; *such as it is,* ඒක තියෙනාආකාරය; *as if he were my brother,* මගේ මාගේ සහෝදරයාමෙන්; *all such as are poor,* සියළුම්ම එබදුදුප්පතුන්; *as I,* මාවැනි; *as like as can be,* හැකිපමණපදෙනක් එලෙස මය; *as he lived so he died,* ඔහු ජීවත්ව උන්වාගේම මැරුනා; *this book is as that,* මේපොත ඒවාගේය; *when this word implies the time of an action it is rendered by,* විට, දී, *or* කලාද; *as I was paying down the money the man happened to come in,* මම මුදල ගෙවනවිට ඒමනුස්සයා ඇතුලට එබ හැදුනාය; *sometimes it may be rendered by,* ගෙයක්; *as I walked along,* මම යාඑනකොට කලාද; *as I cannot*

come to you, මට තමුන්සේවෙත ට එඩබැරිසෙයින්; *as for him,* ඔහු උදෙසා; *as for instance,* ආ දිසන්නාට වෙනුව

Asafœtida, *s.* හිඟු, පෙරුංකායන්

Ascarides, *s.* බඩපණුවන්, කුමි

Ascend, *v. n.* ආරූඪවෙනවා, ගොඩනඟිනවා; නඟිනවා, උඩ යනවා; *in learning,* වැඩියනි පුණවෙනවා

Ascendant, *s.* උසස්වූ, උස

Ascendency, *s.* උසස්කම

Ascension, *s.* ආරූඪවීම, නැඟීම

Ascertain, *v. a.* නිශ්චයවදැනගන් නවා; දැනගන්නවා

Ascertainer, *s.* නිශ්චයවදැනගන් නා, දැනගන්නා

Ascertainment, *s.* නිශ්චයව දැන ගැනීම, දැනගැනීම

Ascetic, *a.* තාපසයා, යෝගී

Ascetical, *a.* තාපසවූ, යෝගීවූ

Ascribable, *a.* ගුණයක්පෙන් වාදෙනට පිලිවන්

Ascribe, *v. a.* ගුණපෙන්වාදෙනවා

Ascription *s.* ගුණපෙන්වාදීම

Ascriptions, *a.* ගුණයන්

Ash, *s.* වනිනයක ගහක්

Ashamed, *a.* ලැජ්ජාවූනා

Ashes, *s.* භස්ම, අලු

Ashore, *ad.* වෙරල

Aside, *ad.* එකපැත්තකටවෙන්ව; *to lay aside,* පැත්තක තියනවා; *that set aside,* ඒක පැත්තකින් තිබූ; *set that aside,* ඒක කොන්කරපන්, අත්අරපන්

Ask, *v. a.* *to enquire,* විචාරනවා; *to beg, to entreat,* ඉල්ලනවා; *to demand,* අහනවා

Asker, *s.* ඉල්ලනනා

Aslant, *ad.* පාන්සිවෙලා, ඇලවෙලා

Asleep, *ad.* නිද්‍රී

Asp, *s.* සර්පයෙක්

Aspect, *s.* දෘෂ්ටිය, බැලීම, රූපය, පෙනීම

Aspect, *v. a.* බලනවා; *aspection,* දෘෂ්ටිවීම, බැලීම

Asperity, *s.* කටුකබව

Asperse, *v. a.* අපකීර්තිකරනවා, නින්දාකරනවා

Aspersion, *s,* නින්දාව

Aspirate, *v. a.* ඝෝෂනාය කරනවා, මහාප්‍රාණකොට කියනවා

Aspirate, *a.* ඝෝෂනායකරන්නා වූ, මහාප්‍රාණකොටකියන්නා වූ

Aspiration, *s.* ඝෝෂනායකිරීම, මහාප්‍රාණකොටකීම

Aspire, *v. n.* උසස්වෙනවා

Ass, *s.* ගර්දභයා, කොටළුවා

Assail, *v. a.* උරණකරනවා, උර නවගැසූමට පන්නවා, තර්ජනයන් අසූකොටගන්නවා, පෙරලිකරනවා, සඩහන්කර නදා

Assailable, *a.* උරණවෙන්ටහැකි වූ

Assailant, *s.* උරණකරන්නා

Assailant, *s.* උරණකරුවන්

Assailer, *s.* *see assailant,*

Assassin, *s.* මිනීමරන්නා

Assassinate, *v. a.* මිනීමරනවා

Assassinator, *s. see assassin.*

Assault, *s.* ඩබරය, පෙරලිය

Assault, *v. a.* ඩබරකාරනාවා, පෙරලිකාරනාවා

Assay, *s.* සොදිසිය

Assay, *v. a.* සොදිසිකරනාවා, කරබලනාවා

Assayer, *s.* රිදිවල තරම සොයනනා

Assemblage, *s.* රැස්විම

Assemble, *v. a.* රැස්කරනාවා, එක්වෙනාවා, එකමුතුවෙනාවා, සමූහවෙනාවා, සම්ගවෙනාවා

Assembly, *s* සභාව, සමූහය, සමාගම

Assent, *s.* අවසර

Assent, *v. n.* අවසරදෙනාවා, එක්සිත්වෙනාවා, එක්තුගන්නාවා

Assentation, *s.* අවසරදීම, එක්තු ගැනීම

Assert, *v. a.* සත්‍යකරකියනාවා, සහතිකකරනාවා, සත්තකකරනාවා

Assertion, *s.* සත්‍යකිරීම, සහතිකකිරීම, සත්තකකිරීම

Assertive, *a.* සහතිකවූ, සත්තකවූ

Assertor, *s.* සහතිකකරන්නා, සත්තකකරන්නා

Asserve, *v. a.* උපකාරකරනාවා, උදවුකරනාවා

Assess, *v. a.* පඬුරු අයකරනාවා

Assession, *s.* ලඟම්ම උදවුපිණිස ලඟහිඳීම

Assessment, *s.* පඩුරු

Assessor, *s.* අදිකාරන්නා සොලාවට වාඩිවෙනාකෙනෙක්, පඬුරුගන්නා

Assever, asseverate, *v. a.* අවශ්‍යයෙන් කියනාවා

Asseveration, *s.* අවශ්‍යයෙන් කියවීම

Assiduity, *s.* වීර්‍ය්‍ය, උත්සාහය, දිවසම

Assiduous, *a.* වීර්‍ය්‍යවූ, උත්සාහවූ

Assiduously, *ad.* වීර්‍ය්‍යලෙස, උත්සාහලෙස

Assign, *v. a. as a reason for*, කාරණාදක්වනාවා, පෙන්වාදෙනාවා; *to appoint*, නියෝගකරනාවා, පත්කරනාවා, නියමකරනාවා

Assignation, *s.* සංකතාවපාව, පාවාදීම, බාරදීම

Assignee, *s.* බලයලත්අය

Assigner, *s.* නියෝගකරන්නා, නියමකරන්නා

Assignment, *s.* නියෝජනය, නියමය

Assimilable, *a.* සදිසවියහැකිවූ, සමානවෙන්ට හැකිවූ

Assimilate, *v. a.* සදිසවෙනාවා, සමානකරනාවා, සමානවෙනාවා

Assimilation, *s.* සදිසවීම, සමානකිරීම, සමානවීම

Assist, *v. a.* උදවුකරනාවා, උපකාරකරනාවා, පිහිටවෙනාවා

Assistance, *s.* උදවුකිරීම, උපකාරකිරීම, පිහිටවීම

Assistant, *a.* උදව්වූ, උපකාරවූ, පිහිටවූ

Assistant, *s.* උදව්කාරයන්නා, උපකාරකාරයන්නා, පිහිටවෙන්නා

Assize, *s.* විනිශ්චයදිනය, නඩුදින

Assize, *v. a.* බැගන්කරනවා

Associable, *a.* හාජනායවියහැකිවූ, සමාගන්වියහැක්වූ

Associate, *v. a.* හාජනායකරනවා, සේවනායකරනවා, සමාගන්කරනවා

Associate, *s.* හාජනායකාරයන්නා, සමාගන්කාරයා, ආශ්‍රයකාරයා

Association, *s.* රැස්වීම, සමාගම, එකතුවීම

Assonance, *s.* හඬඑන්වීම

Assonant, *a.* හඬඑකාහාවෙනවාවූ

Assort, *v. a.* බෙදනවා, බෙරැන්කරනවා

Assuage, *v. a. to mitigate, to ease,* මඳිනායකරනවා; *to appease,* පසුබටකරනවා; *to pacify,* නලවනවා; *to quiet,* නිශ්චලකරනවා; *to stop,* නවත්තනවා

Assuager, *s.* මඳිනායකාරයන්නා, නලවන්නා, පසුබටකාරයන්නා; *see the verb*

Assuasive, *a.* පසුබස්නාවූ

Assume, *v. a. to take,* ගන්නවා, *or* රැගෙණ; *the Son of God assumed human nature,* දෙවියන්වහන්සේගේ පුත්‍රයා මනුෂ්‍ය සවභාවය රැගෙණ; *to arrogate to one's self,* උඩඟුකාරගන්නවා, වඩවඩාගන්නවා; *a most assuming young man,* ඉතා උඩඟුකම්ගන්නාවූ යෞවනයෙක්; *he assumes too much to himself* ඔහු තමාටම බොහෝ වඩවඩා ගන්නාහුය

Assumer, *s.* උඩඟුකම්ගන්නා

Assuming, *a.* ආඩම්බරවූ

Assurance, *s.* සත්‍යතාවවීම, ශබ්දකම, විශ්වාසවීම, අනුමානනොවීම

Assure, *v. a.* සත්‍යතාවකෙරෙනවා, ශබ්දවකියනවා, විශ්වාසකරනවා

Assured, *a.* සත්‍යවූ, විශ්වාසවූ

Assuredly, *ad.* සත්‍යලෙස, විශ්වාසලෙස, ශබ්දලෙස

Asthma, *s.* ශ්වාසය, මූස

Asthmatic, *a.* ශ්වාසවූ

Astern, *ad.* පසුබට

Astonish, *v. a.* මවිතකරනවා, විස්මයන්කරනවා, පුදුමකරනවා; *to be astonished,* විස්මයන්වෙනවා, මවිතවෙනවා

Astonishment, *s.* විස්මයත්වීම, මවිතෙන්, පුදුමේ

Astray, *ad* මුළාලෙස; *to go astray,* මුළාවියනවා; *to lead astray;* මුළාවගන්නනවා

Astrict, *v. a.* අසුරනවා, අකුලනවා

Astriction, *s.* ඇකිලීම

Astride, *ad.* දෙපැරුණ්දපිටිනවා

Astringe, *v. a.* අසුරනවා, අකුලනවා

Astringent, *a* අසුරහනාවූ, අකුළහනාවූ

Astrologer, astrologian, *s.* ජොතිශාස්ත්‍රකාරයා

Astrological, *a.* ජොතිශාස්ත්‍රයලෙස

Astronomer, *s.* නක්ෂත්‍රශාස්ත්‍රකාරයා

Astronomy, *s.* නක්ෂත්‍රශාස්ත්‍ර

Asunder, *ad.* බෙදීම; *to put asunder;* බෙදා දමනවා

Demonstrable, a. දක්වියහැකිවූ, ඔප්පු කෙනෙහැරදක්වියහැකිවූ

Demonstrate, v. a. දක්වනවා, සැබවට ඔප්පුකරනවා, ඔප්පු කෙනෙහැරදක්වනවා

Demonstration, s. දැක්වීම, සැබවට ඔප්පුකිරීම, ඔප්පුකෙනෙහැරදැක්වීම

Demulcent, a. මොලොක්වූ

Demur, v. a. to delay, ප්‍රමාදවෙනවා, සුනාඟුවෙනවා; to

doubt, අනුමානකරනවා; *to object*, අභියෝගකරනවා, අසම්මතිසකරනවා

Demur, *s.* අනුමානය

Demure, *s.* සුචරිතවූ, අලාමකවූ, සෝභනවූ

Demurely, *ad.* සෝභනකලස

Den, *s.* ගුහාව, කුහරය, කුහරය

Deniable, *a.* වැලකියහැකිවූ, නැතිකලහැකිවූ

Denial, *s.* වැලකීම, නැතිකිරීම, නැතකීම; *see the verb*

Denier, *s.* වලක්වන්නා, සඟවන්නා, නැතිකරන්නා

Denominate, *v. a.* නම්තබනවා, නම්පටබඳිනවා

Denomination, *s.* නම්තැබීම, නම්පටබැඳීම

Denote, *v. n.* පෙන්නනවා, ලකුණුකරනවා

Denounce, *v. a.* තර්ජනයකරනවා, හැඟීගනිනවා

Denouncer, *s.* තර්ජනයකරන්නා, හැඟීගනින්නා

Dense, *a.* අහුරුවූ, ඝනවූ

Density, *s.* අහුරුකම, ඝනකම

Dental, *a.* දන්තජවූ

Denudate, *v. a.* නග්නකරනවා, නිර්වස්ත්‍රකරනවා

Denunciation, *s.* තර්ජනයකිරීම, භයගැන්වීම, හැඟීගැන්වීම

Denunciator, *s.* තර්ජනයකරන්නා, භයගන්වන්නා

Deny, *v. a. to contradict an accusation*, නැතකියනවා; *to disown*, පිළිනොගන්නවා, ප්‍රත්‍යුත්තරනොගන්නවා; *to refuse*, ප්‍රතිකියනවා

Depaint, *v. a.* සිතියම්කරනවා, රූපඅඳිනවා

Depart, *v. n.* නික්මෙනවා, නික්මයනවා, පිටත්වෙනවා

Depart, departure, *s.* නික්මීම, නික්මයෑම, පිටත්වීම

Department, *s. separate allotment*, පාංගුවය, පංගුව; *a particular business*, නිලමයක්, වැඩක්

Depend, *v. a. hang upon*, එල්ලෙනවා; *confide in*, විශ්වාසකරනවා; *for support*, උපකාරලැබෙනවා; *a law suit still depending*, තීන්දුනොවී තිබෙන නඩුව *it depends on circumstances*, ඒක කාරණාවන්ගේ යටහතේ තිබෙනවා; *to depend upon one's promise*, යමෙකුගේ පොරොන්දුවක් විශ්වාසකරනවා; *on God as the most high, all inferior causes are dependant*, සියළු සුළු කාරණාවල්ම ඉතා උසස්වූ දෙවියන්වහන්සේ වෙත එල්ලී තිබෙනවාය

Dependence, *s.* එල්ලීම, උපකාරලැබීම, විශ්වාසකිරීම; *see the verb*

Dependant, *a.* එල්ලවන්නාවූ

Dependence, depending, යටහත්වීම, එල්ලවීම, විශ්වාසකිරීම

Deperdition, *s.* අලාභය, නාස්තිය

Depict, *v. a.* සිතියම්කරනවා, රූප අඳිනවා, පෙන්වාදෙනවා

Deplorable, *a.* වැලපිවිචූ, දුක්බිකාවූ, සෝකාවූ, ලතාවූ, කනගාටුවූ

Deplore, *v. n.* විලාපකියනවා, දුක්කියනවා, සෝකවෙනවා, ලතාවෙනවා, කනගාටුවෙනවා

Depone, *v. a.* ඇපදෙනවා

Deponet, *s.* දිවුරපු සාක්ෂිකාරයා

Depopulate, *v. a.* උදකලාකරනවා, ජනයින්නාස්තිකරනවා, පාළුකරනවා

Depopulation, *s.* ජනයින් නාස්තිකිරීම, පාළුකිරීම

Deportment, *s.* ආචාරවනාවිම, යතිය, හැසිරීම

Depose, *v. a.* *to give testimony,* සාක්ෂිදෙනවා; *dethrone,* සිංහාසනයෙන් පහකරනවා, රාජ්‍යයෙන් නිදහස්කරනවා; *to take away,* පහකරනවා, ඉවත්කරනවා, ඇදදමනවා

Depositary, *s.* භාණ්ඩාගාරය, ගබඩාව

Deposite, *v. a.* ගබඩාවෙහි තබනවා

Deposition, *s.* සාක්ෂිදීම, රාජ්‍යයෙන් පහකිරීම; *see the verb*

Depository, *s.* භාණ්ඩාගාරය, ගබඩාව

Deprivation, *s.* සිරිහීම, හොඳ සින්නාරකනට ලත්වීම

Deprave, *v. a.* සිරිකෙනනවා, නීච කරනවා, නරක්කරනවා

Depravity, *s.* සිරිතුනුකම, නීච කිරීම, දුශ්ශීලිකම

Deprecate, *v. a.* බැහැපෙත්ව ඉල්වනවා, සැලවීම ඉල්වනවා

Depreciate, *v. a.* *to lower the price,* අගේ අඩුකරනවා; *to undervalue,* වටිනාකම අඩුකරනවා

Depredate, *v. a.* උදුරාගන්නවා, සොරකම්කරනවා: *to destroy,* නාශකරනවා

Depredation, *s.* උදුරාගැනීම, සොරකම්කිරීම, නාස්තිකිරීම

Depress, *v. a.* *to thrust down,* බිඳදමනවා; *to humble,* පහත්කරනවා, යටහත්කරනවා; *to deject,* සෝකකරනවා, කනගාටුකරනවා, කලකිරවනවා; *to sink,* ගිලවනවා

Depression, *s.* බිඳදැමීම, පහත්කරදැමීම, ගිලදැමීම, සෝකකිරීම; *see the verb*

Deprivation, *s.* *the act of taking away,* ඉවත්කිරීම, පහකරදැමීම, අහක්කරදැමීම, අලාභය

Depth, *s.* ගැඹුර, ජම්බුර

Depure, *v. a.* පවිත්‍රකරනවා

Deputation, *s.* උදෙසයින්කිරීම, නානාපතිකම්කාරම

Depute, *v. a.* උදෙසයින්යවනවා, නානාපතියා අරිනවා, සහායකාරයා සිටිනවා, පුතිනි

ශකාරයා අරිනාවා, දෙවිනියා අරිනාවා

Deputy, *s.* උපදේසිකායා, ප්‍රතිකා යකාරයා, දෙවනියා

Derange, *v. a.* විපරිතවාදමනාවා, අවුල්කරනාවා

Deray, *s.* කෝෂ්ටය, කෝලාහලය

Dereliction, *s.* අත්අරිම

Deride, *v. a.* අපහාසකරනාවා, නින්දාකරනාවා, සමච්චල්කරනාවා, කවටකම්කරනාවා, සරදම්කරනාවා

Derision, *s.* අපහාසකිරිම, නින්දාකිරිම, සමච්චල්කිරිම, කවටකම්කිරිම, සරදම්කිරිම

Derivation, *s.* ධාතුංශාවවිචාරම, මූලධාතුවශයෙවිම, උත්පාදය විභාගකිරිම

Derive, *v. a.* *to trace a word from it's original*, ධාතුංශාවවිචාරනාවා, මූලධාතුවශයනාවා, උත්පාදයවිභාගකරනාවා; *to communicate to another as from the origin and source*, උත්පාදවෙනාවා, උපදිනාවා; *to deduce from*, මුල්නත්යොනාහාරදකිනාවා

Derogate, *v. a.* අගෞරවකරනාවා, වටිනාකමඅඩුකරනාවා

Derogation, *s.* අගෞඅඩුකිරිම, වටිනාකම අඩුකිරිම

Derogatory, *a.* අගෞඅඩුවූ, වටිනාකමඅඩුවූ

Descant, *v. n.* දෝෂනායකරනාවා, වදරනාවා, දෙසනාකරනාවා

Descend, *v. a.* බසිනාවා, පහල්වෙනාවා

Descendant, *s.* වංශය

Descent, *s.* බැසීම, පහල්වීම; *of a family*, වංශය

Describe, *v. a.* *to point out, to mark out*, පෙන්වාදෙනාවා, දක්වනාවා; *to delineate*, සලකුණුකරනාවා, අදිනාවා; *to define a thing by the mention of it's qualities*, ප්‍රකාශකරනාවා

Description, *s.* පෙන්වාදීම, දක්වීම; *see the verb*

Descriptive, *a.* පෙන්වාදෙනාවූ, දක්වනාවූ; *see the verb*

Descry, *v. a.* ඔත්තුබලනාවා, දුරබලනාවා

Desert, *s.* ආරණ්‍යය, වනාන්තරය, කාලය

Desert, *v. a.* අත්අරිනාවා, බැහැරකරනාවා

Deserve, *s.* යෝග්‍යවීම, වටිනාකම

Deserve, *v. a.* යෝග්‍යවෙනාවා, සුදුසුවෙනාවා, සෑහුම්වෙනාවා

Desiccate, *v. c.* සුස්කකරනාවා, වියලනාවා, වේලනාවා

Design, *v. a.* *to purpose*, කල්පනාකරනාවා; *to plan*, අදිනාවා; *to project*, මන්ත්‍රනායකරනාවා

Design, *s.* කල්පනාව, ඇදීම; *bad intention*, කුමන්ත්‍රනාය, නපුරුඅදහස; *see the verb*

Designation, *s.* *pointing out*, ප්‍රසිඬකිරීම, පෙන්වාදීම, දක්වීම, ලකුණුකිරීම; *appointment*, නියෝගකිරීම, නියමකිරීම

Designate, *v. a.* ලකුණුකරනවා, නියමකරනවා, ප්‍රසිඬකරනවා, පෙන්වාදෙනවා, දක්වනවා, නියෝගකරනවා; *see the noun*

Designedly, *ad.* සිත්වූ පරිද්දෙන්, කල්පනාලෙස

Designing, *a.* ප්‍රයෝගවූ, උපාමාරුවූ, උපායවූ

Desirable, *a.* ප්‍රියවූ, සතුටුවූ, මනාපවූ

Desire, *s.* අභිලාසය, මනාපය, කැමැත්ත, ආසාව

Desire, *v. a.* *wish*, අභිලාසකරනවා, මනාපවෙනවා, කැමැතිවෙනවා, ආසාවෙනවා; *to ask, to entreat*, ඉල්වනවා

Desirous, *a.* අභිලාසවූ, ඇල්මවූ, මනාපවූ, ආසාවූ

Desist, *v. n.* නවතිනවා, වලකිනවා, හිටවනවා

Desolate, *a.* අසරණ, අනාථ, ආරණාවූ, වනාන්තවූ

Desolate, *v. a.* අසරණකරනවා, අනාථකරනවා, විනාසකරනවා

Desolately, *ad.* අසරණලෙස, අනාථලෙස, විනාසලෙස

Desolation, *s.* අසරණකිරීම, අනාථකිරීම, විනාසකිරීම

Despair, *s.* ප්‍රාර්ථනානැතිකම

Despair, *v. n.* ප්‍රාර්ථනානැතිවෙනවා, පැතීමනැතිවෙනවා

Despatch, *s.* කඩිසරකම, දූතකම, පණිවිඩය

Despatch, *v. a.* කඩිනමින් අරිනවා, පණිවිඩඅරිනවා, එවනවා; *to conclude an affair*, නිමකරනවා, නින්දුකරනවා

Desperate, *a.* *hopeless*, ප්‍රාර්ථනාවක්නැතිවූ; *rash, furious*, රළුවූ, රෞද්‍රවූ, චණ්ඩවූ, සිත්දැඩිවූ

Desperation, *s.* ප්‍රාර්ථනානැතිකම

Despicable, *a.* හෙළාදකිනාවූ, නීචවූ, ජඩවූ

Despisable, *a.* අපහාසවූ, නිග්‍රහවූ, නින්දිතවූ, නීචවූ, අගෞරවවූ

Despise, *v. a.* අපහාසකරනවා, නිග්‍රහකරනවා, නින්දාකරනවා, නීචකරනවා, අගෞරවකරනවා

Despite, *s.* ක්‍රෝධය, වෛරය, විසය, තරහව

Despiteful, *a.* ක්‍රෝධවූ, වෛරවූ, විසවූ, තරහවූ

Despitefully, *ad.* ක්‍රෝධලෙස, තරහලෙස

Despoil, *v. a.* අදත්තාදානයකරනවා, සොරකම්කරනවා

Despond, *v. n.* ප්‍රාර්ථනානැතිවෙනවා, පැතීමනැතිවෙනවා

Despondency, *s.* ප්‍රාර්ථනානැතිවෙනකම, පැතීමනැතිවෙනකම

Despot, s. අපරජ්ජුරුවො, යට ප්‍රාතන්නැති ස්වාමිය ආඥාකාරයා

Destinate, v. a. නියොගකරනවා, පත්කරනවා

Destine, v. a. නියොගකරනවා, පත්කරනවා, පවරනවා

Destiny, s. නියොගකිරීම, පත්කිරීම, පැවරීම

Destitute, a. අනාථවූ, අසරණවූ, දිළිදුවූ, නිවත්වූ

Destroy, v. a. භඟකරනවා, නාසකරනවා, [විනාසකරනවා, නැතිකරනවා

Destruction, s. භඟකිරීම, නාස්තිය, විනාසය, නැතිකිරීම

Destructive, a. භඟවූ, නාස්තිකරන්නාවූ, විනාසකරන්නාවූ, නැතිකරන්නාවූ

Desultory, desultorious, a. එකින් එකට චචලවෙන්නාවූ, ස්ථිරයක්නැතිවූ, එකඟනුවූ. මුලාවූ

Detach, v. a. කොටස්කරනවා, බෙදනවා

Detail, v. a. හරිහරියට කියනවා

Detain, v. a. *to hold in custody*, නොදීතබාගන්නවා; *to cause to delay*, ප්‍රමාදකරවනවා; *to hinder*, තහනම්කරවනවා; *to withhold*, නවත්වනවා, අල්ලවනවා

Detect, v. a. දැකගන්නවා, පෙනීගන්නවා

Detecter, s. ප්‍රසිද්ධකරන්නා, එළිකරන්නා

Detection, s. දැකගැනීම, පෙනීගැනීම, ප්‍රසිද්ධකිරීම, එළිකිරීම

Detention, s. නොදී තබාගැනීම, ප්‍රමාදකිරීම, තහනම්කිරීම

Deter, v. a. විස්මිතකරනවා, අධෛර්‍යකරනවා, බෙලහීනකරනවා, භයකරනවා

Determinable, a. තීන්දුකලහැකිවූ, නිමකලහැකිවූ

Determinate, a. නියොගකලාවූ, තීන්දුකරන්නාවූ

Determination, s. නියොගකිරීම, සන්ටුහන්කිරීම, නඩුතීන්දුකිරීම; *see the verb*

Determine, v. a. *to decree*, නියොගකරනවා; *to settle*, තීන්දුකරනවා, මුහින්චිකරනවා; *to resolve*, සන්ටුහම්කරනවා, අරමුණුකරනවා

Detest, v. a. වෛරකරනවා, නුරුස්සනවා

Detestable, a. වෛරවූ, නොරිස්සුම්වූ

Detestation, s. වෛරවීම, නොරිස්සීම

Dethrone, v. a. සිංහාසනයෙන් පහකරනවා, රාජ්‍යයෙන් නිදහස්කරනවා

Detract, v. a. *from the price*, අගය අඩුකරනවා; *from the real value*, වටිනාකම අඩුකරනවා

Detriment, s. අලාභය, විනාසය

Detrimental, a. අලාභකරනනාවූ

Detruncate, v. a. ලොප්කරනවා, අඩුකරනවා

Devastation, s. නාස්තිවීම, විනාසකිරීම, නැසිකිරීම

Develop, v. a. to explain, විස්ත්‍රකරනවා; to make clear, පැහැදිලිකරනවා; to unfold, ප්‍රසිඬකරනවා

Devest, v. a. නොවිස්ත්‍රකරනවා, නග්නකරනවා, පහකරදමනවා

Deviate, v. n. මුලාවෙනවා, ඉසැඅතඨනවා, ඉබාගාතේයනවා

Deviation, s. මුලාවීම, ඉසැඅතඨැම, ඉබාගාතේයෑම

Device, s. contrivance, උපාය, ප්‍රයෝගය; plan, සලකුනුකිරීම, ඇදීම

Devil, s. භූතයා, යක්ෂයා, යකා

Devious, a. මුලාවන්නාවූ

Devise, v. a. to invent, උපාකරනවා, උපාවකරනවා; to contrive, සිතින්යොදනවා; to consider, කල්පනාකරනවා, සිතනවා, සිතටගන්නවා; to form plans, සලකුනුකරනවා, ඇදිනවා

Devoid, a. රහිත, හිස්, උදකලා

Devolve, v. a. පැවතඑනවා, බසිනවා

Devote, v. a. නියෝගකරනවා, පත්කරනවා

Devotee, s. තපසියා, භජසියා, දහනාය

Devotion, s. පූජාකිරීම, ඇදහීම, නමස්කාරකිරීම

Devotional, a. සඬාවූ, ඇදහීම්වූ

Devour, v. a. භක්ෂනයකරනවා, ගිලිනවා, කාවිනාසකරනවා

Devout, a. දේවභක්තිවූ, සඬාවූ, ඇදහීම්වූ

Dew, s. තුෂාර, පිනි

Dew, v. n. පිනිවැටෙනවා, තෙමෙනවා

Dewlap, s. ගොන්තැලල

Dexterity, s. බුඥවකම, දක්ෂකම, කඩිසරකම, සමර්ථකම

Dexterous, a. දක්ෂවූ, සමර්ථවූ, ශ්‍රේෂ්ඨවූ, වහාග්‍රවූ, ශ්‍රාප්තවූ, කඩිසරවූ

Diabetes, s. දියවැඩියාව, මූත්‍රබින්දීම

Diadem, s. කිරුළ, කිරීටය, ඔටුන්න

Diagonal, a. කොනින්කොනට

Dial, s. අවුච්චාව

Dialect, s. දේසභාෂාව

Dialogue, s. උත්තරප්‍රත්‍යුත්තර, සමාගකථාකිරීම

Diameter, s. විතර, හරස්

Diamond, s. වජ්‍ර, වජිර, විදූර්‍ය

Diaphragm, s. බඩබයිවිය

Diarrœa, s. අතීසාර

Diary, s. නිකායකාරලිපි, සටහන්පොත

Dice, s. පසඇටේ

Dictate, v. a. ශාලකාරනවා, ආඥාකාරකියනවා

Diction, s. වාසගම, කීම

Dictionary, s. අක්ෂරාදිය

Didactical, a. didactick, අනාදෙනනාවූ

Die, v. n. මැරෙනවා, මියනවා, නැසිනවා, උතුන්වෙනවා

Die, v. a. colour, සායම්කාරනවා

Dier, s. සායම්පොවන්නා

Diet, s. *food*, ආහාර, කෑම; *regimen*, පත්‍යාහාර

Diet, v. a. ආහාරදෙනවා

Diet, v. a. පත්‍යාහාරදෙනවා

Differ, v. n. *to be distinguished from another*, විප්‍රකාරවෙනවා, වෙනස්වෙනවා; *to become at variance*, භේදවෙනවා, විරුඩවෙනවා

Difference, s. විප්‍රකාරය, වෙනස, භේදය, විරුඩය; *see the verb*

Different, a. විප්‍රකාරවූ, වෙනස්වූ

Differently, ad. විප්‍රකාරලෙස, වෙනස්ලෙස

Difficult, a. අමාරුවූ, වෙහෙසවූ, මාන්ඩිවූ, අසීරුවූ

Difficulty, s. අමාරුව, වෙහෙස, මාන්ඩිය, අසීරුව

Diffide, v. a. අවිශ්වාසකාරනවා

Diffidence, s. අවිස්වාසකම

Diffident, a. අවිස්වාසවූ, භයවූ

Difform, a. විප්‍රකාරවූ, වෙනස්වූ

Difformity, s. අරූපකම, විහිළුකම

Diffuse, v. a. උසුරවාදමනවා, විසුරුවාදමනවා, අතුරනවා

Diffusely, ad. උසුරුවනලෙස, විසුරුවනලෙස, අතුරනලෙස

Diffusion, s. උසුරුවාදැම්ම, විසිරිම, ඇතිරිම

Diffusive, a. උසුරුවාදමන්නාවූ, විසුරුවන්නාවූ, අතුරන්නාවූ

Dig, v. a. කනිනවා, කොටනවා, හාරනවා

Digest, v. a. *to concoct in the stomach*, ජීර්ණවෙනවා, පැසවනවා; *to arrange methodically*, පිළිවෙළකාරනවා

Digestion, s. ජීර්ණවීම, පැසවීම, පිළිවෙළකාරීම; *see the verb*

Digestive, a. ජීර්ණවූ, පාකවූ

Dignified, a. ජ්‍යෙෂ්ඨවූ, ශ්‍රෙෂ්ඨවූ, උතුම්වූ, නාම්බුවූ, ගරුවූ

Dignify, v. a. ජ්‍යෙෂ්ඨකම්කාරනවා, ශ්‍රෙෂ්ඨකම්කාරනවා, උතුම්කාරනවා, ගරුකම්දෙනවා, උසස්කාරනවා, නාම්බුදෙනවා

Dignity, s. ජ්‍යෙෂ්ඨකම, ශ්‍රෙෂ්ඨකම, උතුම්කම, ගරුකම, උසස්කම, නාම්බුකම

Digress, v. n. මූලාවෙනවා, අසරණවෙනවා

Digression, s. මූලාවීම, අසරණවීම

Dike, s. *a channel*, අගල; *a mound*, නියර, ඉවුර

Dilapidate, *v. a.* නාස්තිකාරනාවා, විනාසකාරනාවා

Dilapidation, *s.* විනාසකාරීම, නාස්තිකාරීම

Dilatation, *s.* දිගීසකාරීම, දික්කාරීම, විසාලවීම

Dilate, *v. a.* දිගීසකාරනාවා, දික්කාරනාවා, විසාලකාරනාවා

Dilatoriness, *s.* ප්‍රමාදකාම, අලසකාම, කාන්මැලිකාම

Dilatory, *a.* ප්‍රමාදවූ, අලසවූ, කාම්මැලිවූ

Dilemma, *s.* කාලවිකාලත්වය

Diligence, *s.* ව්‍යායාම, උත්සාහය

Diligent, *a.* ව්‍යායම්වූ, සාවධානාම්නාවකාම්න්වූ, කාඩිසරවූ

Diligently, *ad.* ව්‍යායම්ලෙස, උත්සාහලෙස, වීරියලෙස

Dilucid, *a.* දීප්තිවූ, පැහැදිලිවූ

Dilucidate, *v. a.* දීප්තිකාරනාවා, පැහැදිලිකාරනාවා

Diluent, *s.* තුනීකාරනාදය, බුරුල්කාරනාදය

Dilute, *v. a.* තුනීකාරනාවා, බුරුල්කාරනාවා

Diluter, *s.* තුනීකාරන්නා, බුරුල්කාරන්නා

Dim, *a. sight,* කාදිෂ්ටිය, ඇස්අඳුර; *not clear,* අඳුරුවූ

Dim, *v. a.* ඇස්අඳුරුකාරනාවා, කාළුවරකාරනාවා

Dimension, *s. extent, space,* විසාල, අවකාසය; *bulk, size,* කාරම, මහත

Diminish, *v. a.* මඩිනාකාරනාවා, මඩිනාවා, අඩුකාරනාවා,

Diminish, *v. n.* මැලවෙනාවා, අඩුවෙනාවා

Diminution, *s.* මඩිනාකාරීම, කායකාරීම, අඩුකාරීම

Diminutive, *s.* සූක්ෂමවූ, කුඩාවූ, සූඑවූ, අඩුවූ, පුංචිවූ

Dimish, *a.* අඳුරුවූ

Dimly, *a. not quick sighted,* දෘෂ්ටිවිලෙස, ඇස්අඳුරලෙස; *obscure,* කාළුවරවූ, අඳුරවූ

Dimple, *s.* වලයම

Din, *s.* ඝෝෂාව, ඝෝෂාසබ්දය

Din, *v. a.* ඝෝරසබ්දකාරනාවා, ඝෝෂාකාරනාවා

Dine, *v. n.* මධ්‍යාන්හභෝජනකාරනාවා, දවල්කෑමකානාවා

Ding, *v. a.* තට්ටුකාරනාවා, ගසනාවා

Dinner, *s.* මධ්‍යාන්හභෝජනය, දවල්කෑම

Dint, *s. mark caused by a blow,* පහරෙහිලකුණ; *force,* ඝාරය, බලය, සවිය

Dint, *v. a.* පහරින් ලකුණුකාරනාවා

Diocesan, *s.* පාරිදේශිකායා

Dip, *v. a.* ගිලවනාවා, හිඳවනාවා

Dipthong, *s.* විමාත්‍රය, ශුර

Diploma, *s.* සන්නාස පටබැඳිනාව

Dire, *a.* භයානාකවූ, විපත්වූ, ඝෝරවූ

Direct, *a.* කෙලින්, ඇදනැති

Direct, *v. a. aim in a direct line,* එල්ලකාරනාවා; *command,* අනාඥකාරනාවා, අනාඥදෙනාවා;

point out the way, පාරපෙන්නනවා; to inform, දන්වනවා

Direction, s. එලවාකිරීම, අනාඥාකිරීම, පාරපෙන්වීම; see the verb

Directly, ad. in a straight line, කෙලින්ලෙස; immediately, එකෙනෙහිම, ක්ෂණයෙහිම, දැන්ම,

Director, s. පාලිදක්ෂිකයා, නායකයා, ප්‍රධානියා

Direful, a. ශිතවූ, භයානකවූ

Direption, s. කොල්ලකෑමෙනීම, උදුරාගැනීම

Dirge, s. දුක්ඛගීය, ලතෝනිගීය

Dirt, s. කසල, කුනු

Dirt, v. a. මලිනකරනවා කෙලෙසනවා කිලිටුකරනවා,

Dirtiness, s. මලිනකම කිලිටුකම කෙලෙසුන්කම,

Dirty, a. මලින කෙලෙසිච්ච, කිලුටු, කැත

Dirty, v. a. කෙලෙස්නවා, කිලිටුකරනවා, අපවිත්‍රකරනවා

Diruption, s. පිපිරීම

Dis, as a privative and negative particle, is rendered into Singhalese, by such particles, as, අ, අව, නි, නිර්, නො, නැ, නැති; disobedient, අකීකරුවූ; dishonourable, අවනම්බුවූ; disentangled, නිදහස්වූ; denuded, නිර්වස්ත්‍ර; disregardful, නොසලකනවූ; disable, නොහැකිවූ; distrustful, විස්වාසනැතිවූ: to disuse, භාවිතානැතිකරනවා; it disappears, ඒක නොපෙනී යනවා

Disability, s. අපරාක්‍රම, අසමර්ථ

Disable, v. a. අසමර්ථකම්කරනවා, බලහීනකරනවා

Disaccustom, v. a. ව්‍යවහාරනැතිකරනවා

Disadvantage, s. අලාභ, අප්‍රයෝජන

Disadvantageous, a. අලාභවූ, අප්‍රයෝජනවූ

Disadventurous, a. අවාසනාවන්තවූ

Disaffect, v. a. to make disloyal, අපක්ෂවාදිකම් කරනවා; to make discontented, අප්‍රසන්නකරනවා, අමනාපකරනවා

Disaffected, a. අපක්ෂවාදිවූ, අමනාපවූ, අප්‍රසන්නවූ; see the verb

Disaffection, s. අපක්ෂවාදිකම

Disagree, v. a. to differ, එකඟනොවෙනවා; to become opposed, භේදවෙනවා, විරුද්ධවෙනවා; to be disunited in sentiment, එක්සිත්නොවෙනවා

Disagreeable, a. එකඟනොවූ, භේදවූ, විරුද්ධවූ; offensive, unpleasing, අප්‍රසන්නවූ, නුරුස්සනවූ; see the verb

Disagreeableness, s. එකඟනැතිකම, භෙදකම, විරුද්ධකම

Disagreement, s. එකඟනොවීම, භෙදවීම, විරුද්ධවීම, නොගැලපුම; see the verb

Disallow, *v. a.* ප්‍රතිෂෙධපකරනවා, පිළිනොගන්නවා, අවසරනොදෙනවා

Disallowable, *a.* ප්‍රතිෂෙධපද්දු, පිළිනොගන්නාවූ, අවසරනොදෙන්නාවූ

Disanimate, *v. a.* වීර්‍යනැතිකරනවා

Disannul, *v. a.* උල්ලංඝනයකරනවා, නිරාඥාකකරනවා, බලයනැතිකරනවා

Disappear, *v. n.* අදෘශ්‍යමානවෙනවා, අන්තර්ධානවෙනවා, නොපෙනීයනවා, නොපෙනෙනවා

Disappoint, *v. a.* නොඉෂ්ටවෙනවා, බාධාවෙනවා, සිද්ධනොවෙනවා

Disappointment, *s.* නොඉෂ්ටවීම, බාධාවීම, සිද්ධනොවීම, වැලකීම

Disapprobation, *s.* අපරාධකිරීම, අමනාපකිරීම

Disapprove, *v. a.* අමනාපවෙනවා, අප්‍රසන්නවෙනවා, පිළිනොගන්නවා

Disarm, *v. a.* ආයුධඅසනැඩවෙනවා, දුර්වලකරනවා

Disarrange, *v. a.* විසුරුවාදමනවා, අවුල්කරනවා

Disaster, *s.* සූමන්දුව, ආන්ත්‍රාව, අනතුර

Disaster, *v. a.* ආන්ත්‍රාවෙනවා, සූමන්දුවෙනවා, අනතුරුවෙනවා

Disastrous, *a.* ආන්ත්‍රාවූ, දුක්ඛිතවූ, ලතැවෙන්නාවූ

Disavouch, *v. a.* පිළිනොගන්නවා, වැදූනොගන්නවා

Disavow, *v. a.* පිළිනොගන්නවා, දුරානොගන්නවා, නැතකියනවා, ඒත්තුනොගන්නවා

Disauthorize, *v. a.* නිරාඥාකකරනවා, බලනැතිකරනවා

Disband, *v. a.* එකහාවීම නැතිකරනවා, නිදහස්කරනවා

Disbelief, *s.* අවිශ්වාසකම, විශ්වාසනොකිරීම

Disbelieve, *v. a.* අසඹාවෙනවා, අවිශ්වාසකරනවා

Disbeliever, සඹානැත්තා, අවිශ්වාසයා

Disburden, *v. a.* බරඅරදමනවා

Disburse, *v. a.* වියදම්කරනවා

Disbursement, *s.* වියදම්කිරීම

Discard, *v. a.* නිලෙඅත්අරිනවා, වැඩෙන් නිදහස්කරනවා

Discern, *v. a.* *to descry,* දකිනවා, බලනවා; *to judge,* විනිශ්චයකරනවා; *to distinguish,* බෙිරාපෙනවනවා; *to take knowledge of,* දැනගන්නවා

Discerner, *s.* දකින්නා, බලන්නා, විනිශ්චයකරන්නා, බෙිරාපෙනවාදෙන්නා, දැනගන්නා; *see the verb*

Discernment, *s.* විනිශ්චයකිරීම, දැනගැනීම; *see the verb*

Discharge, *v. a.* *to disburden,* බරඅරිනවා; *to disembark,* බඩු

බානවා; *to give vent to, or let off as a gun,* ඉවරකරනවා; *to set free from,* නිදහස්කරනවා, අයක්කරනවා, අත්අරිනවා; *to discharge a ship of her cargo,* නැවේ බඩු බානවා; *he was discharged from his office in consequence of his imprudence,* තමන්ගේ අඥානකම නිසා ඔහුගේ තනතුරෙන් නිදහස්වුණා, or වැඩෙන් අත්අැරුණා; *by discharging his gun at an improper time he wounded his friend,* නුසුදුසු ප්‍රස්තාවෙහිදී ඔහුගේ තුවක්කුව ඉවරකරබැවින් ඔහුගේ මිත්‍රයාට තුවාලවෙඩ වැදුනාය; *to discharge a debt,* ණයක් නිදහස්කරනවා; *to discharge one's duty,* යමෙකුගෙ නියමයක් නිෂ්ඨකරනවා; *to discharge a business,* වැඩක් නිදහස්කරනවා; *a river that discharges itself into the sea,* සමුද්‍රයට බැහැවෙන ගඟ වෙනවා; *to discharge one's conscience,* යමෙකුගේ හෘදසාක්ෂිය පරිද්දෙන් කරනවා

Discharge, *s.* නිදහස්කිරීම; *see the verb*

Discind, *v. a.* සිඳඅරිනවා, කැබලිකපනවා

Disciple, *s.* සිෂ්‍යයා, ගෝලයා

Discipline, *s. exercise,* හරඹය, *education,* පුහුණුකිරීම, ඉගැන්වීම; *government,* ආඥාකිරීම; *chastisement,* දඬුවම්කිරීම, අවවාදකිරීම

Discipline, *v. a.* හරඹකරනවා, පුහුණුකරනවා, උගන්වනවා; *see the noun*

Disclaim, *v. a.* පිළිනොගන්නවා, ඒත්තුනොගන්නවා

Disclose, *v. a.* තියාපලිකරනවා, එළිදරව්කරනවා, ප්‍රසිද්ධකරනවා, වැස්ම අරිනවා

Disclosure, *s.* ප්‍රසිද්ධකිරීම, පෙන්වීම, වැස්මඅැරීම

Discolour, *v. a.* අවිවර්ණකරනවා, පාටනරක්කරනවා

Discomfit, *v.* ජයගන්නවා

Discomfiture, *s.* ජයගැනීම

Discomfort, *s.* අවාසනාව

Discomfort, *v. a.* අවාසනාවෙනවා, දුක්ඛිතවෙනවා.

Discommend, *v. a.* අප්‍රසන්සාකරනවා, අගුණකියනවා

Discommode, *v. a.* අමාරුකරනවා, අපාසුකරනවා, දුස්කරවෙනවා

Discommodious, *a.* අමාරුවූ, අපාසුවූ, දුස්කරවූ

Discompose, *v. a.* චවලකරනවා, අනාවකනවා, කරච්චල්කරනවා, ලෙලෙන්කරනවා, කරදරකරනවා, කලබැගෑනිකරනවා

Discomposure, *s.* චවලය, අවුල්කිරීම, අනාවුකම

Disconcert, *v. a.* සිතචවලවෙනවා, අනාවකනවා

Disconformity, s. අසමානවීම

Disconsolate, a. ශොකසිලිපැලුනු, දුක්ඛිතවූ; ශෝකවූ

Discontent, a. නොයැපෙන්නාවූ, අමනාපවූ, අසතුටුවූ

Discontent, v. a. අසතුටුවෙනවා, අප්‍රසන්නවෙනවා; අසන්තෝසවෙනවා, අමනාපකරනවා

Discontentment, s. සතුටුනොවීම

Discontinuance, s. නොපැවැත්ම

Discontinue, v. a. නොපවත්වනවා, නවත්වනවා

Discord, s. විරුඩය, විවාදය, වාදය, භේදය, නොපෑහීම, වෙනස්වීම

Discord, v. n. විරුඩවෙනවා, වාදවෙනවා, භේදවෙනවා, නොසෑහුම්කරනවා

Discordant, a. වාදවූ; භේදවූ, වෙනස්වූ

Discordantly, ad. වාදලෙස, භේදලෙස, වෙනස්ලෙස

Discover, v. a. see, දකිනවා; inform or publish, වැස්මඅරිනවා, ප්‍රසිඩකරනවා

Discoverable, a. දකින්ඩපුළුවන්වූ

Discount, s. ගිලවුකිරීම, සෙන්දුකිරීම

Discount, v. a. ගිලවුකරනවා, සේන්දුකරනවා

Discountenance, v. a. දුම්මුඛකරනවා ලැජ්ජකරනවා

Discourage, v. a. පිලිනොගණ්නාවා; විශීමදකරනවා; හීඛලුකරනවා, භයකරනවා

Discouragement, s. විශීමදකිරීම; හීඛලුකිරීම, භයකිරීම

Discourse, s. conversation, සාකච්ඡාව, කථාකිරීම; a dissertation, දේසනාකිරීම

Discourse, v. n. සාකච්ඡාකරනවා, කථාකරනවා, දෙසනාකරනවා; see the noun.

Discourteous, a. රළුවූ; පළුවූ, රෞද්‍රවූ, ආචාරවන්තනූවූ

Discredit, s. අපහාසය, නින්දාව; අවනම්බුව, ශබුනොශෑසීම

Dscredit, v. a. සැබෑනොගන්නාවා, අපහාසකරනවා, නින්දාකරනවා

Discreet, a. ඥානවන්තවූ, උඩිතවූ, ප්‍රඥාවන්තවූ; modest, සොභනවූ, ලැජ්ජවූ

Discreetly, ad. ඥානවන්තලෙස, සෝභනලෙස; see the adj.

Discretion, s. ප්‍රඥාවන්තකම, ඥානවන්තකම; liberty, විසාරදකම, නිදහස, නිස්කලන්කය

Discretionary, විසාරදවූ, නිදහස්වූ, නිස්කලන්කවූ

Discriminate, v. a. ප්‍රභේදකරනවා, වෙන්කරනවා, වෙනසපෙන්වාදෙනවා

Discrimination, s. ප්‍රභේදකිරීම, වෙන්කිරීම, වෙනසපෙන්වාදීම

Discriminative, a. ප්‍රභේදකරන්

හාවූ, වෙන්කරන්නාවූ, වෙනසකොටබලාදැනනාවූ

Discursory, *a.* විවාදකරනනාවූ, තරහකරන්නාවූ

Discuss, *v. a.* තරහකරනවා, විභාගකරනවා

Disdain, *v. a.* අපහාසකරනවා, නින්දාකරනවා, අගෞරවකරනවා

Disdainful, *a.* අහංකාරවූ, නින්දාකරනනාවූ

Disdainfully, *ad.* අහංකාරලෙස, නින්දාලෙස

Disease, *s.* රෝගය, ලෙඩ

Disease, *v. a.* රෝගාතුරවෙනවා, ලෙඩවෙනවා, අපාසුවෙනවා

Disembark, *v. n.* ගොඩබැහීනවා, ගොඩබානවා

Disembodied, *a.* අවරූප, සරීරරහිතවූ

Disembogue, *v. a.* බැහැසනවා, පිටවෙනවා

Disenable, *v. a.* දුර්වලකරනවා, අසමර්ථකරනවා, අශක්තිකරනවා

Disencumber, *v. a.* බරින්නිදහස්කරනවා, බාධාවෙන් නිදහස්කරනවා

Disengage, *v. a.* මුදනවා, බැඳුම්කින් නිස්කලන්කකරනවා, බාධාවෙන් නිදහස්කරනවා

Disengaged, *a.* නිස්කලන්කවූ, නිවාඩුවූ, නිදහස්වූ

Disengagement, *s.* නිස්කලන්කය, නිදහස, නිවාඩුව

Disentangle, *v. a.* මුදනවා, බැඳුමකින් නිදහස්කරනවා, බාධාවකින් නිදොස්කරනවා

Disesteem, *v. a.* අගෞරවකරනවා, නොසලකනවා

Disfavour, *v. a.* ද්‍රෝහිකම්කරනවා, අනුප්‍රකාරකරනවා

Disfiguration, *s.* වෙසධාරිවීම, වෙස්පෙරලීම

Disfigure, *v. a.* අනුරූපකරනවා, විවර්ණකරනවා

Disgorge, *v. a.* වමනේකරනවා

Disgrace, *s.* අපහාසය, අපකීර්තිය, අප්‍රසිද්ධය, නිග්‍රහව, අවනම්බුව, නින්දාව

Disgrace, *v. a.* නිග්‍රහකරනවා, අපහාසකරනවා, අපකීර්තිකරනවා, නින්දාකරනවා, අප්‍රසිද්ධකරනවා, අවනම්බුකරනවා

Disgraceful, *a.* නින්දිතවූ, අපහාසවූ, අපකීර්තිවූ

Disgracefully, *ad.* නින්දිතලෙස, අපහාසලෙස, අපකීර්තිලෙස

Disguise, *v. a.* වෙසධාරිකරනවා, වෙස්පෙරලනවා

Disguise, *s.* වෙසධාරිවීම, වෙස්පෙරලීම

Disguiser, *s.* වෙසධාරිකරනනා, වෙස්පෙරලනනා

Disgust, *s.* අහය, අසතුටු, අසන්තෝෂ, නොරිස්සුම

Disgust, *v. a.* අහයකරනවා, අසතුටුකරනවා, අසන්තොසකරනවා, නොරිස්සුම්කරනවා.

Dish, *s.* තැටිය, මඩ

Dishearten, *v. a.* වියසීමදකරනවා, හිත්බුරුල්කරනවා, හයගන්වනවා

Disherit, *v. a.* උරුමයෙන් පහකරනවා

Dishevel, *v. a.* ඉසකෙස්මුදනවා

Dishonest, *a.* පාපනැතිවූ, අසෝභනවූ, අවිශ්වාසවූ, අවනම්බුවූ

Dishonestly, *ad.* පාපනැතිලෙස, අසෝභනලෙස, අවිශ්වාසලෙස, අවනම්බුලෙස

Dishonour, *s.* නිග්‍රහව, නින්දාව, අවනම්බුව

Dishonour, *v. a.* නිග්‍රහකරනවා, නින්දාකරනවා, අවනම්බුකරනවා

Dishonourable, *a.* නිග්‍රහවූ, නින්දාවූ, අවනම්බුවූ

Dishumour, *s.* ක්‍රෝධය, අවශතිය

Disinclination, *s.* අමනාපය, පිළිනොගැන්ම

Disincline, *v. a.* අප්‍රියකරනවා, අමනාපකරනවා

Disingenuous, *a.* නීචවූ, ප්‍රයෝගවූ

Disengenuously, *ad.* නීචලෙස, ප්‍රයෝගලෙස

Disinherit, *v. a.* උරුමයෙන් පහකරනවා

Discnterested, *a.* *fair, ingenious*, අභිසිරහිතවූ, ශුද්ධවූ; *not regarding private profit*, ප්‍රයෝජනනොසලකනාවූ

Disinterestedness, *s.* අභිසිරහිතකම, ප්‍රයෝජනය නොසලකනකම

Disintricate, *v. a.* මුදනවා, බැඳීමෙන්පහකරනවා

Disjoin, *v. a.* බෙදනවා, වෙන්කරනවා

Disjoint, *v. a.* සන්ධිගලවනවා

Disjunction, *s.* සන්ධිගැලවීම, බෙදීම, වෙනස්කිරීම

Disjunctive, *a.* බෙදනාවූ, වෙනස්වෙන්නාවූ

Dislike, *s.* අප්‍රියතාවය, අමනාපකම, අසන්තෝසය

Dislike, *v. a.* අප්‍රියවෙනවා, අමනාපවෙනවා, අසතුටුවෙනවා

Dislocate, *v. a.* සන්ධිගලවනවා,

Dislocation, *s.* සන්ධිගැලවීම

Dislodge, *v. a.* පිටපත්කරනවා, පහකරනවා, දුරුකරනවා

Disloyal, *a.* රාජපරාධවූ, අපක්ෂවාදීවූ, අවිශ්වාසවූ

Disloyalty, *s.* රාජපරාධකම, අපක්ෂවාදීකම, අවිශ්වාසකම

Dismal, *a.* භයානකවූ, දුක්ඛිතවූ, ශෝකාවූ, කාන්තාවූ

Dismantle, *v. a.* නිරුවස්ත්‍රකරනවා, ඇඳුම්අරිනවා

Dismay, *v. a.* භයානකකරනවා, භීතකරනවා, වියසීමදකරනවා

Dismay, *s.* භයානකකිරීම, භීතකිරීම, වියසීමදකිරීම

Dismember, *v. a.* ගාත්‍රයෙන්ගාත්‍රය බෙදනවා, කොටස්කරනවා

Dismiss, *v. a.* අත්අරිනවා, අැරදෙනවා, පහකරනවා

Dismission, *s.* අත්අැරීම, අැරදීම, පහකිරීම

Dismount, *v. a.* බහිනවා

Disobedience, *s.* අකීකරුකම

Disobedient, *a.* අකීකරුවූ

Disobey, *v. a.* අකීකරුකම්කරනවා, අකීකරුවෙනවා

Disoblige, *v. a.* අපිළිබඳවෙනවා, අසතුටුකරනවා

Disorder, *s* *confusion*, කොලාහලය, අවුල්කිරීම; *sickness*, අපාසුව, රෝගය, ලෙඩ; *discomposure of mind*, සිත චචලකිරීම

Disorder, *v. a.* අවුල්කරනවා, අපාසුකරනවා, රෝගාතුරකරනවා; *see the noun*

Disorderly, *a.* අනාචාරලෙස

Disown, *v. a.* නොකියනවා, පිළිනොගන්නවා, ඒත්තුනොගන්නවා

Disparage, *v. a.* අගෙය-අඩුකරනවා, වටිනාකම අඩුකරනවා

Disparagement, *s.* අගේඅඩුකිරීම, වටිනාකම අඩුකිරීම

Disparity, *s.* ප්‍රභේදය, අසමානය, වෙනස

Dispart, *v. a.* බෙදනවා, කොටස්කරනවා, භෙදකරනවා

Dispassionate, *a.* ශිතිල්වූ, නිශ්චලවූ, ක්ෂාන්තිවූ

Dispel, *v. a.* විසුරුවාදමනවා, පහකරනවා

Dispensation, *s.* *distribution*, දානයකිරීම *freedom from law or obligation*, නිදහස්වීම; *method of divine Providence*, දෙවියන්වහන්සේගේ ආඥකිරීම

Dispense, *v. a.* දෙනවා, බෙදාදෙනවා; *to dispense with*, තමින් නැතිවෙනවා

Disperse, *v. a.* ඉහිරියනවා, විසුරුවාදමනවා, කුණ්කාරදමනවා, ගසාළසුරුවාදමනවා

Disperser, *s.* විසුරුවාදමන්නා

Dispersion, *s.* විසුරුවාදැමීම

Dispirit, *v. a.* වියසීමදකරනවා, බදබිඳිනවා, ප්‍රාණවත්කම නැතිකරනවා

Displace, *v. a.* *to put out of office*, නිලමෙයෙන් පහකරනවා; *to put into disorder*, අවුල්කරනවා; *to put in a fresh place*, සථානයෙන් වෙනස්කරනවා

Display, *v. a.* විසුරුවාඅරිනවා, පෙන්වනවා, දක්වනවා, පතලකරනවා

Display, *s.* පෙන්වාදීම

Displease, *v. a.* අමනාපකරනවා, අප්‍රියකරනවා, අසන්තෝෂකරනවා

Displeasure, *s.* අප්‍රියව, අමනාපව, අසන්තෝසව

Displode, *v. a.* පිපිරෙනවා

Disposal, *s.* පිළිවෙළකිරීම, මනාපවීම, දියහැකිවීම; *see the verb*

Dispose, *v. a.* දෙනවා, සූදානම්කරනවා, මනාපකරනවා, නියමකරනවා, විකුණනවා; *see the following examples*; *to dispose of alms*, දානයදෙනවා; *a mind*

disposed to think, හිතුවක්කාල් පන්නාව සුදුසුව තිබෙනවා; *he was disposed to go abroad,* ඔහු පිටකාඩ මනාපවුණා; *the affair was properly disposed,* ඒ කාරණාව හරියට නියමකලා; *we have disposed of all our goods,* අපේ සියලු ද්‍රව්‍යයම විකුණ්නා

Disposition, *s. of the mind,* ස්වභාවය, ගතිය, තත්වය; *order,* ප්‍රකාරය

Dispossess, *v. a.* පහකරදමනවා, අහකදමනවා, පිටපත්කරදමනවා, උරුමයෙන් ඉවත්කරනවා

Disposure, *s.* ආණ්ඩුකිරීම, නියමකිරීම, මනාපවීම

Dispraise, *s.* අපකීර්තිකිරීම, අප්‍රසන්සාකිරීම

Dispraise, *v. a.* අපරාධකරනවා, අපකීර්තිකරනවා, අප්‍රසන්සාකරනවා

Dispread, *v. a.* විසුරුවාදමනවා, විහිදුවාඅරිනවා

Disproof, *s.* අවසාක්ෂිදීම

Disproportion, *s.* අසමකම, අසමානකම, ඒකාකාරනැතිකම

Disproportion, *v. a.* අසමානකරනවා, ඒකාකාරනැතිකරනවා, එකමතුනැතිකරනවා

Disproportionably, *ad.* අසමානත්වයලෙස, ඒකාකාරනැතිලෙස

Disproportional, *a.* අසමානවූ, ඒකාකාරනැත්තාවූ

Disproportionally, *ad.* අසමානත්වය පරිද්දෙන්, ඒකාකාරනැතිලෙස, එකමතුනැතිලෙස

Disproportionate, *a.* අසමානවූ

Disproportionately, *ad.* අසමානත්වයලෙස

Disproportionateness, *s.* ඒකාකාරනැත්තකම, එකමතුනැතිකම

Disprove, *v. a.* උදිරිව ඔප්පුකරනවා, අවසාක්ෂිදෙනවා

Disprover, *s.* අවසාක්ෂිදෙන්නා, උදිරිව ඔප්පුකරන්නා

Disputable, *a.* විවාදකලහැකිවූ, තරහකලහැකිවූ

Disputant, *s.* විවාදකරන්නා, තරහකථාකරන්නා

Disputation, *s.* විවාදකථාව, තරහකථාව

Disputative, *a.* විවාදකථාකරන්නාවූ, තරහකථාකරන්නාවූ

Dispute, *v. n.* විරුද්ධකථාකරනවා, විවාදකරනවා, තරහකථාකරනවා, අබරාකරනවා

Dispute, *s.* විරුද්ධය, තරහය, විවාදය

Disputer, *s.* විවාදකථාකරන්නා, තරහකථාකරන්නා

Disqualification, *s.* අසමර්ථභාවය

Disqualify, *v. a. to disable,* අසමර්ථකරනවා, බලනැතිකරනවා; *to make unfit,* නොසුදුසුකරනවා, අයෝග්‍යකරනවා

Disquiet, *s.* චංචලවීම, කාංසාව, වෙහෙස; *see the verb*

Disquiet, *v. a. to disturb*, චචලකරනවා; *to vex*, කාන්සාකරනවා; *to fret*, වෙහෙසකරනවා

Disquietly, *ad.* චචලලෙස, කාන්සාලෙස, වෙහෙසලෙස

Disquietness, *s.* චචලකම, නොසනසුම ; *see the verb*

Disquietude, *s.* චචලවීම, කාන්සාවීම, වෙහෙසවීම

Disquisition, *s.* සාකච්ඡාව, විභාග කථාව

Disregard, *s.* නොසලකිල්ල, ගරුසරුනොකිරිල්ල

Disregard, *v. a.* නොසලකනවා, ගරුසරුනොකරනවා, සැක නොකරනවා, කම්කට නොගන්නවා

Disregardful, *a.* නොසලකනනා වූ, ගරුසරුනොකරන්නා වූ

Disregardfully, *ad.* නොසලකන්නාවූලෙස, ගරුසරුනොකරන්නාවූලෙස

Disrelish, *s.* අරුචිය, රසනැතිකම, නොරිස්සුම

Disrelish, *v. a.* අරුචිකරනවා, රසනැතිකරනවා, නුරුස්සනවා

Disreputation, *s.* අවනම්බුකම, නින්දාගතිකම

Disrepute, *s.* නින්දාගතිය, අවනම්බුගතිය

Disrespect, *s.* නින්දිතය, නින්දාව, අවනම්බුව

Disrespectful, *a.* නින්දිතවූ, අවනම්බුවූ

Disrespectfully, *ad.* නින්දාලෙස, අවනම්බුලෙස

Disrobe, *v. a.* නග්නකරනවා, නිරුවත්කරනවා

Disruption, *s.* ඇලීම, පිපිරීම

Dissatisfaction, *s.* අමනාපය, නොසෑහීම, නොඇදීම

Dissatisfactory, *a.* අමනාපවූ, නොසෑහුම්වූ, නොඇදෙන්නාවූ

Dissatisfy, *v. a.* අමනාපවෙනවා, නොසෑහෙනවා, නොඇදෙනවා

Dissect, *v. a.* කොටස්කරනවා, බෙදනවා

Dissection, *s.* කොටස්කිරීම, බෙදීම

Dissemble, *v. a.* කපටිකම්කරනවා, කුහකකම්කරනවා, වංචාකරනවා, ප්‍රයෝගකරනවා, රැවටිලිකරනවා

Dissembler, *s.* කපටිකම්කරන්නා, කුහකකම්කරන්නා, වංචාකරන්නා, ප්‍රයෝගකරන්නා

Dissemblingly, *ad.* කපටිකම්කරනලෙස

Disseminate, *v. a.* විසුරදමනවා, විසුරුවාදමනවා, උසුරුවාදමනවා

Dissemination, *s.* වැපිරීම, විසිරීම, ඉසිරීම

Disseminator, *s.* විසුරකනා, විසුරුවන්නා, උසුරන්නා

Dissent, *v. n.* භේදවෙනවා, විරෝධවෙනවා, එකඟනොවෙනවා

වෙනවා, එක්සිත්නොවෙනවා

Dissent, *s.* භේදවීම, විරොධවීම, එකඟනොවීම, එක්සිත්නොවීම

Dissenter, *s.* භේදවෙනනා, විරොධවෙනනා, එකඟනොවෙන්නා

Dissention, *s.* භේදවීම, විරොධවීම, එකඟනොවීම

Dissentious, *a.* භේදවූ, විරොධවූ, එකඟනොවෙනනාවූ

Dissertation, *s.* බණ, දේසනාදි, කථාව

Dissever, *v. a.* බෙදනවා, දෙකට කපනවා

Dissidence, *s.* භේදකිරීම, එකඟනොවීම, එක්සිත්නොවීම

Dissimilar, *a.* අසමවූ, අසමානවූ, භේදවූ

Dissimilarity, *s.* භේදවීම, අසමානවීම

Dissimulation, *s.* කපටිකම, කුහකකම, වංචාව, ප්‍රයෝගය

Dissipate, *v. a.* විසුරුවාදමනවා, උසුරුවාදමනවා, වස්තුවවිසුරුවාදමනවා

Dissipation, *s.* විසුරුවාදැමීම, උසුරුවාදැමීම, වස්තුවවිසුරුවාදැමීම

Dissolvable, *a.* ක්ෂයවියහැකිවූ, දියවියහැකිවූ, මැකෙන්නාවූ, විනාසවෙන්නාවූ

Dissoluble, *a.* ක්ෂයවියහැකිවූ, දියවියහැකිවූ, විනාසවෙනනාවූ; *see the verb*

Dissolve, *v. a.* *to wear away*, ක්ෂය කරනවා; *to melt*, දියකරනවා, මකනවා; *to destroy*, විනාසකරනවා

Dissolve, *v. n.* දියවෙනවා, මැකෙනවා

Dissolvent, *s.* දියකරන්නා

Dissolvent, *a.* දියවෙන්නාවූ

Dissolvible, *a.* ක්ෂයවෙන්නාවූ, විනාසවෙන්නාවූ

Dissolute, *s.* කාමචාරවූ

Dissolutely, *a.* කාමචාරලෙස

Dissoluteness, *s.* කාමචාරකම

Dissolution, *s.* *the act of wearing away*, ක්ෂයකිරීම; *the act of liquifying*, දියකිරීම, මැකීම; *destruction*, නාස්තිකිරීම, විනාසකිරීම

Dissonance, *s.* විරොධශබ්දකිරීම, අසමානකම

Dissonant, *a.* විරොධ, අසමානවූ

Dissuade, *v. a.* අත්වසනවා, නවතිනවා, වලක්වනවා

Dissuader, *s.* අත්වසනනා

Dissuasive, *a.* අත්වසනනාවූ, නවත්වන්නාවූ

Dissyllable, *s.* දෙපදවචනය

Distain, *v. a.* පොවනවා

Distance, *s.* දුර, එපිට, ඈත, බැහැර

Distance, *v. a.* දුරකරනවා, එපිටහරනවා

Distant, *a.* දුරවූ, එපිටවූ

Distaste, *s.* අරුචිය, අප්‍රිය, නොරිස්සුම

Distaste, *v. a.* අරුචිකරන්වා, අප්‍රියකරනවා, කුරුසනවා

Distasteful, *a.* අරුචිවූ, අප්‍රියවූ

Distemper, *s. sickness,* රෝගය, ලෙඩ; *depravity,* නපුරුකම

Distemper, *v. a.* රෝගකරනවා, ලෙඩකරනවා, නපුරුකරනවා; *see the noun*

Distend, *v. a.* විසාලකරනවා, පලල්කරනවා, දිගකරනවා

Distent, *s.* විසාලය

Distention, *s.* විසාලය, පලල්කිරීම, දිගඇරීම

Distich, *s.* දෙපදකාව්‍යක්

Distil, *v. n.* පෙරනවා, වාස්සනවා

Distillation, *s.* පෙරීම, වැස්සීම

Distiller, *s.* පෙරන්නා, වාස්සවන්නා

Distinct, *a.* වෙනස්වූ; *clear,* පැහැදිලිවූ, බිරුන්වූ

Distinction, *s.* වෙනස්කිරීම, භේදබව; *honor, superiority,* උතුම්කම, නම්බුකම, උසස්කම

Distinctive, *a.* බිරුන්කරන්නාවූ

Distinctly, *ad.* වෙනස්ලෙස, පැහැදිලිලෙස

Distinctness, *s.* භේදකම, වෙනස්කම, පැහැදිලිකම

Distinguish, *a.* භේදදක්වනවා, වෙනසදකිනවා; බිරුන්කරනවා; *to honour,* උතුම්කරනවා, උසස්කරනවා, නම්බුදෙනවා; *to judge,* වෙනස්පෙන්වනවා

Distinguishable, *a.* භේදවියහැකිවූ, නම්බුදියසුදුසුවූ

Distinguished, *a.* ශ්‍රේෂ්ඨවූ, උතුම්වූ, නම්බුවූ

Distinguisher, *s.* භේදදක්වන්නා, වෙනසපෙන්වන්නා, වෙනසදක්වන්නා

Distinguishingly, *ad.* භේදකරන්නාවූලෙස

Distinguishment, *s.* භේදදැක්වීම

Distort, *v. a.* වක්‍රකරනවා, වන්කකරනවා, විපරීතකරනවා

Distract, *v. a.* වියවුල්කරනවා, කරදරකරනවා

Distractedly, *ad.* වියවුල්කරනලෙස, කරදරකරනලෙස

Distraction, *s.* වියවුල්කිරීම, කරදරකිරීම

Distrain, *v. a.* අල්වනවා, යමෙකුගෙ බඩු හෙහෙනුම්කරනවා

Distress, *s.* විපත්තිය, දුක්ඛය, සෝකය, අවාසනාව

Distress, *v. a.* විපත්තිකරනවා, දුක්කරනවා, සෝකකරනවා

Distressful, *a.* විපත්තිවූ, දුක්ඛිතවූ, සෝකවූ, කාන්සාවූ

Distribute, *v. a.* කොටස්කරනවා, බෙදනවා, භාගකරනවා

Distribution, *s.* කොටස්කිරීම, බෙදීම, භාගකිරීම

Distributive, *a.* කොටස්කරදෙන්නාවූ

Distributively, *ad.* කොටස්කරදෙන්නාවූලෙස

District, s. කොටමුනේ, පත්තුව, දිසාව, කෝරළේ

Distrust, v. a. අවිශ්වාසකරනවා

Distrust, s. අවිශ්වාසය

Distrustful, a. අවිශ්වාසවූ

Distrustfully, ad. අවිශ්වාසලෙස

Disturb, v. a. වවුලකරනවා, කරදරකරනවා, විස්සෝපකරනවා, පෙළනවා, වෙහෙසනවා

Disturbance, s. කොලාහලය; දබරය, ඝෝෂාව

Disturber, s. a causer of tumults, දබරකාරයා; he that perturbates the mind, සිත්වවුලකරන්නා

Disvaluation, s. අගයඅඩුකිරීම

Disvalue, v. a. අගයඅඩුකරනවා,

Disunion, s. disjunction, සම්බන්ධනොවීම, ප්‍රභේදවීම, භේදවීම, එකඟනොවීම; breach of concord, වෙනස්වීම, වෙන්වීම, එදිරිවීම

Disunite, v. a. භේදකරනවා, වෙනස්කරනවා, වෙන්කරනවා, එකඟනැතිකරනවා; see the noun

Disuse, s. භාවිතානැතිවීම, ව්‍යවහාරනැතිවීම, පුරුදුනැතිවීම, සිරිත්නැතිවීම

Disuse, v. a. භාවිතානැතිකරනවා, ව්‍යවහාරනැතිකරනවා, සිරිත්නැතිකරනවා, පුරුදුනැතිකරනවා

Disvouch, v. a. අවසාක්ෂිදෙනවා

Ditch, s. අගල

Ditch, v. a. අගලකපනවා

Ditto, s. පෙරකියාලම

Divaricate, v. a. කොටස්කරනවා, බෙදනවා

Dive, v. a. කිමිදෙනවා; examine with attention, විභාගකරනවා

Diver, s. කිමිදෙන්නා, විභාගකරන්නා; see the verb

Diverge, v. n. විහිදෙනවා

Divers, a. නානාප්‍රකාර, නොයෙක්

Diverse, a. ප්‍රභේදවූ, වෙනස්වූ

Diversify, v. a. ප්‍රභේදකරනවා, වෙනස්කරනවා, නානාප්‍රකාරකරනවා, නොයෙක්කරනවා

Diversity, s. නානාප්‍රකාරකිරීම, ප්‍රභේදකිරීම; see the verb

Diversly, ad. නානාප්‍රකාරලෙස, ප්‍රභේදලෙස

Divert, v. a. to draw off in another direction, අදිනවා; to amuse, සෙල්ලන්කරනවා, කෙළිනවා, ශනාසිල්කරනවා, සනසනවා

Divertise, v. a. සෙල්ලන්කරනවා

Divertive, a. සෙල්ලන්වූ

Divest, v. a. නග්නකරනවා, නිර්වස්ත්‍රකරනවා, නිලෙන්අහකදමනවා

Divesture, s. නග්නකිරීම, නිර්වස්ත්‍රකිරීම

Dividable, a. කොටස්කලහැකිවූ

Divide, v. a. to give out as in shares,

සහභාගිකෙදනවා, කොටස්කරදෙනවා; *to separate*, වෙන්කරනවා, බෙදනවා; *to disunite*, භේදකරනවා, එකඟනැතිකරනවා, භෙදකරනවා

Divide, *v. n.* සම්බන්ධනැතිවෙනවා, බෙදෙනවා

Dividend, *s.* කොටස, පංගුව

Divider, *s.* කොටස්කරන්නා, බෙදන්නා; *see the verb*

Divination, *s.* අනාගතවාක්‍යකීම, සාස්ත්‍රපිසාචවිධානය

Divine, *a.* දේවභක්තිවූ

Divine, *s.* දේවභක්තිවනායකයා

Divine, *v. n.* අනාගතවාක්‍යකියනවා; *to guess, to utter predictions*, අනුමානකොට කියනවා.

Divinely, *ad.* දේවභක්තිලෙස

Diviner, *s.* සාස්ත්‍රපිසාචයා

Divinity, *s. participating of the divine nature*, දේවභක්තිකම; *the science of divine things*, දේවභක්තිකමෙහි ශාස්ත්‍රය

Divisible, *a.* කොටස්කලහැකිවූ, භෙදකලහැකිවූ

Divisibility, *s.* භෙදගතිවීම

Division, *s.* කොටස්කිරීම, වෙනස්කිරීම, බෙදීම, සහභාගීකම, පංගුව; *see the verb*

Divisor, *s.* බෙදන්නා

Divorce, *s.* වෙන, විරහවීම, වියෝගවීම

Divorce, *v. a. to separate man and wife*, විරහවෙනවා, වියෝගකරනවා; *to force away* හැරපාඅරිනවා, අයින්වෙනවා, වෙන්කරනවා

Divorcement, *s.* විරහකිරීම, වියෝගකිරීම

Divorcer, *s.* විරහකරන්නා, වියෝගකරන්නා

Diurnal, *a.* දවස්වූ, දවස්පතා

Diurnally, *ad.* දවස්පතාලෙස

Divulge, *v. a.* ප්‍රසිද්ධකරනවා, ප්‍රකාසකරනවා, එළිදරව්කරනවා

Divulger, *s.* ප්‍රසිද්ධකරනනා, ප්‍රකාසකරන්නා, එළිදරව්කරන්නා

Dizziness, *s.* කෝන්තුකම

Dizzy, *a.* කෝන්තුවූ

Dizzy, *v. a.* කෝන්තුකරනවා

Do, *v. a.* කරඩි, කරන්ට; *but when used in the formation of verbs it is commonly written*, කරනවා *or* ක්‍රියාකරනවා; *it will require a few examples to shew how this word is variously rendered into Singhalese; to do a thing well*, යමක් යහපත් කොට කරනවා; *every man is bound to do his best*, සියළුම මනුෂ්‍යයින්ම ඔවුන්ගේ වඩාය හපත කරඩ බැඳීඉන්නේය; *I do it*, මම ඒක කරනවා; *I did it*, මම ඒක කළා, *he will do it*, ඔහු ඒක කරාවි *or* ඔහු ඒක කරනවාඇති; *we can do*

it, අපට ඒක කලහැකියි; *you must do it,* තමුසෙ ඒක කරන්ඩ ඕනෑ; *if they do it,* ඔවුන් ඒක කලොත්; *I have something to do with him,* මට ඌත් සමග යම් දෙයක් කරඩ තිබෙනාවා; *what have you to do with it,* එයින් තමුසෙට කරඩ තිබෙන්නේ මොකද; *I have done with him,* මම ඔහු සමග අන්තිමකලා; *I have done with it,* මම එයින් අන්තිමකලා; *how do you do?* තමුසෙගෙ සනීප කොහොමද; *this will not do,* මේක හරිනෑත; *I shall come, but if I do not,* මම එන්ට හොයි එසේනමුත්; *may he do well,* ඔහු හොඳකෙරෙත්වා; *help me do, when addressed to a superior,* මට උපකාරව වදල මැනව, *or* මට උපකාරවෙන වාහොද; *to an equal,* මට උපකාරවෙව; *or* මට උපකාර කරඩ ඕනෑ; *to an inferior,* මට උපකාරකරපන්; *do make haste,* ඉක්මන්කරවා; *I had much to do to pacify him,* ඌව සමාදානකරනාපිනිස මට බොහොම උත්සහය තිබු නෑ; *I do love him,* මම ඔහුට සෙනෙහවෙනවා

Docible, *a.* සුබුඩිවූ, උගනන්නට පහසුවූ

Docibleness, *s.* සුබුඩිකම

Docile, *a.* සුබුඩිවූ, උගන්වඩ පුළුවන්වූ

Docility, *s.* සුබුඩිය, උගන්වඩ පහසුකම

Dock, *s.* නැවුකාදනාසටිනාත්

Dock, *v. a.* කොටකරනාවා, අඩු කරනාවා

Doctor, *s.* වෛද්‍යාචාරියා, වෙද

Doctor, *v. a.* සුවකරනාවා

Doctrinal, *a.* ශාස්ත්‍රවූ, සිල්පවූ, ශාස්ත්‍රයට අයිතිවූ

Doctrine, *s.* ශාස්ත්‍රය, සිල්පය, ඉගැන්වීම

Document, *s.* දැන්වීම, ඔප්පුව

Dodge, *v. a.* රවටිලිකරනාවා

Doe, *s.* මුගදෙන්නුව, මුවදෙන

Doer, *s.* කරන්නා

Does, *v. a.* කරනාවා

Dog, *s.* සුනඛයා, බල්ලා

Dog-teeth, *s.* දළදත

Dogfish, *s.* මෝරා

Dogma, *s.* තීන්දුවූකල්පනාව

Dogmatist, *s.* අහංකාරවූ ආචාර්යයෙක්

Dogmatize, *v. n.* සහසකොට කියනාවා, ඒකානතකොට කියනාවා

Doings, *s.* ක්‍රියාවන්, චරිතවල්

Dole, *s. the act of dealing out,* දනාදීම; *sorrow,* ශෝකය, කණගාටුව

Dole, *v. a.* දනයදෙනාවා

Doleful, *a.* දුක්ඛිතවූ, ශෝකවූ, කාන්සාවූ

Dolefully, *ad.* දුක්ඛිතලෙස, ශෝකලෙස, කාන්සාලෙස

Dolefulness, *s.* දුක්ඛිතකම, ශෝකකම, කාන්සාකම

Dolesome, *a.* දුක්සිතවූ, සෝකවූ, කාන්තාවූ

Dolourous, *a.* සෝකවූ, කාන්තාවූ

Dolour, *s.* සෝකය, කාන්තාව

Dolt, *s.* බාලයා, අඥානයා

Doltish, *a.* බාලවූ, අඥානවූ

Domain, *s.* රාජසන්තකස්ථානය

Dome, *s.* ඇගුංව

Domestick, *a.* ගෘහොපකාරනවූ, ගෘහයට අයිතිවූ, ගෙදරටඅඩුන්තුවූ

Domesticate, *v. a. to tame,* හීලෑකරනවා; *to accustom to any thing,* පුරුදුකරනවා, හොඳර පුරුදුකරනවා

Dominant, *a.* අඥාසනාකරන්නාවූ

Dominate, *v. a.* අඥාසනාකරනවා, ඇඬුකරනවා

Domineer, *v. n.* අහංකාරයෙන් අඥාසනාකරනවා, උඩඟුයෙන් අඬුකරනවා

Dominion, *s. sovereign authority,* ආධිපත්‍යය, පරාක්‍රමය; *territory, country,* රාජ්‍යය, දෙසය

Donation, *s.* දානයදීම, තෑග්ගදීම

Done, *pret.* කළ, කළා, කරපු

Donor, *s.* දානයදෙන්නා; තෑගිදෙන්නා

Doom, *v. a. to eppoint to punishment,* දඬුවමට පමුණනවා, අවවූවටපත්කරනවා; *to destine,* නියෝගකරනවා

Doom, *s.* පත්කිරීම, නියෝගකිරීම

Doomsday, *s.* නඩුතීන්දුදවස

Door, *s.* වාසෙල්, දොර; *within door,* වාරඹ්‍යන්තරයෙහි; *out of doors,* දොරින්පිටත

Doorcase, *s.* උළුවස්ස

Doorkeeper, *s.* දොරටුපාලයා

Dormant, *a.* නිදි, නිදනාකාර, ගහාවූ

Dormouse, *s* බටුමීයා

Dose, *s.* කොටස, පඟුව

Dot, *s.* බින්දුව, තිත

Dot, *v. a.* බින්දුගහනවා, තිත්ගහනවා

Dotage, *s.* වෘඩවියරුව, ලාමකභාවය

Dote, *v. n.* ලාමකවෙනවා, ආදරෙකරනවා

Doter, *s.* ලාමකවෙන්නා, ආදරෙකරන්නා

Double, *a.* යුග්ම, යුග, ඉරට්ට, දෙක; *double edged,* දෙමුවාත; *double dealer,* රැවටිලිකාරයා, දෙආකාරයට කියන්නා; *double minded,* දෙහිත්වූ; *double tongued,* දෙදිව

Double, *v. a. to add one to another in the same order or quentity,* එගුණකරනවා, යුවලකරනවා, යුගලකරනවා, යුග්මකරනවා; *to make twice the quantity,* දෙවරක්වැඩිකරනවා; *to fold,* නමනවා

Doubly, *ad.* දෙබිඩ, දෙබඩ

Doubt, *v. a.* අනුමානකරනවා, සැකකරනවා

Doubt, *v. n.* අනුමානවෙනවා, සැකවෙනවා

Doubter, *s.* අනුමානකරන්නා, සැකකරන්නා

Doubtful, *a.* අනුමානවූ, අවිස්වාසවූ, සැකවූ

Doubtfully, *ad.* අනුමානලෙස, අවිස්වාසලෙස, සැකලෙස

Doubtfulness, *s.* අනුමානකම, අවිස්වාසකම, සැකකම

Doubtingly, *ad.* අනුමානලෙස, අවිස්වාසලෙස, සැකලෙස,

Doubtless, *a.* අනුමානනැති

Dove, *s.* පරවියා, පරෙයියා; *wild pigeon,* කොබෙයි, කොබෙය්යා

Dove cot, *s.* පරවිකූඩුව

Dough, *s.* අනාපුපිට

Douse, *v a.* අවගාහනයකරනවා, දියෙහිගිලනවා

Dower, dowery, *s.* දායාදය, භාර්යාවගේ දැවැද්ද

Down, *s. any soft wool or hair,* සුඹුළු, රෝම, ලොම; *the soft feathers of birds,* පුබ්බරපියාපු

Down, *ad.* පාත, පහත, පහල; *down the river,* ගඟ පහල; *to lie down,* හාන්සිවෙනවා; *to sit down,* ඉඳගන්නවා, වාඩිවෙනවා; *downcast, ashamed,* ලැජ්ජවූ; *sorrowful,* කාන්සාවූ, දුක්ඛිතවූ

Down, *interj.* එලාපන්; *as down with that wall,* ඒ තාප්පේ හෙලාපන් *or* ඒ බිත්තිය බිඳපන්

Downfal, *s.* වැටීම, නාස්තිවීම, විනාසවීම

Downfallen, *imp. v.* නාස්තිවූනා, විනාසවූනා

Down hill, *s.* කන්දෙ බෑවුම

Downlooked, *a.* යටතුරුබැල්මවූ

Downright, *a.* ප්‍රසිද්ධවූ, හරිවූ

Downward, *a.* පහත්දිසාවට

Downy, *a.* සුඹුළු, පුබ්බරවූ; *see the noun*

Dowry, *s.* දායාද, දැවැද්ද

Doxology, *s.* ස්තුතිගීය

Doze, *v a.* නින්දවැටෙනවා

Dozen, *s.* දොලොස

Dozy, *a.* නිදිමතවූ

Drag, *v. n.* අදිනවා

Drag, *s.* කොක්ක

Draggle, *v. a.* බිමඅදලා කිළුටුකරනවා

Dragon, *s.* සර්පයක්; *a northern constellation of stars,* භුජංගය

Dragoon, *s.* අස්වපේවකයා

Drain, *v. a.* අඳුවනවා

Drain, *s.* අගල, ඇල

Drake, *s.* තාරාවා; *Portuguese*

Dram, *s. a weight,* කලඳ; *a small quantity of spirits,* සෝප්පිය; *Portuguese*

Drama, *s.* ක්‍රීඩාවක්

Draper, *s.* වස්ත්‍රවෙලෙන්ද

Draught, *s. quantity of liquor,* බීම; *dragging,* අදින්න; *picture,* සිතියම; *drain,* අගල; *bill of payment,* මුදල්පත්‍රය

Draw, v. a. අදිනවා; to draw water, පැන්අදිනවා; or දියර ගන්නවා; to draw air, හුස්ම අදිනවා; to draw a sword, කඩුවක්අදිනවා; to draw blood, ලේඅඳුවනවා; to draw wine, මුද්‍රිකපානය වාස්සනවා; to draw lots, පස්ඇටදමනවා; to draw a bill of exchange, මිලමාරු කාරැඹ පත්‍රයක්ලියනවා; to draw up a writing, ලිවුමක් ලියනවා; to draw off, ඇදදමනවා; to draw over, අගක අදිනවා; to draw out, පිටතට අදිනවා; to draw a line, ඉරක් අදිනවා; to draw up an army, යුධසේනාව එක්කාසු කරනවා; to draw near, සමීපයට එළඹෙනවා; to draw to a head, අන්තිමයකටවෙනවා; to draw to an issue, කෙළවරකට වෙනවා; to draw a circle, චක්‍රයක් අදිනවා; to draw to an end, නිම්මාවකට එනවා

Drawbridge, s. උඩඅදිනපාලම

Drawing, s. සිතියම්කිරීම

Draw-well, s. දියඅදිනළිඳ

Drawl, v. n. ඇදලාකියනවා, ලගලගාකියනවා

Dread, s. භීතවීම, භයානකවීම

Dread, v. n. භීතවෙනවා, භයින් සිටිනවා, භයවෙනවා

Dreader, s. භීතවෙන්නා, භයානකවෙන්නා

Dreadful, a. භීතවූ, භයානකවූ

Dreadfully, ad. භීතලෙස, භයානකලෙස

Dreadless, a. නිර්භීත, බයනැති

Dream, s. ස්වප්නය, සීනය, සිහිනය

Dream, v. n. ස්වප්නදකිනවා, සිහිනදකිනවා

Dreamer, s. ස්වප්නදකින්නා, සිහිනදකින්නා

Drear, a. කාන්තාර, කකර

Dreary, a. as a place, කාන්තාර වූ, කකරවූ; dismal, කාලකන්නිවූ, සෝකාතුරවූ

Dreggish, a. බොරවූ, මඩවූ

Dregs, s බොර, මඩ, මණ්ඩි

Drein, v. n. see drain

Drench, v. a. පොඟනවා

Dress, v. a. පලඳිනවා, අඳිනවා; as a wound, ආලේපකරනවා, ගානවා; as victuals, පිසනවා

Dress, s. පැලඳීම, ඇඳීම

Dresser, s. පලඳවන්නා, අඳවන්නා

Dressing, part. ආලේප කරමින්, පිසමින්; see the verb

Dribble, v. n. බින්දුවෙහෙනවා, තිත්වෙහෙනවා

Drier, s. වියළිකරන්නා

Drift, s. impulse, වේගය; force, ශෝරය, බලය; design of, tendency of, අදහස, අභිප්‍රාව; a heap, ගොඩ

Drift, v. a. වේගයකරනවා, එලවනවා; see the noun.

Drill, v. a. සිදුරුකරනවා, හිල්කරනවා
Drill, s. බුරුමේ
Drink, v. n. පානයකරනවා, බොනවා
Drink, s. පානයකිරීම, බීම
Drinkable, a. පානයකලහැකිවූ
Drip, v. n. බින්දුවැටෙනවා, පොදවැටෙනවා
Drive, v. a. පන්නනවා, දක්කනවා; to drive a nail, ඇණගහනවා; to drive to despair, දුක්ඛිනාවක් නැතිලෙස පන්නනවා; to drive into the ground, පොළොවෙහි හිටවනවා
Drive-on, v. a. පන්නනවා
Drivel, v. n. කෙලවැගිරෙනවා
Driveller, s. මුකිඩයා, මෝඩයා
Driven, pret. පැන්නුවා, දක්කුවා
Driver, s. පන්නනනා, දක්කන්නා
Droll, s. කවටයා, සමච්චල්කාරයා
Droll, v. a. කවටකම්කරනවා, සමච්චල්කරනවා
Drollery, s. කවටකම, සමච්චලය
Dromedary, s. වේගගාමීඔටුවෙක්
Drone, s. අලසයා, කම්මැලියා
Drone, v. n. අලසආකාරහිටිනවා, කම්මැලිකම්වෙනවා
Dronish, a. අලසාකාරවූ, කම්මැලිවූ
Droop, v. n. දුර්වලවෙනවා, කලානතවෙනවා, වුසක්කක්ඩුවෙනවා
Drop, s. පොද, බින්දුව
Drop, v. n. to fall in drops, වෑහෙනවා, පොදවැටෙනවා, බින්දුවැටෙනවා; to cease, නවතිනවා
Dropping, part. පොදබින්දුවැටෙමින්
Dropsical, a. ජලෝදරවූ, දියළදරවූ
Dropsy, s. ජලෝදරය, දියළදරය
Dross, s. of metals, බොරය; of sugar, oil, කුණු; refuse of corn, බොල්
Drossy, a. බොරවූ, කුණුවූ, බොල්වූ; see the noun
Drove, s. සමූහය, රැළ, රොඩුව
Drought, s. ග්‍රීෂ්මකාලය, වියළීම, පිපාසය
Drown, v. a. ගැලීමැරකරනවා
Drowse, v. n. නිදිමතවෙනවා
Drowsily, ad. නිදිමතලෙස
Drowsiness, s. කම්මැලිකම, නිදිමතකම
Drowsy, a. කම්මැලිවූ, නිදිමතවූ
Drub, v. a. ගහනවා, තලනවා
Drub, s. ගැසීම
Drudge, v. a. නොවටිනාවැඩකරනවා
Drudgery, s. නොවටිනා වැඩකිරීම
Drug, s. භෛෂජ්‍ය, ඖෂධ, බෙහෙත්
Druggist, s. ඖෂධවාණිජයා, බෙ

මහත්බඩු විකුණන්නා.

Drum, *s.* බෙර, දවුල්, වාද්‍යන්

Drum, *v. n.* බෙරගහනවා

Drunk, *a.* කිමත්වූ, මත්, වෙරි

Drunkard, *s.* සුරාධූර්තයා, වෙරිබද්ද

Drunken, *a.* මත්වූ

Drunkenness, *s.* වෙරිමත්කම, කිමත්කම

Dry, *a.* සුස්කවූ, වියළුණුවූ, පිපාසවූ

Dry, *v. a.* සුස්කකරනවා, වේලනවා; *to dry the hair*, හිසකෙස් වියලනවා; *to dry up*, සුස්කවෙනවා

Dubious, *a.* අනුමානවූ, ශංකාවූ

Dubiously, *ad.* අනුමානලෙස, ශංකාලෙස

Dubitable, *a.* අනුමානවූ, අසත්‍යවූ

Duck, *s.* තාරාව; *Portuguese*; *wild*, ටේරා, සේරා

Duck, *v. a.* ගලවනවා

Duct, *s. way*, මග; *guidance*, මගපෙන්වීම

Ductile, *s.* කීකරුවූ, නැමෙන්නාවූ, බාලවූ

Due, *s.* නය, නියමය, යුතු; *I have paid all that was due*, මාවිසින් දියයුතුවූ සියල නයම ගෙව්වා; *a word spoken in due time how good it is*, නියමකාලීන් කථාකල වචනයක් කොපමන යහපත්ද

Duel, *s.* දෙදෙනාඅතරෙයි පොර

Dug, *a. pret of dig*, කනාපුඩුව කැණෙන්නා, හෑරුවා, හෙවුවා

Duke, *s.* අධිපතියෙක්

Dulcify, *v. a.* මධුරකරනවා, මිහිරිකරනවා

Dulcimer, *s.* ගායනාවක්

Dullhead, *s.* මුග්ධයා, මෝඩයා, අලසයා

Dull, *a.* ජඩබුද්ධිවූ, මුග්ධවූ, අලසවූ, මෝඩවූ, බරවූ, කම්මැලිවූ

Dull, *v. a.* මුග්ධකරනවා, මෝඩවෙනවා, කම්මැලිකරනවා

Dulness, *s.* මුග්ධකම, අලසකම, බරකම

Duly, *ad.* යුතුලෙස, නියමලෙස, සුදුසුලෙස

Dumb, *a.* ගොළුවූ

Dumbness, *s.* ගොළුකම

Dump, *s.* කාංසාව

Dun, *a.* ගෙලළු, එලළු

Dun, *v. a.* නයඉල්වනවා, අයකරනවා

Dunce, *s.* නිබුද්ධියා, මුග්ධයා, මෝඩයා

Dung, *s.* කසල, මල, ගූ, ගොම, බෙටි

Dung, *v. a.* පෝරකරනවා

Dungeon, *s.* බන්ධනාගාරය, හිරගෙය

Dunghill, *s.* කසලගොඩ

Dunner, *s.* නයඉල්වන්නා

Dupe, *s.* රවටෙන්නා

Dupe, *v. a.* රවට්ටිලිකරනවා

Duplicate, *v. a.* යුග්මකරනවා

Duplicate, *s.* යුග්මය

Duplicity, *s.* දෙපිටකාට්ටුකම,

ප්‍රයෝගකම, රැවටිලිකම, වංචාකම

Durability, s. පවතිනකම, නොනස්නාකම

Durable, a. පවතින්නාවූ, නොනස්නාවූ

Durably, ad. පවතිනාලෙස, නොනස්නාලෙස

Duration, s. පැවතීම

During, part. පවතිමින්; *during my residence in the country,* ඒ රට මාගේවාසයකිරීමේදී; *during three years,* තුන්අවුරුද්දක් මුළුල්ලෙහි; *during three days,* තුන්දිනක් අතරෙහි

Durst, *pret. of dare,* සැහැසිකය

Dusk, s. අඳුරැවණ්ණය

Duskily, ad. අඳුරැලෙස

Duskish, a. අඳුරැවූ

Dust, s. රැණු, රජස්, දූවිලි, දූවිල්ලෙ, ධූලි

Dust, v.a. දූවිලිගහනවා

Dusty, a. දූවිල්වූ

Duteous, a. කීකරුවූ, යටහත්වූ

Dutiful, a. කීකරුවූ, යටහත්වූ

Dutifully, ad. කීකරුලෙස, යටහත්ලෙස

Dutifulness, s. කීකරුකම, යටහත්කම

Duty, s. යුතුකම, යටහත්කම, කීකරුකම, නියමය

Dwarf, s. අඟුට්ටා, කුරා, මිට්ටා

Dwarfish, a. අඟුටුවූ, කුරුවූ, මිටිවූ

Dwell, v. n. වාසයකරනවා, වසනවා, පදිංචිව සිටිනවා

Dweller, s. වාසස්ථානයකාරන්නා, පදිංචිකාරයා

Dwelling, s. වාසස්ථානය, පදිංචිස්ථානය

Dwellinghouse, s. වාසස්ථානය, පදිංචිගෙය

Dwindle, v. n. කුඩාවෙනවා, හීනවෙනවා, මදවෙනවා

Dying, s. මැරීම, ප්‍රාණහානිවීම; *colouring,* සායම්පොවමින්

Dynasty, s. රාජවංශ

Dysentery, s. බඩකඩුත්තුව

Dyspepsy, s. ජීර්ණවියනොහැකිවීම

Dysphony, s. කථාකරන අපහසුවූ

Dyspnœa, s. ආශ්වාස ප්‍රශ්වාසවිය නොහැකිවීම

Dysury, s. මූත්‍රබාධය

E

Each, *pron.* එක එක, එක එකා; *he gave to each of them a reward,* ඔහු එකඑකාට ත්‍යාගදුන්නේය; *to love each other,* ඔවුනොවුන් සෙනෙහකරනවා; *give to each his due,* එකින් එකාට ඔහුගේ හිමිකමදියන්

Eager, a. ගිජුවූ, තන්හාවූ

Eagerness, s. ගිජුකම, තන්හාකම

Eagerly, ad. ගිජුලෙස, තන්හාලෙස

Eagle, s. *Falco, of this genus there are several species in Ceylon,* ලලිහිණියා, කුරුළුගොයා, ගුරුළා, රාජාලියා, වල් ඊරාජා, උකුස්සා; *the* ගිජු ලිහිණියා *is not found here*

Ear, s. *the organ of hearing,* ශ්‍රෝත්‍රය, සවන, කණ; *attention,* ශ්‍රවණාවධානය; *ear of corn,* කරල; *up to the ears over head and ears,* අධිකව; *to fall together by the ears,* සඬන්නකරනවා; *to set by the ears,* සඬන්නකරවනවා, උසිගන්වනවා

Earring, s. කණාභරණ, කුණ්ඩලාභරණ; කරාබුව; *Portuguese*

Earpicker, s. කන්හැරේද

Earshot, s. ශබ්දයක් ඇසෙනදුර

Earwax, s. කාදුරු

Earwitness, s. කනින්ඇසුසාක්ෂි

Ear, v. a. කරලහට ගන්නවා

Early, a. වේලාසන, වේලාපහ, කල් තිබා; *early fruits,* ප්‍රථමඵල; *in early times,* පූර්වකාලයෙහි, පූර්වකාල, ආදිකාලයෙහිදී.

Earn, v. a. උපදවනවා, උපයනවා, සපයනවා

Earnest, a. ශීඝ්‍රවූ, ආසාවූ, උත්සාහකරන්නාවූ; *money,* අත්තිකාරම්

Earnestly, ad. ශීඝ්‍රලෙස, උත්සාහලෙස, ආසාවලෙස

Earnestness, s. ශීඝ්‍රකම, ලොල්කම, උත්සාහකම, ආසාකම

Earth, s. පස්; *the earth,* පෘථිවිය, පොළොව, ගොඩ, භූමිය, බිම

Earth, v. n. පොලවදමනවා

Earthborn, a. පොලවෙන්උපන්

Earthen, a. මැටිමයවූ, පස්වූ

Earthenware, s. මැටිමය

Earthly, a. භූමිකවූ

Earthquake, s. භූමිකම්පාව

Earthy, a. භූමිකවූ, පෘථිවිවූ, පොලවටඅයිතිවූ

Ease, s. නිශ්චලය, ශාන්ත, පහසුව

Ease, v. a. *to free from sickness or pain,* ශාන්තදෙනවා, සනීපදෙනවා; *to relieve from any thing oppressive,* පහසුදෙනවා; *to free from difficulty,* ලෙහෙසිකරනවා, පහසුකරනවා

Easily, ad. ලෙහෙසියෙන්, පහසුවෙන්

Easiness, s. නිශ්චලකම, පහසුකම, ලෙහෙසිකම; *see the verb*

East, s. ඉන්ද්‍රදිශ, පූර්වදිශ, නැගෙනහිර

Easter, s. උපරිගාමිනා මංගල්‍යය; පාස්කු; *Portuguese*

Eastwind, a. පූර්වදිශ සුලඟ, නැගෙනහිර සුලඟ

Easterly, ad. පූර්වදිශාවට, නැගෙනහිරට

Eastern, a. පූර්වදිශාවටවූ, නැගෙනහිරවූ

Eastward, a. පූර්වදිශාදිශාවට, නැගෙනහිරදිශාවට

Easy, a. පහසු, ලෙහෙසි, ලේසි

Eat, v. a. බුදිනවා, අනුභවකරනවා, කනවා; *I feel no disposition to eat,* මට අනුභවයට

මොහුපසත් හැමෙහෙන්මෙන්නෙහු කු; *to cut the food that is prepared for one,* යමෙම කුට සූදානම්කල කෑමකනවා; *the rust eats into it,* මලකඩබඳිනවා *or* කෑ වා

Eatable, *a.* අනුභවකලහැකිවූ, කෑමට සුදුසුවූ

Eater, *s.* අනුභවකරන්නා, කනනා

Eaves, *s.* අගුව, බිතත්කෑන

Ebb, *s. the reflux of the tide,* බාදිය, බාජ්ජ; *decline,* නැසවීම

Ebb, *v. n.* බහිනවා, නැසවෙනවා; *see the noun*

Ebbing-water, *s.* බස්නාදිය

Ebony, *s.* කළුවරලී

Ebriety, *s.* බීමත්කම

Ebullition, *s.* ඉතිරයාම

Eccentrical, excentric, *a.* විකුතිකාලය, විකුතිකියාව

Ecclesiastical, *a.* දේවසභාවූ

Echo, *s.* සබ්දදීවීම, දෙන්නාර දීම

Echo, *v. n.* ශබ්දදුවනවා, දෙන්නාරදෙනවා

Electic, *a.* තෝරාගන්නාවූ

Eclipse, *v. n.* ග්‍රහණය *literally, a seizure; the idea which the Singhalese astrologers and astronomers have of an eclipse has given rise to this term;* රාහු, *one of the inferior planets having in consequence of certain unfair actions committed against him both by the sun and moon conceived an eternal hatred against them, at certain seasons takes the advantage of laying hold of them with his mouth, or hand, threatens them with destruction, and the darkness is caused by his grip; hence an eclipse is properly called* ග්‍රහණ ය, *that is* සූය්‍යග්‍රහණය, ඉරරාහු අල්ලීම, *an eclipse of the sun;* චන්ද්‍රග්‍රහණය, හඳරාහු අල්ලීම; *an eclipse of the moon.*

Eclipse, *v. a.* ග්‍රහණයකරනවා; *see the noun*

Economy, *s. the disposition or arrangement of any work,* සකාසුරුවම්කිරීම; *the management of a family,* ගෘහකම්මානාකිරීම, ගෙයිකලමනාකිරීම; *frugality,* උපවාසම; සූදානම්කිරීම

Ecstasy, *s.* ප්‍රීතිමත්වීම, ප්‍රීතියෙන් ඊනීම

Ecstatic, *a.* ප්‍රීතිමත්වූ

Edacious, *a.* කෑදරවූ

Edacity, *s.* කෑදරකම

Eddy, *s.* දියගලාව, දියසුළිය

Edentated, *a.* දත්සැලීම

Edge, *s.* මුවඅත, හැවිය, ගාව

Edge, *v. a. to sharpen,* මුවඅත්කරනවා; *it sets the teeth on edge,* එයින් දත් හිරිවැටෙනවා

Edged, *a.* මුවගත්වූ

Edging, *s.* අග, අඳුර, වාටිය

Edible, *a.* අනුභවයට සුදුසු

Edict, *s.* ආඥාව, ප්‍රසිඬපත්‍රය

Faintness, s. ක්ලාන්තය

Fair, s. *market*; කඩපල, වෙළඳමිපල

Fair, a. සෝභන, මනොඥ, සුන්දර, සුභ, පිළිස, සුඛ, ඉතාද; *thou art fairer than the sons of men*, ඔබවහන්සේ මනුෂ්‍ය පුත්‍රයින්ටවඩා සෝභනසේක; *Moses was exceeding fair*, මෝසෙස් ඉතා මනොඥවූයේය; *fair weather*, යහපත් කාලය; *fair speech*, මිහිරිකථාව; *fair dealings*, යුතුක්‍රියාව, *or* යුතුක්‍රියාකිරීම

Fairly, ad. සෝභනලෙස, යුතුලෙස, යෝග්‍යලෙස, සුද්ධලෙස

Fairness, s. සුන්දරකම, සුභකම, සෝභනකම, යුතුකම, යෝග්‍යකම, සුද්ධකම

Faith, s. සැදැහැ, විශ්වාසය

Faithful, a. සැබෑවූ, විශ්වාසවූ, ශුබැවූ

Faithfully, ad. සැබෑවූලෙස, විශ්වාසවූලෙස

Faithfulness, s. සැබෑවන්තකම, විශ්වාසකම

Faithless, a. අසැබෑවූ, භක්තිනැතිවූ, අවිශ්වාසවූ, අසත්‍යවූ

Falcation, s. අඩදකම, කුදුකම, වකුටුකම

Falcon, s. රාජාලියා

Fall, s. පතනයවීම, වැටීම, හැලීම

Fall, v. a. පතනයවෙනවා, වැටෙනවා, හැලෙනවා; *to fall*

out, or happen, සිඩවෙනවා; *to fall away,* පහවෙනවා, නො බුංවෙනවා; *to fall back,* පස්සට වැටෙනවා; *to fall in love,* ආලයවැටෙනවා; *to fall in with one,* සම්මුඛවෙනවා; *to fall in with an island,* දිවයිනක් සම්භවෙනවා; *his cheeks, fall in,* කොපුල්දෙක ගිලෙනවා; *to fall into a passion,* කෝපවෙනවා; *to fall off,* වැටියනවා; *to fall out (with a friend)* නොදපොරකරනවා, සණ්ඩුවෙනවා; *this falls under our consideration,* මේක අපේ කල්පනාවට එනවා; *to fall under one's displeasure,* කම්කෙනෙකු අප්‍රියවට යවනවා; *to fall short of one's expectation,* යමෙකු ගේ ප්‍රාර්ථනාව අඩුවෙනවා; *to fall short of provisions,* වියදම් නොවෙනවා

Fallarious, *a.* ප්‍රයෝග වූ, වංචා වූ

Fallaciously, *ad.* ප්‍රයෝගලෙස, වංචාලෙස

Fallaciousness, *s.* ප්‍රයෝගකම, වංචාකම

Fallacy, *s.* ප්‍රයෝගය, වංචාව

Fallibility, *s.* වැරදිගතිය, රැවටෙනගතිය

Fallible, *c.* වැරදියහැකිවූ, රැවටෙන වූ

Falling sickness, *s.* අපස්මාර, මිමය මර

Fallow, *a.* පුරන්

Fallow, *v. a.* දෙවනිපියහානවා

False, *a.* මිථ්‍යා, ප්‍රයෝග, වංචා, බොර, හොර, දුෂ්, රැවටිලි

Falsehood, *s.* මිථ්‍යාව, ප්‍රයෝගය, වංචාව, බොරුව, රැවටිල්ල

Falsely, *ad.* මිථ්‍යාලෙස, ප්‍රයෝගලෙස, වංචාලෙස, බොරුලෙස, රැවටිලිලෙස

Falseness, *s.* මිථ්‍යාකම, ප්‍රයෝගකම, වංචාකම, බොරුකම, රැවටිලිකම

Falsification, *s.* මිථ්‍යාකිරීම, ප්‍රයෝගකිරීම, වංචාකිරීම, හොරකම්කිරීම, බොරුකීම, දුෂ්කිරීම, රැවටිලිකිරීම

Falsifier, *s.* මිථ්‍යාකාමකරන්නා, ප්‍රයෝගකරන්නා, වංචාකරන්නා, බොරුකරන්නා, රැවටිලිකාරන්නා

Falsify, *v. a.* මිථ්‍යාකම්කරනවා, ප්‍රයෝගකරනවා, වංචාකරනවා, බොරුකරනවා

Falsity, *s.* මිථ්‍යාකම, ප්‍රයෝගකම, වංචාකම, බොරුකම, දුෂ්කම, රැවටිලිකම

Falter, *v. n.* ගොතගහනවා

Falteringly, *ad.* ගොතගහමින්ලෙස

Fame, *s.* කීර්තිය, ප්‍රසන්සාව, ප්‍රසිද්ධිය, නාමය

Famed, *a.* කීර්තිවූ, ප්‍රසන්සාවූ, ප්‍රසිද්ධවූ, ප්‍රකටවූ

Familiar, *a.* මිත්‍ර, අඳුනවූ; *accustomed to,* පුරුදුවූ, පුරුදුවූ, සිරිත්වූ

Familiar, *s.* මිත්‍රයා, අඳුනයා

Familiarity, *s.* මිත්‍රකම; අඳුලකම, ව්‍යවහාරකම, පුරුදුකම

Familiarize, *v. a.* ව්‍යවහාරකරනවා, පුරුදුකරනවා, සිරිත්ලෙස කරනවා, භාවිතාකරනවා

Familiarly, *ad.* ව්‍යවහාරලෙස, පුරුදුලෙස, භාවිතාලෙස

Family, *s. household,* ගෘහවාසීන්, ගෙයිවැසියෝ, පවුල; *tribe,* ගෝත්‍රය; *progeny,* වංශය; *a race,* ජන්මය; *a class,* වර්ගය

Famine, *s.* දුර්භික්ෂය, සාගතය, සාය, හාමතය

Famish, *v. a.* ආහාරනොදීමරනවා, කෑමනොදීමරනවා, කෑම නැතුවායින් මැරෙනවා, හාමගේකරනවා

Famous, *a.* කීර්තිවූ, ප්‍රසන්සාවූ, පූජිතවූ, ප්‍රසිද්ධවූ, නාම්වූ

Famously, *ad.* කීර්තිලෙස, ප්‍රසන්සාලෙස, පූජිතලෙස, ප්‍රසිද්ධලෙස

Fan, *v. a.* පවන්ගසනවා, පොලනවා; *see the noun*

Fan, *s. an instrument used for cooling the air,* වජිනිපත, තල්වැට, පවන්පත; *a winnow,* සුළිප, කුල්ල

Fanaticism, *s.* සන්නාසිකම, යෝගිකම

Fanatic, *a.* සන්නාසියා, යෝගියා

Fanciful, *a.* අවශ්‍යවූ, හිතුවක්වූ

Fancifully, *ad.* අවශ්‍යලෙස, හිතුවක්ලෙස

Fancifulness, *s.* අවශ්‍යකම, හිතුවක්කම

Fancy, *s.* සිතීම, කල්පනාකිරීම, ඉනාපවීම

Fancy, *v. n. to imagine,* සිතනවා; *to desire,* අභිලාෂකෙරෙනවා, ඉනාපවෙනවා; *to be pleased with,* සතුටුවෙනවා

Fane, *s.* දේවස්ථානය

Fang, *v. a.* අශ්‍රුරුඅල්ලනවා, පවුරුගානවා

Fang, *s. the long teeth of animals,* දල; *a claw,* නිය

Fangle, *s.* නිර්ථකකිරීම

Fantastical, fantastic, *a.* හිතුවක්වූ, අවශ්‍යවූ

Fantastically, *ad.* හිතුවක්ලෙස, අවශ්‍යලෙස

Fantasticalness, *s.* හිතුවක්කම, අවශ්‍යකම

Fantasy, *s.* සිතීම

Far, *a.* කතර, දුර, එපිට, ඈත; *from far,* දුරින්; *so far,* මෙපමණදුර; *far better,* ඉතායහපත; *as far as possible,* පුළුවන්පමණදුරට; *as far as the fort,* කොටුව පමණදුර; *as far as I see,* මට පෙනෙනපමණදුර; *far distant,* දුරස්තරය, දුරකතර

Farce, *s.* නිවකෝලමක්

Fardel, *s.* මිටිය, පොදිටකිය

Fare, *v. n. to travel,* ගමන්යනවා; *to be in any state good or bad,* හොඳියකින් සිටිනවා; *to feed,* අනුභවකරනවා; *to be*

entertained, සංග්‍රහකරනවා; *farewell,* සුවසේ හිටුව, ආයි බෝවන්

Farm, s. ගොත

Farm, v. a. ගොත්බිම්බද්දකරනවා, ගොවිතැන්කරනවා, ගොත්අස්වද්දනවා

Farmer, s. ගොත්බද්දකාරයා, ගොවියා

Farmost, a. ඉතාදුර, දුරගතර

Farrago, s. හවුල්කිරීම

Farrier, s. අශ්වවෙද

Farrow, s. ඌරුපැටව

Farrow, v. a. ඌරුපැටියන් හෙනවා

Farther, s. වඩාදුර

Fartherance, s. උපකාරය

Farthermore, ad. ඇරත්, වඩා, වෙන

Farther, v. a. උපකාරකරනවා, උදවුකරනවා

Farthest, a. ඉතාදුර

Fascinate, v. a. හිත්අලවනවා, හිත්ඇලලනවා, ප්‍රීත්මත්කරනවා, සත්මොහසකරනවා

Fascination, s. හිත්ඇලවීම, ප්‍රීතිමත්වීම, සත්මොහසවීම

Fashion, s. *form, or figure,* රූපය, රූව; *manner,* ප්‍රකාරය, අන්දම, ආකාරය; *custom, general practice,* ව්‍යවහාරය, හැටිහැටි, සිරිත, පුරුද්ද; *a borrowed appearance,* වෙසය

Fashion, v. a. මවනවා, රූපයකරනවා, රූවකරනවා, ප්‍රකාරයකරනවා, අන්දම්කරනවා, ආකාරයකරනවා, ව්‍යවහාරකරනවා, හාවිතාකරනවා, සිරිතකරනවා, පුරුදුවකරනවා; *see the noun*

Fashionable, a. සිරිත්වූ, ව්‍යවහාරවූ, පුරුදුවූ

Fashionably, ad. සිරිත්ලෙස, ව්‍යවහාරලෙස, පුරුදුලෙස

Fast, v. n. ලංඝනයකරනවා, නිරාහාරකරනවා, උපවාසකරනවා

Fast, s. ලංඝනය, උපවාසය, නිරාහාරය; *firm,* සවිර, තද, සවි; *quick,* කඩිසර, ඉක්මන්

Fasten, v. a. සවිරකරනවා, තදකරනවා, සවිකරනවා

Fastener, s. සවිරකරන්නා, තදකරන්නා, සවිකරන්නා

Faster, s. ලංඝනයා, උපවාසයා, නිරාහාරයා

Fasthanded, a. තත්හාවූ

Fastidious, a. අහංකාරවූ, අභිමානීසිත්වූ, උඩඟුවූ, සැකකිය කල්පනාකාරවූ

Fastidiously, ad. අහංකාරලෙස, අභිමානීලෙස, උඩඟුලෙස, සැකකිය කල්පනාකාරලෙස

Fastingday, s. ලංඝනදින, උපවාසදින, නිරාහාරදින

Fastness, s. සවිරකම, සවිකම, තදකම

Fat, s. තෙල; a. සථූලවූ, තරවූ

Fate, s. භාවය; *production or creation,* නිර්මාණ; *the power by which all things, whether good or bad, are brought about;* ධර්මතාව, *an unchangeable influence by*

the operations of which all things in all worlds happen to resemble each other, or are produced with similar features; සවභාවධම්මය, ලෝකධම්මය, *the same as above;* සංසාරය, *the eternal existence, or continuance of all things;* ඉරණම, *is that by which the lesser affairs of life happen, which is usually termed chance or fortune.*

Father, *s.* පිතෘ, පියා, පියාණෝ

Father in law, *s.* මාමා; *step father,* සුළුඅප්පා, පරපියා; *grand father,* මුත්තා; *godfather,* ඉස අත්තිබූ පියා; *forefathers,* ඥාතිමහල්ලෝ

Father, *v. a.* පියාවෙනවා

Fatherhood, *s.* පියකම, පියගුණය

Fatherless, *a.* පියන්නැති

Fatherliness, *s.* පියානිකම

Fatherly, *ad.* පියාකාර

Fathom, *s.* බඹ

Fathom, *v. a. to measure with the arms,* බඹමනිනවා; *to sound,* ජම්බුරබලනවා, ගැඹුරබලනවා; *to penetrate into,* විභාගකරනවා, සොයනවා; *I cannot fathom his designs,* ඔහුගේකල්පනාව මට විභාගකරන්ඩ බැරිය, *or* තේරෙන්ඩබැරිය

Fathomless, *a.* පතුලන්නැත්තාවූ, කෙලවරක්නැත්තාවූ, තේරෙන්ඩනුපුළුවන්වූ; *see the verb*

Fatigue, *s.* දුර්වලය, වෙහෙසය, කාලාන්තය, කොඩෙන්තුව, සෑහෙනිය, විඩාව

Fatigue, *v. n.* කාලාන්තවෙනවා, දුර්වලවෙනවා, ගැහැට්ටුවෙනවා, හෙහෙට්ටුවෙනවා, වෙහෙසවෙනවා, විඩාවෙනවා

Fatling, *s.* තරසතා

Fatness, *s.* සථූලභාවය, තරකම

Fatten, *v. a.* සථූලකරනවා, තරකරනවා

Fault, *s.* අපරාධය, දොසය, වරද

Faultfinder, *s.* දොසසොයන්නා, වරදතබන්නා

Faultily, *ad.* දොසලෙස, වරදලෙස

Faultiness, *s.* දොසකම, වරදකම

Faultless, *a.* නිර්දෝස, නිවැරදි

Faulty, *a.* අපරාධවූ, දොසවූ, වරදවූ

Favour, *v. a.* අනුග්‍රහයදෙනවා, උපකාරකරනවා, උදවුවෙනවා, පිහිටවෙනවා

Favour, *s.* අනුග්‍රහය, ආදරය, උපකාරය, උදවුව, පිහිට

Favourable, *a.* අනුග්‍රහවූ, උපකාරවූ, උපකාරවන්තවූ, උදවුවූ, පිහිටවූ, ආදරවූ

Favourableness, *s.* අනුග්‍රහකම, උපකාරකම, උදවුකම

Favourably, *ad.* අනුග්‍රහලෙස, උපකාරලෙස, උදවුලෙස

Favoured, *a.* අනුග්‍රහලත්තාවූ, උපකාරලත්තාවූ

Favourer, *s.* අනුග්‍රහකරන්නා, උපකාරකරන්නා, උදවුකරන්නා

Favourite, s. ඉෂ්ටයා, සමහිකාරයා

Favourless, a. අනුග්‍රහනොලත්තාවූ, උපකාරනොලත්තාවූ, උදවුනොලත්තාවූ

Fautor, s. අනුග්‍රහකාරන්නා, උපකාරකාරන්නා

Fawn, s. මුවපැටවා

Fawn, v. a. මුවපැටවුන් වදනවා; *to court*, ආලයකාරනාවා

Fawner, s. ආලයකාරන්නා

Fawningly, ad. ආලයකාරනාලෙස

Feague, v. a. වධයින්භාකාරනාවා

Fealty, s. භාරනොබිඳුකම

Fear, s. ත්‍රස්ත, භීත, භය

Fear, v. n. ත්‍රස්තවෙනවා, භීතවෙනවා, භයවෙනවා

Fearful, a. ත්‍රස්තවූ, භීතවූ, භයවූ

Fearfully, ad. ත්‍රස්තලෙස, භයානකලෙස, භීතලෙස

Fearfulness, s. ත්‍රස්තකම, භීතකම, භයකම

Fearlessly, ad. නිර්භීතලෙස, භයනැතිලෙස

Fearlessness, s. නිර්භීතකම, භයනැතිකම

Fearless, a. නිර්භීතවූ, භයනැතිවූ

Feasibility, s. කලහැකිවූදෙය

Feasible, a. කලහැකිවූ

Feast, s. මහාලෑසය, මඟුල

Feast, v. n. මහාලෑසකාරනාවා

Feaster, s. මහාලෑසකාරනා

Feastrite, s. මහාලෑසයෙහිසිරිත

Feat, s. ක්‍රියාව, කාලදෙය

Feather, s. පිහාටුව, පියාපත ; *down feathers*, පුඛ්බරපියාටුව

Feather, v. n. පියාවුපනාවා

Featherbed, s. පියාවුඇතිරිල්ල

Featly, ad. කාඩසරලෙස, දක්‍ෂලෙස

Feature, s. රූපය, මුහුණුවර

Feaze, v. a. ලිහනාවා, ගහනාවා

Febrile, a. ජ්වරයට නිසිවූ

February, s. නවම්මස

Feces, s. බොර

Feculence, feculency, s. බොරකම, මඩකම

Feculent, a. බොරවූ, මඩවූ

Fecund, a. ඵලධරවූ

Fecundation, s. ඵලදරවීම

Fecundify, v. a. ඵලදරකාරනාවා

Fecundity, s. ඵලදරකම

Fedary, s. සම්භිකාරයා

Federal, a. ගිවිසින්නාවූ, පොරොන්දුවෙන්නාවූ

Federary, s. සම්භිකාරයා

Federate, a. ගිවිසුනාවූ

Fee, s. *payment*, ගෙවීම; *recompense*, ප්‍රතිඵල, විපාකය ; *that which is due*, නියමෙ

Fee, v. a. වියදම්ගෙවනාවා, විපාකදෙනවා, නියමයදෙනාවා: *see the noun*

Feeble, a. දුර්වලවූ, වසත්කෙන්ඩුවූ, කෙබඩත්තුවූ, නිලගොරනවූ, ගිලන්වූ

Feebleminded, s. දුර්වලහිත, අසමර්ථහිත, අස්ථිරසිත

Feebleness, s. දුර්වලකම, ගිලන්කම, කෙබඩත්තුකම, අස්

රකම, වසක්නේදු කම

Feebly, *ad.* දුර්වලලෙස, ශිලුන්ලෙස, නොබෙත්තුලෙස, අස්ථිරලෙස, වසන්නේදුලෙස

Feed, *v. a.* *to supply with food,* ආහරදෙනවා, පොෂ්‍යකරනවා; *to cause to eat,* කවනවා; *to eat,* අනුභවකරනවා, කනවා

Feeder, *s.* පොෂ්‍යකරන්නා, ආහරදෙන්නා, කවන්නා, කන්නා; *see the verb*

Feel, *v. a.* සංඥාවෙනවා, ස්පර්ශවෙනවා, හැඟෙනවා, දැනෙනවා

Feel, *s.* ස්පර්ශවීම, සංඥාවීම, දැනීම, හැඟීම

Feeling, *a.* ස්පර්ශවූ, සංඥාවූ, දැනෙන්නාවූ, හැඟෙන්නාවූ

Feeling, *s.* ස්පර්ශකිරීම, සංඥාකිරීම, දැනීම, හැඟීම

Feelingly, *ad.* ස්පර්ශවෙනලෙස, සංඥාවෙනලෙස, දැනෙනලෙස

Feet, *s.* පාදයන්, කකුල්

Feign, *v. n.* කතාලාකියනවා, බොරුවන්කියනවා, ප්‍රයෝගකරනවා, කපටකම්කරනවා

Feignedly, *ad.* බොරුවෙන් කියනලෙස, කපටකම්කරනලෙස

Feigner, *s.* බොරුවන්කියන්නා, කපටකම්කරන්නා

Feint, *s.* කපටකම්පෙන්වීම

Felicitate, *v. a.* වාසනාකරනවා, ශුභකාවදුන්වෙනවා

Felicity, *s.* පුණ්‍යවන්තකම, වාසනාව, ශුභය

Feline, *a.* බළල්ගතිවූ

Fell, *a.* රෞද්‍රවූ, කෲරවූ

Fell, *v. a.* *to knock down,* පළනවා, බිමදමනවා; *to fell trees,* ගස්කපාපළනවා

Fell, *pret. of to fall,* සිඩවුනා; *it fell out well for me,* ඒක හොඳලෙස මට සිඩවුනා; *he fell from his horse,* ඔහු ඔහුගේ අශ්වයාකෙන්ඩැටුනා; *the lot fell upon me,* පසඅට මා පිටට වැටුනා; *he fell down at the emperor's feet,* ඔහු අගරජ්ජුරුවන්ගේ පාදමුලවැටුනා; *in the act of performing that business they fell asleep,* ඔවුන් ඒ වැඩකෙරීමෙන් නිදුවැටුනා

Feller, *s.* පළන්නා

Fellness, *s.* රෞද්‍රකම, අසත්පුෂිකම, කෲරකම

Felloe, *s.* රෝදය, වළල

Fellow, *s.* *an associate,* සහකාරයා, සමඟිකාරයා; *a match,* යුගය; *a wretch,* කාලකණ්නියා, නීචයා

Fellow, *v. a.* යුග්මකරනවා

Fellow-creature, *s.* එකජම්මය

Fellow-feeling, *s.* සමගිවහැඟෙනකම

Fellow-heir, *s.* සමදායාදකායා

Fellow-helper, *s.* සහකාරයා

Fellow-labourer, *s.* සහකාරිකායා

Fellow-servant, *s.* සමගමෙහෙකරුවා

Fellow-soldier, *s.* සහාසේවකයා
Fellow-student, *s.* සහශිෂ්‍යයා
Fellow-sufferer, *s.* සමගිව විඳින්නා
Fellowship, *s.* සහභාගීකම, සමගීකම
Felly, *ad.* රෞද්‍රලෙස. කෲරලෙස
Felo de-se, *s.* ආත්මඝාතකයා
Felon, *s.* වරදකාරයා
Felonious, *a.* දුෂ්ටවූ, වරදවූ
Feloniously, *ad.* දුෂ්ටලෙස
Felony, *s.* දුෂ්ටකම, තදවරද
Felt, *pret.* සැලෙහාවුවා
Female, *s.* *a woman*, ස්ත්‍රී, ගෑණි; *a she*, ගෑණුසතා
Feminality, *s.* ස්ත්‍රීජාතිය
Feminine, *a. partaking of the nature of a female*, ස්ත්‍රීජාතිවූ; *the term which distinguishes words of this gender*, ස්ත්‍රීලිංග
Femoral, *a.* කලවයටඅයිති
Fen, *s.* මඩගොහොරුව, වගුර
Fence, *s.* ප්‍රාකාරය, පවුර, වැට; *art of fencing*, හරඹකිරීම
Fence, *v. a.* ප්‍රාකාරයකරනවා, වැටබඳිනවා; *exercise*, කඩුහරඹකරනවා, හරඹකරනවා
Fenceless, *a.* ප්‍රාකාරයක්නැති, පවුරනැති, වැටනැති
Fencer, *s.* හරඹකාරයා
Fencible, *a.* රක්ෂාකලහැකිවූ
Fencing-master, *s.* හරඹඉගන්වන්නා
Fend, *v. a.* රක්ෂාකරනවා, අහක්කරනවා

Fenny, *a.* මඩගොහොරුවූ, වගුරුවූ
Feoff, *v. a.* උරුමදෙනවා
Feoffee, *s.* උරුමවූයා
Feoffer, *s.* උරුමදෙන්නා
Feoffment, *s.* උරුමලැබීම
Feracity, *s.* ඵලදරන්නාවූ
Ferine, *a.* කැලෑවූ, වනචරවූ
Ferineness, *s.* කැලෑකම, වනචරකම
Ferment, *v. a.* කැසලනවා, පැසෙනවා, පිපෙනවා
Ferment, *s.* කැසලීම, පැසීම, පිපීම; *tumult*, කෝලාහලය
Fermentation, *s.* කැසලීම, පැසීම, පිපීම
Fermentative, *a.* කැසලන්නාවූ, පැසෙන්නාවූ, පිපෙන්නාවූ
Fern, *s.* මීවනා
Ferny, *a.* මීවනාවූ
Ferocious, *a.* රෞද්‍රවූ, කෲරවූ, වනචරවූ
Ferocity, *s.* රෞද්‍රකම, වනචරකම
Ferreous, *a.* යකඩමයවූ
Ferriage, *s.* ආදායම, තොටුපලකුලී
Ferruginous, *a.* යකඩගතිවූ
Ferry, *v. a.* එතෙරගෙනායනවා, ගොඩබානවා
Ferry, *s.* තොටුපල
Ferryman, *s.* තොටියා, තොටුපලකාරයා
Fertile, *a.* බොහෝඵලදරනාවූ

Fertileness, s. ඵලධරකාම, සශ්‍රීකකාම

Fertility, s. ඵලධර, සශ්‍රීක

Fertilize, v. a. ඵලධරකරනවා, සශ්‍රීකකරනවා

Fervency, s. splendour, දිලිසීම, තේජස; zeal, ජ්වලිතය, දාහය; heat, ග්‍රීෂ්ම, උෂ්ණ

Fervent, a. දිලිසුනාවූ, තේජවන්තවූ, ජ්වලිතවූ, ග්‍රීෂ්මවූ, දාහවූ, උෂ්ණවූ; see the noun

Fervently, ad. දිලිසෙනලෙස, තේජවන්තලෙස, ග්‍රීෂ්මලෙස, ජ්වලිතලෙස; see the noun

Fervid, a. උෂ්ණවූ, තේජවන්තවූ; ග්‍රීෂ්මවූ, ජ්වලිතවූ

Ferula, s. පලම්බෙතොටිය

Fervour, s. උෂ්ණය, තේජස, දාහය, ග්‍රීෂ්ම, ජ්වලිතය

Fester, v. n. සෑදෙනවා, කුණුවෙනවා

Festinate, a. සැඩපරවූ

Festival, a. මඟුල්වූ, මඟුල්දවස, බරදවස

Festive, a. මඟුල්වූ, සෙල්ලන්වූ

Festivity, s. මඟුල්දවස, සෙල්ලන්දවස

Fetch, v. a. to bring, ගෙනෙනවා; to procure, සපයනවා; to obtain, ලබාගන්නවා, සම්භකරනවා

Fetch, s. ප්‍රයෝගය, වංචාව

Fetid, a. දුර්ගන්ධවූ, පූතිගන්ධවූ, ගඳගහන්නාවූ

Fetter, s. විලංගුව, යදම, දම

Fetter, v. a. විලංගුදමනවා, යදම්දමනවා

Fettle, v. n. නිෂ්ප්‍රයෝජනදේය කරනවා

Fetus, s. දරුගැබ්බිත්ත, දරුගැබ

Feud, s. දබරය, සටකපටය

Feudal, a. කප්පන්

Feudatory, s. කප්පන්වූ

Fever, s. ජ්වරය, උණ

Feverish, a. ජ්වරවූ, උණවූ

Feverishness, s. ජ්වරවීම or කම

Few, a. අල්ප, ස්වල්ප, ටික

Fewel, s. දර

Fewness, s. ස්වල්පකම

Fib, s. මුසාවාදය, බොරුව

Fib, v. n. මුසාවාදකියනවා, බොරුකියනවා

Fibber, s. මුසාවාදියා, බොරුකියන්නා

Fibre, s. කෙඳ

Fibrous, a. කෙඳිවූ

Fibula, s. කෙණ්ඩඇටයක්

Fickle, a. වෙනස්වෙන්නාවූ, අනිසතිරවූ, චපලවෙන්නාවූ

Fickleness, s. වෙනස්වෙනකම, අනිසතිරකම, චපලකම

Fickly, ad. වෙනස්වෙනලෙස, අනිසතිරලෙස, චපලලෙස

Fiction, s. ප්‍රයෝගකිරීම, මිත්‍යාකිරීම, වංචාකිරීම

Fictitiously, ad. ප්‍රයෝගලෙස, මිත්‍යාලෙස, වංචාලෙස

Fiddle, s. වීණාව; stick, වීණාදුන්න; string, වීණාතත

Fiddle, v. n. වීණාගානවා, වී

ගායනායකාරනාවා
Fiddler, *s.* වීණාගායන්නා, වෙණාවාදනකාරයා
Fidelity, *s.* ධර්මිෂ්ඨකම, විශ්වාසකම; *conjugal*, පතිව්‍රතාකම
Fidget, *v. n.* සලපසල
Fiducial, *a.* සත්‍යාකූ, අනුමාන ඇති
Fief, *s.* බඩ
Field, *s.* කෙත, කුඹුර, පිට්ටනිය
Fieldmarshal, *s.* සේනාධිපතියා
Fiend, *s.* *an enemy*, සතුරා, විරුද්ධකාරයා; *the devil*, යක්ෂයා, යකා
Fierce, *a.* රෞද්‍ර, කෘර, චණ්ඩ, රළු, දුෂ්ට, චණ්ඩ
Fiercely, *ad.* රෞද්‍රලෙස, කෘරලෙස, රළුලෙස, චණ්ඩලෙස, දුෂ්ටලෙස
Fierceness, *s.* රෞද්‍රකම, කෘරකම, රළුකම, චණ්ඩකම, දුෂ්ටකම
Fierceness, *s.* අග්නිභාවය, උෂ්ණභාවය, තැවීගතිය, රළුකම, කෝපවත්කම
Fiery, *a.* අග්නිවූ, උෂ්ණවූ, තැවුණු, රළුවූ, කෝපවත්වූ
Fife, *s.* නළාවක්
Fifteen, *a.* පසළොස, පහළොහ
Fifteenth, *a.* පසළොස්වෙනි
Fifth, *a.* පස්වෙනි
Fifthly, *ad.* පස්වෙනිලෙස
Fiftieth, *a.* පනස්වෙනිවූ
Fifty, *a.* පනස
Fig, *s.* උදුම්බරා; *Ficus carica*, රට අත්තික්කා; *F. glomerata*, අත්තික්කා; *F. religiosa*, බෝ ගහ; *F. benghalensis*, නුගගස
Fight, *v. a.* පොරඅල්ලනවා, යුද්ධකරනවා, ගහගන්නවා
Fight, *s.* පොරඅල්ලීම, යුද්ධකිරීම, ගහගැනීම
Fighter, *s.* පොරඅල්ලන්නා, යුද්ධකරන්නා, පෙරළිකාරයා
Figment, *s.* ප්‍රයෝගකිරීම, වංචාකිරීම
Figurative, *a.* උපමාකාරවූ
Figuratively, *ad.* උපමාකාරලෙස
Figure, *s.* *the likeness of a person or thing*, රූපය; *an image or statue*, ප්‍රතිමාව, පිළිමය; *external from*, පෙනීම; *representations in painting*, සිත්තමකිරීම; *a character denoting a number*, ඉලක්කම; *a sign of, or signature*, සිතියම, ලකුණ; *a type*, ආදර්ශය
Figure, *v. a.* රූපකරනවා, ප්‍රතිමාවකරනවා, පිළිමයකරනවා, පෙනීමකරනවා, සිතියම්කරනවා, ඉලක්කම්ගහනවා, ලකුණුකරනවා, ආදර්ශයකරනවා; *see the verb*
Filament, *s.* රේණු, *applied principally to flowers*; කෙන්ද, *any slender thread*,
Filch, *v. n.* හොරකන්කරනවා
Filcher, *s.* හොරා
File, *s.* පීර
Filecutter, *s.* පීරසාදන්නා
File, *v. n.* පීරනවා

Filemot, *s.* පාඬුවර්ණ
Filer, *s.* පීරිගාන්නා
Filial, *a.* පුත්‍රවූ
Filiation, *s.* පුත්‍රවූභාවකම
Filings, *s.* රෙසුණු
Fill, *v. a.* සම්පූර්ණකරනවා; පූරවනවා, පූර්ණකරනවා
Fill, *s.* සම්පූර්ණය, පිරවීම, පූර්ණකිරීම
Filler, *s.* සම්පූර්ණකරන්නා, පූරවන්නා, පූර්ණකරන්නා
Fillet, *s.* බැම්ම, බඳපටිය
Fillet, *v. a.* පටියබඳිනවා
Fillip, *v. a.* නියපිටින්ගහනවා
Fillip, *s.* නියපිටින්ගැහීම
Filly, *s.* අස්නාඹ
Film, *s.* තුනීහම
Film, *v. a.* තුනීහම්හදනවා
Filmy, *a.* තුනීහම්හදන්නාවූ
Filter, *v. a.* පෙරනවා
Filter, *s.* පෙරගන්නබඩ
Filth, *s.* කැත, කැතකම, මලිනභාවය, කිළුටුකම, අපවිත්‍රකම
Filthy, *a.* මලිනවූ, කිළුටුවූ, කැතවූ, අපවිත්‍රවූ
Filtrate, *v. a.* පෙරනවා
Filtration, *s.* පෙරීම
Fin, *s.* මත්ස්‍යතාවරල, වල්පත.
Finfooted, *a.* බඩපාදයන්වූ
Final, *a.* නිමවූ, අන්තිමවූ
Finally, *ad.* අන්තිමලෙස
Finance, *s.* ආදායම
Find, *v. a.* *to obtain by searching,* සපයනවා; *to meet with,* සොයනවා, සම්භකරනවා; *to know by experience,* දැනගන්නවා; *to search out by study,* විභාගකරනවා, සම්භවෙනවා; *to find out,* දකිනවා; *to furnish with,* සපයාදෙනවා; *as, if you will undertake that work I will find you all that is necessary,* තමුසේ ඒවැඩේ බාරගන්නවා නම් මම තමුසේට ඕනෑවූදේ වල් සපයාදෙන්නෙමු
Finder, *s.* සපයන්නා, සම්භකරන්නා; *see the verb*
Findfault, *s.* වරදසොයන්නා
Fine, *s.* සිහින්, සිනිදු
Fine, *v. n.* *as water,* පාදනවා; *as thread,* සිහින්කරනවා; *as a penalty,* දඩගහනවා
Finery, *s.* ආභරණය, අලංකාරය
Finer, *s.* පාදන්නා, සුද්ධකරන්නා
Finger, *v. a.* ඇඟිලිගානවා, අතගානවා
Finger, *s.* ඇඟිල්ල; *forefinger,* තර්ජනය, දබරඇඟිල්ල; *middle finger,* මධ්‍යමය, මැදැඟිල්ල; *ring finger,* අනාමිකාව, මුදුඇඟිල්ල; *little finger,* කනිෂ්ඨය, සුලැඟිල්ල
Finical, *a.* අභාර
Finish, *v. a.* නිමවනවා, ඉවරකරනවා, අන්තිමකරනවා
Finisher, *s.* නිමවන්නා, අන්තිමකරන්නා, ඉවරකරන්නා
Finite, *a.* පරිමෙයවූ, සීමාවූ, කෙළවරවූ, අන්තිමවූ

Finiteless, *a.* අප්‍රමාණවූ, නිම නැති, කෙළවරක් නැති, අන්තිම නැති

Finitely, *ad.* පරිමිතයකලෙස, නිමවූලෙස, අන්තිමලෙස

Finiteness, finitude, *s.* පරිමිතය කම, නිමවූකම, අන්තිමවූකම

Finny, *a.* වරල්ඇත්තාවූ

Fintoed, *a.* බඩවූපාදයන් ඇති

Fir, *s.* දේවදාරු

Fire, *s.* වහ්නි, අග්නි, ගිනි, ගින්දර

Fire, *v. a. to enflame, to kindle,* ගිනිතබනවා, පත්තුකරනවා; *as a gun,* වෙඩිතබනවා

Fire arms, *s.* අග්නිශස්ත්‍ර, ගිනි ආවුද

Firebrand, *s.* ගින්දරපෙනෙල්ල, ගිනිපෙනෙල්ල

Firelock, *s.* තුවක්කුව

Firepan, *s.* ගින්දරකබල, තුවක්කුකතුකබ

Firewood, *s.* කාෂ්ඨ, දර

Fireworks, *s.* අග්නික්‍රීඩා, ගිනි කෙළි

Firm, *a.* ද්‍රිඩවූ, සථිරවූ, ශක්තිවූ, සවිවූ

Firm, *v. a.* සථිරකරනවා, ශක්ති කරනවා, සවිකරනවා

Firmament, *s.* අඹර, ගුවන, අව කාශය, අහස

Firmly, *ad.* සථිරලෙස, ද්‍රිඩලෙස, ශක්තිලෙස, සවිලෙස

Firmness, *s.* සථිරකම, ද්‍රිඩකම, ශක්තිකම, සවිකම

First, *a.* ප්‍රථම, පූර්ව, පළමුවෙනි

First begotten, *s.* ප්‍රථමජන

First fruits, *s.* අග්‍රස්, ප්‍රථමඵල

Firstling, *s.* කුළුඳුලා

Fiscal, *s.* කාසි, විනිශ්චවාදියා

Fish, *s.* මත්ස්‍යයා, ඣෂටකායා, මාළුවා

Fish, *v. a.* මස්බානවා, මාළුබානවා, මස්මරනවා

Fisher, *s.* මස්බානනා

Fisherboat, *s.* මස්ඔරුව, මස්පඩවුව

Fisherman, *s.* මස්බාන්නා, මස්මරන්නා

Fishery, *s.* මස්මැරීම

Fish-hook, *s.* බිලිකටුව

Fishmonger, *s.* මස්විකුණන්නා

Fishpond, *s.* මත්ස්‍යතටාකය, මස්පොකුණ

Fissile, *a.* කීරිවූ

Fissility, *s.* කීරිකම

Fissure, *s.* පැළුම, සුර

Fist, *s.* මිටමොළවාපුඅත, මිට, ගුටිය

Fisticuffs, *s.* ගුටිඅන්නාපොර

Fistula, *s.* මුලවාතුව

Fistular, *s.* සිදුර, හිල

Fit, *a.* යෝග්‍යවූ, ශුතවූ, සමතීවූ, හරිවූ, සුදුසුවූ: *of sickness,* මූර්ඡාව

Fit, *v. a.* යෝග්‍යකරනවා, හරි ගස්සනවා, සුදුසුකරනවා; *to fit out,* සපයාදෙනවා: *to fit up,* සූදානම්කරනවා

Fitly, *ad.* යෝග්‍යලෙස, ශුතලෙස, සුදුසුලෙස, හරිලෙස

Fitness, *s.* යෝග්‍යකම, යුතුකම, සුදුසුකම

Five, *a.* පච, පස, පහ

Fix, *v. a. make firm,* ස්ථිරකරනවා, සවිකරනවා; *settle or appoint,* නියමකරනවා; *direct the attention,* එලනවා; *withhold from motion,* නවත්වනවා; *to fix the eyes upon a thing,* යම්දෙයකට නෙත්හෙලනවා; *to fix upon a day for going,* යෑමට දවසක් නියමකරනවා

Fixedly, *ad.* ස්ථිරලෙස, සවිලෙස, නියමලෙස, නවතිනලෙස

Fixedness, *s.* ස්ථිරකම, සවිකම, නියමුකම, නවත්වනකම

Fixture, *s.* සවිකිරීම, ස්ථිරකිරීම

Fizgig, *s.* අත්නාමඩය

Flabby, *a.* ලිහිල්වූ, එල්ලෙන්නාවූ, වැනෙන්නාවූ

Flaccid, *a.* දුර්වලවූ, ගිලන්වූ, බුරුල්වූ

Flaccidity, *s.* දුර්වලකම, ගිලන්කම, බුරුල්කම

Flag, *v. n. hang loose,* එල්ලෙනවා, වැනෙනවා; *grow spiritless, or dejected,* දුර්වලවෙනවා, වසත්නැත්තුවෙනවා

Flag, *s.* දජය, කොඩිය

Flageolet, *s.* නලාව

Flagitious, *a.* දුෂ්ටවූ, බොහෝනා පුරදුවූ

Flagitiousness, *s.* දුෂ්ටකම, ඉතා නපුරුකම

Flaggon, *s.* භාජනයක්

Flagrancy, *s.* දැවීම, ජ්වලිතය, ග්‍රීෂ්මය, ලාස්නාය, දැහැය

Flagrant, *a. ardent, burning, eager,* දවනනාවූ, ජ්වලිතවූ, ග්‍රීෂ්මවූ, ලාස්නවූ, දැහැවූ; *notorious,* ප්‍රසිඬවූ, එළිදරවූ

Flagration, *s.* දැවීම

Flagstaff, *s.* කොඩිගහ, කොඩිකුඹය

Flail, *s.* දැත්ත, ගොයම්මඩනලීය

Flake, *s. any loose thing,* එල්ලෙනදේ, වැනෙනදේ; *stratum,* තට්ටුව

Flake, *s.* තහඩුව

Flaky, *a.* එල්ලෙන්නාවූ, තට්ටුවූ

Flaw, *s.* බොරුව, වංචාව

Flam, *v. a.* බොරුවචනකරනවා

Flambeau, *s.* හුළු, පන්දම්

Flame, *s.* වහ්නිශිඛාව, ගිනිදැලව, පාන්දැලව

Flame, *v. n.* ගිනිදැල්ලනගිනවා

Flamability, *a.* ගිනිදැල්වියයුතුවූ

Flammation, *s.* ගිනිදැල්වීම

Flank, *s.* පැත්ත, ඇලපත

Flank, *v. a.* පැත්තකටවෙනවා

Flannel, *s.* ලොම්රෙදි

Flap, *s.* ලෙලෙනාදෙය, එල්ලෙනදේ

Flap, *s.* ලෙලෙනාශබ්දය, වැනෙනාශබ්දය

Flare, *v. n.* දිලිසෙනවා

Flash, *s.* දීප්තිය, කාන්තිය

Flash, v. n. දිස්නාවෙනවා, කාන්තිවෙනවා

Flashy, a. දිස්නාවූ, කාන්තිවූ

Flask, s. භාජනයක්

Flasket, s. භාජනයක්

Flat, s. *level*, පැතලි; *dull*, අලස වූ; *stupid*, අඥානවූ

Flat, v. a. පැතලිකරනවා

Flatly, ad. පැතලිලෙස, අලස ලෙස; *see the adj.*

Flatness, s. පැතලිකම, අලසක ම; *see the verb*

Flatten, v. a. *as ground*, සමතලා කරනවා: *to smooth*, පැතලි කරනවා; *to dispirit*, වසත් බෙත්බුකරනවා

Flatter, v. a ඉච්චාකරනවා, පාරම්බුකරනවා, බොරුසතුති කරනවා

Flatter, s. ඉච්චාකරන්නා, පාරම්බුකරන්නා, බොරුසතුති කරන්නා

Flattery, s. ඉච්චාකිරීම, පාරම්බු කිරීම, බොරුසතුතිකිරීම

Flattish, a. සමතලාවූ, පැතලිවූ

Flatulency, s. සූලන්නකම, වාත කම, වායුකම

Flatulent, a. සූලහවූ, වායුවූ, වාතයවූ, වැසූබඩවූ

Flatus, s. වාතබඩය

Flatwise, ad. සමතලාලෙස

Flaunt, v. n. ලිහිල්වෙනවා

Flaunt, s. ලිහිල්වූ

Flavour, s. රස, ගඳ, සුවඳ

Flavourous, a. රසවූ, ගඳවූ, සුවඳ වූ

Flaw, s. *a crack*, ඉර, පැළුම; *a defect*, දොසය; *a fault* වරද; පළුදුව *will apply to any kind of a defect.*

Flaw, v. a. ඉරිතලනවා, පලනවා, දොසකරනවා, පළුදුකරනවා; *see the noun*

Flawless, s. පැළුම්ඉරිනැති, නිදොස, පළුදුනැති

Flawy, a. පළුදුවූ

Flax, s. හණ

Flaxcomb, s. හණඅවුල්හරිනා පනාව

Flaxdresser, s. හණඅවුල්අරින්නා

Flaxen, a. හණවූ

Flay, v. a. හම්ගහනවා

Flea, s. බලුමැක්කා

Fleam, s. විදිනාකටුව

Fleak, v. a. පිත්ගහනවා

Fled, *part.* පියාසරකරා

Fledge, *part.* පියාවුදෙනවා

Flee, v. n. *to fly from*, ගොවියනවා, ඉකිලියනවා; *to run to for shelter*, ආරක්ෂාවට වදිනවා, ගැලවීයනවා

Fleece, s. බැටළුරෝමසල්

Fleece, v. a. බැටළුරෝමකපනවා

Fleer, v. a. සරදම්කරනවා, කවටකම්කරනවා

Fleerer, s. සරදම්කරන්නා, කවටකම්කරන්නා

Fleet, s. නැව්කණ්ඩායම

Fleet, a. *swift of pace*, ජවගමින් වූ, කඩිසරගමන්වූ

Fleet, v. n. සීඝ්‍රවූගමන්යනවා, අතුරුදන්වෙනවා, කඩිසරට පියාඹනවා

Fleetly, *ad.* සීඝ්‍රලෙස, කඩිසර ලෙස

Fleetness, s. සීඝ්‍රකම, කඩිසරකම

Flesh, s. මාංශ, මස්

Fleshliness, s. කාමුකකම

Fleshly, a. ශාරීරිකවූ, මාංශවූ, කාමුකවූ

Fleshmonger, s. මස්වෙළෙන්දා

Fleshpot, s. මස්තම්බනවලඳ

Fleshy, a. සප්පලවූ, තරවූ, මාංශවූ

Flexibility, s. *pliancy*, නැමෙනකම, බුරුල්කම, නැවුණකම; *easiness to be persuaded*, එක්සිත්වෙනකම

Flexible, s. නැවීම, බුරුල්කම, නැවූ, එක්සිත්වෙන; *see the adj.*

Flexion, s. නැවීම

Flexuous, a. එතෙන්නාවූ, පැටලෙන්නාවූ, වටලවූ

Flexure, s. නැමීම

Flicker, v. a. පියාසරගහනවා

Flier, s. පැනවියන්නා

Flight, a. පැනවියාම, පලායාම

Flighty, a. *swift*, සීඝ්‍රවූ, කඩිසරවූ; *fanciful*, කායිකොතුකවූ, හිතුවක්කාරවූ

Flimsy, a. සියුම්වූ, තුනීවූ, හරනැතිවූ

Flinch, v. a. ඉඩදෙනවා

Flincher, s. ඉඩදෙන්නා

Fling, v. a. විසිකරනවා, විසිකරදමනවා

Fling, s. විසිකිරීම, අපහාසදැමීම

Flint, s. අග්නිපාෂාණ, ගිනිගල

Flippant, a. නිරාශීක කථාකරන්නාවූ

Flirt, v. a. *move quickly*, පනිනවා; *to jerr*, කටවකැමිතරනවා; *to be unsteady*, කායිකොතුකවෙනවා, හිතුවක්කාරවෙනවා

Flirt, s. කායිකොතුකවෙන්නා, හිතුවක්කාරවෙන්නා

Flit, v. n. පැනවියනවා, පලායනවා, ඉඩන්මාරුකරනවා

Flittermouse, s. මාවවුලා

Flix, s. සිහින්සුඹුළු

Float, v. n. ඉල්පෙනවා, පාවෙනවා

Float, s. ඉපිල්පීම, පාවීම

Flock, s. රැළ, පට්ටිය, රළව, සමූහය

Flock, v. a. සමූහයවෙනවා, රැස්වෙනවා

Flog, v. a. තලනවා, ගහනවා

Flood, s. ජලප්‍රවාහය, වතුරගැලීම, ජලපිරීම

Flood, v. n. ජලප්‍රවාහවෙනවා, වතුරගලනවා

Floodgate, s. ජලදොර

Floor, s. ගබඩාල්බිම, ගෙයිබිම

Floor, v. a. ගෙයිබිමහදනවා

Florid, a. මලින්සමන්විතවූ, පැහැදිලිවන්නවූ, දීප්තවූ

Floriferous, a. පුෂ්පවෙනනාවූ, මල්හටගන්නාවූ

Florist, s. මාලාකාරයා, මල්වවන්නා
Flote, v. a. පාවෙනවා
Flounce, v. n. දිස්සෙදබෑකරනවා
Flounce, v. a. වාටියරැලිඅල්ලනවා
Flounder, s. කාරල්ලා
Flounder, v. n. දඟලනවා
Flour, s. පිටි
Flourish, v. n. සශ්‍රීකවෙනවා, වැඩෙනවා, ලියලනවා
Flourisher, s. සශ්‍රීකවෙන්නා, වැඩෙන්නා, ලියලන්නා
Flout, v. a. කවටකම්කරනවා, අපහාසකරනවා, නින්දාකරනවා
Flouter, s. සරදම්කරන්නා
Flow, v. n. ප්‍රවාහවෙනවා, වතුරදුවනවා, ගලනවා
Flow, s. ප්‍රවාහවීම, වතුරගැල්ම
Flower, s. පුෂ්පය, කුසුම, මල
Flower, v. n. මල්පිපෙනවා
Flower garden, s. මල්වත්ත
Flowery, a. මල්ඇතිවූ
Fluctuant, a. අස්ථිරවූ
Fluctuate, v. n. අස්ථිරවෙනවා, චංචලවෙනවා
Fluctuation, s. අස්ථිරවීම, චංචලවීම
Flue, s. *a chimney*, දුම්කවුළුව; *down or fur*, සිහින්පුළුන්
Fluency, s. ප්‍රවාහවීම, තොරොන්දැම
Fluent, s. ප්‍රවාහවූ, තොරොන්දුයන්නාවූ
Fluid, a. දියවූ දියාරුවූ
Fluidness, s. දියවූකම දියාරුකම
Flurry, s. හුලන්කැලතුම, කලබැගෑණිය
Flush, v. a. ලොල්මුඛවෙනවා, රතුවෙනවා
Flute, s. නලාව; *channel or furrow on a pillar*, කුරිදැර
Flute, v. a. කුරිඅදිනවා
Flutter, v. n. අතනටුනහනවා, කලබැගෑණිකරනවා
Flutter, s. අතනටුනැගීම, කලබැගෑණිකිරීම
Flux, s. *the act of flowing*, ප්‍රවාහවීම; *disease in the bowels*, අතිසාරය, බඩකැවුත්තුව
Flux, v. n. දියවෙනවා, ප්‍රවාහවෙනවා
Fluxion, s. ප්‍රවාහවීම
Fly, v. n. ඉගිලෙනවා, පලාබනවා, සැඟවියනවා
Fly, s. මස්ස, මැස්සා, මදුරුවා
Foal, s. අස්පැටියා
Foal, v. a. අස්පැටියන්ප්‍රසූතකරනවා
Foam, s. පෙණ
Foam, v. n. පෙණවෙනවා, රළවෙනවා
Fob, v. a. ප්‍රයෝගකරනවා, වංචාකරනවා
Focal, a. කාච්ඡරයටවූ, දිෂ්ටිමණ්ඩලේවූ
Focus, s. කාච්ඡරයාව, දිෂ්ටිමණ්ඩලය
Fodder, s. මුනයින්ගේ සූදුකාහාර

Fodder, v. a. මුහශින්ට සුප්කා කොරදෙනවා

Foe, s. ශත්‍රුවා, විරුඩකාරයා, ප්‍රදිවිකාරයා

Fœtus, s. දරුගැබිහිස

Fog, s. මීහිදුම

Foggy, a. අඳුර, මීහිදුම්වූ

Foh, interj. ඉස්, ඡී

Foil, v. a. *frustrate*, නවතනවා; *conquer*, ජයගන්නවා

Foil, s. නැවතීම, ජයගැනීම

Foist, v. a. උඩොබවන්ලියනවා

Fold, s. *for sheep*, පට්ටිය; *double*, දෙපටකිරීම

Fold, v. a. *as sheep*, පට්ටිකරනවා; *to double*, නවනවා, පටලනවා

Foliage, s. පත්‍ර, කොළ

Folk, s. සමූහය, සමූදුව, ජනයෝ

Follow, v. a. *to go after*, අනුවයනවා, පස්සෙයනවා, පසුගමන්යනවා; *to succeed*, උත්තෙවෙනවා, පැමිනෙනවා; *to imitate, to copy*, සදිසකරනවා, ආදිසයකරනවා, ආකාරකරනවා; *to attend to*, සිතාරගෙනවා

Follower, s. පසුගමන්යන්නා, පස්සෙයන්නා, අනුවයන්නා

Folly, s. නිබුද්ධිකම, මුකාඩිකම, පිස්සුකම, මෝඩකම, අඥානකම

Foment, v. a. උණුකරනවා, තවනවා, කාසියනවා

Fomentation, s. උණුවතුරෙන්තැවීම

Fond, s. ආදරය

Fondle, v. a. ආදරයකරනවා, සුරතල්කරනවා

Fondler, s. ආදරයකරන්නා, සුරතල්කරන්නා

Fondling, s. ආදරයලබන්නා, සුරතල්විදින්නා

Fondly, ad. ආදරයලෙස, සුරතල්ලෙස

Fondness, s. ආදරකම, සුරතල්කම

Font, s. බව්තිස්මකරන වතුර භාජනය; *see to baptize*,

Food, s. අහාර, ආහාරය, භෝජනය, කෑම

Fool, s. නිබුද්ධියා, මුකාඩියා, අඥානයා, පිස්සා, මෝඩයා

Fool, v. a. කවටකම්කරනවා

Fool, s. පිස්සා, මෝඩයා

Foolery, s. නිබුද්ධිකම, මුකාඩිකම, අඥානකම, පිස්සුකම

Foolhardy, a. මුකාඩිවීරවූ

Foolish, a. නිබුද්ධිවූ, මුකාඩිවූ, අඥානවූ, මෝඩවූ

Foolishly, ad. නිබුද්ධිලෙස, මුකාඩිලෙස, අඥානලෙස, මෝඩලෙස

Foolishness, s. නිබුද්ධිකම, මුකාඩිකම, අඥානකම, මෝඩකම

Foot, s. පාදය, කකුල, පය; *the bed's foot*, ඇඳකකුල; *the foot of the pillar*, කනුමුල; *the foot of a mountain*, කන්දපාමුල; *the*

foot of a wall, බිත්තියේ පඩිය; *to go on foot*, පයින් යනවා; *to tread under foot*, පයින් පාගනවා; *a foot soldier*, පාබලසේවකයා; *to set on foot*, සමිත් උපදිනවා; *foot path*, පාමග; *foot stool*, පාදපීඨය, පාපුටුව; *foot step*, අඩිය; *five feet long*, පස්අඩියක දුර; *foot bridge*, පයින්යන පාලම; *footing, ground for the foot*, පාතැබීම බිම; *foundation, state*, පදනම, අඩම

Footman, *s. foot soldier*, පාබලසේවකයා; *kind of servant*, මෙහෙකාරයා; *racer*, දුවන්නා

Foot, *v. a.* සත්මන්කරනවා; *to kick*, පයින්අනිනවා

Fop, *s.* පාරම්බුකාරයා, ආඩම්බරයා

Foppish, *a.* පාරම්බුවූ, ආඩම්බරවූ

For, *prep. because of*, නිසා, හින්දා, නිසා, පිණිස, *he suffered for his imprudence*, ඔහුගේ අප්‍රවේසම්කම්බැවින් ඔහු දුක් වින්දේය; *let no man for his own poverty become more oppressive in his transactions*, කිසි මනුෂ්‍යයෙක් තමාගේ දුප්පත්කම හැර ඔහුගේ ක්‍රියාවෙන් වෙහෙස නොකරන්නේය; *for fear of discovery the plot was abandoned*, කුමන්ත්‍රණය දැනගැනීමෙහි භයනිසා එය අත්හැරුනේය; *for this cause we faint not*, මේකාරණාව නිසාඅප කලාන්ත නොවන්නෙමු; *for that reason*, ඒකාරණාවනිසා; *in the place of, instead of*, උදෙසා, වෙනුවට; *I received this for the one I lost*, නැතිවූ දේවෙනුවට මේක මට ලැබුණා; *if a man suffer for his friend he gives proofs of the sincerity of his friendship*, යම් මනුෂ්‍යයෙක් ඔහුගේ මිත්‍රයා උදෙසා වදවින්දේනම් එයින් ඔහුගේ මිත්‍රභාවයේ ඇති සිද්ධවූ සාක්ෂිදෙන්නේය; *on account of*, කාරණාකොටගෙන, *persecute no man for his religious opinions*, යමෙක්තමාගේ දේවභක්ති විශ්වාසනාව කාරණාකොටගෙන ඔහුට පීඩාකොකරන්නේය; *in search of*, සොයනා පිණිස, *to be always for one's own ends is a proof of a penurious disposition*, යමෙක්තමාගේම ප්‍රයෝජනය පිණිසම සොයනා වාසනාවෙන් ලෝභකමෙහි ගතිය ඒකාන්තම සාක්ෂිදෙන්නේය; *when this word occurs as a conjunction it is translated by such terms as*, කුමක්හෙයින්ද, මක්නිසාද, හින්ද, මන්ද; *for if the tree be good the fruits will be good also*, කුමක්හෙයින්ද වෘක්ෂය යහපත්නම් එලත් යහපත්වන්නේය; *I went not for it was too late*, මම ගියේ නෑ, මක්නිසාද බොහෝකාම කළ

ල් ප්‍රමාදව තබුනා; *for you are well known here,* මෙහිදී තො මුසේලමහි යෙසපත්කොට හැඳි නාකනාහියෙ; *for why, what for,* මක්නිසා; *why do you do that,* තමුසේ ඒක කරන්නේ මන් ද; *were it not for you,* තමුසේට නැත්නම්; *I take it for granted,* ඒක මම සැබෑව ට ගන්නවා; *for two days,* දෙ දවස අතරෙහි; *for his share,* ඔහුගේ කොටසට; *for the time to come,* මතුඑනකාලය ට; *for the present,* දැනට; *as for me,* මට නම්; *it is not for us to undertake that matter,* අප ට ඒකාරණාව පාවාගැණිබැරි ය

Forage, v. a. *to plunder,* උදුරාගන්නවා; *to search for provisions,* කෑමද්‍රව්‍යසොයනවා

Forage, s. උදුරාගැනීම, අහාර සෙවීම, කෑමද්‍රව්‍යසපයීම; *see the verb*

Forbear, v. a. වලක්වනවා, නොකරසිටවනවා, නවත්වනවා

Forbearance, s. වැලැක්වීම, නොකරසිටවීම, නැවැත්වීම, ඉවසීම

Forbid, v. a. තහනම්කරනවා, වලක්වනවා

Forbidder, s. තහනම්කරනනා, වලක්වන්නා

Forbidding, a. තහනම්කරනනාවූ, එදිරිකාරණාවූ

Force, s. ශක්තිය, ශරය, බලය, සවිය

Force, v. a. ශක්තිකරනවා, ශරයදෙනවා, බලයදෙනවා

Forcedly, ad. බලෙන්

Forceless, a. දුර්වල, බලනැති, සවිනැති

Forcer, s. බලකරන්නා, සවිකරන්නා, තදකරන්නා

Forcible, a. බලත්කාරවූ, ශක්තිවූ, තදවූ, බලවූ, සවිවූ

Forcibly, ad. බලත්කාරයෙලස, ශක්තියෙලස, සවියෙලස, තදයෙලස

Ford, s. *a stream,* ජලධාරාව; *shallow part of a river,* දියබැසින්තා

Ford, v. a. දියේබැසලායනවා, එතරයනවා

Fordable, a. දියේබැසලායඩපුළුවන්වූ, එතරයඩපුළුවන්වූ

Fore, a. ප්‍රථම, පළමු, ආදි, ඉසස්ර

Forearm, a. ප්‍රථමයෙන් ආවුධම ලීමෙලකාරගන්නවා

Forebode, v. a. නිමිත්තකියනවා

Foreboder, s. අනාගතවිාකාය කියන්නා, නිමිතිකියන්නා

Forecast, v. a. ප්‍රථමයෙන් සපයාගන්නවා

Forecast, s. ප්‍රථමයෙන් සපයාගැනීම

Forechosen, s. ප්‍රථමයෙන් තෝරාගත්තා

Fore-end, s. ප්‍රථමකොනා

Forefather, s. පූර්වපුරුෂයා, මුතුන් මුත්තන්

Forefinger, s. තර්ජනිය, දබරඇඟිල්ල

Forefoot, s. ඉස්සරහකකුල

Forego, v. a. *to quit*, පහවෙනවා; *to go before*, ඉස්සරවෙලා යනවා

Foreground, s. ඉස්සරඅහබිම

Forehead, s. ලලාටය, නළල

Foreign, a. අන්‍යවූ, විදේශිවූ, පරදේශිවූ, ආගන්තුකවූ

Foreigner, s. අන්‍යදේශියා, විදේශියා, පරදේශියා

Forejudge, v. a. පලමුවෙන් විනිශ්චයකරනවා, ප්‍රථමයෙන් කල්පනාකරනවා

Foreknow, v. n. ප්‍රථමයෙන් දැනගන්නවා

Foreknowledge, s. පූර්වඥානය, ප්‍රථමයෙන්දැනගැන්ම

Foreland, s. ප්‍රථමභූමිය, තුඩුව

Forelay, v. n. රැකබලනවා

Forelock, s. නළල්කෙස්ගොඩ

Foreman, s. ප්‍රධානියා, නායකයා

Forementioned, a. ඉහතසඳහන්කල, ප්‍රථමකී

Foremost, a. පූර්වවූ, පලමුවූ, ප්‍රථමවූ

Forenamed, a. ප්‍රථමනාමලත්

Forenoon, s. පූර්වාහ්නකාලය, පෙරවරභාගය, උදයකාලය

Forenotice, s. ප්‍රථමදැනගැන්ම, පලමුදැන්වීම

Forensic, a. ව්‍යවස්ථාවටඅයිතිවූ, විනිශ්චයටඅයිතිවූ, පනතට අයිතිවූ, අනාකීර්මටඅයිතිවූ

Foreordain, v. a. පූර්වයෙහි නියෝගකරනවා, පලමුපත්කරනවා

Forepart, s. ප්‍රථමපැත්ත, ඉස්සරහපැත්ත

Forerank, s. ප්‍රථමපෙල

Forerun, v. a. ප්‍රථමයෙන්දුවනවා, පෙරටුවදුවනවා, ඉස්සරින්දුවනවා

Forerunner, s. ප්‍රථමයෙන්දුවන්නා, පෙරටුවදුවන්නා, ඉස්සරින්දුවන්නා; *a prognostic*, ලකුණුපෙන්වනදෙය

Foresay, v. n. අනාගතවාක්‍යය කියනවා, ශාස්තරකියනවා

Foresee, v. a. පූර්වදර්ශනයකරනවා, ප්‍රථමයෙන් දකිනවා

Foreshew, v. a. අනාගතවාක්‍යය දක්වනවා, අනාගතලකුණු පෙන්වනවා

Foresight, s. පූර්වඥානය, ප්‍රථමදැනගැන්ම

Foreskin, s. චර්මාග්‍රය

Forespeak, v. n. අනාගතවාක්‍යයකියනවා

Forespent, a. ප්‍රථමයෙන්වියදම්කලාවූ

Forest, s. වනාන්තරය, ආරණ්‍යය, කැලෑව

Forestal, v. n. ප්‍රථමයෙන්වැඩවී ලුමකනනවා

Forestaller, *s.* පළමුවෙන්වැඩිමිළට ගන්නා

Forester, *s.* දඩයක්කාරයා, අරණ්‍යවාසයා

Foretaste, *v. a.* අනාගතරසය ගන්නවා

Foretaste, *s.* අනාගතරසයගැනීම

Foretell, *v. a.* අනාගතවාක්‍යය කියනවා, මතුවෙනදෙය කියනවා

Foreteller, *s.* අනාගතවාක්‍යය කියනනා, මතුවෙයදෙනදෙය කියනනා

Forethink, *v. n.* අනාගතයසිහි කරගන්නවා, අනාගතයදැ නගන්නවා

Forethought, *s.* අනාගතයකල්ප නාකරගැනීම, අනාගතයදැ නගැනීම

Foretoken, *v. n.* අනාගතලකුණු පෙන්වනවා

Foretoken, *s.* අනාගතලකුණු පෙන්වීම

Foretooth, *s.* ඉස්සරහදත්

Forewarn, *v. a.* ප්‍රථමයෙන්අඩවා දදෙනවා, පූර්වයෙන්දන්වන වා, කල්තියාදන්වනවා

Forfeit, *s.* දඩ

Forfeit, *v. a.* දඩගෙවනවා

Forfeiture, *s.* දඩගැසීම

Forefend, *v. a.* බාධාකරනවා, තහනම්කරනවා

Forge, *s.* කම්මල, පට්ටලේ

Forge, *v. a.* බොරුඅතගන්කරන වා, බොරුලියුම්ලියනවා

Forger, *s.* බොරුඅතහන්කරන් නා

Forgery, *s.* බොරුඅතහන්කිරීම

Forget, *v. a.* මතකනැතිකරන වා, සිහිනැතිකරනවා, කල් පනානැතිකරනවා

Forgetful, *a.* මතකනැතිවූ, සිහි නැතිවූ

Forgetfulness, *s.* මතකනැතික ම, සිහිනැත්කම

Forgive, *v. a* ක්ෂමාවෙනවා, ක මාවෙනවා

Forgiveness, *s.* ක්ෂමාව, කමාව

Forgiver, *s.* ක්ෂමාකරනනා, ක මාකරනනා

Forgot, forgotten, *part. pass.* සිහි නැති, මතකනැති

Fork, *s.* මස්කටුව; ගාරුප්පුව; *Portuguese*

Forlorn, *a.* නාස්තියටපැමුණුනා වූ, අසරණවූ, අත්හැරුනාවූ

Form, *v. a. to make,* මවනවා, තන නවා, සාදනවා; *to model,* ප්‍රකාරයකරනවා, ආකාරය කරනවා, අන්දමකරනවා

Formal, *a. ceremonial,* චාලිත්‍රවූ, පෙළහරවූ; *methodical,* ආකා රවූ, ප්‍රකාරවූ, අන්දමවූ

Formalist, *s.* ලුතුපෙනීම්වලට ප්‍ර සන්නඅය

Formality, *s.* පෙළහර, චාලිත්‍රය, සිරිත

Formalize, *v. a.* අන්දම්කරනවා, ප්‍රකාරකරනවා

Formally, *ad.* චාලිත්‍රලෙස, පෙළ හරලෙස, භාවනාලෙස, සි

රීත්‍යලෙස, ව්‍යවහාරලෙස

Formation, *s.* මැවීම, සෑදීම, ප්‍රකාරකිරීම; *see the verb*

Former, *s.* මවන්නා, සාදන්නා, ආදිශාස්ත්‍රකාරන්නා, ප්‍රකාරකරනා

Former, *a.* පූර්ව, ප්‍රථම, පළමු, ආදි, පෞරාණ

Formerly, *ad.* ආදි, ආදිකෙදිමෙන්, පූර්වසරලෙස, ප්‍රථමලෙස

Formidable, *a.* ත්‍රස්තවූ, භයානකවූ, භීතවූ, භයවූ

Formidably, *ad.* ත්‍රස්ථලෙස, භයානකලෙස, භීතලෙස, භයලෙස

Formless, *s.* අරූපවූ

Formulary, *s.* වාලිස් ප්‍රපෝස්තකය

Formula, *s.* වාලිත්‍රකිරීම, පෙළහරකිරීම

Fornicate, *v. a.* පරදාරකරනවා, වේශ්‍යාගමිකරනවා

Fornication, *s.* පරදාරකිරීම, කාමමිත්‍යාචාරකිරීම, වේශ්‍යාකම්කිරීම

Fornicator, *s.* පරදාරගාමියකාරන්නා, කාමමිත්‍යාචාරකාරන්නා, වේශ්‍යාගාමිකාරනානා

Forsake, *v. a.* අත්අරිනවා

Forsaker, *s.* අත්අරිනනා

Forsooth, *s.* සැබෑව

Foreswear, *v. n.* බොරුදිවුරනවා

Foreswearer, *s.* බොරුදිවුරන්නා

Fort, *s.* කෝප්පුර, කොටුව, කෝට්ටවිය

Forth, *ad.* පටන්, පිටව; *from this time forth,* මෙතැන්පටන්; *and so forth,* යනාදි; *to go forth,* පිටතටයනවා; *to set forth,* ඒලිඛයේතබනවා; *to set forth on a journey,* ගමනට පටන්ගන්නවා; *to set forth a book,* පොතක් ප්‍රසිද්ධකරනවා; *forth coming,* පිළිවෙලටසිටිනාවූ, මනාගහාවූනාවූ; *forth issuing,* පිටතටබැසීම; *forth with,* වහාම, ක්ෂණයෙහිම, අප්‍රමාදව, එකකෙනෙහිම

Fortieth, *a.* හතලිස්වෙනි

Fortification, *s.* සුරක්ෂිතකිරීම, කොටුසෑදීම, පවුරුසෑදීම, කෝට්ටසෑදීම

Fortifier, *s.* කොටුසාදන්නා, පවුරුසාදන්නා, කෝට්ටසාදන්නා

Fortify, *v. a.* සුරක්ෂිතකරනවා, කොටුකරනවා, පවුරුකරනවා, කෝට්ටසාදනවා

Fortitude, *s.* වීර්‍ය්‍ය, ධෛර්‍ය්‍ය, වික්‍රම, බල, හිත්දැඩි

Fortnight, *s.* දෙසතිය; සුමානදෙක; *Portuguese*

Fortress, *s.* කොටුව, කෝට්ටය

Fortuitous, *a.* ඉරණම්වූ, අහම්බවූ

Fortuitously, *ad.* ඉරණම්ලෙස

Fortunate, *s.* භාග්‍යවන්ත, පුණ්‍යවන්ත, වාසනාවන්ත

Fortunately, *ad.* භාග්‍යවන්තලෙ

වාසනාවන්තලෙස, පින්වන්ත ලෙස

Fortune, *s. the power supposed to distribute the lots of life*, ඉරණම, අනාතම ; *success, good luck*, කුසල, පින්වන්තකම; *estate, possession, portion*, උරුමය, දායාදය

Eortune, *v. a.* සිඩවෙනවා

Fortune teller, *s.* වාසනාඅවාසනා කියන්නා, කුසලඅකුසල කියන්නා

Forty, *a.* හතළිහ

Forum, *s.* විනිශ්චයශාලාව, ප්‍රසිඩ ස්ථානය

Forward, *ad.* ඉදිරියට, ඉදිරිපිටට; *to go forward*, ඉදිරිපිටටයනවා, මතුවයනවා; *to put one's self forward*, තමන් ඉදිරිපිටට තබනවා; *from that time forward*, එතැන්පටන් මත්තට; *to stretch one's hand forward*, අතදිගුකරනවා

Forward, *v. a.* අරිනවා, උදවුවෙනවා, වැඩිදියුණුකරනවා

Forwardet, *s.* උදවුකරන්නා

Fotwardly, *ad.* ශීඝ්‍රලෙස, ඉක්මන්ලෙස

Forwardness, *s. unbecoming assurance*, උඩඟුකම; *state of readiness*, පිළියෙලවීම, සූදානම්වීම

Forwards, *s.* ඉදිරිපිටට, මතුපිටට

Fossil, *s.* පොළවහාරනවස්තු

Foster, *v. a.* රක්ෂාකරනවා, සාත්තුකරනවා

Fosterer, *s.* රක්ෂාකරන්නා, සාත්තුකරන්නා

Foul, *s.* මලින, කිලුටු; *foul weather*, බිරුණුකාලෙ; *foul dealing*, අයුතු වෙළඳාම්කිරීම; *foul language*, නීචකථාකිරීම

Foul, *v. a.* මලිනකරනවා, කිලුටුකරනවා

Foulmouthed, *a.* දුර්මුඛ, පරුෂවචන කියන්නා, නීචකථාකියන්නා

Foulness, *s.* මලිනකම, කිලුටුකම, නීචකම, කුනුකම, අපවිත්‍රකම

Found, *v. a. to lay a foundation*, අත්තිවාරම්දමනවා; *as in a foundery*, ලෝමනනවා; *to erect*, සදනවා, ඉදිකරනවා; *to establish*, නියමකරනවා

Foundation, *s.* අත්තිවාරම, පදනම, මුල, පතුල

Founder, *s.* අත්තිවාරම්තබන්නා, පදනම්බඳින්නා; *moulder*, ලෝහමනන්නා

Founder, *v. n.* ගිලෙනවා, කිඳනවා, බසිනවා

Foundry, *s.* ලෝහමනනස්ථානය, ලෝවැඩ වාත්තුකරන ස්ථානය

Fount, fountain, *s.* උල්පත

Fountainless, *a.* උල්පත්නැති

Four, *a.* චතුර්, සිව්, හතර

Fourfold, *a.* සතරගුණයක්වූ, ස

'තාරවරත්වූ

Fourfooted, *a.* සිවුපා, සතරගා තේඅැති

Fourscore, *a* අසූව

Foursquare, *a.* චතුස්කෝණ, සතරැස්

Fourteen, *a.* තුදුස, දහතරක

Fourteenth, *a.* තුදුස්වෙනි, දහතරවෙනි

Fourth, *a.* සතරවෙනි

Fourthly, *ad.* සතරවෙනිලෙස

Fourwheeled, *a.* සිවුවලලුවූ, සතරවලලුවූ

Fowl, *s.* කුකුළා, කුකුලා

Fowl, *v. n.* පක්ෂිදඩයම්කරනවා

Fowler, *s.* පක්ෂිවැද්දා, කුරුලුදඩයම්කාරයා, පක්ෂිදඩයම් කාරයා, පක්ෂිදඩයම්කරන්නා

Fox, *s.* (*jackall?*) නරිනාකිලා, සිගාලයා, සිවලා, නරියා

Foxhunter, *s.* සිවල්දඩයම්කාරයා

Fract, *v. a.* කඩනවා, බිදිනවා

Fraction, *s.* බිදීම

Fractional, *a.* බිදින්නාවූ

Fracture, *s.* වෙන්වීම, බිදීම

Fracture, *v. a.* භග්නකරනවා, බිදිනවා

Fragile, *a.* බුරුල්, බෙලහීන

Fragment, *s.* කෑබැල්ල

Fragmentary, *a.* කෑබැලිවූ

Fragor, *s.* ශබ්දයෙන්පිපිරීම

Fragrance, *s.* සුගන්ධය, සුවඳ

Fragrant, *a.* සුගන්ධවූ, සුවඳවූ

Fragrantly, *ad.* සුගන්ධලෙස, සුවඳලෙස

Frail, *a.* දුබල, නොබඩත්තු, වසන්නෝවූ

Frailness, *s.* දුබලකම, නොබඩත්තුකම, වසන්නෝවූකම

Frailty, *s.* දුබලවීම, නොබඩත්තුවීම, වසන්නෝවූවීම

Frame, *s.* බුන්දුකිලය; රාමුව

Frame, *v. a.* *to form,* සාදනවා, *to contrive,* සිතින්යොදනවා

Framer, *s.* සාදන්නා

Franchise, *s.* නිදහස, නිස්කාලන්තය

Franchise, *v. a.* නිදහස්කරනවා, නිස්කලන්තකරනවා

Frangible, *a.* බුරුල්වූ, බෙලහීනවූ

Frank, *a.* *ingenuous, impartial,* පාපවිසකමනැතිවූ; *sincere,* යහපත්වූ; *unrestrained,* නිදහස්වූ

Frank, *v. a.* නිදහස්කරනවා

Frankincense, *s.* කුවරලා, කට්ට කුමන්චල්

Frankly, *ad.* දයාලෙස

Frankness, *s.* පාපවිසකමනැති කම, යහපත්කම; *see the adj.*

Frantic, *a.* පිස්සු, උන්මාද

Franticly, *ad.* උන්මාදලෙස; පිස්සුලෙස

Fraternal, *a.* සහෝදරවූ, සහෝදරවූ

Fraternity, *s.* *brotherhood,* සහෝදරභාවය, සහෝදරකම, එකාරය; *society,* සභාව, සමාගම

Fratricide, *s.* සහෝදරයාමැරීම

Fraud, *s.* බොරු, රැවටිලි, වංචා, ප්‍රයෝග, දඟ

Fraudulent, *a.* බොරුවූ, වංචාවූ, ප්‍රයෝගවූ, දඟවූ, රැවටිලිවූ

Fraudulently, *ad.* බොරුලෙස, වංචාපරිද්දෙන්, ප්‍රයෝගපරිද්දෙන්

Fraught, *part.* පරිපූර්ණකළා, සම්පූර්ණකළා, පිරෙවූවා

Fray, *s.* පොරඅැල්ලීම, සඩගුව

Fray, *v. a.* ගානවා, උරච්චකරනවා, ගෙවනවා

Freak, *s.* වික්ෂිප්තකිරීම, චපලත්වය

Freak, *v. a.* නානාවර්ණකරනවා

Freakish, *a.* වික්ෂිප්තවූ, චපලවූ

Freckle, *s.* නානාවර්ණකිරීම

Freckled, *a.* නානාවර්ණවූ

Free, *v. a.* නිදහස්කරනවා, නිස්කලන්කකරනවා

Free, *a.* නිදහස්වූ, නිදීදසවූ, නිස්කලන්කවූ

Freebooter, *s.* සොරා, කොල්ලකාරයා, උදුරන්නා

Freeborn, *a.* නිදහස්ලෙසඋපන්, නිදීදසලෙසඋපන්

Freecost, *s.* නිදහස්වූවියදම

Freedman, *s.* නිදීදසයා, නිදහස්ලැබූනුඅය

Freedom, *s.* නිදහස්කම, නිදහස්වීම

Freehold, *s.* නින්දෙද්බුත්තිවිඳිනදේය

Freeholder, *s.* නින්දෙද්බුත්තිවිඳිනගමඅැත්තා

Freely, *ad. without restraint,* නිදහස්ලෙස, නිදොස්ලෙස *of it's own accord,* හිතවූපරිද්දෙන්

Freeman, *s.* නිදීදසයා, නිදහස්වීමලැබූනුඅය

Freeminded, *a.* නිදහස්සිතවූ

Freeness, *s.* නිදීදසකම, නිදහසකම

Freewill, *s.* නිදීදසවූමනාපය, නිදහස්වූහිතවිල්ල

Freewoman, *s.* නිදීදසස්ත්‍රිය

Freeze, *v. n.* සීතලෙන්මිදෙනවා

Freight, *v. a.* පටවනවා, බරකරනවා

Freight, *s.* පැටවීම, බරකිරීම

Frenetic, *a.* උන්මාදවූ, පිස්සුවූ

Frenzy, *s.* උන්මාදකම, පිස්සුකම

Frequence, *s.* සමෝහය, සමාගම

Frequency, *s.* නැවත නැවත

Frequent, *a.* මුහුර්මුහුඃ, පුනඃපුනඃ, නැවතනැවත

Frequent, *v. a.* නිතරසම්ප්‍රාප්තවෙනවා, නැවතනැවතඑනවා

Frequenter, *s.* නිතරසම්ප්‍රාප්තවෙන්නා, නැවතනැවතඑන්නා

Frequently, *ad.* නිතර, බොහෝවිට, නැවතනැවතලෙස

Fresh, *a.* අභිනව, අලුත්

Freshcourage, *s.* අභිනවවූ වීර්‍යය, අලුත්හිත්දැඩිකම

Freshlooking, a. අළුත්පෙනීමවූ

Freshen, v. a. අළුත්කරවනවා

Freshly, ad. cold, සීතලලෙස; newly, අළුත්ලෙස

Freshness, s. සීතලකම, අළුත්කම; see the adj.

Fret, s. සිත්විවලුවීම, අසතුටුවීම

Fret, v. a. to deject, සාංකාවෙනවා; to make angry, අසතුටුකෙරෙනවා; to vex, කරදරකරනවා, කෝපකරනවා; to wear away by rubbing, ගෙවෙනවා; to varegate, නානාප්‍රකාරකරනවා

Fretful, a. කනගාටුවූ, අසතුටුවූ, කෲරවූ, කරදරවූ; see the verb

Fretfully, ad. කනගාටුලෙස, අසතුටුලෙස, කෲරලෙස, කරදරලෙස

Fretfulness, s. කනගාටුකම, අසතුටුකම, කෲරකම, කරදරකම

Friary, a. විහාරෙ

Friction, s. උරච්චකිරීම, ඉලීම

Friday, s. සිවිද්දිනා, සිකුරාද

Friend, s. මිත්‍රයා, යාළුවා, විශ්වාසයා, ප්‍රේමයා

Friendless, a. විශ්වාසනැතිවූ, අමිත්‍රවූ

Friendliness, s. මිත්‍රකම, යහළුකම, විශ්වාසකම

Friendly, a. මිත්‍රලෙස, යහළුලෙස, විශ්වාසලෙස

Friendship, s. මිත්‍රභාවය, යහළුභාවය, විශ්වාසභාවය

Frigate, s. යුධනැව

Fright, v. a. භීතකරනවා, භයකරනවා, තැතිගන්වනවා

Fright, s. භීතය, භය.

Frighten, v. a. භයකරනවා, තැතිගන්වනවා

Frightful, a. භයානකවූ, භීතවූ, බයවූ

Frightfully, ad. භයානකලෙස, භීතලෙස, භයලෙස

Frigid, a. සිහිල්වූ, සීතලවූ

Fringe, s. වාටියසැදීම

Fringe, v. a. වාටියසාදනවා

Frippery, s. පාත්පඩ, කඩමාළු

Frisk, v. n. to skip, to dance, පනිනවා, නටනවා; to play, සෙල්ලම්කරනවා

Frisk, s. පැනීම, නැටීම, සෙල්ලම

Frisky, a. පනිනසුළුවූ, නටනසුළුවූ, සෙල්ලන්වූ

Fritter, s. පෙති

Fritter, v. a. පෙතිකපනවා

Frivolous, a. නිරාර්ථකවූ, නිස්ඵලවූ, අවැඩවූ

Frivolously, ad. නිරාර්ථකලෙස, නිස්ඵලලෙස, අවැඩලෙස

Frizle, v. a. රැලිගහනවා

Frizler, s. රැලිගහන්නා

Fro, ad. මොබ; to and fro, ඔබ මොබ

Frock, s. ඇඳුම්ගවුම

Frog, s. මඩිකයා, ගෙම්බියා, ගෙඹා, මැඩියා

Frolic, s. සෙල්ලම

Frolic, v. n. සෙල්ලම්කරනවා

Frolicsome, *a.* සෙල්ලම්වූ

From, *prep.* කෙරෙන්, ගෙන්, යෙන්, ඉන්, සිට, හිට, පටන්, *these are a few of the particles by which this preposition is rendered into Singhalese, and usually follow the word to which they belong, as a few examples will shew: light proceeds from the sun,* සූර්‍ය්‍යයාකෙරෙන් ආලෝකය විහිදෙන්නේය; *the messengers departed from the presence of the king,* රජ්ජුරුවන්ගේ අභිමුඛයෙන් පනිවිඩකාරයෝ නික්මගියෝය; *it is the duty of man to celebrate the glory of God from the consideration of the greatness of his works,* දෙවියන්වහන්සේගේ ක්‍රියාවල මහත්බව කල්පනාකරන්නා උන්වහන්සේගේ මහානුභාවයට ප්‍රසංසාකරන මනුෂ්‍යයාට නියමයක් තිබෙන්නේය; *it is about seventy three miles from Colombo to Galle,* කොළඹහිට ගාල්ලට හැතැක්ම හැත්තෑතුනක් පමණ තිබෙන්නේය; *from the beginning,* ආරම්භයපටන්; *from the creation of the world,* ලෝකයේ මැවීමේසිට; *from everlasting,* සදාකාලයෙන්; *from my youth up,* මාගේ යෞවනයේ පටන්; *from above,* ඉහළින්, උඩින්; *from afar,* දුරස්තරයෙන්, දුරින්; *from beneath,* පහතින්; *from behind,* පස්සෙන්; *from day to day,* දිනෙන්දිනට, දවසින් දවසට; *from one to the other,* එකිනෙකට; *from that time to this,* එකාලේපටන් මේකාලයට; *distant from each other,* එකිනෙකට දුර; *I received the information from himself,* මට මූහුණෙන්ම දැනගන්නලැබුණා

Front, *s.* අභිමුඛ, ඉදිරිපිට, පෙරමුළ, ඉස්සරහපිට

Front, *v. n.* අභිමුඛවෙනවා, ඉදිරිපිටවෙනවා

Frontier, *s.* දේසන්තරය, රටේ ඉම, දේසයෙහි අද්දර

Frontless, *a.* නිර්ලජ්ජිත, ලැජ්ජනැති

Frontroom, *s.* ඉදිරිපිටගෙය

Frost, *s.* මිදීම, කැටිගැහීම

Frosty, *a.* මිදුණාවූ, කැටිගැහුණාවූ

Froth, *s.* පෙණ

Froth, *v. n.* පෙණවෙනවා

Frothily, *ad.* පෙණආකාරවූ

Frothy, *a. foamy,* පෙණවූ; *vain, trifling,* නිරාර්ථකවූ, නිෂ්ඵලවූ

Froward, *a.* නොහික්මෙන, වෛර

Frowardly, *ad.* නොහික්මෙනලෙස, වෛරලෙස

Frowardness, *s.* නොහික්මෙනකම, වෛරකම

Frown, *v. a.* මූනපුළුවූකරනවා, මූනමැලිකරනවා

Frown, *s.* මුහුණපුළුවූකිරීම, මු

ඝූනාමෙලිකිරීම

Frozen, *part.* මිදුනා, කැටිගැසුනා

Fructiferous, *a.* ඵලදරවූ

Fructification, *s.* ඵලදැරීම, ඵලහටගැනීම

Fructify, *v. a.* ඵලදරනවා, ඵලහටගන්නවා

Fructuous, *a.* ඵලදරවූ

Frugal, *a.* සකස්සුරුවන්, ප්‍රවේසම්, හැමනුම්වූ

Frugality, *s.* සකස්සුරුවන්කම, ප්‍රවේසම්කම, හැමනුම්කම

Frugally, *ad.* සකස්සුරුවන්ලෙස, ප්‍රවේසම්ලෙස, හැමනුම්ලෙස

Fruit, *s.* ඵලය, ගෙඩිය

Fruitful, *a.* ඵලදර, ගෙඩිහැබෙනා

Fruitfully, *ad.* ඵලදරලෙස

Fruitfulness, *s.* ඵලදරකම

Fruition, *s.* භුක්තිවිඳීම, වැඩවිඳීම, ඵලවිඳීම

Fruitless, *a.* නිස්ඵල; *vain,* නිරාර්ථක, අකාරණ, නිෂ්කාරණ

Fruit-tree, *s.* ඵලවෘක්ෂය, ගෙඩිගහ

Frustrate, *v. a.* නොඉෂ්ටකරනවා, ඉෂ්ටනොවෙනවා, බාධාකරනවා, නිරාර්ථකකරනවා

Frustrate, *a.* නිෂ්ප්‍රයෝජනවූ, නිරාර්ථකවූ

Frustration, *s.* ඉෂ්ටනොවීම, බාධාකිරීම, නිරාර්ථකකිරීම

Frustrative, *a.* ඉෂ්ටනොවෙනනාවූ, බාධාකරන්නාවූ

Fry, *v. a.* බදිනවා

Fryingpan, *s.* බදිනාවලඳ

Fuel, *s.* ගිනිගාන්දුන්දර, දවට

Fugitive, *a.* සචාරයා, විදේශියා, පැදබසා

Fulfil, *v. a.* ඉෂ්ටකරනවා, සම්පූර්ණකරනවා, සම්පාදනයකරනවා

Fulgency, *s.* තේජස, දීප්තිය

Fulgent, *a.* තේජවන්තවූ, දීප්තිවූ

Full, *a.* සම්පූර්ණ, පුරා, පුරාම, පිරී; *person of full age,* සම්පූර්ණවයසෙහි යමෙක්; *full of days,* බොහෝදිනවූ; *a full year,* සම්පූර්ණවූ වර්ෂයක්; *full of sorrow,* දුක්ඛිතවූ, දුක්භරිතවූ; *hands full of business,* අත්පුරාවැඩ; *after a full perusal of the papers,* ආරන්චිපත්‍රය සම්පූර්ණයෙන් දුටුවායින්පසු; *he is too full of words,* ඔහු බොහෝවචනවල්න් යුක්තය; *the full worth,* සම්පූර්ණඅගය; *with full speed,* ඉක්මන්කමින් සම්පූර්ණවූ; *a full stop,* නැවතීමක ලකුණක්; *full moon,* පූර්ණචන්ද්‍රයා, පුන්සඳ; *to the full,* සම්පූර්ණවීමට; *he is full a hundred years old,* ඔහුට සියක් වරුෂයයි; *he is full as wise as before,* ඔහු පලමුමෙන්ම ප්‍රඥාවන්-යුක්තයි; *full well,* ඉතායහපත්; *full enough,* ඉතාඅපුරුව; *full bodied,* සථූලාකාර; *mouthful,* පුරාම්කටක්; *a a handful,* පුරාඅහුර; *full nigh,* ඉතාසමීප

Full, *v. a.* පිරිසිදුකරනවා

Fuller, *s.* රදවා, අප්පුලන්නා

Fuller's earth, *s* අප්පුලනපස්

Fully, *ad.* පූර්ණලෙස, පිරුම්ලෙස

Fulminant, *a.* ගිගිරුම්, මහසංඝර්ෂනාව

Fulminate, *v. n.* මහසංඝර්ෂනාකරනවා, තර්ජනාකරනවා

Fulness, *s.* සම්පූර්ණකම

Fulsome, *a.* කැහැවූ, දුගඳවූ, පිළිකුල්වූ

Fumble, *v. n.* අදක්ෂලෙසකරනවා, නොදන්නාලෙසකරනවා

Fumbler, *s.* අදක්ෂලෙසකරන්නා, බැරිලෙසකරන්නා

Fume, *s.* ධූම, දුම, දුම්

Fume, *v. a.* දුම්ගසනවා

Fumid, *a.* දුම්වූ

Fumidity, *s.* දුම්වූකම

Fumigate, *v. a.* දුම්ගහස්සනවා

Fumigation, *s.* දුම්ගැසීම

Fumingly, *ad.* ක්‍රෝධලෙස

Fun, *s.* කෙළිය, සෙල්ලම, සතුට

Function, *s.* කාරිතවය, කර්මය, වැඩ, නිලය

Fund, *s.* මුදල

Fundament, *s.* භූමිමුල

Fundamental, *a.* අත්‍යවශ්‍යවූ, පදනම්වූ, මුලවූ, ප්‍රධානවූ

Funeral, *s.* මිනීවළලෑම, මිනියබුම්දානෙකිරීම

Funeral, *a.* මිනීවළලනවූ, මෘත්‍යුසුවූ, දුක්ඛිතවූ

Fungous, *a.* හතුවූ, බුරුල්වූ

Fungus, *s.* හතු

Funicle, *s.* සිහින්ලනුව

Funnel, *s.* පුනෙල්ල; *Portuguese.*

Fur, *s.* රෝම, මෘගලොම්, මෘගකෙස්: *remains of exaled moisture*, කැල්ක

Fur, *v. a.* රෝමදමනවා, ලොම්දමනවා

Furbish, *v. a.* ඔපදමනවා

Furfur, *s.* කෙල්, පතුරු

Furious, *a.* කෝපවූ, තරහවූ, රෞද්‍රවූ, ක්‍රෝධවූ

Furiously, *ad.* කෝපලෙස, රෞද්‍රලෙස, ක්‍රෝධලෙස, තරහලෙස

Furl, *v. a.* ඔතනවා, වෙලනවා

Furlong, *s.* කෝශය, හැතැක්මෙන් අටෙන් පංගුව

Furlough, *s.* අවකාසය, අවසරය

Furnace, *s.* ගිනිඋදුන

Furnish, *v. a.* ද්‍රව්‍යදෙනවා, සරහනවා, සපයාදෙනවා

Furnisher, *s.* සපයාදෙන්නා

Furniture, *s.* ද්‍රව්‍ය, අඩුවැඩිය, බඩු

Furrow, *s.* සීවට

Furrow, *v. a.* සීහානවා

Further, *ad.* වඩාදුර, වැඩිදුර

Further, *v. a.* උදව්වෙනවා

Furtherer, *s.* උදව්වෙනනා

Furthermore, *ad.* තවද්නාමුත්, එපමණක්, නොයෙක්

Furtive, *a.* සොරකමනා

Furuncle, *s.* සෝජවීම, උදුවීම, ඉදිමීම

Fury, *s.* කෝපය, ක්‍රෝධය, තරහව

Fuse, *v. a.* උණුකරනවා, වකනවා

Fusee, *s.* ඇවිත්තැව

Fusible, *a.* උණුකලහැකිවූ, වකාබපුළුවන්වූ

Fusil, *a.* උණුවූ, මැකුනාවූ

Fusion, *s.* උණුකිරීම, මැකීම

Fust, *s.* දුර්ගන්ධය, දුගඳ

Futile, *a.* දෙඩනනාවූ, නිරාර්ථකවූ, නිස්ඵලවූ

Futility, *s.* දෙඩීම, නිරාර්ථකය, නිස්ඵලය

Future, *a.* අනාගතය, එනකාලය, මතු

Futurity, *s.* අනාගතකාලය, මතුඑනකල, එනකල

Fy, *interj.* ඉස්, ස්

G

Gabble, *s.* නිරාර්ථකකථාකිරීම, නිස්කාරනාකථාකිරීම, නිස්ඵල කථාකිරීම

Gabble, *v. n.* නිරාර්ථකකථාකරනවා, නිස්කාරනාකථාකරනවා, නිස්ඵලකථාකරනවා

Gabbler, *s.* නිරාර්ථකකථාකරන්නා, නිස්කාරනාකථාකරන්නා, නිස්ඵලකථාකරන්නා

Gabel, *s.* සංගම ආදායම

Gable, *s.* වහලේගැබ

Gad, *s.* *wedge*, පෙනුව; *a style*, උල්කටුව

Gad, *v. n.* සවාරනායකරනවා, හරිසරාඇවිදිනවා

Gadder, *s.* සවාරනායකරන්නා, හරිසරාඇවිදිනා

Gadfly, *s.* ඇටමැස්සා

Gaff, *s.* අවුලනබිල්ලය, අනාමඩය

Gag, *v. n.* මුඛබන්ධනායකරනවා

Gag, *s.* මුඛබැඳීම

Gage, *s.* උගස, උකස

Gage, *v. a.* උගස්කරනවා; *measure*, මනිනවා,

Gaggle, *v. n.* හංසයාමෙන්ශබ්ද කරනවා

Gaily, *ad.* සන්තෝසයෙන්, ප්‍රිය ලෙස

Gain, *s.* ලාභය, දිනුම, සම්කොරිම, ප්‍රයෝජනය

Gain, *v. a.* ලාභගන්නවා, ප්‍රයෝජනගන්නවා, දිනනවා; *to gain ground*, ඇඹිපෙරෙනවා, ලාභවෙනවා; *to gain over*, ජයගන්නවා; *to gain upon one*, යමෙකු සතුටුකරනවා

Gainer, *s.* ලාභගන්නා, ප්‍රයෝජනගන්නා, දිනන්නා

Gainful, *a.* ලාභවූ, ප්‍රයෝජනවූ, දිනුම්වූ

Gainfully, *ad.* ලාභලෙස, ප්‍රයෝජනලෙස, දිනුම්ලෙස

Gainless, *a.* නිෂ්ප්‍රයෝජනය, අලාභය

Gainly, *ad.* පහසුලෙස

Gainsay, *v. a.* භේදවකථාකරනවා, විරුඬවකථාකරනවා, උදිරිවකථාකරනවා

Gainsayer, *s.* භේදවකථාකරන්නා, විරුඬවකථාකරන්නා, උදිරිවකථාකරනා

Gait, *s.* ගමනෙහි අන්දම

Gale, *s.* තදමාරුතය, ශරහුලඟ

Gall, *s.* පිත

Gall, *v. a.* *to hurt by fretting the skin*, උරච්චිකරනවා, උලනවා; *to vex*, ක්‍රෝධකරනවා, තරහකරනවා

Gallant, *a* ශ්‍රෙෂ්ටවූ, දක්ෂවූ, වික්‍රමවූ, නාඹුවූ, ආචාරවනතවූ

Gallantly, *ad.* ශ්‍රෙෂ්ටලෙස, දක්ෂලෙස, වික්‍රමලෙස, නාඹුලෙස, ආචාරවනතලෙස

Gallantry, *s.* ශ්‍රෙෂ්ටකම, දක්ෂකම, වික්‍රමකම, නාඹුකම, ආචාරවනතකම

Gallery, *s.* උඩුමාලේ

Galley, *s.* පාරුව

ඉද්රිපිටට යනවා, වැඩිදියුණු වෙනවා; *to make a good dinner,* හොඳ අහාරයක් කනවා; *to make account of,* ගණනකට ගන්නවා; *to make one's escape,* තමන්ගේ ගැලවීම කරනවා; *to make a fool of one,* යමෙක් මෝඩයෙකුට කරනවා; *to make a wonder of,* විස්මයක් කරනවා; *to make much of one,* යමෙකුට ගරුසැලකිලි කරනවා; *to make land,* ගොඩබිමට ළංවෙනවා; *he will make nothing of it,* එයින් ඔහුට කිසිදෙයක් කරන්ටබැරි වෙයි; *to make good,* හොඳකරනවා, පල්දෙනවා; *to make a doubt,* අනුමාන කරනවා; *I cannot tell what to make of it,* ඒ ගැන මොක්කරන්ඩද කියා මට තේරෙන්නේනැත; *to make after one,* යමෙකුට පස්සෙන් කරනවා; *to make away,* ඉවත්කරනවා; *to make away with himself,* තමන්ගේ ප්‍රාණඝාතකරනවා; *to make away with one's estate,* තමන්ගේ සම්පත නාස්තිකරනවා; *to make for a place,* යම් ස්ථානයකට යනවා; *to make over,* භාරදෙනවා, දීදමනවා; *to make out,* තේරුම්කරනවා; *to make up,* විස්වාසවෙනවා, හොඳවෙනවා; *to make up a letter,* ලියුමක් නමනවා; *to make free with,* මිත්‍රලෙසකරනවා; *to make light of a thing,* සරලකොට කරනවා, වැදගත්කමට නොගන්නවා; *to make off,* පැනයනවා

Maker, *s.* මැවුම්කාරයා, සාදන්නා, හදන්නා, කරන්නා

Malady, *s.* රෝගය, ලෙඩ, පීඩාව

Malanders, *s.* වැල්ලිකබල

Male, *a.* පුංශ, පිරිම

Maleadministration, *s.* නාපුරුලෙස පාලනය කිරීම

Malecontent, *s.* අසතුටුවූඅය, අමනාපවූඅය

Malecontent, malecontented, *a.* අසතුටුවූ, අමනාපවූ

Malediction, *s.* ඇනීම, යැදීම, නාපුරුසාපදීම

Malefaction, *s.* දුස්කර්මය, අපරාධය, වැරද්ද

Malefactor, *s.* දුස්කර්මයා, අපරාධයා, වරදකාරයා

Malefick, *a.* අනාදරවූ, වදකරන්නාවූ

Malevolence, *s.* ඊර්ෂ්‍යාවීම, වෛෂවීම, ක්‍රෝධවීම, වෛරවීම, නාපුරුඅදහස්වීම

Malevolent, *a.* ඊර්ෂ්‍යාවූ, වෛෂවූ, ක්‍රෝධවූ, වෛරවූ, නාපුරුඅදහස්වූ

Malevolently, *ad.* ඊර්ෂ්‍යාලෙස, වෛෂලෙස, ක්‍රෝධලෙස, වෛරලෙස, නාපුරුඅදහස්ලෙස

Malice, *s.* ඊර්ෂ්‍යාව, වෛෂය, වෛරය, ක්‍රෝධය, නාපුරුඅදහස

Malicious, *a.* ඊර්ෂ්‍යාවූ, වෛෂවූ, වෛරවූ, ක්‍රෝධවූ, නාපුරුඅදහස්වූ, දුෂ්ටවූ

Maliciously, ad. ඊර්ෂ්‍යාලෙස, වෛරසහලෙස, ක්‍රෝධලෙස, වෛරලෙස, දුෂ්ටලෙස, නපුරඅදහස්ලෙස

Maliciousness, s. ඊර්ෂ්‍යාකම, වෛරකම, ක්‍රෝධකම, වෛරකම, දුෂ්ටකම, නපුරඅදහස්කම

Malign, a. ඊර්ෂ්‍යාවූ, වෛරවූ, නපුරඅදහස්වූ, නපුරුසිත්වූ: *infectious, pestilential*, වඩුරු, විසඝාත, වසූරි

Malign, v. a. ඊර්ෂ්‍යාකරනවා, වෛරකරනවා, නපුරුකරනවා, පීඩාකරනවා

Malignancy, s. ඊර්ෂ්‍යාකම, වෛරකම, නපුරුකම, හිංසකකම, වඩුරුකම, විසඝාතකම, වසූරිකම; *see the adj.*

Malignant, a. *malicious*, ඊර්ෂ්‍යාවූ, වෛරවූ; *bad*, නපුරුවූ; *hurtful*, හිංසකවූ; *infectious as fevers*, වඩුරුවූ, විසඝාතවූ, වසූරිවූ

Malignantly, ad. ඊර්ෂ්‍යාලෙස, වෛරලෙස, නපුරුලෙස, හිංසකලෙස, වඩුරුලෙස, විසඝාතලෙස, වසූරිලෙස

Malignity, s. ඊර්ෂ්‍යාකම, වෛරකම, නපුරුකම, හිංසකකම, වඩුරුකම, විසඝාතකම, වසූරිකම; *see the adj.*

Mall, s. මිටිය

Malleable, a. බුරුල්වූ

Malleate, v. a. මිටියෙන්තලනවා

Mallet, s. අතකොටුව

Malmsey, s. මුද්‍රිකාමිශ්‍රරසත්

Malt, s. වේළුයව

Mamma, s. අම්මා

Mammillary, a. තනපුඩුවූ

Mammock, v. a. ඉරනවා

Mammon, s. ධන, සම්පත්, වස්තුව

Man, s. නරයා, ජනයා, පුරුෂයා; මනුෂ්‍යයා, මිනිහා; *man of war*, යුධනැව

Man, v. a. මනුෂ්‍යයන්ගෙන්සම්පූර්ණකරනවා; *to man a ship*, නැවක පලපහාඩුවට මනුෂ්‍යයන් දෙනවා

Manacles, s. අත්විලංගුව

Manacle, v. a. අත්විලංගුලනවා

Manage, v. a. *to carry on affairs*, පලපහාඩු කරනවා; *to govern*, ආඥාකරනවා; *to make tractable*, යටහත්කරනවා, හීලෑකරනවා, පුරුදුකරනවා; *to accomplish any thing artfully*, උපායෙදනවා

Manageable, a. ආඥාකරන්ඩපුළුවන්වූ, යටහත්වූ

Management, s. පලපහාඩුකිරීම, උපායදීම

Manager, s. පලපහාඩුකරන්නා, ආඥාකරන්නා, උපායයොදන්නා

Manation, s. පැතිරීම

Mancipate, v. a. දාසකරනවා, වහල්කරනවා

Mancipation, s. දාසකිරීම, වහල්කිරීම

Mandate, s. ආඥාව, අණ

Mandatory, *a.* ආඥාකාරන්නාවූ

Mandible, *s.* හකුපාඩාව

Mandrake, *s.* දුදසිඹ

Manducate, *v. a.* සපනාවා, වකනාවා

Manducation, *s.* සැපීම, වකීම

Mane, *s.* අස්වබෙල්ලෙකෙස්

Maneater, *s.* රාක්ෂයා

Manes, *s.* ශැවිකම

Manful, *a.* නිබ්භීතවූ, වීය්‍යීමත්වූ, බලවන්තවූ

Manfully, *ad.* නිබ්භීතලෙස, වියෙීමත්ලෙස, බලවන්තලෙස

Manfulness, *s.* නිබ්භීතකම, වියෙීමත්කම, බලවන්තකම

Mange, *s.* ම්‍රගයින්ගේහොරි

Manger, *s.* ගවයෝකනඔරුව

Mangle, *v. a.* ඉරනාවා, පොඩිකරනාවා, කැබලිකපනාවා

Mangler, *s.* ඉරන්නා, පොඩිකරන්නා, කැබලිකපන්නා

Mango, *s.* අඹ

Manhood, *s.* පුෂ්භාවය, මනුෂ්‍යකමය; *virility*, පුෂ්ශක්ති

Maniack, maniacal, *a.* උන්මාදවූ, විකාරවූ, වස්මරරෝගවූ, පිස්සුවූ

Maniack, *s.* උන්මාදයා, විකාරයා, වස්මරරෝගියා, පිස්සා

Manifest, *a.* එලිවූ

Manifest, *v. a.* ප්‍රසිඩකරනාවා, ප්‍රකාසකරනාවා, එලිදරවූකරනාවා, ඇඟිගැවිදන්වනාවා

Manifestation, *s.* ප්‍රසිඩකිරීම, ප්‍රකාසකිරීම, එලිදරවූකිරීම, ඇඟිහැවිදන්වීම, දන්වීම

Manifestly, *ad.* ප්‍රසිඩලෙස, ප්‍රකාසලෙස, දකිනලෙස

Manifold, *s.* අනේක, නානාවිධ, අනන්ත, නොයෙක්, සීප

Manifoldly, *ad.* අනේකලෙස, නානාවිධලෙස, අනන්තලෙස, නොයෙක්ලෙස

Mankiller, *s.* මිනීමරන්නා, මනුෂ්‍යඝාතනයකරන්නා, ප්‍රාණඝාතයකරන්නා

Mankind, *s.* මනුෂ්‍යජාති, ජනයෝ

Manlike, *a.* මනුෂ්‍යවූ

Manliness, *s.* මනුෂ්‍යවීය්‍යීමත්කම, මනුෂ්‍යබලවන්තකම

Manly, *a.* මනුෂ්‍යකාරවූ, මනුෂ්‍යවීය්‍යීවන්තවූ

Manna, *s.* වලිණ්දි

Manner, *s.* *form*, ප්‍රකාරය, ආකාරය, අන්දම, හැටිය; *habit*, ගතිය, ව්‍යවහාරය, සිරිත; *sort, kind*, ජාතිය, වර්ගේ; *behaviour*, ආචාරවන්තකම, ක්‍රියාව, ගතිය

Mannerly, *ad.* ආචාරවන්තවූ, හොඳටඇතිවූනාවූ

Manor, *s.* දිසාපතිකම

Mansion, *s.* ආවාසය, වාසස්ථානය, පදිංචිගෙය

Manslaughter, *s.* අත්වැරැද්දේමැරීම

Manslayer, *s.* ප්‍රාණඝාතකරන්නා, අත්වැරැද්දේමරන්නා

Mansuete, *a.* ශීලවූ

Mantelet, *s.* උතුරුසළුව

Mantiger, *s.* වානරයා, මහාවඳුරා

Mantle, *s.* උතුරුසළුව, මතුපිටඅඳුම

Mantle, *v. a.* උතුරුසළුවදමනවා, මතුඅඳුමඅඳිනවා

Mantua, *s.* උතුරුසළුව පෙරවීම, වස්ත්‍රඅඳිම

Mantuamaker, *s.* වස්ත්‍රඅඳුම්මහන්නා

Manual, *a.* හස්ත කර්මාන්තවූ, අත්වැඩවූ

Manufacture, *s.* හස්තකර්මාන්ත කිරීම, අත්වැඩකිරීම, වැඩ සෑදීම

Manufacture, *v. a.* හස්තකර්මාන්ත කරනවා, අත්වැඩකරනවා, වැඩසාදනවා

Manufacturer, *s.* හස්තකර්මාන්ත කරන්නා, අත්වැඩ කරන්නා, වැඩසාදන්නා

Manumise, manumit, *v. a.* විමෝක්ෂ කරනවා, නිදහස්කරනවා

Manure, *v. a.* බිම්සාරකරනවා, පෝරකරනවා

Manure, *s.* පෝර

Manurement, *s.* බිම්සාර කිරීම, පෝරකිරීම

Manurer, *s.* බිම්සාර කරන්නා, පෝර කරන්නා

Manuscript, *s.* ලියාපුපොත

Many, *a.* අනේක, විශිෂ්ට, අනන්ත, බොහොම, බොහෝ: *how many*, කොපමණද, කොච්චරද; *so many*, මෙපමණ, මෙච්චර; *as many as the stars*, තරුපමණ බොහෝවූ; *twice as many*, දෙවරක්පමණවැඩි; *too many*, අධික; *be they never so many*, බොහෝ තිබියනමුත්; *very many*, ඉතාබොහෝය

Manycoloured, *a.* නානාවර්ණවූ

Manytimes, *s.* නොයෙක්වර, බොහෝවට

Map, *s.* චිත්‍ර, සිතියම

Mar, *v. a.* විග්‍රහකරනවා, අලාභකරනවා, පළුදුකරනවා

Maranatha, *s.* සාපවචා

Marauder, *s.* උදුරාගන්නාපෙච්කයා

Marasmus, *s.* ක්ෂයරෝගය

Marble, *s.* කළුගල

March, *s.* මැදින්දින

March, *v. a.* ගමන්යනවා

March, *s.* ගමන්යෑම

Marcid, *a.* ක්ෂයවූ, තුසවූ, කෙට්ටුවූ

Mare, *s.* අස්නී, අස්වෙළඹ

Mareschal, *s.* සේවකාධිපතියා

Margarite, *s.* මුතු

Margent, margin, *s.* කොර, තීරය, අග, අද්දර

Marginal, *a.* කොරවූ, අද්දරවූ, දෙරඅයිතිවූ

Marine, *a.* සමුද්‍රඅයිතිවූ, සමුද්‍රභාවූ, මුහුදුවූ

Mariner, *s.* නාවිකයා, යාත්‍රාකාරයා, රුවල්කාරයා

Marjoram, *s.* රටතලා

Marish, *s.* මඩගොහොරුව

Marital, *a.* ස්වාමියාට අයිතිවූ
Maritimal, maritime, *a.* සමුද්‍රතීර වූ, මුහුදුතෙරවූ
Mark, *s.* *token or impression of any kind,* ලකුණ, හාන; *proof, evidence,* සාක්ෂිය, ඔප්පුව
Mark, *v. a.* *to impress a token,* ලකුණුගසනවා, සටහන්කරනවා; *to take notice of,* සිහියට ගන්නවා, සැලකිල්ලට ගන්නවා
Marker, *s.* ලකුණුකාරයා, සටහන්කාරයා, සිහියටගන්නා; *see the verb*
Market, *s.* *a place for selling,* වෙළඳපොල, කඩේ; *a purchase,* විකුණාපු බඩු; *a rate,* මිල, වටිනාකම
Market, *v. a.* ක්‍රයවික්‍රය කරනවා, වෙළඳාම්කරනවා, මිලට දෙනවා, මිලදීගන්නවා; *see the noun*
Market-bell, *s.* වෙළඳපොළේ ඝණ්ටාව, කඩේසීනුව
Market-day, *s.* වෙළඳාම්කෙරෙන දිවස, කඩේතිබෙනදවස
Market-folk, *s.* වෙළඳපොළට එන්නෝ, කඩේටයන්නෝ, කඩකාරයෝ
Market-man, *s.* කඩේටයන්නා, විකුණන්ට හෝ මිලේ ගන්ට කඩේටයන තැනැත්තා, කඩකාරයා
Market-place, *s.* වෙළඳපොළ, කඩේ
Market-price, *s.* විකුණනබඩු වටිනාකම, මිල
Market-rate, *s.* විකුණන ගණන
Market-town, *s.* වෙළඳපොලඇති ගම
Marketable, *a.* විකුණන්ඩ පුළුවන්
Marksman, *s.* ඉලක්කෙට වදින්ඩ දන්නා
Marl, *s.* සුදුමැටි, සුදුපස්
Marl, *v. a.* සුදුමැටිදමනවා
Marlinespike, *s.* ආවුධයක්
Marlpit, *s.* සුදුමැටිවළ
Marmalade, marmalet, *s.* බෙලිවලින් හදනමධුරරසය, බෙලිදොසි
Marmoset, *s.* පුංචිරිලවා
Marmot, *s.* වල්මීයා
Marquetry, *s.* නොයෙක් වර්ණ වලින් තැනූ කැටයම්කම, නොයෙක් වර්ණවූ කැටයම්කම
Marquis, *s.* අමාත්‍යයා
Marrer, *s.* නරක්කරන්නා
Marriage, *s.* විවාහකිරීම, සරණපාවාදීම; *see the verb*
Marriageable, *a.* විවාහකිරීමට සුදුසු, විවාහකිරීමට සුදුසුවයස්ඇති
Married, *a.* විවාහකලාවූ
Marrow, *s.* ඇටමොල, මොල
Marrowbone, *s.* මොලඇති ඇටකටුව
Marrowfat, *s.* අවරපලා
Marry, *v. a.* *to join together in*

marriage. විවාහකරනවා ; *to take in marriage,* සරනපාවාගන්නවා ; *to give in marriage,* සරනපාවාදෙනවා ; *the Portuguese word,* කසාද *is frequently used hence,* කසාදබඳිනවා

Mars, *s. the planet,* අඟහරුවා

Marsh, *s.* වගුර, වෙල

Marshal, *s. of an army,* සේනාධිපතියා ; *a harbinger,* ඉස්සරහ වයන්නා

Marshaller, *s.* සූදානම්කරන්නා, සොයන්නා, පංනාතිතුකරන්නා

Marshalsea, *s.* හිරෙදමනස්ථානයක්, හිරෙ

Marshy, *a.* වගුරුවූ, වෙල්වූ

Mart, *s.* කඩේ, වෙළෙඳම්පොළ, වෙළෙඳමඩු

Mart, *v. a.* වෙළෙඳම්කරනවා, ගරිකරනවා, සපයනවා, උපයනවා, විකුණනවා, මිලේටගන්නවා

Marten, *s.* නොාන්කාවඩියා

Martial, *a.* විකුමවූ, යුඩවන්තවූ; *a court martial,* යුඩයෙයි මන්ත්‍රණය, සෙවකායින්ගේ මන්ත්‍රණයකෙරිම

Martin, *s.* වැහිලිහිණි වර්ගයක්, වැහිලිහිණි වර්ගයක්

Martingal, *s.* සමවලින් සාදපු අස්වයාගේපටියක්

Martyr, *s.* දිවිපිදූඅය, සමයමිනිසාමරුන්කෑඅය

Martyr, *v. a.* සමයමිනිසාවදකරනවා

Martyrdom, *s.* සමයමිනිසාවදවීම

Martyrology, *s.* සමයමිනිසා වද විඳින්දඅයගේ ලිවුපොත

Marvel, *s.* විස්මය, මවිතය, පුදුමය

Marvel, *v. n.* විස්මපත්වෙනවා, මවිතවෙනවා

Marvellous, *a.* විස්මපත්වූ, මවිතවූ, මවිතවෙඩියුතුවූ, මවිතකරවන්නාවූ

Marvellously, *ad.* විස්මපත්ලෙස, මවිතලෙස

Masculine, *a. male,* පිරිමියාවූ, පුරුෂවූ ; *the gender appropriated to the male kind in any word,* පුම්ලිංගය

Masculinely, *ad.* පුරුෂගතිලෙස, පුරුෂගතිආකාර

Masculineness, *s.* පුරුෂගතිය. පිරිමිකම

Mash, *s.* මිශ්‍රකරපුද්‍රව්‍ය

Mash, *v. a.* අනනවා, නොයෙක් ද්‍රව්‍යමිශ්‍රකරනවා

Mask, *s.* වෙස්මූන

Mask, *v. a.* සඟනවා, වෙස්මූනදමනවා

Mask, *v. n.* වෙස්වෙනස්වෙනවා ; *to mask one's self,* සියවෙසවෙනස්කරගන්නවා

Masker, *s.* වෙස්මූනදමන්නා

Mason, *s.* පෙදරේරුවා ; *Por.*

Masonry, *s.* ගල්වඩුවාගේ කාර්යය ; ශාත්‍රය

Masquerade, *s.* වෙස්මූනමඟුල

Masquerade, *v. n.* වෙස්මුනාදමා හැසිරෙනවා

Masquerader, *s.* වෙස්මුනාදමන්නා

Mass, *s.* රැස, ගොඩ

Massacre, *s.* ප්‍රාණඝාතකිරීම, මරාදැමීම, සංහාරකිරීම, විනාසකිරීම

Massacre, *v. a.* ප්‍රාණඝාතකරනවා, මරනවා, සංහාරකරනවා, විනාසකරනවා

Massiness, *s.* බරකම

Massive, massy, *s.* බරවූ

Mast, *s.* කූඹ

Masted, *a.* කූඹඇති

Master, *s. owner,* අයිතිකා; *chief of a house,* ගෙයිස්වාමියා; *a head man,* මූලාදෑනියා; *a Teacher,* ගුරුවරයා; *when this word is shortened to Mr. as a term of civility,* මහත්මයා *is used; to be master of a language,* යම්භාෂාවකින් නිපුණවෙනවා

Master, *v. a.* ආඥාකරනවා, ආඥාකරනවා, ජයගන්නවා

Masterdom, *s.* ආඥාව, අනුසාසනාව, ආනුභාව

Master-string, *s.* වීණාවෙහිප්‍රධානනූල

Master-stroke, *s.* සමර්ථකමෙන් කළකර්මාන්තයක්

Masterless, *a.* අස්වාමිකා, ස්වාමියා නැති, මූලාදෑනියා නැති

Masterly, *ad.* සමර්ථලෙස

Masterly, *a.* සමර්ථවූ, හපන්වූ, නිපුණවූ, උගත්වූ

Mastership, *s.* ගුරුකම, සමර්ථකම, හපන්කම, නිපුණකම, උගත්කම; *see master*

Master-teeth, *s.* ප්‍රධානවූදත්

Mastery, *s. rule,* අනුසාසනාව, ආඥාව; *power,* ආනුභාවය, පරාක්‍රමය; *victory,* ජයගැනීම

Mastication, *s.* විකීම

Masticatory, *s.* විකීම, විකීමපිණිස ඖෂධයක්

Mastiff, *s.* ප්‍රවේසම්කරනබල්ලා, රැකකරනබල්ලා

Mastless, *a.* කූඹනැති

Mastlin, *s.* මිශ්‍රකරපුබෝගවල්

Mat, *s.* පැදුර; *a fine mat,* සිව්ස පැදුර; *a small square mat,* කොට්ටපැදුර

Mat, *v. a.* පැදුරුදමනවා

Match, *s. match to catch fire,* ගිනිපුළුන්, ගෙන්දගම් පොටාගාපු පන්කෙඩ; *one thing that suits another,* සමවූඑකක්; *match at play,* කෙළිමට එකාකාරසමවියා; *to make a match,* එකට බැඳිනවා, ජෝඩුකරනවා, පෙදිමන්කරනවා; *to marry,* විවාහයක්කරනවා

Mat-maker, *s.* පැදුරුවියන්නා, පැදුරුවියනඑකා; *a female mat maker,* පැදුරුවියන්නී, පැදුරුවියනඑකී

Match, *v. a.* සමානකෙරෙනවා, එකාකාරවෙනවා

Matchless, *a.* අසමානවූ, සමානනැතිවූ, සමානකරන්ට නොහැකිවූ

Mate, *s. companion, partner,* සහකාරයා, සාංවුව යන්නා; *a friend,* යහළුවා; *mate of a ship,* මාලිමියා, දෙවෙනි මුලාදෑන්නා

Mate, *v. a. to couple,* ජොඩුකරනවා; *to unite in marriage,* සරනවිමෙන් එකතුකරනවා

Material, *a. corporeal,* ශරීරයෙන්වූ, ද්‍රව්‍යයෙන්වූ; *important,* ප්‍රධානවූ, බරපතලවූ

Materials, *s. for buildings &c.* ද්‍රව්‍ය, උපකරණාදිය

Materiality, *s.* ද්‍රව්‍යභාවය

Materially, *ad.* ශරීරාකාරයෙන්, ද්‍රව්‍යයෙන්, බරපතලලෙස, ප්‍රධානලෙස; *see the adj.*

Materialness, *s.* ශරීරත්වය, ද්‍රව්‍යභාවය, බරපතලකම; *see the adj.*

Materia, medical, *s.* ඖෂධද්‍රව්‍ය ද්‍රව්‍ය

Maternal, *a.* මෑණියන්ගෙන්වූ, මව්ගේ; *maternal love,* මව්ගේ ස්නේහය

Maternity, *s.* මව්භාවය

Matin, *s.* උදය

Matins, *s.* උදයකාලයෙහි, උදය දෙවිසංකීර්තන

Matrice, *s.* ගැබ්හය, ගැබ, ගැබ පස්ය

Matricide, *s.* මෑණියන්මැරීම, මව්මැරීම

Matrimonial, *a.* විවාහසම්බන්ධ වූ, සරණපාවාදීමට අයිත්වූ

Matrimonially, *ad.* සරණපාවාදීමේ ක්‍රියාලෙස

Matrimony, *s. christian,* සරණ ලැබීම, විවාහකෙරීම, කසාද; *Por. heathen,* අසංස්කෘතබැඳීම, කාරබැඳීම

Matrix, *s.* ගැබ්හය, ගැබ, ගැබ පස්ය

Matron, *s.* සංසත්කාරී, වයසේ ස්ත්‍රී

Matronal, *a.* සංසත්කාරීටයුතු

Matronly, *a.* සංසත්කාරීවෙන්

Matter, *s. substance,* ද්‍රව්‍ය; *subject,* කාරණාව; *corruption, rottenness, purulent matter,* සැරය; *what is the matter,* මොකද, කාරියමොකද; *what is the matter with you,* උඹට මොකවුණාද; *no such matter,* එපුකාරකාරණා වෙන්නැත; *it is no matter,* කම නැතිහැ; *he spoke much to the matter,* ඔහු ඒ කාරණාවට යුතුවූ බොහොමයකට ලෙය; *upon the whole matter,* මේ කාරණාවගැන; *I make no matter of it,* ඒකමට කමිනැත, ඒක නොදැකීමෙන් නො කරන්නෙමි; *what is the matter with this medal,* මේ පදක්කමට කුමක් සිද්ධවුණද

Matter, *v. n.* සැරව උපදවනවා

Mattery, *s.* සැරව ඇත්තාවූ

Mattock, *s.* උදැල්ල, උදලු

Mattress, *s.* කුළු වච්චම, මෙට්ටය; *P.*

Matturate, *v. a.* පැසෙන්ගසනවා

වා, ඉදෙන්ඩත්බනවා, ඉදවා නාවා

Maturate, *v. n. to become ripe*, පැහෙනවා, ඉදෙනවා

Maturation, *s.* පැසීම, ඉදීම

Maturative, *a.* ඉදවන්නාවූ

Mature, *a.* ඉදුනාවූ, පැසුනාවූ

Mature, *v. a.* ඉදවනවා

Maturely, *ad. ripely*, ඉදීමෙන්; *completely*, සම්පූර්ණභාවය ට

Maturity, *s.* ඉදීම, පැසීමවශති ය

Maul, *v. a.* බොහෝ ගසනවා, තැලීමෙන් අඹරනවා

Maund, *s.* පැස

Maunder, *v. n.* අවලාදකියනවා, අසතුටෙව ක්‍රෝධමොරගසන වා, ජීගානවා

Maunderer, *s.* අවලාද කියනාව නා, අසතුටුවෙක්‍රෝධමොරගස න්නා

Mausoleum, *s.* අලන්කාර කල සොහොන්ගෙ, සැරසිල්වූ මි නිවල

Maw, *s.* පක්ෂිගෙආපුර, පසුව, බොක්ක

Mawish, *a.* අරුචිවූ

Maw-worm, *s.* බඩවැලෙහිපණු වා

Maxillar, maxillary, *a.* හකුපාඩා වටඅයුත්තු

Maxim, *s.* වාක්තුව

May, *s. month of*, වෙසක්මස

May, *auxy. verb. to be possible*, හැකිවෙන්ට, පුළුවන්වෙන්ට; *to be at liberty*, නිදහස්කාලගන්න වලඉන්නවා, නිදහස්වඉන්නා වා; *may be*, වෙන්ට පුළුවන; *it may be*, ඒක වෙන්ඩපුළුවනි සම්භාරවිට; *may I go*, මට ය න අවසර ලැබෙව: *you may come*, තමුසෙට එන්ඩඅවසරය; *may you prosper*, තමුසේ දියුණු වේවා: *you may for me*, තම සෙට මගෙන් ව රැඳුත්නැත

May-day, *s.* වෙසක්මාසේ පලමු වෙනිදින

Mayor, *s.* නාගර ආඩුකාරයා, නුවරප්‍රධානියා

Mayoralty, *s.* නුවරපධානිකම

Mazarines, *s.* නිලවර්ණය

Maze, *s. labyrinth*, උමංමාර්ග ය, වංකමාවත; *confusion of the thoughts*, කරදරසිත්, කර වවල්සිත්

Maze, *v. a.* පාරමුලාවෙනවා, සි ත්කරදරකරනවා, සිත්කර වවල් කරනවා; *see the noun*

Mazy, *a.* පාරමුලාවූ, කරදරවූ, ක රවවලවූ

Me, *oblique case.* මා, මට, මාව; *your friend resides with me*, තමු සෙගෙ මිත්‍රයා මාලඟ සිටිනා වා; *it appears to me*, ඒක මට පෙනෙනාවා

Mead, *s.* බිම්පැනියක්

Mead, meadow, *s.* පිට්ටනිය, ප ල්මගාන

Meager, *v. n.* කෙට්ටුකරනා වා

Meager, meagre, *a.* කෙට්ටු

Meagerness, meagreness, *s.* කෙට්ටුවීම

Meal, *s. a repast,* අහාර, බොජනය, කෑම; *meal time,* අනුභවකරනකාලය, කන්නාවේකාලය; *flower of corn,* පිටි

Mealman, *s.* පිටිවිකුනාතැන්නා

Mealy, *a.* පිටියකිවූ

Mean, *a. base,* පහත්වූ, නීචවූ; *low in worth,* නොවටිනාවූ; *such conduct is mean,* ඒප්‍රකාරක්‍රියාවල් නීචවත්තිබෙන්නේය

Mean, *s. medium, or middle rate,* මධ්‍යස්ථභාවය, මැදහත්වීම; *instrument or that which is used in order to any end,* උපාය, කාමය, කාරනාව; *by these means he recovered his health,* මේකාමවලින් ඔහුට ගුණලැබුනා; *to accomplish our wishes suitable means must be used,* අපේ මනාපවල් සිද්ධවෙනපිනිසයුතුවූ කාරනා කෙරෙයිඹිනාය; *in the mean while,* ඒඅතරෙහි; *by this means,* මේආකාරයෙන්, මේමාර්ගයෙන්; *by all means,* ප්‍රධානකොට; *by no means,* කොහෙත්ම නැත; *by fair means,* සුද්ධවූ මාර්ගවලින්; *by foul means,* අසුද්ධවූ මාර්ගවලින්; *I do not mean to do it,* ඒක කරන්ට මම කල්පනා නොකෙරෙමි; *you know what I mean,* මගේ අභිප්‍රාව තමුසේදන්නාවා; *what does this word mean,* මේවචනේ අභිප්‍රාව මොකද; *I mean so,* එසේවා මගේ අභිප්‍රාව තිබෙනවා, මගේඅභිප්‍රාව එසේතිබෙනවාය; *to mean no ill,* නපුරු කරන්ට කල්පනානොකරනාවා

Mean, *v. a.* චින්තනාවා, හඟවනාවා, කල්පනාකරනාවා

Mean, *v. n.* අදහස්වෙනාවා, අභිප්‍රාවවෙනාවා, හඟවනාවා;

Meant, *pret. p.* කල්පනාකල

Meander, *s.* හැරවීම, කරකැවීම

Meandrous, *a.* හරවන්නාවූ, කරකවන්නාවූ

Meaning, *s.* අර්ථය, අභිප්‍රාව, හැඟීම, කල්පනාව; *see mean*

Meanly, *ad.* නීචව, නීචලෙස, හීනාකාරයෙන්; *see the adj.*

Meanness, *s.* නීචකම

Measles, *s.* සරම්පරෝගය

Measled, *a.* සරම්පරෝගයඇති

Measurable, *a.* මනින්ටහැකිවූ

Measurableness, *s.* මනින්ටහැකිබව

Measurably, *ad.* මනින්ටහැකිලෙස

Measure, *s. a rule, by which any thing is proportioned,* මිනුම; *proportion, degree,* පරිම, ප්‍රමාණ; *in some measure,* පමනක්, යම්පමනකින්; *beyond measure,* අතිශයෙන්, අප්‍රමානව; *six measures of rice,* හාල්නැළිහයක්

Measure, *v. a.* මනිනාවා

Measureless, *a.* මනින්ටනොහැකිවූ, අප්‍රමානවූ

Measurement, *s.* මැනීම

Measurer, s. මනින්නාවූතැනා, මනින්නා

Meat, s. *flesh to be eaten,* දඩමස් ; *food in general,* ආහාර, බොජ්ජන, කෑම

Meathe, s. බීම, පානය

Mechanical, mechanick, a. කලයිතානමට අදුන්නු, සූත්‍රයන්ට අදුන්නු

Mechanick, s. කර්මාන්තය, හස්තකර්මාන්තයා, අයින්වැඩකාරන්නා

Mechanically, ad. කලයිතානන්වලන්, සූත්‍රයෙන්

Mechanician, s. සූත්‍රදන්නා, සූත්‍රසාදනාවතා

Mechanism, s. සූත්‍රකර්මාන්තය, or සූත්‍රකර්මාන්තයෙන්

Meconium, s. අබින්, මැඩා

Medal, s. මාලපෙනත

Meddle, v. n. මැදහත්වෙනවා, මැදිවෙනවා; *to meddle with,* වැදගැම්මිත්කාරනවා, මැදිවෙනවා; *do not meddle with him,* ඔහු සමුගමැදිවෙඩ එපා

Meddler, s. මැදහත්වෙන්නා, මැදිවෙනාවයා

Meddlesome, a. මැදිවෙන්නාවූ, මැදිවෙන්ටකැමත්තවූ

Mediate, v. a. මැදහත්කම කාරනවා

Mediate, a. මධ්‍යමෙසම්වූ, මැදවූ

Mediately, ad. මැදහත්ලෙස

Mediation, s. මධ්‍යස්තවීම, මැදහත්කම්කිරීම

Mediator, s. මධ්‍යස්තකාවත්තා, මැදහත්කම්කාරන්නා, මැදහත්කාරයා

Mediatorial, mediatory, a. මධ්‍යස්තවූ, මැදහත්කමටඅයිත්වූ, මැදහත්කාරන්නාවූ

Mediatorship, s. මධ්‍යස්තකම, මැදහත්කාරකම

Mediatrix, s. මැදහත්කාරී, මැදහත්කම්කාරනාවෙක්

Medical, a. අවිසදවූ, බෙහෙතට අයත්වූ, අවිසැදදනාවූ

Medically, ad. අවිසධලෙස, බෙහෙතටඅයත්ලෙස

Medicate, v. a. බෙහෙත්වලින් මුසුකරනවා

Medication, s. බෙහෙත්වලින් මුසුකිරීම

Medicinable, a. බෙහෙත්වලින් සුවවෙන්ටහැකිවූ

Medicinal, a. ඖෂධවූ, බෙහෙත්වූ

Medicinally, ad. ඖෂධලෙස, බෙහෙත්ලෙස

Medicine, s. ඖෂධ, බෙහෙදා, බෙහෙත්

Medicine, v. a. ඖෂධකාරනවා, බෙහෙත්දෙනවා

Medeity, s. අඩිය, භාගය

Medriocrity, s. මධ්‍යස්තභාවය, මැදහත්කම, සමහාදිනානාව, අඩුවැඩිනැත්කම

Meditate, v. a. මෙනෙහිකාරනවා, සිතනවා, විචාරකාරනවා, විසාරම්භකාරනවා, පරීක්ෂාකාරනවා

Meditation, s. මෙනෙහිකිරීම, විපරම්කිරීම, විසාරවිකිරීම, කල්පනාකිරීම

Meditative, a. මෙනෙහිකරන් නාවූ, විපරම්කරන්නාවූ; *a meditative person,* විපරම්කර නාළුතා, මෙනෙහිකෙරීමට කැමතිළුතා

Mediterranean, mediterraneous, a. මධ්‍යදේසවූ, රටමධ්‍යයෙහිවූ

Medium, s. මැද, මධ්‍යය, මාර්ගය; *in order to obtain his purpose he must seek another medium,* ඔහුගේ කල්පනාව ලබාගන්නාපිණිස අන්මාර්ගයක් ඔහුසොයාබැලිමනාය

Medly, s. කලවම්, කලවම්කෙරීම, මිශ්‍රකිරීම

Medly, a. කලවම්කරපු, මිශ්‍රකරපු

Medullar, medullary, a. මොලට අඩංගු

Meed, s. ප්‍රතිඵලදීම, විපාක, යෙදීම, තෑගිදීම

Meek, a. මෘදුගුණ, හොඳසිත්

Meeken, v. a. මෘදුකරනවා, සංසුංකරනවා

Meekly, ad. මෘදුගුණඇතිලෙස, සංසුංලෙස

Meekness, s. සංසුංකම, මෘදුගුණය, මෘදුගුණකම

Meer, s. තනි

Meet, a. යුතුවූ, සුදුසුවූ

Meet, v. a. සම්මුඛවෙනවා, සඹවෙනවා, හාලෙනවා; *to go to meet one,* කිසිවෙකුසම්ම ඛවෙනපිණිස යනවා; *to meet with a good reception,* යහපත්වූ ලහාව සඹවෙනවා; *we met with a storm,* චණ්ඩමාරු තයක් අපට පැමුනුණේය; *I shall meet with him,* ඕහට මම සඹවෙනවාඇත

Meeter, s. සම්මුඛවෙනාළුතා, සම්මුඛවෙන්නා

Meeting, s. *the act of meeting* සම්මුඛවීම, සඹවීම, හාලෑම; *a concourse of people,* රැස්වූ සමූහ, සමූහය, සමාගම

Meeting-house, s. දෙවසතිප්පුව රැස්වෙනගෙ

Meetly, ad. සුදුසුලෙස, යුතුලෙස, යුතුහැටියට

Meetness, s. සුදුසුකම, යුතුකම

Megrim, s. ඉසකැක්කුම, හිසරදීම

Melancholy, s. කාන්සාවීම, ශෝකවීම, සිත්බරවීම

Melancholy, a. කාංසාවූ, ශෝකවූ, සිත්බරවූ; *a melancholy accident,* ශෝකයට පැමිණෙනා පැමිණීම, ශෝකවූපැමිණීම

Melasses, s. පැණිදිය, හකුරුව ලින් නොනාන් පිනිවෙසන් සාදපු පැණිදිය

Meliorate, v. a. මෘදුකරනවා, යහපත්කරනවා, හොඳකරනවා

Melioration, s. අළුත්කෙරීම, ය

හපත්කොරිම, හොඳකොරිම.

Meliority, s. වඩාංගහපත්කම, වඩාහොඳකම

Melliferous, a. මීපැණිඋපදවන්නාවූ

Mellification, s. මීපැණිවීම

Mellifluence, s. මීපැණිහාලීම

Mellifluent, mellifluous, a. මීපැණි මෙන්ගලනනාවූ

Mellow, a. ඉදුනා, මෙරිවූනා; *a mellow scent*, ඉදිච්චකම්මයි සුවඳත්

Mellow, v. a. ඉදවනවා

Mellow, v. n. පැහෙනවා, ඉදෙනවා

Mellowness, s. ඉදිච්චකම

Melodious, a. මධුරශබ්දඇතිවූ, මිහිරිහඬවූ

Melodiously, ad. මධුරශබ්දඇති ලෙස, මිහිරිහඬලෙස

Melodiousness, s. මධුරශබ්දය

Melody, s. නාදාශබ්දය, මධුර ශබ්දය

Melon, s. කැකිරිවගයක්

Melt, v. a. *to dissolve*, මකනවා, උණුකරනවා; *to liquify*, දියකරනවා; *to soften*, මුදුකරනවා, මොලොක්කරනවා; *to waste away*, ක්ෂයකරනවා, ගෙවනවා

Melter, s. මකන්නා, උණුකරන්නා

Member, s. ගාත්‍රය, අවයවය, ශරීරාංගය; *one of a community*, සභාසමිකාරයා

Membrane, s. හෝගම

Membranaceous, membranous, a. හෝගමඇති වූ, ලපටිහමඇතිවූ

Memento, s. හැඟවීම, දැන්වීම, මතක්කිරීම, සිහිවීමට ලකුණ, සිහිවීමක්

Memoir, s. *a memorandum book*, සිහිකොරිමෙහිපොත; *a history of or account of any transaction*, ජනකථා, කතාන්තරය, කථාන්දරය

Memorable, a. සිහිකරඹවවන්නාවූ

Memorably, ad. සිහිකරඹයුතු ලෙස

Memorandum, s. සිහිවීමටලකුණ, කළයුතුවෙනසටහන; *memorandum book*, සිහිකරන් වලියනපොත

Memorial, s. සිහිවීමටලකුණ, සිහිවීම

Memorial, a. සිහිඇතුවහිබෙඹ පමනුවන්නාවූ

Memorialist, s. *a petitioner*, ඉල්ලුම්කාරයා, *a writer of memoirs*, ජනකැලියන්නා

Memorize, v. a. සිහියට ගන්නවා

Memory, s. මතක, සිහිය

Men, s. pl. ජනයෝ, මනුෂ්‍යයෝ, පුරුෂයෝ

Menace, v. a. තර්ජනයකරනවා, ගරකරනවා, බයවද්දනවා, උරුක්කුකරනවා

Menace, s. තර්ජනයකිරීම, උරුක්කුකිරීම, ගරකිරීම

Menacer, s. තර්ජනයකරන්නා, උරුහුන්කාකරන්නා

Menage, s. මෘගකොටුව

Mend, v. a. a thing out of repair, අලුත්වැඩියාකරනවා, හොඳකරනවා, අලුත්කරනවා; to correct, හරිගස්සනවා

Mend, v. n. යහපත්වෙනවා; to mend the pace, ඉක්මන්ගමන්කරනවා, to be on the mending hand after sickness, ලෙඩින් සනීපවෙමින් සිටිනවා

Mendable, a. හොඳකරවන්ට හැකිවූ, සෑදකරන්ටපුළුවන්

Mendacity, s. බොරුකීම, බොලම

Mender, s. අලුත්කරන්නා, හොඳකරන්නා; see the verb

Mendicant, s. හිඟන්නා

Mendicate, v. a. හිඟනවා

Menial, s. මෙහෙකාරයෙක්, සවෙහිසිටින්නෙක්

Menial, a. මෙහෙකාරයන්ටඅයිතිවූ

Menology, s. මස්පතාලියනලද ලියමන

Mensal, a. මේසයටඅයිත්වූ

Menstrual, a. මස්පතාපැමිණෙන

Menstruous, a. කිලිවූ

Mensurability, s. මනින්ට පිළිවන්කම

Mensurable, a. මනින්ටපිළිවන්වූ, ප්‍රමාණවූ

Mensural, a. ප්‍රමාණයටඅයිත්වූ

Mensurate, v. a. මනිනවා

Mensuration, s මැනීම

Mental, a. කල්පනාවටඅයිත්වූ

Mentally, a කල්පනාලෙස, සිතනාලෙස

Mention, v. a. මතක්කරනවා, කියනවා, සඳහන්කරනවා; I intend to mention it to him, මම ඒක ඔහුට මතක්කරන්ට කල්පනාකරනවා; the very mention of such names is painful, ඒ ප්‍රකාර නාමවල් කීම පවා අප්‍රියය; such subjects were never mentioned to me, ඒ ප්‍රකාර කාරනාවල් කිසිකලකවත් මට සඳහන්වුණේනැත

Mercantile, a. වෙළඳාම්කර්මට අයිත්වූ, වෙළඳාම්කරන

Mercenary, a. ලෝබවූ, සියප්‍රයෝජනයසොයන

Mercenary, s. කුලීකාරයා

Mercer, s. පටපිළිවෙළෙන්ද

Mercery, s. පටපිළිවෙළඳාම

Merchandise, s. ක්‍රයවික්‍රයකිරීම, වෙළඳාම, භාණ්ඩ

Merchandise, v. a. වෙළඳාම්කරනවා, ක්‍රයවික්‍රයකරනවා

Merchant, s. ක්‍රයවික්‍රයකරන්නා, වෙළෙන්ද

Merchantly, merchantlike, a. වෙළඳාම්කර්මට සුදුසු, වෙළඳාම්කාරයාලෙස

Merchant-man, s. වෙළඳාම්නැව

Merciful, a. කරුණාවන්තවූ, දයාබරවූ, අනුකම්පාවූ, ලෙන්ගතුවූ

Mercifully, ad. කරුණාලෙස, ද

ගාම්භීරලෙස, අනුකම්පාලෙස

Mercifulness, s. කරුණාව, දයාව, දයාබරකම, අනුකම්පාව

Merciless, a. අකාරුණාවූ, දයාව නැතිවූ, කෲරවූ

Mercurial, a. රසදියවූ; *a preparation of*, රසදියවලින්මිශ්‍රවූ

Mercury, s. රසදිය, or රසදිය

Mercury, s. *the planet*, බුදග්‍රහ

Mercy, s. දයාව, කරුණාව, අනුකම්පාව.

Mercy-seat, s. කරුණාසනය

Mere, a. තනි; *a mere fancy*, තනි කල්පනාවක්

Mere, s. පොකුණ, වෙල

Merely, ad තනිලෙස, විතර; *it is merely an imagination*, ඒක තනිකල්පනාවක්ය, or ඒක කල්පනාවක් විතරයි

Meretriceous, a. වෛශ්‍යාභාවී

Meretreciously, ad. වෛශ්‍යාලෙස

Meridian, s. දවාල, මද්දහන, මධ්‍යාහ්නවේලාව

Meridian, a. මධ්‍යම, මුදුන; *the meridian of Colombo*, කොළඹ යන ස්ථානයේ මුදුන

Merit, s. සුදුසුකම, යෝග්‍යකම, යුතුකම, යෝග්‍යතාව, වටිනාකම; *the merit of a cause*, කාරණාවක යුතුකම

Merit, v. a. යුතුවෙනවා, යෝග්‍යවෙනවා, වටිනවා; *to merit favour*, උපකාරයට වටිනවා; *such orders must be punctually executed if you intend to merit my confidence*, මගේ විස්වාසකමට යුතුවෙන්ඩ තමුන් කැමැත්තේ කල්පනාකාරකමනම් මේ ආඥාවල් නිවරදිලෙස කරවෙන්ඩ ඕනෑය; *this affair merits our consideration*, මේකාරණාව අපේ කල්පනාවට සුදුසුවෙන්නේය; *they have merited this punishment by their own folly*, ඔවුන්ගේම අඥානකමින් ඔවුන් මේ දඬුවමට යෝග්‍යවූනෝය

Meritorious, a. යුතුවූ, යෝග්‍යවූ; *a meritorious work*, යහපත්වූ විපාකලැබීමට යුතුක්‍රියාවක්

Meritoriously, ad. යෝග්‍යලෙස, යුතුලෙස, සුදුසුලෙස

Mermaid, s. දියකිඳුරා

Merrily, ad. ප්‍රියලෙස, ප්‍රසන්නලෙස, සතුටුලෙස, සන්තෝෂලෙස

Merriment, s. විහිළුතහළුකිරීම, සෙල්ලම්කිරීම

Merry, a. ප්‍රසන්නවූ, සන්තුෂ්ටවූ, ප්‍රීතිවූ, සතුටුවූ, සෙල්ලන්වූ

Merry-andrew, s. සෙල්ලම්කාරයා

Mersion, s. ගැලීම

Mesh, s. දැල්ඇස

Mesh, v. a. දැල්වලින්අල්ලනවා

Meshy, a. දැල්ඇස්ඇතිවූ

Meslin, s. මිශ්‍රධාන්‍ය

Mess, s. එකවරටකඛනකාවූ භෝජනය, කෑමෙන්පඟුවක්

Mess, v. n. එකතුවකනවා, ස

කනවා, අනුන්සමගඅනුභවක
රනවා

Message, *s.* දූතවාක්‍යය, පණිවි
ඩය

Messenger, *s.* දූතයා, පණිවිඩකා
රයා

Messiah, *s.* ක්‍රිස්තුස්වහන්සේ,
අපේ ගැලවුම්කාරයාණන්ව
හන්සේ

Messieurs, *s.* ස්වාමිවරු, ශාමිදු
රුවරු, මහත්වරු

Messmate, *s.* සමගඅනුභවකර
නයා

Messuage, *s.* වාසස්ථානය

Met, *part. past.* සම්බවුනා, සම්බවු
නු, සම්මුඛවුනා, සම්මුඛවු
නු; *he is not to be met without,*
ඔහුට දක්නටබැරිව සිටිනා
වා; *well met,* කමුත්නාන්සේ
දුටුවාංගහපන; *he is met with*
ඔහුට සම්බවුනා; *see the verb*

Metabola, *s.* වෙනස්වීම

Metal, *s.* ලෝ, ලෝහ

Metallical, metallick, *a.* ලෝහය
වගඩත් ආ, ලෝහයෙන්වූ

Metalliferous, *a.* ලෝහඋපදවන්
නාවූ

Metalline, *a.* ලෝහයෙන්වූ

Metallist, *s.* ලෝහකාරයා, ලෝ
හකර්මාන්තකාරයා

Metallography, *s.* ලෝහප්‍රවෘත්ති
ය, ලෝහප්‍රයෝජනය

Metallurgist, *s.* ලෝහකර්මාන්ත
කාරයා

Metallurgy, *s.* ලෝහකර්මාන්ත
කරීම

Metamorphose, *v. a.* රූපයවෙ
නස්කරනවා, වෙසයමාරු
කරනවා

Metamorphosed, *a.* රූපයවෙනස්
කල, වෙසයමාරුකල

Metamorphosis, *s.* රූපයවෙනස්
වීම, වෙසයමාරුවීම

Metaphor, *s.* උපමාව

Metaphorical, metaphorick, *a.* උප
මාවකින්වූ

Metaphrase, *s.* අක්ෂර *or* වචන
හැටියටපිටපත්කෙරීම

Metaphrast, *s.* අක්ෂර *or* වචන
හැටියට පිටපත්කරනනා

Metaphysical, metaphysick, *a.* පැව
ත්මෙන්වැඩවූ

Metaphysicks, *s.* පැවතීමෙන්වි
ඩවූදේශනාශාස්ත්‍රය

Metathesis, *s.* තැන්මාරුකරනවස
ම

Metation, *s.* මැනීම

Mete, *v. a.* මනිනවා

Metempsychosis, *s.* පුනර්භවය,
ශරීරයකින් ශරීරයකට ආ
ත්මයාගේවෙනස්වීම

Meteor, *s.* සමයම්පිටපත්වීම

Meteorological, *a.* සමයම්වූ

Meter, *s.* මනින්නා, මැනුම්
කාරයා, මිනුම්කාරයා

Methinks, *verb impers.* මමසිතමි

Method, *s.* පිළිවෙල, ප්‍රවෘත්තිය,
අන්දම, ආකාරය, චාරිත්‍රය

Methodical, *s.* ප්‍රවෘත්තියවූ, පිළි
වෙලවූ, ප්‍රකාරයවූ, අන්දමවූ,
ආකාරයවූ, චාරිත්‍රයවූ

Methodically, *ad.* ප්‍රවෘත්තියලෙස,

පිළිවෙළෙලෙස, අනුපිළිවෙලෙස, ආකාරයකලෙස, විධිනුකූලෙස

Methodise, v. a. පද්ධතිකයකරනවා, පිළිවෙළකරනවා, අනුක්‍රමකරනවා, ආකාරයකරනවා, විධිනුකූලකරනවා

Methodist, s. උපාසකයා, දේවභක්තිකයා

Methought, pret. මම සිතුවා

Metre s. කාව්‍යබැඳීම, කාව්‍යබන්ධනය

Metrical, a. කාව්‍යබැඳීමටයුතුවූ

Metropolis, s. මහානගරය, ප්‍රධානනුවර

Metropolitan, s. ප්‍රධානපාදිලිකයා

Metropolitan, a. ප්‍රධානනුවරකට අයුත්වූ

Mettle, s. වික්‍රමකම, සමර්ථකම, ධෛර්යවීර්ය, කුණනාබලකම

Mettled, a. ධෛර්යවීර්යනාතවූ

Mew, s. a sea fowl, ලංකාවෙගියෙයක්; a place of confinement, සිරවදම්නාතැන; a cage, කූඩුව

Mew, v. a. to shut up, හිරකරනවා, කූඩුවෙහි දමනවා; to shed the feathers, පිහාටුහෙලනවා; to mew as cat, බලලෙක්මෙන් අඬනවා

Mewl, v. n. ළදරුවෙකුමෙන්අඬනවා

Mezzotinto, s. කොටිමෙගීඅඳුමක්, අනාවනාශාස්ත්‍රය

Mice, pl. මීයෝ

Miche, v. n. සැඟවීසිටිනවා, අහම්බයට නොවීසිටිනවා

Micher, s. සැඟවිසිටින්නා, අනාත්වසිටින්නා, කම්මැලියා

Mid, a. මධ්‍යයවූ, මැදවූ

Mid-course, s. ගමනෙහි අඩිය

Midday, s. මධ්‍යාහ්නකාලය, මද්දිහනවෙලාව, ඉරමුදුන්වෙලාව

Middle, a. මධ්‍යවූ, මැදවූ

Middle, s. මධ්‍යය, මැද

Middle-aged, a. මධ්‍යවයස්අයිතිවූ

Middlemost, a. ඉතාමධ්‍යයෙහි තිබෙනාවූ; in the midst, මධ්‍යමයෙහි, මධ්‍යයෙහි

Middling, a. මධ්‍යතරමවූ, මැදතරමවූ

Midland, a. මධ්‍යදෙසවූ, රටමධ්‍යයෙහිවූ

Midge, s. මදුරුවා

Mid-heaven, s. ආකාසයෙහිමුදුන

Midmost, a. මධ්‍යයෙහි තිබෙනා, අතරෙහි තිබෙනා

Midnight, s. මධ්‍යමරාත්‍රිය, මදියම්වෙලාව

Midriff, s. දෙකට බෙදනා වරේ

Midshipman, s. නැවෙඋපකාලමයෝ

Midst, s. මැද, මධ්‍යය

Midst, a. මධ්‍යවූ, මැදවූ

Midstream, s. ගඟාවෙහිපාරේ, දියහාමැඩි, වතුරපාරේ

Midsummer, s. ඉඩවරක්ෂඩයය, ග්‍රීෂ්මකාලයේ මැඩයය

Midway, s. අමතහගිමැද, මාර්ගයමැද

Midwife, s. වින්නඹුයන්, වින්නඹිකැනී

Midwifery, s. වින්නඹුකම් කිරීම

Midwinter, s. ශීතකාලයෙහි මැඩයය

Mien, s. රූ, රුව, ආකාර

Might, s. ශක්තිය, බලය, බලේ, වීර්‍ය

Might, pret. පුළුවන්වුනා; see may.

Mightily, ad. ශක්තිලෙස, පරාක්‍රමලෙස, බලයලෙස, වල්ලභලෙස

Mightiness, s. ශක්තිකම්, පරාක්‍රමකම්, බලයකම්, වල්ලභකම

Mighty, a. ශක්තිවූ, පරාක්‍රමවූ, බලයවූ, වල්ලභවූ

Migration, a. තැනකින්තැනක යෑම

Milch, s. කිරිදෙන්නාවූ

Milch-cow, s. කිරිඑලදෙනා, කිරිදෙනාගවයා

Mild, a. මෛත්‍රීවූ, මෘදුගුණවූ, දයාබරවූ

Mildew, s. සස්‍යරෝගය, පොරොන්දොල්වීම

Mildew, v. a. සස්‍යහිනිඅල්ලනවා, පොරොන්දොලවෙනවා

Mildly, ad. මෛත්‍රීලෙස, මෘදුගුණලෙස, දයාබරලෙස

Mildness, s. මෛත්‍රීකම, මෘදුගුණ ය, දයාව, දයාබරකම

Mile, s. English, සැතැක්ම; Singhalese, හැවුව that is four English miles

Milestone, s. ගව්ලකුණ, සැතැක්මගල, ගව්කණුව

Miliary, a. කුඩාවූ, ශාන්තනැති වූ

Miliary-fever, s. උණරෝගයක්

Militant, a. සේවාවසන්කරනා, යුඩකිරිමට ඇරඹුවූ

Militar, military, a. සේවාවසන් කිරිමට යුතු, යුඩකිරිමට අයිත්වූ

Militate, v. n. සේවාවසන්කර නවා

Militia, s. ආයුධදැරීවැසියෝ

Milk, s. ක්ෂීර, කිරි

Milk, v. n. දොවනවා

Milken, a. කිරිවලින්සැදූ

Milker, s. දෙවුන්කාරයා, දොවන්නා

Milkiness, s. කිරිගතිය

Milkmaid, s. දෙවුන්කාරි, දොවන්නී

Milkman, s. කිරිවිකුණනතා

Milkpail, s. කිරිගන්නාභාජනය, කිරිදොවනභාජනය

Milkpan, s. කිරිභාජනය

Milkpottage, s. කිරිහාපිටිවලින් සදුහොජනයක්

Milktooth, s. අශ්වපැටියන්ගේ කිරිදත

Milkwhite, a. කිරිමෙන්සුදු

Milkwoman, s. කිරිවිකුණන්නී

Mill, s. a water mill, ජලයන්ත්‍ර

තෙල් අඹරනගල ; *the mill by which the oil is pressed from the cocoanut,* සෙක්කුව ; *hand mill,* කුරක්කන්ගල, අඹරනගල

Mill, *v. a.* අඹරනවා

Mill-cog, *s.* ජලයන්ත්‍රයෙ දත

Mill dam, *s.* වැව

Millennium, *s.* අවුරුදුදහසක් පවත්නා ධර්මරාජ්‍ය

Millepedus, *s.* ගෝනුස්සා

Miller, *s.* ඇඹුරුම්කාරයා

Milliner, *s.* ස්ත්‍රීආභරණවිකුණන ගෑනී

Million, *s.* දසලක්ෂ

Millionth, *a.* දසලක්ෂවෙනි

Millstone, *s.* අඹරනගල

Milt, *s.* ඇලදිව, මාළුබිජු

Mime, *s.* විසුළුකම, කවටකම්කිරීම

Mime, *v. a.* විහිළුකම්කරනවා, කවටකම්කරනවා

Mimer, *s.* විසුළුකාරයා, විහිළුකම්කරන්නා, කවටකම්කරන්නා

Mimical, *a.* විහිළුකම්කරන, කවටකම්කරන; *see the verb*

Mimically, *ad.* විහිළුකම්කරන ලෙස ; *see the verb*

Mimick, *s.* විහිළුකාරයා, විහිළුකෙළින්නා ; *see the verb*

Mimick, *a.* විහිළුකම්කරන

Mimick, *v. a. to imitate,* සද්‍රිසකොටකරනවා, ඒකාකාරව කරනවා ; *to burlesque,* විහිළුකම්කරනවා, විහිළුකෙළිනවා

Mimicry, *s. a carricature, burlesque,* විහිළුකිරීම, කවටකම්කිරීම ; *imitation,* සද්‍රිසකොටකරනවා, ඒකාකාරව කරනවා

Minacious, *a.* තර්ජනයකරන්නාවූ, උරුස්කරන්නාවූ

Minacity, *s.* තර්ජනයකිරීම, උරුස්කමකිරීම

Minatory, *a.* තර්ජනයකරන්නාවූ, උරුස්කරන්නාවූ

Mince, *v. a. to cut into small pieces,* කෑබලිකපනවා; *to mention a thing scrupulously,* ඒන්සැර කතාකරනවා; *to palliate,* සිඝකරනවා ; *to speak affectedly,* අහංකාරමෙන් කතාකරනවා

Mincingly, *ad.* හීන්සැරෙරලෙස ; *see the verb*

Mind, *s. the intelligent power,* සිත, හිත; *thought, sentiment,* අභිප්‍රාව; *opinion,* කල්පනාව; *liking, choice,* මනාපය, කැමැත්ත; *to call to mind,* සිහිකරනවා, මතක්වෙනවා; *mind what I say,* මම කියනවා කල්පනාකරව ; *to put in mind,* සිහිකරවනවා, මතක්කරවනවා; *I have a mind to go,* මට යෑම කැමැත්තක් තිබෙනවා; *time out of mind,* සිහියෙනැති කාලෙ, අනාදිකාලෙ; *since time out of mind,* සිහිනැති කාලයපටන්, මතකනැති කාලයපටන්

Mind, *v. a.* හිතනවා, කල්පනාකරනවා

Mind, v. n. කැමතිවෙනවා
Minded, a. කැමතිවූ
Mindful, a. සිහිඇතිවූ, ප්‍රවේසම්වූ
Mindfully, ad. සිහිඇතිලෙස, ප්‍රවේසම්ලෙස
Mindfulness, s. සිහිකාරගැනීම, ප්‍රවේසම
Mindless, a. සිහිනැතිවූ, අප්‍රවේසම්වූ
Mindlessly, ad. සිහිනැතිලෙස, අප්‍රවේසම්ලෙස
Mine, pron. මාගේ, මගේ, මගෙ
Mine, s. ලෝහඋපදිනාතැන
Mine, v. n. ලෝහාරනවා, භූමියහාරනවා
Miner, s. භූමියහාරන්නා, ලෝහාරන්නා
Mineral, s. ලෝහය
Mineral, a. ලෝගතිවූ
Mineralist, s. ලෝහදන්නා
Mineralogist, s. ලෝහගැණලියනනා
Mineralogy, s. ලෝහගැණලියවීම
Mingle, v. a. මිශ්‍රකරනවා, කලවන්කරනවා, හවුල්කරනවා
Mingle, v. n. මිශ්‍රවෙනවා, කලවන්වෙනවා
Mingle, s. මිශ්‍රකිරීම, කලවන්කිරීම
Mingler, s. මිශ්‍රකරන්නා, කලවන්කරන්නා, අනන්නා
Miniature, s. සුළුරූපය
Minikin, a. කුඩා, ඉතාකුඩා
Minion, s. කරුණාදිපතියා, දයාව, කරුණාවලබන්නා
Minious, a. රතුමැටිවෙයන්වූ
Minish, v. a. අඩුකරනවා
Minister, s. *royal agent, or servant of Government*, රාජමන්ත්‍රී, අමාත්‍යයා; *one who performs sacred services*, පූජාවාරියා, දේවගැතියා; *one of the most common names used, is the Port.* පාද්‍රි; *hence*, පාද්‍රිලන්නාන්සේ; *a servant*, මෙහෙකාරයා; *a helper*, උපකාරකරන්නා
Minister, v. a. දෙනවා, මෙහෙකරනවා, උපකාරකරනවා; *see the noun*
Ministerial, a. පූජක තානාතුරට අඩුත්තු, රාජ්ජයෙයි ඇඩුවට අඩුත්තු; *see the noun*
Ministry, s. අමාත්‍යකම, නිලම්ය, මෙහෙය, තානාතුර; *see minister*
Ministral, a. *see ministerial*
Ministration, s. මෙහෙකාරීම; *see minister*
Minium, s. රතුපස්
Ministry, s. රාජමන්ත්‍රීයො, ආඩුකාරමහත්වරු, රාජ්ජයෙයි අමාත්‍යයෝ; *see minister*
Minor, a. සුළු, අඩු
Minor, s. බාලවයස්කාරයා, බාලවයසඇත්තා
Minorate, v. a. අඩුකරනවා, කුඩාකරනවා, දුර්වලකරනවා, සොලපකරනවා

Minority, s. *underage*, බාලකම, *the smaller number*, සොලුපවීම, සුළුවීම, අඩුවීම

Minstrel, s. ගායනාකාරයා, බෙර නාකාරයා

Minstrelsy, s. ගායනා ශාස්ත්‍රය, වෙනාවෙසාස්ත්‍රය

Mint, s. මිලවාත්තු කරන ස්ථානෙත්

Mint, s. තුලසි, තලා

Mint, v. a. මිලවාත්තුකරනවා, මිලඅච්චුගහනවා, අලුතෙන් උත්පාදකරනවා

Mintage, s. අච්චුගසාදුමිල

Mintmaster, s. මිලඅච්චු ගසන ස්ථානයෙහිප්‍රධානයා, නායකයා, පලමුවෙනියා

Minuet, s. නැටීමක්

Minute, s. කොටුම්පත, සටහන් කෙරීම; *minute of time*, විනාඩිය

Minute, a. කුඩා, පුන්චි, සුළු

Minute, minute-down, v. a. සටහන්කරනවා, සටහන්කර ගනනවා

Minute-book, s. සටහන් කරන පොත

Minutely, ad. ප්‍රවේසම්ලෙස, විපරම්ලෙස, හරිලෙස

Minuteness, s. *smallness*, පුන්චිකම, සිහුවීම, සොලුපකම; *exactness*, ප්‍රවේසම්කම, විපරම්කම, හරිකම

Miracle, s. ආශ්චර්යය, හාස්කම, පුදුමය, මවිතය

Miraculous, a. ආශ්චර්යවූ, පුදුමවූ, හාස්කම්වූ, මවිතවූ

Miraculously, ad. ආශ්චර්යලෙස, හාස්කම්ලෙස, පුදුම්ලෙස

Miraculousness, s. ආශ්චර්යකම, හාස්කම්භාවය, පුදුමකම, මවිතය

Mire, s. මඩ, ගොහොරු

Mire, v. a. මඩගහනවා, කිලිටි කරනවා

Mirror, s. දර්පනය, කැඩපත

Mirth, s. සෙල්ලම, සන්තොසය, ප්‍රීතිය

Mirthful, a. සෙල්ලම්වූ, ප්‍රීතියෙන් පූර්ණවූ

Mirthless, a. ප්‍රීතිනැති, දුකවූ, දුක්වූ, සොකවූ

Miry, a. මඩවූ, මඩඇති, ගොහොරුවූ

Mis, *when this word occurs in composition it may be rendered by* අ, *or* වැරදිලෙස; *as may be seen in such words as have it prefixed*

Misacceptation, s. වැරදිලෙස තේරුම්ගැනීම

Misadventure, s. අපලකම, පල නැතිකම, නිෂ්පලකම, අප්‍රයෝජනකම, නිෂ්ප්‍රයෝජනකම, අසේතුව, අවාසනාව, අකුසල

Misadventured, a. අසේතුවූ, අකුසල්වූ

Misadvice, s. අනුකූලෙසලසාවිය කෙරීම, නුපුරුදුඋපදෙස

Misadvise, v. a. අයහපත්ලෙස අනුමතකම්දෙනවා

Misadvised, *a.* අයුතු උපදෙස් කලාවූ, අයහපත් මන්ත්‍රණය කලාවූ

Misadviser, *s.* නිෂ්ඵලවූ උපදෙස් දෙන්නා

Misaimed, *a.* වෙඩි වැරදුනු

Misanthrope, *s.* මනුෂ්‍යයින්ට වෛර කරන්නා

Misanthropy, *s.* මනුෂ්‍යයින්ට වෛරය

Misapplication, *s.* නිෂ්ඵල භාවිතය, නිෂ්ප්‍රයෝජනභාවය, වැරදි පාවිච්චිය, වැරදි කිරීම; *see verb*

Misapply, *v. a. to put to wrong purposes,* නිරාජීකාගේ භාවිතාකරනවා, නිෂ්ඵලලෙස පාවිච්චිකරනවා; *to missay,* වැරදිව කියනවා; *to misapply money,* අයුතුලෙස වියදම්කරනවා; *to misapply one's labour,* නිෂ්ඵල සෙවකයම්කරනවා

Misapprehend, *v. a.* වැරදිවතේරුම්ගන්නවා

Misapprehension, *s.* වැරදිවතේරුම්ගැනීම

Misascribe, *v. a.* වැරදිවගුනකියනවා

Misassign, *v. a.* වැරදිවපෙන්වාදෙනවා

Misbecome, *v. a.* නොහොබිනාවෙනවා, *or* අයුතුවතිබෙනවා

Misbecoming, *a.* අයෝග්‍යවූ, අයුතුවූ, නුසුදුසුවූ

Misbegot, misbegotten, *a.* පරදාරයෙන්උපන්නාවූ, වේශ්‍යාකමෙන්උපන්නාවූ

Misbehave, *v. n.* අයුතුලෙස, *or* අකීකරුලෙස හැසිරෙනවා, නපුරුකාල ක්‍රියාකරනවා

Misbehaviour, *s.* අයුතු හැසිරීම, නපුරුකාල ක්‍රියාකිරීම

Misbelief, *s.* මිථ්‍යාඇදහිල්ල, අවිශ්වාසකම

Misbelieve, *v. a.* අවිශ්වාසකරනවා

Misbeliever, *s.* මිථ්‍යාඇදහිලිවන්තයා, අවිශ්වාසියා

Miscalculate, *v. a.* වැරදිවගනන්කරනවා

Miscall, *v. a.* වැරදිවඅඬගසනවා, වැරදිවනම්තබනවා; *to miscall one,* යමෙකුට වැරදිව නම්තබනවා

Miscarriage, *s. abortion,* ගබ්සාවිනාසය, හස්සාවීම; *a mistake, a mishap,* වැරද්ද, නොඉෂ්ටවීම, වැරැද්ද

Miscarry, *v. a.* ගබ්සාවෙනවා, නොඉෂ්ටවෙනවා, වරදිනවා; *see the noun*

Miscellaneous, *a.* නානාප්‍රකාර, නොයෙක්

Miscellany, *s.* නානාප්‍රකාරකෙරීම, නොයෙක්ප්‍රකාරදෙය

Miscast, *v. a.* වැරදිවගනන්කරනවා

Mischance, *s.* අසේතුව, අවාසනාව

Mischeif, *s. great damage,* අනාථකිරීම, අනාදරකිරීම; *any ill,* නරක, නපුරුකම; *working ill,* නපුරුකිරීම; *harm,* අලාබය, අලාබකිරීම

Mischief, v. a. අනර්ථකරනවා, අනාදරකරනවා, අලාබකරනවා; *see the noun*

Mischiefmaker, s. අලාබකරන්නා, නරකකලහපදවනනා

Mischievous, a. අනර්ථකරන්නාවූ, අනාදරකරන්නාවූ, අලාබකරන්නාවූ, නරකකලහපදවන්නාවූ; *see the noun*

Mischievously, ad. අනර්ථකරනා ලෙස, අනාදර කරනා ලෙස, නපුරකරනාලෙස

Mischievousness, s. අනර්ථකරනාකම, අනාදරකරනාකම, නපුරකරනාකම

Miscible, a. කලවන්නෙකරීමට සුදුසු, මිශ්‍රකරනුලබන්ටපුළුවන්වූ

Miscitation, s. වැරදිවසංග්‍රහකිරීම, *or* වෙනස්හැරදක්වීම

Miscite, v. a. වැරදිව සංග්‍රහකරනවා

Misclaim, s. වැරදිව ඉල්ලීම, වැරදිවඅයකිරීම

Miscomputation, s. වැරදිවගනන්කිරීම

Misconceit, misconception, s. වැරදිවතේරුන්ගැනීම

Misconduct, s. වැරදිව හැසිරීම, නපුරුකල්ක්‍රියාකිරීම

Misconduct, v. a. වැරදිවහැසිරෙනවා, අයුතුලෙසහැසිරෙනවා, නපුරුකල්ක්‍රියාකරනවා

Misconjecture, s. වැරදි කල්පනාව

Misconstruction, misconstrue, v. a. වැරදිවතේරුන්දෙනවා, වැරදිවතේරුන්ගන්නවා

Miscontinuance, s. නොපැවැත්ම, නිලදරිවීවනොවීම

Miscount, v. a. වැරදිවගනන්කරනවා

Miscreance, miscreancy, s. මිත්‍යා ඇදහිල්ල, දෙසය, පිලිකුල, නුරුස්සීම

Miscreant, s. නත්නතියා, දුෂ්ටයා, දුර්ජනයා, නීචයා, අපිත්සනයා

Misdeed, s. වැරදිවකෙරීම, අයුතුක්‍රියාව

Misdeem, v. a. වැරදිව විනිශ්චයකරනවා, වැරදිවකල්පනාකරනවා

Misdemean, v. a. වැරදිවහැසිරෙනවා, අයුතුලෙස කල්ක්‍රියාකරනවා

Misdemeanor, s. වැරදිව හැසිරීම, අයුතුකල්ක්‍රියාකිරීම

Misdo, v. a. වැරදිවකරනවා, නපුරුක්‍රියාවල් කරනවා

Misdoer, s. වැරදිකාරයා, වැරදිවකරන්නා, නපුරුක්‍රියාවල් කරන්නා

Misdoubt, v. a. සාන්කාකරනවා, අනුමානකරනවා, නපුරවබියවෙනවා, සැකවෙනවා

Misdoubt, s. සාන්කාව, අනුමානය, නපුරවබිය, සැකය

Misemploy, v. a. *to misapply*. වැරදිව පාවිච්චිකරනවා, අවශ්‍ය

යාකරනවා; *to misemploy the time,* අයුතුලෙස කාල්අරිනවා; අයුතුලෙස ජීවත්වෙනවා; *to misemploy money,* අයුතුලෙස මිලවියදම්කරනවා

Misemployment, *s.* අයුතුලෙස පාවිච්චිකරීම, ව්‍යවහාරකරීම

Miser, *s.* අලෙපයා, ලෝබයා, තන්හාවන්තයා

Miserable, *a.* අවාසනාවන්තවූ, කාලකණ්නිවූ

Miserableness, *s.* අවාසනාවන්තකම, කාලකණ්නිකම

Miserably, *ad.* අවාසනාවන්තලෙස, කාලකණ්නිලෙස

Misery, *s.* අවාසනාව, කාලකණ්නිකම, විපත්තිය

Misesteem, *s.* නින්දාව, තුච්චකම, අගෞරවකම

Misfashion, *v. a.* වැරදිවසාදනවා, අවලක්ෂණකරනවා, අරූපකරනවා, වෙස්මාරුවෙනවා

Misfortune, *s.* අවාසනාවන්තකම, අලාබපැමිණීම, අසෙත්තුව, අකුසල්පැමිණීම

Misgive, *v. a.* සැකවීමටපැමිණෙනවා

Misgovernance, *s.* වැරදිව ආඥාකරීම, අයුතු අනුසාසනාකොරීම

Misguidance, *s.* වැරදිවමඟපෙන්වීම, රැවටීම

Misguide, *v. a. to ill instruct,* වැරදිවඋගන්වනවා; *to mislead,* වැරදිව මඟපෙන්වනවා; *to deceive,* රවටනවා

Mishap, *s.* අවාසනාව, අසෙත්තුව, අකුසල

Misinfer, *v. a.* වැරදිවනිශ්චයකරනවා, වැරදිවමුශින්වකරනවා

Misinform, *v. a.* වැරදිවදන්වනවා

Misinformation, *s.* වැරදිවදැන්වීම

Misinterpretation, *s.* වැරදිව *or* බොරුපිටපත්කරීම, බොරුබස්කීම

Misinterpret, *v. a.* වැරදිවතුජපජීකරනවා, වැරදිවපිටපත්කරකියනවා

Misjoin, *v. a.* වැරදිවඑකතුකරනවා, එක්වීමට අයුතුවෙද් එකාලුකරවනවා

Misjudge, *v. a.* වැරදිවවිනිශ්චයකරනවා

Mislay, *v. a.* වැරදිවතබනවා

Mislayer, *s.* වැරදිවතබන්නා

Mislead, *v. a.* වරදවාමඟගනයනවා, මුලාකරවනවා, වරදවාමඟපෙන්වාදෙනවා

Misleader, *s.* වරදවමඟපෙන්වාදෙන්නා, පාරවරදවන්නා, මුලාකරවන්නා

Misled, *a.* පාරවැරදුනු, වැරදිව ගෙනුන්නු

Mislike, *v. a.* වෛරකරනවා, නුරුස්සනවා, අප්‍රියකරනවා

Mislike, *s.* අප්‍රිය, අසන්තෝසය, සෙනෙහසැතිකම

Misliker, v. a. අප්‍රියවෙන්නා, නුරුස්සන්නා
Mislive, v. n. අනුකූලෙසජීවත්වෙනාවා, අනුකූලෙසකාල්අරිනාවා
Mismanage, v. a. වැරදිවනඩත්තුකාරනාවා, අනුකූලෙසආඬුකාරනාවා, වැරදිව අනුශාසනාකාරනාවා; *see manage*
Mismanagement, s. වැරදිවනඩත්තුකොරිම, අනුකූආඬුකොරිම, වැරදිවඅනුශාසනාකොරිම; *see management*
Mismark, v. a. වැරදිවලකුණුකාරනාවා, ඉලක්කේවරදිනාවා
Mismatch, v. a. වැරදිවසමානකාරනාවා, අයෝග්‍යකාරනාවා
Misname, v. a. වැරදිවඅඩගහනාවා, වැරදිවනාමිතබනාවා
Misnomer, s. වැරදිවඅඩගැසීම
Misobserve, v. a. වැරදිවබලනාවා
Misogamist, s. සරනවීමට වෛරකරන්නා
Mispend, v. a. අබුතේවියදම්කාරනාවා
Mispender, s. අබුතේවියදම්කාරන්නා
Mispersuasion, s. වැරදිකල්පනාව
Misplace, v. a. වැරදිවතබනාවා,
Misprise, v. a. සැමකාටවෙනොගන්නාවා, ගෞරවනොකාරනාවා
Misprise, s. සාමකාටවනොගන්නාවා, ගෞරවනොකොරිම
Misproportion, v. a. නොගැලපුනාමාත්‍රයදේ එකතුකාරනාවා, අසමානකාරනාවා
Misquotation, s වරදවාසඟ්‍රහකොරිම, වැරදිගෙනහැරදැක්වීම
Misquote, v. a. වරදසඟ්‍රහකාරනාවා, වැරදිගෙනහැරදක්වනාවා
Misrecite, v. a. වැරදිවකියනාවා
Misreckon, v. a. වැරදිවගානන්කාරනාවා
Misrelation, s. වැරදිකීම
Misremember, v. a. වැරදිවසිහිකාරනාවා
Misrelate, v. a. වැරදිවකියනාවා
Misreport, v. a. වැරදිවදන්වනාවා, යමක් බොරුවෙන් කියනාවා
Misreport, s. වැරදිදැන්වීම
Misrepresent, v. a. වැරදිවපෙන්වනාවා
Misrepresentation, s. වරදවපෙන්වීම
Misrule, s. අනුකූ, වැරදිආඬුකොරිම
Miss, s. වැරදීම, නැතිවීම
Miss, v. a. *not to hit, to fly wide of,* වරදිනාවා; *to wander from,* මුළාවෙනාවා; *to fail in obtaining,* නොලැබෙනාවා; *not to succeed,* නොඉෂ්ටවෙනාවා, සිඩනොවෙනාවා; *to be in want of,* නැතිවෙනාවා; *to miss the way,* මංමුලාවෙනාවා; *he missed the mark,* ඔහුට ලකුණ වැරදුනා; *I miss it,* මට දක්ක බැරිය, මට සම්බදෙබැ

රිය ; *something is missing here,* මෙහි යමක් අඩුවතිබෙනවා, මෙහියමක් නැතිවිතිබෙනවා ; *I cannot miss him,* ඔහුනැතුව මට බැරිය, ඔහු අහක්වෙන්ට මට ඉඩසඩ බැරිය; *I miss him,* ඔහු නැති නිසා මට අලාබය ; *I miss some words,* සමහරවචන මට අහැරෙනවා ; *a missing ship,* නැතිවූ නැවක්, දක්කබ්ඩනොවූනැවක්

Miss, *s.* අවිවාහස්ත්‍රී, *or* ලමිස්සි

Missay, *v. a.* වැරදිවකියනවා

Misseem, *v. a.* වැරදිවපෙනෙනවා, බොරුවිපෙනෙනවා

Misserve, *v. a.* අවිස්වාසවවැඩකරනවා

Misshape, *v. a.* වැරදිවඅඹනවා, අරූපකරනවා

Missile, *a.* විසිකරඩහුලන්වන්වූ, විසිකරඩයුතුවූ

Missionary, *s. words of this particular and definite nature are seldom translated by the Natives, hence* මිසියෝනාරිපාදිලිතුමාන්සේ, *and hence also, a Mission or Missionary Society is called* මිසියෝනාරිස් සමාගම

Misspeak, *v. a.* වැරදිවකථාකරනවා

Misspell, *v. a.* වැරදිවලියනවා, වැරදිවඅකුරුඑකතුකරනවා

Mist, *s.* මීහිදුම, වැසිකාළුව

Mist, *v. n.* මීහිදුමින්වසනවා, වලාපටලවලින්වසනවා

Mistake, *v. a.* වැරදිවතේරුම්ගන්නවා, වරදනවා, වරදවනවා; *to be mistaken,* වරදිනවා; *he mistook me,* ඔහු මා වැරදිව තේරුන්ගත්තේය ; *you mistake me,* තමුසේ මා නොතේරුන්ගනනවාය

Mistake, *s.* වැරද්ද, වැරදිතේරුන්ගැන්ම

Mistakingly, *ad.* වැරදිව, වැරදිලෙස

Misstate, *v. a.* වැරදිවගෙනහැරදක්වනවා, වැරදිවකියාදෙනවා

Misteach, *v. a.* වැරදිඋගන්වනවා

Misterm, *v. a.* වැරදිවනාමකියනවා

Misthink, *v. a.* වැරදිසිතනවා, වරදවසිතවිලිකරනවා

Mistem, *v. a.* කාලයගැනවරදිනවා, වැරදිවකාලයබලනවා

Mistiness, *s.* මීදුම්කම, වලාපටලබව

Mistion, *s.* කලවම්, මිශ්‍ර

Mistlike, *a.* මීහිදුමමෙන්

Mistook, *part. past.* වැරදුනා, වැරදිව තේරුන්ගත්තා; *see verb*

Mistress, *s. a female of great respect,* ලමාතෑනා; *a female owner,* අයිති, හිමිකාරි; *a title of common respect,* එතනා, හාමිනේ; *a female teacher,* ඉගැන්නුම්කාරි; *a whore,* වෙසගස්ත්‍රී

Mistrust, *s.* අවිශ්වාසය, විශ්වාස නැතිකම

Mistrust, *v. a.* අවිශ්වාසකරනවා

Mistrustful, *a.* අවිශ්වාසවූ

Mistrustfulness, *s.* අවිශ්වාසකම

Mistrustfully, *ad.* අසම්භාවලෙස *or* අවිශ්වාසලෙස

Misty, *a.* මිහිදුම්වූ, වලාපටලවූ

Misunderstand, *v. a.* වැරදිවතේරුම් කරනවා

Misunderstanding, *s.* වැරදිවතේරුම්ගැනීම

Misusage, *s.* යම්කෙනෙකුට අයහපත්කම්කිරීම

Misuse, *v. a.* *to ill treat,* අකටයුතුකම්කරනවා, අයුතුකම් කරනවා; *to ill treat athing,* යම්දෙයක් අයුතුලෙසපාවිච්චිකරනවා, *or* අයුතුවව්‍යවහාරකරනවා

Misuse, *s.* නොමනාව අයුතුකම් කිරීම

Mite, *s.* කුඩා, සුළුදෙයක්

Mithridate, *s.* අවිසදක්, අබ

Mitigant, *a.* සැහැල්ලුකරන, මඩිනායකරන

Mitigate, *v. a.* *to moderate,* මඩිනායකරනවා, අඩුකරනවා සැහැල්ලුකරනවා; *to alleviate,* පහසුකරනවා; *to soften, to mollify,* මෘදුකරනවා, මොළොක්කරනවා; *to cool,* සිහිල්කරනවා

Mitigation, *s.* මඩිනායකිරීම, අඩුකිරීම, සැහැල්ලුකිරීම, පහසුකිරීම, මෘදුකිරීම, මොළොක්කිරීම, සිහිල්කිරීම; *see the verb*

Mitre, *s.* මකුට, පාරිදෂීකයාගේ ඔටුනන

Mittens, *s.* හස්තාවැසුම

Mittimus, *s.* බන්ධනාගාරපත්‍රය, හිරකරුවිදයිය; වරෙන්තුව *is generally used*

Mix, *v. a.* මිශ්‍රකරනවා, කලවම්කරනවා

Mixt, *a.* මිශ්‍රකලාවූ

Mixtion, *s.* මිශ්‍රය, කලවම

Mixtly, *ad.* කලවන්වූ

Mixture, *s.* කලවන්කිරීම, මිශ්‍රකිරීම

Mizzen-mast, *s.* අවරේකුඹය

Mnemonicks, *s.* සිහිකැරීමේහි ශාස්ත්‍රය

Mo, *a.* වැඩි, වඩා

Moan, *v. a.* ලතෝනිකියනවා, විලාපකියනවා, කන්නලවු කියනවා

Moan, *s.* ලතෝනි, විලාප, ලතෝනිකීම, විලාපකීම

Moanful, *a.* ලතෝනිලබ්යුතුවූ, අඬක්ඬයුතුවූ

Moat, *s.* අගල, කොටුවවටෙව තිබෙනඅගල

Moat, *v. a.* අගලකාරනවා, කොටුවහාත්පස්හි අගලක්හාරනවා

Mob, *s.* මිනිස්සුරැවුණුම, රොත්තම, මනුෂ්‍යගොඩවලෑ

Mob, *v. a.* කොලාහලකරනවා, මිනිසුන්ගෙ විලුසස්පයනවා

Mobbish, *a.* කෝලාහලව

Mobile, *s.* මහජනසෙනා

Mobility, *s.* *fickleness,* චංචලවීම; *the common people,* මහජනා සෙනඟ

Mocho stone, *s.* අගත්තිවශීස්ත්

Mock, *v. a.* *to deride, to ridicule,* සමච්චල් කරනවා, සරදම්කරනවා, කවටකම්කරනවා; *to elude,* නොඉෂ්ටවෙනවා, සිද්ධනොවෙනවා.

Mock, *s.* සරදම, කවටකම

Mocker, *s.* සරදම්කරන්නා

Mockery, *s.* සරදම්කිරීම, කවට කම්කිරීම, සමච්චල්කිරීම

Mockingly, *ad.* සරදම්කිරීමඇතිව, කවටකම්ලෙස

Mocking-stock, *s.* සරදම්කරනුලබනනා

Mode, *s.* *manner,* හැටි, ආකාර, ගති; *in grammar see mood*

Model, *s.* අන්දම, ආදර්ශ

Model, *v. a.* රූපකරනවා, අඹනවා, ආකාරකරනවා

Modeller, *s.* රූපකරන්නා, ආකාරකරන්නා

Moderate, *a.* පමණඇති, නියම හැටිවූ, සුදුසුවූ

Moderate, *v. a.* මඩිනාකරනවා, අඩුකරනවා, සන්සිඳෙනවා; *to moderate the heat,* ග්‍රීෂ්මමඩිනාකරනවා; *to moderate the passions,* මෝහය සන්සිඳුවනවා; *to moderate the price,* ගනනඅඩුකරනවා

Moderately, *ad.* පමණඇතිලෙස

Moderateness, *s.* පමණඇතිකම

Moderation, *s.* මධ්‍යස්ථකම, මන්දගත්කම, පමණඇතිවීම

Moderator, *s.* පමණදැනගන්නා, සුදුකම්කරන්නා

Modern, *a.* අලුතෙන්වූ, පරණනූවූ, නොබොදවූ

Modernize, *v. a.* වත්මානසිරිත් හැටියටකරනවා

Moderuness, *s.* අලුත්කම, වත්මානවූපැවැත්වීම

Modest, *a.* සෝභනවූ, සුතුවූ, සුතුචාරිතඇතිවූ

Modestly, *ad.* සෝභනලෙස, පවිත්‍රලෙස, සුචාරිත්‍රලෙස

Modesty, *s.* සුචාරිත්‍රය; සෝභනවීම

Modification, *s.* අන්දමකිරීම, ආකාරකිරීම

Modify, *v. a.* යොදනවා, අන්දම කරනවා, ආකාරකරනවා

Modish, *a.* සිරිත්ලෙස හැසිරෙනනාවූ, ව්‍යවහාරලෙස්ගන්නාවූ

Modishly, *ad.* ව්‍යවහාරපරිදෙන්

Modishness, *s.* ව්‍යවහාරපරිදෙන්හැසිරීම

Modulate, *v. a.* පමණහැටියට ශබ්දකරනවා

Modulation, *s.* පමණහැටියට ශබ්දකිරීම

Modulator, *s.* පමණහැටියට ශබ්දකරන්නා

Modus, *s.* ඔප්පුවිසිහීම

Mohair, *s.* ඔටුවරෝමරෙදි

Moiety, *s.* දෙකොන්පංගුවක්, අඩියක්, දෙකොන්කොටසක්

Moil, *v. a.* මඩඇඟේදමනාවා

Moist, *a.* තෙත, තෙම්මුනු, තෙමුනාවූ

Moisten, *v. a.* තෙත් කරනාවා, තෙම්මනාවා, රාවරකරනාවා

Moisten, *v. n.* තෙත්වෙනාවා, තෙමෙනාවා, රාවරවෙනාවා

Moistener, *s.* තෙත් කරන්නා, තෙම්මන්නා

Moistness, *s.* තෙත්කම, තෙම්ම, රාවරය

Moisture, *s.* තෙත, රාවිරය

Molar-teeth, *s.* හක්කේදත්

Mole, *s. a little animal that works under ground,* වැල්මීවගියක්; *(doubtful,); a false conception,* කොප්පවාසුගෙඩිය; *a natural spot on the body,* උපන්ලපේ; *a dike;* අගල, අැල

Molecast, *s.* වැලිමියාගේ ගොඩ

Molecatcher, *s.* වැලිමියන්අල්ලන්නා

Molehill, *s. see molecast*

Molest, *v. a.* දුක්පමුනුවනාවා, හිංසාකරනාවා, වෙහෙසකරනාවා, ලෙලලන්කරනාවා

Molestation, *s.* දුක්පැමිණිවීම, හිංසාකරීම, වෙහෙසකරීම

Molester, *s.* දුක්පමුනුවන්නා, හිංසාකරන්නා, වෙහෙසකරන්නා

Molition, *s.* වෑයම්කෙරීම, අමුතුවෑයම්කෙරීම

Mollient, *a.* මෘදුකාරන, මොලොක්කරනා, සැහැල්පුකරනා, ලේහුකරනා

Mollifiable, *a.* මොලොක්කරන්ට පුළුවන්වූ, සැහැල්පුකටයුතු

Mollification, *s.* මොලොක්කිරීම, සැහැල්පුකෙරීම

Mollifier, *s.* මොලොක්කරනාදේ, *or* අය, සැහැල්පුකරන්නා

Mollify, *v. a.* මොලොක්කරනාවා, සැහැල්පුකරනාවා, මෘදුකරනාවා, සන්සිඳුවනාවා

Molten, *p. part.* උණුකරනලද, පැසවනලද, උණුකරපු

Moly, *s.* වල්සුදුළූණු

Molasses, *s.* සීනිදිය, පැණි

Mome, *s.* මෝඩයා

Moment, *s.* ක්‍ෂණය, මොහොත

Momentally, *ad.* ක්‍ෂණයෙන් ක්‍ෂණයට

Momentary, *a.* ක්‍ෂණයකටපවතිනා

Momentous, *a.* බරපතලවූ, වැදගත්

Mommery, *s.* වෙස්මුණ කෙළිම, නාටකකෙරීම

Monad, monade, *s.* අදෘශ්‍යමානවූදෙයක්

Monarch, *s. a king,* රජ්ජුරුවො; *an emperor,* අධිරජ්ජුරුවො; *an universal ruler,* චක්‍රවර්තිරජ්ජුරුවො

Monarchal, *a.* රජකමටඅඩුත්තු

Monarchise, *v. n.* රජස්වාමින්ගැ සිරිකරනවා

Monarchy, *s. the nature or form of a government,* රජකම්කිරීම, අනුසාසනාකිරීම; *kingdom,* රාජ්ජ්‍යය

Monastery, *s.* ගණාවාස්ථිය

Monastick, monastical, *a.* තාපසියා වඅඩුත්තු

Monday, *s.* සොමදිනා, සඳුදා, හඳුදා

Money, *s.* මුදල්, මිල, කාසි

Moneybag, *s.* මුදල්පසිය

Moneychanger, *s.* මුදල්මාරුකාරයා, මිලවෙළෙඳා

Moneyed, *a.* මිලඇතිවූ, ධනවත්වූ

Moneyless, *a.* මිලනැතිවූ, ධනනැතිවූ, දුක්පත්වූ

Moneymatter, *s.* මිලගනන, මිල කාරනාව

Monger, *s.* ගනුදෙනුකාරයා, හුණුදෙනුකාරයා, වෙළෙඳාම් කාරයා; *fish monger,* මාළු විකුණන්නා; *iron monger,* යකඩවෙළෙන්දා

Mongrel, *s.* ලේසාලවින්කාරයා, ජම්මදෙකකින් උපන්එකා

Monish, *v. a.* දැනමුතුකම්කියනවා, නුවණකියනවා

Monisher, *s.* දැනමුතුකම්කියන්නා, නුවණකියන්නා

Monition, *s.* දැනමුතුකම්කීම, නුවණක්යාදීම

Monitor, *s.* දැනමුතුකම් දෙන්නා, නුවණකියාදෙන්නා

Monitory, *a.* දැනමුතුකම් දෙන්නාවූ, නුවණදෙන්නාවූ

Monitory, *s.* දැනුම්දීකම් කීම, නුවණදෙනස්ථානය

Monkey, *s.* වඳුරා, රිළවා; *see ape*

Monocular, monoculous, *a.* එකස් කණාඇති, එකස්අන්ධ

Monody, *s.* ශෝකගීතයක්, කවිට ගීතයක්

Monogamist, *s. one having only one wife,* එකභාර්‍යාවක්ඇත්තා; *a disallower of second marriages,* දෙවෙනි විවාහ කතාකම්කාරයා

Monogamy, *s.* එක්විවාහකය

Mongoose, *s.* මුගටියා

Monogram, *s.* ඉලක්කම, *or,* අක්ෂරයක්, අකුරක්

Monologue, *s.* තනිකථාවක්

Monominal, *a.* එක්නාමයක්පමණ ඇති

Monopetalous, *a.* එක්පෙත්තලයට පමණක්ඇති

Monopolist, *s.* සියල්ල තමාටම ගන්ටකැමතිඅය

Monopolize, *v. a.* සියල්ල තමාට මගන්නවා

Monopoly, *s.* සියල්ලතමාටමගැ නීම

Monostick, *s.* එක්පදයකින් සිටිනකවියක්

Monosyllable, *s.* එක්සන්ධිවච නයක්

Monotony, *s.* එකහැටිවූශබ්ද

Monsoon, *s.* පාලුව; *the good*

monsoon, යහපත් පාතුව, කාලය; *the bad monsoon*, අයහපත් පාතුව, කාලය

Monster, *s. any thing frightful*, බිහිසුණුදෙය, භයානකවූදෙය; *an unnatural birth*, අමනුෂ්‍යයෙක්දරුවා

Monstrous, *a.* අවිලක්ෂණ, අරූපවූ ස්වභාවිකආකාරයෙන් අඩුවැඩිවූ

Monstrously, *ad. horribly*, භයානකලෙස; *enormously*, අතිශයලෙස

Monstrousness, *s.* අරූපකම

Month, *s.* මාසේ

Monthly, *ad.* මස්පතා, මසක්පට, මාසෙන්මාසේටපැමිණෙන; *a monthly business*, මස්පතාකරනාවැඩ, මාසෙන්මාසේට පැමිණෙනාවූ කෘත්‍යය

Monument, *s.* ප්‍රතිමාව; *a cenotaph*, දෙනාගාරේනකාන

Ordinance, *s.* චාරිත්‍රය, සිරිත, නියෝගය, පනත

Ordinarily, *ad.* පනතලෙස, සිරිත්ලෙස, ව්‍යවහාරලෙස, භාවිතලෙස

Ordinary, *a.* සිරිත්වූ, ව්‍යවහාරවූ, භාවිතාවූ

Ordinate, *v. a.* නියෝගකරනවා

Ordination, *s.* නියෝගකිරීම, උපසම්පදාකිරීම; *see the verb*

Ordinance, *s.* යුධබඩුයන්

Ordure, *s.* කැත, අසූචි, කාශල

Ore, *s.* ලෝහය

Organ, *s.* *of the senses,* ඉන්ද්‍රියන්, ඉඳුරන්

Organical, organick, *a.* ඉන්ද්‍රියන්වූ, ඉඳුරන්වූ

Organization, *s.* සමගිකිරීම

Organize, *v. a.* සමගිකරනවා

Orient, *s.* පූර්වදිසාව, නැගෙනහිර

Oriental, *a.* පූර්වදිසාවූ, නැගෙනහිරවූ

Orifice, *s.* විවරය, මුඛය, ඇරීම

Origin, original, *s.* ආරම්භය, ආරම්භ, මුල, උත්පත්තිය

Original, *a.* ආරම්භවූ, මුල්වූ, උප්පත්තිවූ; *original sin,* පූර්වපාපය; *an original cause,* මුලකාරණාව; *original language,*

මුලහාසාව; *an original custom*, භාවභාව, උත්පත්තිය

Originally, *ad.* ආරම්භයෙලස, උත්පත්තිලෙස

Originate, *v. a.* පටන්ගන්නවා, හටගන්නවා, උත්පත්තිකරනවා

Origination, *s.* පටන්ගැනීම, හටගැනීම, උත්පත්තිකිරීම

Orisons, *s.* යාඥාවීම

Ornament, *s.* ආබරණ, ආයිත්තම, සරසිල්ල

Ornamental, *a.* ආභරණවූ, සැරසිල්වූ

Ornamentally, *ad.* ආභරණලෙස, සරසිලිලෙස

Ornamented, *a.* ආභරණපැලැඳවූ, සරසනාවූ

Orphan, *s.* දෙමවුපියොනැතිලමයා

Orpiment, *s.* සිරියල්

Orthodox, *a.* භක්තිවූ, සඩාවූ

Orthodoxy, *s.* භක්තිකම

Orthography, *s.* සිපිල්ලාදිවිධිය

Orts, *s.* ඉදුල්

Oscillation, *s.* ඔබමොබයෑම

Oscitancy, *s.* ඇඹීම

Ossicle, *s.* ඇට, කටු

Ossification, *s.* ඇටකටුවීම

Ospray, *s.* උකුස්සුවර්ගයෙක්; *see eagle*

Ossify, *v. a.* ඇටකටුවෙනවා

Ostensible, ostensive, *a.* ප්‍රසිද්ධවූ, දිශාමානවූ, පෙනුම්වූ

Ostent, ostentation, *s. appearence*, ප්‍රසිද්ධවීම, දිශාමානවීම, පෙනීම; *ambition*, අහංකාර, ආඩම්බර

Ostentatious, *a.* අහංකාරවූ, ආඩම්බරවූ

Ostentatiously, *ad.* අහංකාරලෙස, ආඩම්බරලෙස

Ostler, *s.* අශ්වකාරයා, කුදිරැසකරයා

Other, *pron.* අනික්, වෙන; *another*, වෙනික්; *the other*, අනික්; *any other*, වෙනකිසි; *some time or other*, යම්කාලෙක, නොයෙක්වෙනකාලෙක; *the other hand*, අනික්අත, අනික්පැත්ත; *the other day*, වෙනදවස; *every other day*, දවසක් ඇරදවස

Otherwise, *ad.* එසේනැත්නම්, වෙනහැටිනම්, එක්කෝ

Otter, *s.* දියබල්ලා

Oval, *a.* දිගවටවූ

Ovarious, *a.* බිජඇතනාවූ

Ovary, *s.* බීජස්ථානය

Oven, *s.* උදුන

Over, *prep. above*, උඩ, ඉහල; *on the opposite side*, එතර, එගොඩ; *across*, සරස, හරහා; *more*, අධික, වැඩි; *allayed, ended*, නිමිවූ, අවසානවූ; *over my head*, මගේඉසඋඩින්; *over the way*, මගහරහට; *he is gone over the river*, ඔහුගඟ එතරට ගියා; *over and over again*, නැවතනැවත

Overmuch, *a.* ඉතාවැඩි; *it is over*, අවසානවයි, කාමවූතුයි; *all the*

town over, නුවරමුළුල්ලෙහිම: *over against*, ඊට්කෙළිපිට; *over night*, මුළුරාත්‍රිය; *to throw over board*, නැවෙන් පිටත විසිකරනවා; *to over abound*, බොහෝසේ වැඩිවෙනවා

Over-awe, *v. a.* යටහත්කරවනවා

Over balance, *v. a.* කිරෑම් බරවෙනවා

Over-bear, *v. a.* බයගන්නනවා

Over-blow, *v. n.* සුළඟහමනවයනවා

Over-board, *ad.* නැවෙන්පිටත

Over burden, *v. a.* අධිකබරකරනවා

Over-cast, *v. a.* දුඹුරැකරනවා, අඳුරැකරනවා

Over-charge, *v. a.* වැඩිගණන්තබනවා

Over-cloud, *v. a.* වලාපටලෙන් වැසෙනවා

Over-come, *v. a.* ජයගන්නවා

Over come, *v. n.* දිනනවා

Over-do, *v. a.* අධිකතරවකරනවා

Over-flow, *v. n.* ගලායනවා

Over-flow, *s.* ගලාඇම

Over flowing, *s.* අධිකතරවීම, බොහෝසේවැඩිවීම

Over-fly, *v. a.* උඩපියාසරකරනවා

Over-freight, *v. a.* ඉතාබරකරනවා

Over-go, *v. a.* අධිකතරවයනවා

Over-grow, *v. a.* ඉතාසශ්‍රීකවෙනවා, අධිකතරව ලියලනවා

Over-growth, *s.* අධිකතරවසශ්‍රීකවීම

Over-hale, *v. a.* දෙවනුවිභාගකරනවා

Over-hang, *v. a.* නැමීතිබෙනවා

Over-head, *ad.* ඉහළ, උඩ

Over-hear, *v. a.* රහස්කථාඇහෙනවා

Over joy, *v. a.* ප්‍රීතියෙන්පිනනවා, ප්‍රීතිමත්වෙනවා

Over-lade, *v. a.* ඉතාබරකරනවා

Over-lay, *v. a.* පොරවනවා, වසනවා

Over-leap, *v. a.* පනිනවා

Over-load, *v. a.* ඉතාබරකරනවා

Over-loaded, *a.* වැඩිපටවාපු

Overlook, *v. a. to view from a higher place*, උඩින්බලනවා; *to oversee*, පාරිදර්ශනයකරනවා; *to superintend*, මුලාදැනිකම්කරනවා, වැඩබලාගන්නවා; *to neglect*, පැහැරඅරිනවා, අනපසුකරනවා; *to excuse*, සමාවෙනවා

Over looker, *s.* වැඩබලාගන්නා

Over match, *v. a.* ජයගන්නවා

Over much, *a.* මිනුවාටවඩාවූ, අධිකවූ

Over night, *s.* මුළුරාත්‍රිය

Over pass, *v. a.* එතරවයනවා

Over pay, v. a. වැඩියගෙවනවා

Overplus, s. අධිකදෙය, ඉතිරිවූ සුළුදෙය

Overpower, v. a. බලාත්කාරකරනවා

Over-rate, v. a. වැඩිමිලකරනවා, ගොනාඅගයකරනවා

Over-reach, v. n. වංචාකරනවා, රවටනවා, රැවටිලිකරනවා

Over-reacher, s. වංචාකරන්නා, රවටන්නා, රැවටිලිකරන්නා

Over-rule, v. a. මැඩපවත්වනවා, වැඩිආඥාකරනවා

Over-run, v. a. උතුරනවා; *to ravage, as by an army,* යුධගමු දුව අඳුවා වැටෙනවා

Oversee, v. a. පාරිදර්ශනයකරනවා, බලාගන්නවා

Overseen, *part.* වැරදුනා

Overseer, s. පාරිදර්ශකයා, මුකාදමා, කන්කානම, වැඩබලන්නා

Overset, v. a. ගොනාපිටපෙරලනවා

Overshade, overshadow, v. a. පිට ඡායාවවෙනවා, වසාගන්නවා

Overshoot, v. a. ඕනෑදුරටවඩා යනවා, නියමයටවැඩිකරනවා

Oversight, s. බැල්මේවැරද්ද

Overslip, v. a, පැහැරඅරිනවා

Overspread, v. a. හරහාවයනවා, විසුරුවාදමනවා, වසනවා, අතුරනවා

Overstock, v. a. අධිකකරවදනවා

Overstrain, v. a. බලෙත්කරනවා

Oversway, v. a. මැඩපවත්වනවා, බලෙන්අණුකරනවා

Overswell, v. a. ගලනවා

Overt, a. දෘශ්‍යවූ

Overtake, v. a. *to take by surprise,* අසුකරනවා, අල්වනවා; *to come up with,* පැමිපයටවෙනවා, ළඟාවෙනවා

Overthrow, v. a. *to defeat,* ජයගන්නවා; *overturn,* පිටපෙරලනවා; *to demolish,* විනාසකරනවා, නාස්තිකරනවා, නැතිකරනවා

Overthrower, s විනාසකරන්නා

Overtook, *pret.* පැමිපයටආවා

Overtop, v. a. මුදුනටනගිනවා

Overture, s. පැම

Overturn, v. a. පෙරලනවා, විනාසකරනවා, නැතිකරනවා, ජයගන්නවා; *see overthrow*

Overvalue, v. a. අගයවැඩිකරනවා

Overweigh, v. n. කොනාත්වැඩි බරවෙනවා

Overwhelm, v. a. වසාගන්නවා; *to crush down,* පොඩිකරනවා

Ought, s. යම්දෙයක්, කිසියමක්

Ought, *verb imperf.* නියමවූ, ඕනෑවූ; *you ought to have done it,* තමුසෙට ඒක නිමකෙරෙඩ ඕනෑව තිබුනාය

Oviform, a. බිජාකාරය

Oviparous, a. බිජුලපදවන්නාවූ

Ounce, *s.* කොටිව සිංහයෙක්, දිවි ව්‍යාඝ්‍රයෙක්; *see Tiger*

Our, *pron.* අපගේ, අපේ; *this is ours,* මේක අපේයි; *a friend of ours,* අපගේ මිත්‍රයෙක්; *we ourselves,* අපි අපිම

Ourselves, *pron.* අපිම, අපේම

Oust, *v. a.* අරදිනවා

Out, *ad.* පිටත

Out, *prep.* පිටත; *from that,* එයින්; *out of the house,* ගෙදරින් පිටත, ගෙයින් පිටත; *out of sight,* බැල්මෙන් පිටත; *out of hand,* අතින් පිටත; *he is out of debt,* ඔහු ණයෙන් නිදහස්ව ඉන්නවා; *out of the reach,* අසුවෙනතරමින් පිටත; *out of compassion,* අනුකම්පාවෙන්; *out of measure,* නිමනැති; *out of favour,* කරුණානොලද්ද, මිත්‍රභාවයෙන් පිටපත්වූ; *he is out of humour,* ඔහු වෛරව ඉන්නවා; *the fire is out,* ගින්දර නිවීතිබෙනවා; *the time is out,* කාලය නිමවීතිබෙනවා; *he is out of hope,* බලාපොරොත්තු නැතුව ඉන්නවා; *to make out,* අර්ථය රැස්කරනවා, මනිනවා; *he is gone out,* ඔහු එළියට ගියා; *a way out,* පිටතැලයට; *to be out,* උරදේනවා

Outbid, *v. a.* වැඩිඅගයට ඉල්ලනවා

Outbidding, *s.* වැඩිඉල්ලීම

Outborn, *s.* අන්‍යදේශයා

Outbound, *a.* රටවල්වලට යන්නාවූ, රටින්රටයන්නාවූ

Outbrave, *v. a.* ලැජ්ජාකරනවා, පරාජයකරනවා

Outbreak, *s.* පිපිරීම, ගැස්ම

Outcast, *part. a.* පිටතදැමූවාවූ, ඉවත්කළාවූ

Outcast, *s.* පරදේශියා, අන්‍යදේශියා

Outcry, *s.* කෑගැසීම, එළිදරව්වූ කෑම

Outdo, *v. a.* වැඩිවැඩිය කරනවා

Outer, *a.* පිටතවූ

Outerly, *ad.* පිටතලෙස, පිටදිශාවට

Outermost, *a.* වඩාපිටත

Outface, *v. a.* නිර්ලජ්ජව ඉන්නවා, ලැජ්ජානැතිව ඉන්නවා

Outgate, *s.* පිටදොර

Outgive, *v. a.* වැඩියදෙනවා

Outgo, *v. a.* ඉක්මවා යනවා

Outgrow, *v. a.* වඩාලොකුවෙනවා

Outguard, *s.* පිටරැකවල්

Outlandish, *a.* අන්‍යදේශීයවූ

Outlast, *v. a.* වඩා පවතිනවා

Outlaw, *v. a.* ව්‍යවස්ථාවෙන් පිට පන්නවනවා, පනතින් පිට පන්නවනවා

Outlaw, *s.* ව්‍යවස්ථාවෙන් පිට පන්නවනලද්දා, පනතින් පිට පන්නවනලද්දා, අපරාධකාරයා, මංහොරා

Outleap, *v. a.* වඩාදුරපනිනවා, වඩාදුරයනවා

Outlet, *s.* පිටවෙනපාර

Outline, *s.* සටහන්කුර

Outlive, *v. a.* වඩාජීවත්වසිටිනවා

Outliver, *s.* වඩාජීවත්වසිටින්නා

Outlook, *v. a.* ඉවතබලනවා

Outnumber, *v. a.* වැඩිගනන්වෙනවා

Outmost, *a.* ඉඩිඃකෙයන්වැඩිදුර

Outpour, *v. a.* වැගිරෙනවා, වැක්කෙරෙනවා, විසිදුවනවා

Outrage, *v. a.* පෙරලිකරනවා, දබරකරනවා, බලත්කාරකරනවා

Outrage, *s.* පෙරලිකිරීම, දබරකිරීම, බලත්කාරකිරීම

Outrageous, *a.* පෙරලිකරන්නාවූ, දබරකරන්නාවූ, බලත්කාරකරන්නාවූ

Outreach, *v. a.* ඉක්මාදුරයනවා

Outright, *ad.* එවෙලේම, සම්පූර්ණයෙන්

Outroot, *v. a.* උදුරාදමනවා, මුලින්උදුරාදමනවා

Outrun, *v. a.* ඉස්සරවදුවනවා

Outsail, *v. a.* ඉස්සරදැටැවෙල්කරනවා

Outshine, *v. a.* ඉතාපැහැදිලිවෙනවා

Outside, *s.* එළියේ, පිටපැත්තේ

Outspread, *v. a.* විසිදුවනවා, දිගඇරනවා, උසුරවාදමනවා

Outstand, *v. a.* නියමවෙලාවටවඩාසිටිනවා; *outstanding debts*, නියමදසිට වඩාප්‍රමාදවෙනනය

Outstare, *v. a.* ඉවතබලනවා, ලැජ්ජකරනවා

Outstretch, *v. a.* විසිදුවනවා, දිගඇරනවා, උසුරවාදමනවා

Outstrip, *v. a.* ඉස්සරකරදුවනවා

Outvie, *v. a.* වැඩිලුත්සහකරනවා

Outwalk, *v. n.* ඉස්සරඇවිදිනවා

Outwall, *s.* පිටබිත්තිය

Outward, *a.* එළියේවූ, පිටපැත්තේවූ

Outwardly, *ad.* එළියෙන්පෙනෙනලෙස, පිටපැත්තේවූලෙස

Outwards, *ad.* පිටත

Outweigh, *v. a.* වඩාබරවෙනවා, වැඩිබරවෙනවා

Outwit, *v. a.* රවටනවා

Outwork, *s.* පිටපවුර

Outworn, *pron. with age*, දිරාගිය, අබලන්වූනා, පරනවූනා

Owe, *v. a.* ණයවෙනවා; *a debt we owe*, අපිණයවූනායක්; *this is owing to his neglect*, ඔහුගේ අප්‍රවේසම්කමිනුයි

Owl, owlet, *s.* බකමූනා

Own, *a.* තමාගේවූ; *with his own hand*, ඔහුගේම අතින්; *of his own accord*, ඔහුගේම කැමැත්තෙන්; *my own self*, මමම; *my own*, මගේම

Own, *v. n.* *to confess*, ඇතිබැවකියනවා, හැබැයිකියනවා; *to*

acknowledge, to avow, ළවරාගන්නවා, ප්‍රතිඥාකරනවා; *to claim,* අයිතිකරගන්නවා

Owner, *s.* හිමියා, අයිතිකා

Ox, *s.* ගොප්පාදුකෙනා, කරාමිගුදකා

Oxstall, *s.* ගවපට්ටිය

Oyer, *s.* විස්තරයසාලාව, අධිකරණසාලාව

Oyster, *s.* කාවටියා

P

Pabular, *a.* ආහාරදෙන්නාවූ, භොජනදෙන්නාවූ

Pabulation, *s.* ආහාරදීම, භොජනසපයාගැනීම

Pace, *s.* අඩිය, පියවර; *to go a great pace,* ඉක්මනින්යනවා; *to keep pace with one,* යමෙක්සමඑකසරිව යනවා

Pace, *v. n.* අඩිතබායනවා; *to measure by the pace,* අඩියෙන් මනිනවා

Pacification, *s.* සමාදානකිරීම, නැලවීම, ශානතිය

Pacificator, *s.* සමාදානකරන්නා, නැලවන්නා, සනසන්නා; *see the verb*

Pacifick, *a.* සමාදානවූ, නැලවිලිවූ, සංසුන්වූ

Pacified, *a.* සමාදානවුනාවූ, නැලවුනාවූ, ශාන්තවූනාවූ

Pacifier, *s.* සමාදානකරන්නා, නැලවන්නා, සනසන්නා

Pacify, *v. a. to appease,* නැලවනවා; *to still as from resentment,* නිවනවා; *to reconcile,* සමාදානකරනවා

Pack, *a. bundle,* ගොනුබැඳිලිය; *burden,* බර; *a number of people confederated, a gang,* කුමන්ත්‍රණය, කපුරුසමාගම

Pack, *v. a.* පුරවන්කරනවා, මිටබඳිනවා; *to confederate,* කුමන්ත්‍රණයකරනවා, කපුරුසමාගමකරනවා; *to send packing,* අරිනවා, යවනවා

Packcloth, *s.* බඩුබඳිනරෙදි

Packer, *s.* මිටිබඳින්නා

Packet, *s.* මිටිය

Packet, *v. a.* මිටිබඳිනවා

Packhorse, *s.* බරඋසුලනඅසුවෙක්

Packthread, *s.* සිහින්ලනු, සෙල්ගාලනු

Pact, paction, *s.* පොරොන්දුව

Pad, *s.* සිටනාහනාඅස්සයා; *a foot pad,* සොල්ලකාරයා

Pad, *v. n. to rob on the high road,* සොල්ලකනවා; *to level,* සමතලාකරනවා

Paddle, *v. n. to row,* පදිනවා; *to linger,* හෙමිහිටයනවා

Paddle, *s.* හබල, අවලේ

Paddock, *s.* මඬුකයා, මැඩියා

Paddy, *s.* ධාන්‍ය, වී

Padlock, *s.* කෙඩිය පූට්ටුව, ඉබ්බාතාළය

Pagan, *s.* මිත්‍යාදෘෂ්ටි, මිසදිටුවන්

Paganism, *s.* මිත්‍යාදෘෂ්ටිකම, මිසදිටුකම

Page, *s.* පිට ; *a servant*, මෙහෙකරුවා

Page, *v. a.* පිට සටහන්කරනවා

Pageant, *a.* ලස්සනපෙනීමවල්

Pageantry, *s.* මනොබැඳීම

Pagoda, *s.* මන්දිරය, කෝවිල, දේවාලේ, මඩපය

Paid, *pret.* ගෙවූවා

Pail, *s.* ලිණෑජනයක්

Pain, *s.* දුක්ඛය, වේදනාව, කානසිට්ටුව, කනගාටුව, රිදුම

Pain, *v. a.* රිදෙනවා, වේදනාකරනවා ; *to take pains*, වෙහෙසගන්නවා

Painful, *a.* වේදනාවූ, වෙහෙසවූ

Painfully, *ad.* වේදනාලෙස

Painfulness, *s.* උත්සාහකම, වේදනාකම

Painless, *a.* නොරිදෙන, වෙහෙසනැති

Painstaking, *a.* වෙහෙසවූ, උත්සාහවූ

Paint, *v. a.* චිත්‍රකරනවා, සිතියම්කරනවා

Paint, *s.* සායම ; තීන්ත ; *Port.*

Painter, *s.* සිත්තරා, සිතියම්කාරයා

Painting, *s.* චිත්‍රකර්මානුකිරීම, සිතියම්කිරීම

Pair, *s.* ලග්නය, යුග්මය, යුගය, කට්ටුව

Pair, *v. n.* කට්ටිම්කරනවා, ලග්නකරනවා, යුග්මකරනවා, යුගකරනවා

Palace, *s.* ප්‍රාසාදය, රජවාසල, මාලිගාව

Palanquin, *s.* තනම, දෝලාව

Palatable, *a.* රසවූ

Palate, *s.* උඩුතල්ල

Palatine, *s.* රාජමහානාමවූ

Pale, *a.* දුර්වර්ණ, සුදුමැලි

Pale, *v. a.* දුර්වර්ණකරනවා, සුදුමැලිකරනවා

Pale, *s.* ග්‍රාදිවැට ; *Port.*

Pale, *v. a.* ග්‍රාදිවැටබඳිනවා

Paleous, *a.* ලෙල්වූ, පතුරුවූ, සුඹුළුවූ

Palisade, *s.* ග්‍රාදිවැට ; *Port.*

Palisade, *v. a.* ග්‍රාදිවැටබඳිනවා

Palish, *a.* දුර්වර්ණවූ, සුදුමැලිවූ

Pall, *s.* උතුරුසළුව, දේහයවසනරෙද්ද

Pall, *v. a.* අරුචිකරනවා, දුර්වලකරනවා, වසත්කත්තුකරනවා

Palliate, *v. a.* *to extenuate by an apology*, කාරණාපෙන්වාදෙනවා, *or* කාරණාදෙනවා ; *to lessen*, අඩුකරනවා, මඩිනායකරනවා ; *to effect a slight cure*, පිළියම්කරනවා

Palliation, *s.* කාරණාදීම, කාරණාපෙන්වාදීම, පිළියම්කිරීම ; *see the verb.*

Palliative, *a.* මඩිනායකරන්නාවූ ; *see the verb.*

Pallid, *a.* දුර්වර්ණවූ, සුදුමැලිවූ

Palm, *s. tree*, තාලවෘක්ෂය, තල්ගහ ; *of the hand*, අල්ල

Palm, v. a. කවටකම්කරනවා, රවටනවා

Palmatto, s. තල්ජාතිවර්ගයක්

Palmistry, s. සමුද්‍රිකාලකුණුකීම

Palpable, a. perceptible, වැසිල්ලක්නොතිවූ, එළිවූ; perceivable by the touch, ස්පර්ශකලහැකිවූ, හැපෙහෙඹිපුළුවන්වූ

Palpably, ad. වැසිල්ලක්නොතිබෙ ලෙස, එළිදරව්ලෙස, ස්පර්ශකල හැකිලෙස, හැපෙහෙඹිපුළුවන් ලෙස; see the adj.

Palpitate, v. n. කම්පාවෙනවා, හෘදය ගැහෙනවා, හිත් තිගැස්සිවෙනවා

Palpitation, s. කම්පා, හිත් තිගැස්සිම, හෘදයගැස්ම

Palsy, s. පක්ෂාඝාතරෝගය, වලහුනාවීම

Paltry, a. කුඩාකම්වූ, නීචවූ

Pamper, a. ආහාරදෙනවා, පෝෂණයකරනවා; to pamper one's self, රසඅනුභවකරනවා

Pamphlet, s. කුඩාපොත්

Pan, s. වලඳ

Pane, s. හතරැස් වීදුරුකැබෙල්ල

Panegyrick, s. ප්‍රසන්සාකිරීම, වර්ණනාකිරීම, කීර්තිකිරීම

Panegyrist, s. ප්‍රසන්සාකරන්නා, වර්ණනාකරන්නා, කීර්තිකරන්නා

Panegyrize, v. a. ප්‍රසන්සාකරනවා, වර්ණනාකරනවා, කීර්තිකරනවා

Panel, s. පෙනේල්; Portuguese

Pang, s. ප්‍රසවවේදනාව, විලිරුදාව

Pang, v. a. ප්‍රසවවේදනාවෙනවා, විලිරුදාකරනවා

Panick, s. භයව, භීත, භය; a panick terror, නිෂ්ඵලබිය

Panoply, s. සන්නාහය

Pant, v. n. to palpitate, හතිදමනවා; to long for, ආසාවෙනවා

Pant, s. හතිදැම්ම

Pantaloon, s. සරුවාලය, කලිසම; Port.

Panther, s. වඟුරා, දිවිවර්ගයක්, කොටිවර්ගයක්; see tiger

Pantry, s. ගබඩාව

Pap, s. the nipple තනය; a kind of meat for infants, කැඳ; the pulp of fruit, ගෙඩියේ මද

Papa, s. පිතෘ, අප්පොච්චි, පියා

Paper, s. කඩදසි

Papilio, s. සමනලයා

Pappous, a. රෝමවූ, පුළුල්වූ

Par, s. තුල්‍ය, සමානවීම, ඒකාකාරවීම; to be upon a par, සමානවෙනවා

Parable, s. උපමාව

Parabolical, parabolick, a. උපමාවූ

Parade, s. ostentation, ආඩම්බරය, අහංකාරය; show, පෙන්වීම; military order, යුධසේනාව පිළිවෙලවීම

Paradigm, s. ආදර්ශය

Paradise, s. the place so called, පාරාදීසුනම් ස්ථානය; heaven, ස්වර්ගය, දිව්‍යලෝකය

Paradox, s. තේරවිල්ල

Paradoxical, *a.* පෙරළිවූ

Paragon, *s.* ආදර්ශය

Paragon, *v. a.* හරිබලනවා, සමානකරනවා

Paragraph, *s.* වගන්තිය

Parallel, *a.* සමාන්තරවූ, සමවූ: *parallel lines,* සමසූත්‍ර, ඍජුතා රේඛා

Parallel, *v. a.* සමකරනවා, සමානකෙරෙනවා

Paralogize, *v. a.* ප්‍රයෝගයෙන්තර්ක හානිකරනවා, වාදකථාකරනවා

Paralogy, *s.* ප්‍රයෝගයෙන්වාදකිරීම

Paralysis, *s.* පක්ෂාඝාතරෝගය

Paralytical, paralytick, *a.* පක්ෂාඝාතරෝගවූ, අඞ්ගභාගරෝගවූ

Paralytick, *s.* පක්ෂාඝාතරෝගයා, අඞ්ගභාගරෝගකාරයා

Paramount, *a.* උතුම්වූ, ප්‍රධානවූ, උසස්වූ

Paramour, *s.* හොරසැමියා, හොරපෙම්යා

Parapet, *s.* කාප්පෙප්

Paraphrase, *s.* සන්නය, විස්තරය, පෙරළිකිරීම

Paraphrase, *v. a.* සන්නකරනවා, විස්තරකරනවා, පෙරළිකරනවා

Parasite, *s.* අනුව පිරිවපකායා, උපාධිකාරයා, ඉච්චාකාරයා

Parasitical, parasitick, *a.* අනුව පිරිපකාවූ, උපාධිකාරවූ, ඉච්චාකාරවූ

Parasol, *s.* ඡත්‍රය, කුඩය

Parathesis, *s.* වරහන

Parboil, *v. a.* අඩකින්තම්බනවා

Parcel, *s.* මිටිය, පොට්ටනිය, පොදිය; *a parcel of books,* පොත්පොදියක්; *a parcel of seeds,* බීජ පිළිවෙලක්; *a parcel of ground,* බිම්කැබැල්ල

Parcel, *v. a.* මිටිබඳිනවා, කොටස්කරනවා, බෙදාදෙනවා

Parch, *v. a.* ශුෂ්කකරනවා, වියලනවා

Parchment, *s.* සම්පොත, සිනිඳුසම

Pardon, *v. a.* ක්ෂමාවෙනවා, සමාවෙනවා

Pardon, *s.* ක්ෂමාව, සමාව

Pardonable, *a.* ක්ෂමාවිය හැකිවූ, සමාවෙවදපුළුවන්වූ

Pardoner, *s.* ක්ෂමාකරන්නා

Pare, *v. a. to cut off by little and little,* කුඩාවසයෙන්කරනවා, ටිකටිකකපනවා; *to peal,* ලෙල්ලහරිනවා; *to pare a mango,* අඹගෙඩියක් ලෙල්ලහරිනවා

Parenchyma, *s.* මද්‍යය

Parenesis, *s.* සිතටගැහීම

Parents, *s.* මාතෘ පිතෘ, පිතාමාතා, දෙගුරුන්, දෙමව්පියෝ

Parentage, *s.* කුලය, වංශය, ගෝත්‍රය

Parental, *a.* මාතෘ පිතෘවූ, මව්පියවූ

Parenthesis, *s.* වරහන

Parer, *s.* ලෙලිඇරින්නා, උලුප් පන්නා; *see the verb*

Paring, *s.* ලෙලි, පොතු

Parish, *s.* *the word commonly used for the district of a Priest is* කට්ටලය

Parity, *s.* සමානකම, සමවම ඒකාකාරකම

Park, *s.* මුවකෝවරස්ථානය, මුහකින්කනාපිටිවටිය

Parle, parley, *s.* මන්ත්‍රණයකිරීම, සම්භාෂාකිරීම

Parley, *v. n.* මන්ත්‍රණයකරනවා, සම්භාෂාකරනවා

Parliament, *s.* රාජමන්ත්‍රණසභාව

Parliamentary, *a.* රාජමන්ත්‍රණසභාවූ

Parlour, *s.* *a room for entertainment,* සාලාව, සාලේ; *a room for individual enjoyment,* ප්‍රාසාදය

Parody, *v. a.* අර්ථවිපර්‍යාසකරනවා

Parole, *s.* පොරොන්දුකථාව

Paroquet, *s.* බටුගිරවා

Paroxysm, *s.* ත්‍රීව්‍රවෙදනාව

Parricide, *s.* පිතෘඝාතකයා, පියාමරනාපය

Parrot, *s.* ගිරවා; *of which there are several kinds in Ceylon:* පංචවර්ණගිරවා, *the five coloured;* රත්ගිරවා, *the red coloured;* ලෙගිරවා, *green;* බටුගිරවා, *paroquet*

Parry, *v. n.* පහරනවත්තනවා

Parse, *v. a.* සංක්‍ෂිප්තාඛ්‍යවිභාගකරනවා

Parsimonious, *a.* අභිලාෂවූ, මසුරුවූ, තන්හාවූ, ලෝභවූ

Parsimoniously, *ad.* අභිලාෂලෙස, මසුරුලෙස, තන්හාලෙස, ලෝභලෙස

Parsimony, *s.* අභිලාෂය, මසුරුකම, තන්හාව, ලෝභකම

Parsley, *s.* අජමෝජකා, අසමෝදගම්; *but commonly called,* පිකරේසිලි; *Port.*

Parson, *s.* දේවගැතියා, දේසනාකාරයා

Part, *s.* *side, party,* පාර්ශවය; *half,* භාගය; *share, lot, or portion,* පංගුව, කොට්ඨාසය, කොටස; *for my part of that estate,* ඒසම්පත්තියේ මාගේ කොට්ඨාසයට; *this is only a part,* මෙක භාගයක්වා පමනයි; *to take one's part,* යමෙක්ගේ පාර්ශවයට එනවා, යමෙකුට උදවුකරනවා; *he can play any part,* කොයිආකාරයකට්‍ය මුත් ඔහුට කරඩ පුළුවනා; *I take part in all your concerns,* තමුසේගේ සියළුකාරණාවලින් පංගුවක් මම ගන්නවාය; *for the most part,* ප්‍රධානලෙස; *to take in good part,* හොඳසිතින් ඒක්තුගන්නවා; *to take in ill part,* නරකසිතින් ඒක්තුගන්නවා; *good parts,* සම්පත්; *in our parts,* අපේ දිසාවෙන්

Part, *v. a.* කොට්ඨාසකරනවා, භාගකරනවා, බෙදනවා,

වෙන්කරනවා; *to part in two,* දෙකට බෙදනවා; *to bestow a part,* සංභාගීකරදෙනවා; *to part with,* අත්අරිනවා, අහරෙද මිනවා; *see the noun*

Partable, *a.* බෙදකලහැකිවූ, වෙන්කලහැකිවූ

Partake, *v. n. to have a part in,* සහභාගයගන්නවා, පංගුත්ධාරකන්නවා, *to have some thing of the nature of,* සමවෙනවා, එම්සැභාවවෙනවා

Partaker, *s.* සහභාගකාරයා, පංගුකාරයා, සම්භිකාරයා

Parter, *s.* බෙදන්නා, වෙන්කරන්නා

Partial, *a.* පාක්ෂිකවූ, පක්ෂවූ, පාක්ෂිකයකටඅයත්වූ, පැහැරකාටසිත්අදින්නාවූ

Partiality, *s.* පාක්ෂිකකම, පක්ෂකම, පාක්ෂිකයකටඅයත්කම, පැහැරකාටසිත්අදිනාකම

Partialize, *v. a.* පාක්ෂිකයකාටකරනවා, පක්ෂයකාටකරනවා, පැහැරකාටසිත්අලවනවා

Partially, *ad.* පාක්ෂිකයකාටකරනාලෙස, පක්ෂයකාටකරනාලෙස, පැහැරකාටසිත්අලවනලෙස

Participate, *v. a.* සහභාගයගන්නවා, කොටස්ගන්නවා

Participation, *s.* සංභාගයගැනීම, කොටසගැනීම

Participial, *a.* මිශ්‍රක්‍රියාවූ, පූර්වක්‍රියාවූ; *see the noun*

Participle, *s. continuative,* මිශ්‍රක්‍රියාව; *adverbial,* පූර්වක්‍රියාව

Particle, *s. a little of any thing,* ළේශය; *a word unvaried by inflection,* නිපාතය

Particular, *a. individual,* එකමවූ; *not general,* නොහැවූ; *eminent,* ප්‍රධානවූ; *odd or fanciful,* විසිතුරුකාරවූ, සැබෑවූ, අමුතුවූ

Particularity, *s.* එකත්මබව, ප්‍රධානබව, විසිතුරුකාරබව, අමුතුකම; *see the adj.*

Particularize, *v. a.* බේරුම්කරනවා, එකින්එකට තේරුම්කරදෙනවා

Particularly, *ad.* බේරුම්ලෙස, ප්‍රධානලෙස

Partisan, *s.* මහාපක්ෂකාරයා, පාක්ෂිකයකටඅයිතිකාරයා

Partition, *s. the act of dividing,* වෙන්කිරීම, බෙදීම, කොටස්කිරීම; *division,* බෙදනාමේදය *or* බෙදනාබිත්තිය; *the fence which divides the property of two different owners is called,* හද්දල් බිත්තිය

Partition, *v. a.* වෙන්කරනවා, බෙදනවා

Partly, *ad.* කොටස්ලෙස, පංගුලෙස, භාගලෙස

Partner, *s.* සහභාගිකාරයා, පංගුකාරයා, කොටස්කාරයා, හවුල්කාරයා, සමගකාරයා

Partnership, *s.* සහභාගකම,

පක්ෂකාරබව, පක්ෂපාතකාර බව, හවුල්කාරබව, සම්බන්ධ කාරබව

Partridge, s. හබ ජාතිකුරුලා (doubtful)

Parturition, s. ප්‍රසූතකිරීම, වැදීම

Party, s. පක්ෂය, පක්ෂය, සමූහය, පිරිස; the parties, පිරිස; both parties, දෙපිරිසම; the other party, the adverse party, විරුඬපක්ෂය, ප්‍රතිපක්ෂය

Party-coloured, a. නානාවර්ණ වූ

Party-man, s. පාක්ෂිකකාරයා

Parvitude, s. කුඩාකම, කුඩාකම, සුළුකම

Pash, v. a. වද්දනවා, මිරිකනවා

Pass, s. an avenue, විවරය, ඇතුලීම; a passage, or road, මාර්ගය, මග, මාවත, පාර; permission to pass, අවසරය

Pass, v. n. පසුකරනවා, ඇවිදිනවා

Pass, v. a. to go, යනවා; to move from one place to another, ඇවිද්දනවා; to be progressive, පසුකරයනවා. to go beyond, ඉක්මවනවා, එතරයනවා; to vanish away, අතුරුදහන්වනවා, අතුරුදන්වෙනවා; to pass the time, කාලය or කාලයපසුකරනවා, or හරිනවා; to pass by, පසුකර or ලඟින්යනවා; to pass over, පසුමවනවා; to pass the river, ගඟඑතරයනවා, එගොඩයනවා; to pass a law, ආඥාවක්ප්‍රතිෂ්ඨාකරනවා; to pass away, පසුකරයනවා, මැරෙනවා; to pass a severe test, තදවූ විභාගයක් ගෙවා සාර්ථකවෙනවා; I have passed my word for him, මම ඔහුගේ දෙසාක්ෂිකරුව වචනය දුන්නා; to pass sentence, නඩුතීන්දුව කියනවා; to let pass, පසුකරනඩ අවසරදෙනවා

Passable, a. පසුකරඩ පුළුවන්වූ

Passage, s. a way, මාර්ගය, ගමන, පාර; the act of passing, ගමන්කිරීම

Passed, part. පසුකරා, පසුගියා

Passenger, s. ගමන්යන්නා

Passible, a. වේදනාවඩ පුළුවන්වූ, ඔබඩපුළුවන්වූ

Passing, a. supreme, eminent, උතුම්වූ, ප්‍රධානවූ

Passion, s. of anger, උද්‍රහය, කෝපය; of love or affection, කාමය, මෙත්‍රී, ප්‍රසාදය; any violent emotion of the mind, සිත්කලම්බ කිරීම

Passionate, a. කෝපවූ, කාමාවූ, උද්‍රහවූ, සිත්කැළඹුනු; see the noun

Passionately, ad. කෝපයෙලෙස, කාමයෙලෙස, උද්‍රහයෙලෙස, සිත්කැළඹිලෙස

Passive, a. විඳින්නාවූ, ඔරොත්තුදෙන, ඉවසන්නාවූ; a passive verb is කර්මවාච්‍ය

Passively, *ad.* විඳිනාකාරලෙස, ඔරොත්තුලන්නාලෙස, ඉවසනලෙස

Passover, *s.* උපරිගමනමංගල්‍යය

Pass, passport, *s.* අවසරේ

Past, *part.* පසුගිය

Past, *prep.* පසු, පසුකරා; *past age,* මහලුවයසින්පසු; *past cure,* අසාධ්‍යවූ, සුවකරනබැරිවූ; *half an hour past ten,* දසපැයහමාරයි; *past dispute,* විවාදකලනොහැකිවූ, සගතිකවූ, සත්‍යවූ

Paste, *s.* අනාලූපව

Paste, *v. a.* අලවනවා

Pastime, *s.* සෙල්ලම

Pastor, *s. shepherd,* බැටළුඑඬෙරා; *minister,* දේවගැතියා; *the word most in use for a minister is* පාද්‍රි; *Port.*

Pastoral, *a.* බැටළුඑඬෙරවූ, දේවගැතිවූ; *see the noun*

Pasturable, *a.* ගෝචරස්ථානවූ

Pasturage, pasture, *s.* ගෝචරභූමි, ගොචරස්ථානය, බැටළුතෙන

Pasture, *v. a.* ගෝචරකරනවා, ගොදුරුකනවා

Pat, *a.* යුතුවූ, සුදුසුවූ

Pat, *s.* තට්ටුකිරිම

Pat, *v. a.* තට්ටුකරනවා

Patch, *v. a.* අණ්ඩදමනවා; ලාප්පදමනවා; *see the noun*

Patch, *s.* අණ්ඩ, ලාප්පේ; *Port.*

Patcher, *s.* අණ්ඩදමන්නා, ලාප්පදමන්නා

Pate, *s.* ඔළුව

Patent, *s.* බලයදෙනපත්‍රය

Paternal, *a.* පිතෘභාවවූ, පියාවූ, පිතාවූ, පියවූ

Paternity, *s.* පිතෘභාවය

Path, *s.* මාර්ගය, පාර, සුළුමග, පාමග

Pathetical, pathetick, *a.* සිත්අලෙලනනාවූ, සිත්ප්‍රසන්නකෙරෙනාවූ

Pathetically, *ad.* සිත්අලෙලනාලෙස, සිත්ප්‍රසන්නවෙනලෙස

Pathless, *a.* දුර්ගමනවූ, ඉඩියනොහැකිවූ, පාරනැතිවූ

Pathway, *s.* සුළුමග, පාමග, කුඩාපාර, අතුපාර

Patience, *s.* ක්ෂාන්තිය, ඉවසීම, ඉවසිල්ල

Patient, *a.* ක්ෂාන්තිවූ, ඉවසනසුළුවූ, ඉවසිලිවන්තවූ

Patient, *s.* රොගාතුරයා, ලෙඩා

Patiently, *ad.* ක්ෂාන්තිලෙස, ඉවසනලෙස, ඉවසිලිවන්තලෙස

Patriarch, *s.* කුලජ්‍යෙෂ්ඨයා, මුල්මුතුන්

Patriarchal, *a.* කුලජ්‍යෙෂ්ඨවූ, පිතෘභාවවූ

Patrimonial, *a.* කුලයවූ, වංසවූ, ගෝත්‍රවූ, ජන්මවූ

Patrimony, *s.* කුලසම්පත, පරම්පරාඋරුමය

Patriot, *s.* ස්වදේසභක්තිභාවනායා

Patrol, s. මුරකා රයා; පැත්‍රෝල්; *Eng.*

Patrol, v. n. රැකාඅ. විදිනවා, මු රකාරඇවිද්නාවා

Patron, s. ආධාරකාරයා, පිය වෙන්නා

Patronage, s. ආධාරය, උපකාර ය

Patronize, v. a. ආධාරකරනවා උපකාරකරනවා

Patten, s. *of a pillar*; කොනුවිල

Patter, v. n. අඩියැස් වකාරනවා

Pattern, s. ආදර්ශය, අනදුම; මෝ ස්තර; *Port.*

Paucity, s. ස්වල්පකම, සුළුකම, අල්පතාම, කුඩායාම, වකාක ම

Pave, v. a. පාසාණයෙන් වේනායකා රනවා, ගල්ඇල්ලනවා

Pavement, s. පාසාණ ශ්‍රත්වනාය කිරීම, ගලබාල්ඇල්ලීම

Pavilion, s. මණ්ඩපය, වස්ත්‍රකූඩි ය

Pavilion, v. a. මඩපසරහානවා, ව ස්ත්‍රකුටිබදිනාවා

Paunch, s. උදරය, බඩ

Pauper, s. දුවකුන්, දිළිඳුන්, දුප්පතුන්

Pause, s. නැවතීම

Pause, v. n. නවතනවා, සිටුව නවා

Pauser, s. නවත්වන්නා

Paw, s. මුනඅඩිය

Paw, v. n. පදුරගානවා, අඩියෙ ගහනවා

Pawn, v. a. උගස්තියනවා, උකස් කාරතිබනාවා, උකස්තබනා වා

Pawn, s. උගස

Pay, v. a. ගෙවනවා, කුලීදෙනා වා

Pay, s. බැලුය, පඩි, කුලී; *what is your pay for doing this work*, මෙවැඩයකෙරීමට උඹේ බැ ලැයකොමාක; *what pay do you ask per month*, මාසේකට උඹේ ගොපෙ පඩි ඉල්ලනවාද; *I think that a good pay*, ඒක හො ඳ කුලියක් කියා මම හිතනා වා; *how much ought we to pay for that work*, ඒවැඩේටය අ පි කොපමණ ගෙවඩිය්‍යද; *I am quite willing to pay the usual hire*, සිරිත්වූකුලිය ගෙව ඩ මම ඉතාම සතුටුය; *I shall pay him*, ඔහුට මම නයගෙව න්නෙදා; *he was well paid*, ඔහුට හොඳපඩිලැබුනා; *he paid for his folly*, ඔහුගේ අනුවනක මෙන්ජාවිත්ද; *to pay one off as a debt*, නයගෙවනාවා; *as wages to labourers*, කුලීදෙනාවා; *to pay back*, නා. වත ගෙවනාවා

Payable, a. ගෙවඩිය්‍යතුවූ

Payment, s. *of a debt*, නයගෙවී ම; *the act of paying*, ගෙවීම *reward for labour*, කුලීදීම

Pea, s. රටමුං

Peace, s. සමාධිය, *or* සාන්තිය, සමාදානය; *to hold one's peace*, නිස්ශබ්දකාරනාවා

Peace, *interj.* නිස්ශබ්දකරනාවා

Peace-offering, s. සාන්තිපූජාව
Peaceable, a. සමාන්තවූ, සමාද නවූ, සමගිනවූ
Peaceably, ad. සමාන්තිලෙස, සංසුංලෙස, සමාදනලෙස, සමගිනාලෙස
Peaceful, a. සමාන්තවූ, සමාදනාවූ, සමගිනාවූ
Peacefully ad. නිස්චලලෙස, සමාන්තිලෙස, සමාදනලෙස, සමගිලෙස
Peacemaker, s. සමාන්තිකාරන්නා, සමාදනකාරන්නා, සමගිකාරන්නා, නිශ්චලකාරන්නා
Peacock, s. මයුරයා, මොනරා, මොදරා
Peahen, s. මයුරදේනුව, මොනරකිකිලි
Peak, s. මස්තකය, මුදුන
Peal, s. ගර්ජනාව, ඝෝෂාව
Peal, v. n. ගර්ජනාකරනවා, ඝෝෂාකරනවා
Pearl, s. මුතු
Peasant, s. අස්වද්දන්නා
Peascod, peashell, s. රටමුංකරල්
Pebble, s. මුදුගල්
Pebble-crystal, s. පළිඟුවිශේෂයක්
Peccable, a. පාපයෙදෙන්නාවූ
Peccadillo, s. ස්වල්පපාපය, කුඩාවරද
Peccant, a. අපරාධවූ, වරදවූ, පාපවූ
Peck, v. a. පක්ෂින් අඳිලාකනවා, අහිඳිකනවා
Peckled, a. නානාවර්ණවූ

Pectoral, a. ලයටඅයත්වූ
Pectoral, s. ලයටබඳනාභරණ
Peculator, s. හොරලූ කන්නා, මහ රකාශිකරන්නා
Peculiar, a. නියමිවූ, අයිතිවූ, ගුනුවූ, සුදුසුවූ
Peculiarity, s. නියමිස්භාවය
Peculiarly, ad. ප්‍රධානවූ
Pecuniary, a. මුදල්වූ, මිලවූ
Pedagogue, s. ගුරුන්නාන්සේ
Pedal, a. පාදයටඅයිතිවූ, අඩියට අයිතිවූ
Pedaneous, a. පයින්යන්නාවූ
Pedant, s. තමන් උගත්කමින්පාරම්බුකරන්නා, or පාරම්බුකාරයා
Pedantick, a. තමන් උගත්කම්ප්‍රසංසාකරන්නාවූ
Peddle, v. n. නිස්ඵලදෙයකරනවා
Pedestal, s. කණුමුල, පදනම
Pedestrious, a. පයින්යන්නාවූ
Pedicle, s. නාටිල්ල, නැටිව
Pedigree, s. *lineage, genealogy, &c.* කුලය, ගෝත්‍රය, වංසය, ජන්මය; *account of descent,* පරම්පරාකථාව
Pedlar, s. සංචාරනයකොටවස්තු ළද බඩුවිකුනන්නා
Pedobaptism, s. ළදරුවන්බව්තිස්මකිරීම
Peel, v. a. ලෙලිගහනවා, පතුරුඅරිනවා
Peel, s. ලෙලි, පතුරු, පට්ටා
Peeler, s. ලෙලිගහන්නා, පට්ටිගහන්නා

Peep, *v. n.* එබිබලනවා

Peep, *s.* එබිබැලීම; *peep-hole, peeping-hole,* එබිබලනසිදුර

Peer, *s. one of equal rank,* සමාන වංසය; *an equal, a companion,* සමානයන්කෙනා; *a nobleman,* ශ්‍රේෂ්ඨයා, වංශාධිපතියා

Peerage, *s.* ශ්‍රේෂ්ඨබව, උතුම්බව, ජනපතිබව

Peerless, *a.* අතුලවූ, අසමානවූ, සමානයෙක් නැතිවූ

Peevish, *a.* නොරිස්සුම්ගතිවූ, සරහාඅවිකවූ

Peevishly, *ad.* නොරිස්සුම්ලෙස, සරහාඅවිකලෙස

Peevishness, *s.* නොරිස්සුම්කම, සරහාඅවිකකම

Peg, *s.* වල්අකේන්

Peg, *v. a.* වල්අකෙනගහනවා

Pelf, *s.* මුදල, අසත්‍යයෙන්ලැබුනධනය, අධම්මධනය, පාපවස්තුව

Pelican, *s.* බටුබලාකා, *or* බටුමානා

Pell mell, *a.* ඝෝෂාවූ, ඝෝෂාවූ, කෝලාහලවූ

Pellet, *s.* මුගුරුබස්

Pellicle, *s.* සිවිය, හැවිය

Pellucid, *a.* විශද, පවිත්‍ර, සුඛ

Pellucidity, pellucidness, *s.* විශදකම, පැහැදිලිකම, නිර්මලකම, පරිසිදුකම

Pelt, *s.* චර්මය, හම

Pelt, *v. a.* විසිකරනවා, ගහනවා

Pelvis, *s.* ජඝනය

Pen, *s. a coop,* පට්ටිය; *to write with,* පිහාටුව; පෑන, *Port. the stile used by the Natives to write with,* උල්කටුව, පන්හිද

Pen, *v. a. to coop,* පට්ටියේබඳිනවා, හිරඅඩස්සිකරනවා; *to write,* ලියනවා

Penal, *a.* දඬුවම්කරන්නාවූ, අවිවනාරන්නාවූ

Penalty, penality, *s. punishment,* දඬුවම්කිරීම, අවවුකිරීම; *forfeiture,* දඩය

Penance, *s.* තාපසකම, තපස්කම

Pencil, *s.* අඳිනකූර; පොතලොත් කූර, *Port.*

Pencil, *v. a.* අඳිනවා, චිත්‍රකරනවා, සිතියම්කරනවා

Pendant, *s. ornament,* කර්ණාභරණය, එල්ලෙනආභරනා; *of a ship,* නැවේකොඩිය

Pendants, *s.* කොතොක් එහෙන්දී බැඳුවාවූ

Pendent, *a.* එල්ලෙන්නාවූ

Pending, *a. as a law suit,* තීන්දුනැති නඩුවිභාගය

Pendulous, *a.* එල්ලෙන්නාවූ

Penetrable, *a.* කාරාකලහැකිවූ, සිදුරුකලහැකිවූ

Penetrability, *s.* කාරාකලහැකිබව, සිදුරුකලහැකිබව

Penetrate, *v. a.* කාරාකරනවා, සිදුරුකරනවා, අනිනවා; *the nail penetrates the wood,* ඇනය ලීයේඇතුලට වදිනවා; *the army never halted till they had penetrated into the centre of the enemy's*

country, දූඩප්පොව සතුරන් ගෙන්දෙනය මිඩාට යතාතුරු බවුණිහිතුවෙහා

Penetration, *s.* ප්‍රවිෂ්ටවීම, ඇතුලවැදීම; *acuteness*, තියුණුකම, දක්ෂකම, සමර්ථකම

Penetrative, *a.* තියුණුවූ, දක්ෂවූ, සමර්ථවූ

Peninsula, *s.* දේස තුඩුව

Penitence, *s.* අනුතාප, පශ්චාත්තාප කාපය, සිතතැවීම

Penitent, penitential, *a.* පශ්චාත්තාප ඇවූ, පසුතැවුලවූ, සිතතැවෙනාවූ

Penitent, *s.* පශ්චාත්තාපයා

Penitently, *ad.* පශ්චාත්තාපලෙස, පසුතැවුල්ලෙස, සිත්තැවුල්ලෙස

Penknife, *s.* පිහියවුතනපනාපිහිය; පෑනමැස්පිහිය; *Port.*

Penman, *s.* ලේඛනයකාරන්නා, ලියන්නා

Pennant, *s.* ධජය, කුඩාකොඩිය

Penniless, *a.* නිවින්වූ, මිලනැති

Pennon, *s.* ධජය, කුඩාකොඩියවූ

Penny, *s.* මස්ස

Pensile, *a.* එල්ලෙන්නාවූ

Pension, *s.* ප්‍රසාදය, දීමනාව

Pensioner, *s.* ප්‍රසාදලැබෙන්නා

Pensive, *a.* මෙනෙහිකරන්නාවූ, දුක්ඛිතවූ, සෝකයිත්වූ

Pensively, *ad.* මෙනෙහිකරනා ලෙස, දුක්ඛිතලෙස, සෝකයිත්ලෙස

Pensiveness, *s.* මෙනෙහිකරනා කම, දුක්ඛිතකම, සෝකයිත්කම

Pent, *part. pas.* වට්ටිකරපු

Pentagon, *s.* පස්කොන

Pentangular, *a.* පස්කොන්වූ

Pentateuch, *s.* මෝසෙස්ගේ විස්ට සථාව

Pentecost, *s. the word*, පෙන්තකොස්ත *is adopted where this word occurs in Scripture*

Penthouse, *s.* පිලසස, පලය

Penurious, *a.* අදත, නිකුම්වූ, කන්හාවූ, මසුරුවූ, ලෝභවූ

Penuriously, *ad.* අදත, නිකුම්ලෙස, කන්හාලෙස, මසුරුලෙස, ලෝභලෙස

Penuriousness, *s.* අදතවීම, නිකුම්වීම, කන්හාවීම, මසුරුවීම, ලෝභවීම

Penury, *s.* නිවින්කම, දිලිඳුකම, දුප්පත්කම

People, *s.* ජනයෝ, දනෝ, මනුෂ්‍යයෝ

People, *v. a.* ජනගහනවෙනවා

Pepper, *s.* මරිච, ගම්මිරිස්; *blackpepper*, කාලමරිච, කළු මිරිස්

Pepper, *v. a.* මිරිස්දමනවා

Pepper-box, *s.* මිරිස්බහාජනය

Peptick, *a.* ජීර්ණකරන්නාවූ

Peradventure, *ad.* බොහෝවිට සමහර විට

Perambulate, *v. a.* සංචාරකරනවා

රනවා, භ්‍රමනායකාරනවා, ඇවිදිනවා

Perambulation, *s.* සංචාරනායකිරීම, භ්‍රමනායකිරීම, ඇවිදීම

Perceivable, *a.* ද්‍රිශ්‍යමානාවූ, දක්ෂිනයවූ, දක්ඛ්‍යපුලුවන්වූ, පෙනෙන්නාවූ, දැනෙන්නාවූ; *see the verb*

Perceive, *v. a. to discover,* ද්‍රිශ්‍යමානාවෙනවා, දෂ්ඨනායවෙනවා, දකිනවා, පෙනෙනවා; *to know,* දැනෙනවා

Perceptibility, *s.* ද්‍රිශ්‍යමානාවෙනබව, දෂ්ඨනායවෙනබව, දකිනාබව, දැනෙනාබව

Perceptible, *a.* හැඟෙන්නාවූ, දැනුම්වෙබ්ඛ්‍යපුලුවන්වූ

Perception, *s.* ප්‍රජ්ඥාව, හැඟීම, දැනීම

Perceptive, *a.* හැඟෙන්නාවූ, දැනෙන්නාවූ

Perch, *s.* ලශ්නාතහා

Perch, *v. n.* ගසල්ලගිනවා

Perchance, *ad.* සම්භාරවීට, භාග්‍යවෙලාවට

Percipient, *a.* හැඟෙන්නාවූ, දැනෙන්නාවූ; *see the verb*

Perdition, *s.* විනාසය, නාස්තිය, නැතිවීම

Perdue, *ad.* ගහවුනුලෙස

Perigrinate, *v. n.* පරිසරායැවිදිනවා, භ්‍රමනායකාරනවා, සංචාරනායකාරනවා, ගමින්ගමට යනවා

Perigrination, *s.* භ්‍රමනායකිරීම, සංචාරනායකිරීම, පරිසරායැවිදීම, ගමින්ගමටයෑම

Peremptorily, *ad.* තදබලලෙස

Peremptory, *a.* තදබලවූ

Perennial, *a.* චිරාන්තවූ, චිරකාලවූ, නොනවතින්නාවූ

Perfect, *a. complete,* සම්පූර්තවූ, සම්පූර්ණවූ, පිරුනාවූ; *pure,* නිර්මලවූ, පිරිසිදුවූ; *fully informed,* බහුශ්‍රැතවූ, ප්‍රාමාණගතනාවූ; *not defective,* හරිවූ

Perfect, *v. a.* සම්පූර්තකාරනවා, සම්පූර්ණකාරනවා, පුරවනවා, හරිගස්සනවා; *see the adj.*

Perfection, *s.* සම්පූර්තවීම, සම්පූර්ණවීම, පිරීම

Perfectionate, *v. a.* හරියට කාරනවා

Perfectly, *ad.* සම්පූර්තලෙස, සම්පූර්ණලෙස, පුරවනලෙස, හරිලෙස; *see the adj.*

Perfectness, *s.* සම්පූර්තකම, සම්පූර්ණකම, පිරුන්කම, හරිකම; *see the adj.*

Perfidious, *a.* ද්‍රෝහිවූ, ප්‍රයෝගවූ, වංචාවූ, අවිශ්වාසවූ

Perfidiously, *ad.* ද්‍රෝහිලෙස, ප්‍රයෝගලෙස, වංචාලෙස, අවිශ්වාසලෙස

Perfidiousness, perfidy, *s.* ද්‍රෝහිකම, ප්‍රයෝගකම, වංචාකම, අවිශ්වාසකම

Perforate, *v. a.* සිදුරුකාරනවා

Perforation, *s.* සිදුරුකිරීම

Perforce, *ad.* බලෙන්

Perform, *v. a.* *to achieve*, ඉෂ්ටකරගන්නවා, සම්පාදනයකරනවා; *to do*, කරනවා; *it required great skill to perform so important a work*, මේ බලවත් වැඩ ඉෂ්ට කරන්ට සමර්ථකමින් ඕනෑ වෙච්චේය; *I have performed my duty according to my engagement*, මම මගේ පොරොන්දුව පරිදි මගේ යුතුකම කළෙමි; *he will not be able to perform the work*, ඒ වැඩය කරන්ට ඔහු සමර්ථවෙන්නේ නැත

Performance, *s.* ඉෂ්ටකිරීම, සම්පාදනකිරීම; *see the verb.*

Performer, *s.* ඉෂ්ටකරන්නා, ක්‍රියාකරන්නා: *see the verb*

Perfume, *s.* සුගන්ධ, මිශ්‍රසුවඳ, සුවඳ

Perfume, *v. a.* සුගන්ධකරනවා, සුවඳ ගන්වනවා, සුවඳදුම්දෙනවා

Perfumer, *s* සුගන්ධකරන්නා, සුවඳකාරයා

Peruse, *v. a.* බලනවා, අඳුනනවා

Perhaps, *ad.* බොහෝවිට, *or* බොහෝවෙලාව, සමහරවිට

Pericilitation, *s.* උපද්‍රවීම, විපා ගත්වීම, අපායකම

Peril, *s.* භයසා, උපද්‍රවය, අන්තරාව

Perilous, *a.* භයවූ, භයානකවූ, උපද්‍රවූ, අන්තරාවූ

Perilously, *ad.* භයසහලෙස, භයානකලෙස, උපද්‍රලෙස, අන්තරාලෙස

Period, *s.* *a circle*, චක්‍රය, කාලය; *a round of time in which any thing may be performed*, සමය, දශාව, කාලය, වකාවතුව; *fixed time*, නියමකාලය; *end*, කෙළවර, අවසානය

Periodick, periodical, *a.* කාලක්‍රමවූ, යථකාලවූ, නියමකාලවූ

Periodically, *ad.* කාලක්‍රමලෙස, යථාකාලලෙස, නියමිකාලලෙස, කාලයෙන්කාලයට

Perish, *v. n.* නාස්තිවෙනවා, විනාශවෙනවා, නැතිවෙනවා

Perishable, *a.* නාස්තිවෙන්නාවූ, විනාශවෙන්නාවූ, නැතිවෙනනාවූ

Peritoneum, *s.* බඩවැල්වසාතිබෙනසිවිය

Perjure, *v. n.* බොරුදිවුරනවා

Perjurer, *s.* බොරුදිවුරන්නා

Perjury, *s.* බොරුදිවුරීම

Periwig, *s.* බොරුකොණ්ඩ

Perk, *v. n.* නාහයෙසිටිම්ගන්නවා

Permanence, permanency, *s.* සථිරවීම, පැවතීම

Permanent, *a.* සථිරවූ, පවතින්නාවූ

Permanently, *ad.* සථිරලෙස, පවතිනලෙස

Permeable, *a.* අතරෙරිංගිය පුළුවන්වූ

Permeate, *v. a.* අතරෙරිංගනවා

Permissible, *a.* සමුදියහැකිවූ, අවසරදෙන්ට පුළුවන්වූ

Permission, *s.* සමුදීම, අවසරය

Permissive, *a.* සම්මුදෙන්නාවූ, අවසරදෙන්නාවූ

Permit, *v. a.* සම්මුදෙනවා, අවසරදෙනවා

Permit, *s.* අවසරපත්‍රයක්

Permittance, *s.* සම්මුදීම, අවසරදීම

Permutation, *s.* වෙනස්කිරීම, වෙනස්කිරීම

Permute, *v. a.* වෙනස්කරනවා, වෙනස්කරනවා

Pernicious, *a.* විනාසකරන්නාවූ, විසම්වූ, දුක්කාරකවූ

Perniciously, *ad.* විනාසකරනලෙස, විසමලෙස, දුක්කාරකලෙස

Perpend, *v. a.* මෙනෙහිකරනවා, සිහිකරගන්නවා

Perpendicular, *a.* අවකුවූ, කෙළින්වූ

Perpendicularly, *ad.* අවකුලෙස, කෙළින්ලෙස

Perpetrate, *v. a.* දුෂ්ටකරනවා; *in a bad sense,* දුස්කර්මකරනවා, මහාපාපකරනවා

Perpetration, *s.* දුෂ්ටකිරීම, දුස්කර්මකිරීම, මහාපාපකිරීම

Perpetual, *a.* චිරාත්කාලවූ, නිත්‍යවූ, නිතරපවත්නාවූ, නොනවතින්නාවූ

Perpetually, *ad.* චිරාත්කාලලෙස, නිත්‍යලෙස, නිතරපවත්නාලෙස

Perpetuate, *v. a.* නිතරපවත්වනවා

Perpetuation, *s.* චිරාත්කාලයෙහි පැවැත්වීම

Perpetuity, *s.* චිරාත්කාලයෙහිපැවතීම

Perplex, *v. a.* කරදරකරනවා, කැලඹෙනසේකරනවා, කැලඹීකරනවා

Perplexedly, *ad.* කරදරකරනලෙස, කැලඹෙනසේකරනලෙස, කැලඹීකරනලෙස

Perplexedness, perplexity, *s.* කරදරකරනකම, කැලඹෙනසේකරනකම, කැලඹීකරනකම

Perquisite, *s.* ආගන්තුකලාභය, ලාභය, ප්‍රයෝජනය

Perquisition, *s.* විභාගකිරීම

Persecute, *v. a.* හිංසාකරනවා, පීඩාකරනවා, නිතරකරදරකරනවා

Persecution, *s.* හිංසාකිරීම, පීඩාකිරීම, කරදරකිරීම, නිතරකරදරකිරීම

Persecutor, *s.* හිංසාකරන්නා, පීඩාකරන්නා, කරදරකරන්නා

Perseverance, *s.* අනවරතකිරීම, චිරාත්කාලයෙහිපැවතීම, නොනවත්වාකිරීම, අත්නොහැරීම

Persevere, *v. n.* අත්නොහැරකරනවා

Perseveringly *ad.* අත්නොහැරකරනලෙස

Persist, *v. n.* ස්ථිරලෙසසිටිනවා, අත්නොහැරකරනවා

Person, *s.* කෙනෙක්, අයෙක්, ස මෙක්

Personable, *a.* සෝභනවූ, ආචාර වත්වූ

Personage, *s.* උත්කෘෂ්ටයා, උත් තමයා, ශ්‍රේෂ්ඨයා

Personal, *a.* යමෙකුටඅයිතිවූ, කෙ නෙකුටඅයිතිවූ, අයෙකුටඅයි තිවූ

Personality, *s.* තත්වය, ස්වභාව ය

Personally, *ad.* ස්වභාවලෙස

Personate, *v. a.* වේසධාරීවෙන වා, වෙස්දරනවා, යමෙක්ගේව නුවෙන්කරනවා

Personification, *s.* වේසධාරීවීම, වෙස්දැරීම, යමෙක්ගේවෙනුවෙ න්කිරීම

Personify, *v. a.* ස්වරූපකරනවා

Perspective, *s.* දෘෂ්ටිය, දර්ශනය

Perspective, *a.* දෘෂ්ටිවූ, දර්ශනවූ

Perspicacious, *a.* තීක්ෂණසිත්වූ

Perspicacity, *s.* තීක්ෂණසිත

Perspicuity, *s.* විජිතකම, ප්‍රකාශ කම, පැහැදිලිකම, එළියබව

Perspicuous, *a.* විජිතවූ, ප්‍රකාශවූ, පැහැදිලිවූ, එළිවූ

Perspicuously, *ad.* විජිතලෙස, ප්‍ර කාශලෙස, පැහැදිලිලෙස, එ ළියලෙස

Perspiration, *s.* ස්වේදය, ඩහ දිය

Perspire, *v. n.* ඩහදියදමනවා

Persuadable, *a.* එක්සිත්වෙන්ඩ පු ළුවන්වූ, මනාපකරන්ඩ පුළු වන්වූ

Persuade, *v. a.* *to bring over to the same opinion,* එක්සිත්කරනවා, මනාපකරනවා *to expostulate with,* අවවාදකරනවා, හිත්මවනවා ; *to persuade one's self,* තමන්ටම අවවාදකර ගන්නවා, *or* සැනසීමකරනවා ; *I cannot be persuaded of it,* ඒක සැබෑවත් කියා මට සහතික වෙන්ඩබැරිය

Persuader, *s.* හිත්මවන්නා, එක් සිත්කරන්නා, මනාපකරන් නා ; *see the verb*

Persuasion, *s.* හිත්මවීම, එක් සිත්කිරීම, මනාපකිරීම, අව වාදකිරීම ; *see the verb*

Persuasive, *a.* හිත්මවන්නාවූ, එක්සිත්කරන්නාවූ, මනාප කරන්නාවූ

Pert, *a.* සම්ජීවූ, නොගෞරවවූ

Pertain, *v. n.* අයිතිවෙනවා, අ යිත්තුවෙනවා

Pertinacious, *a.* සඹුඩිවූ, හිතුව ක්කාරවූ

Pertinaciously, *ad.* සඹුඩිලෙස, හිතුවක්කාරලෙස

Pertinacity, pertinaciousness, *s.* සඹුඩිකම්, හිතුවක්කාරකම්

Pertinence, pertinency, *s.* යුතුකම, සුදුසුකම

Pertinent, *a.* *just to the purpose,* යු තුවූ, සුදුසුවූ ; *relating to,* අයි තිවූ, අයිත්තුවූ

Pertinently, *ad.* යුතුලෙස, සුදුසු ලෙස, අයිතිලෙස, අයිත්තු ලෙස ; *see the adj.*

Pertly, *ad.* දඞ්ඩලෙස, කඩිසරලෙස, සමච්චලෙස

Pertness, *s.* දඞ්ඩකම, සමච්චලකම, කඩිසරකම

Perturb, perturbate, *v. a.* වියවුලකරනවා, කරච්චල්කරනවා, කැලඹවනවා, කරදරකරනවා, සිත්කලඹිනවා

Perturbation, *s.* වියවුලකිරීම, සිත්කැලඹීම, කරදරකිරීම, කරච්චල්කිරීම, කැලඹවීම

Pertusion, *s.* සිදුරුකිරීම

Pervade, *v. a.* ප්‍රවිෂ්ටවෙනවා, අභ්‍යන්තරවෙනවා, ඇතුල්වෙනවා

Pervasion, *s.* ප්‍රවිෂ්ටවීම, අභ්‍යන්තරවීම; ඇතුල්වීම

Perverse, *s.* *distorted,* විපරීතවූ; *peevish,* දුෂ්ටසිත්වූ; *untractable,* කීකරුනැතිවූ, අහංකාරවූ; *stubborn,* හිතුවක්කාරවූ

Perversely, *ad.* විපරීතලෙස, දුෂ්ටසිත්ලෙස, අහංකාරලෙස, හිතුවක්කාරලෙස

Perverseness, *s.* විපරීතකම, හිතුවක්කාරකම

Perversion, *s.* විපරීතවීම, අවක්‍රියාවීම; *see the verb*

Perversity, *s.* විපරීතකම, අවක්‍රියාකම

Pervert, *v. a.* *to distort from the right purpose,* පෙරලනවා, විපරීතකරනවා, *to corrupt,* දුෂ්ටකරනවා, අවක්‍රියාකරනවා

Perverter, *s.* විපරීතකරන්නා, අවක්‍රියාකරන්නා

Pervious, *a.* ප්‍රවිෂ්ටකලහැකිවූ, කාහාරකලහැකිවූ, සිදුරුකලහැකිවූ

Perviousness, *s.* ප්‍රවිෂ්ටකලහැකිකම, කාහාරකලහැකිකම, සිදුරුකලහැකිකම

Peruke, *s.* බොරුකොණ්ඩය

Perusal, *s.* භාවනාකිරීම, කියවීම; *see the verb*

Peruse, *v. a.* *to read,* කියවනවා; *to examine,* විභාගකරනවා

Pest, *s.* *pestilence,* වසන්තකරෝගය, වදුරුරෝගය; *a nuisance,* පීඩාව, හින්සාව

Pester, *v. a.* හින්සාකරනවා, කරදරකරනවා, කරච්චල්කරනවා, සිත්කලඹිනවා

Pestilence, *s.* වසන්තරෝගය, වදුරුරෝගය

Pestilent, *a.* වසන්තසහිතවූ, වදුරුරෝගවූ

Pestle, *s.* මෝල්ගහ, මෝල

Pet, *s.* *a fit of anger,* තරහ; *a favorite animal,* සුරතල්සතෙක්

Pet, *v. a.* සුරතල්කරනවා, ආදරයකරනවා

Petit, *a.* කුඩා

Petition, *s.* *a written request,* ප්‍රාර්ථනාපත්‍රය, *a prayer,* යාඥාවීම, ඉල්ලීම

Petition, *v. a.* යාඥාකරනවා, ඉල්ලනවා

Petitioner, *s.* යාඥාකරන්නා, ඉල්ලුම්කාරයා

Petre, *s.* වෙඩිලුණු

Petrefaction, *s.* ගල්වීම

Petrify, v. n. ගල්වෙනවා

Petticoat, s. සාය; Port.

Pettish, a. කෙඩෙරවූ, සරාසවූ

Pettishness, s. කෙඩෙරකම, සරාසකම

Petty, a. සුලු, අල්ප, සුළු, කුඩා

Petulant, a. කෝපවූ, සරසවූ, උඩඟුවූ

Petulantly, ad. කෝපලෙස, උඩඟුලෙස, සරසලෙස

Pew, s. ආසනය

Pewter, s. [illegible]

Phænomenon, s. ආශ්චර්යය, අපූර්ව, පුදුමය

Phantastical, phantastick, a. සිතුවිලිකාරවූ

Phantom, s. භූතයා, ප්‍රේතයා, හොල්මන

Pharmacologist, s. වෛද්‍යශාස්ත්‍රඥයා

Pharmacology, s. වෛද්‍යශාස්ත්‍රය

Pharmacy, s. බෙහෙත්ශාලාව

Phasis, s. *appearance*, පෙනීම; *of the moon*, අවපූර්ණකම

Pheasant, s. වලිකුකුළා

Phenomenon, s. ආශ්චර්යය, හාස්කම, පුදුමය

Phial, s. කුප්පිය; බෝතලේ; Por.

Philanthrophy, s. මනුෂ්‍යවර්ගයාට සහායය

Philip, v. a. ඇඟිලිවලින්ගහනවා

Philological, a. ව්‍යාකරණපණ්ඩිතවූ

Philologist, s. ව්‍යාකරණපණ්ඩිතයා

Philology, s. ව්‍යාකරණශාස්ත්‍රය

Philosopher, s. පණ්ඩිතයා, ශාස්ත්‍රඥයා, විද්‍යාවන්තයා

Philosophick, philosophical, a. පණ්ඩිතවූ, ශාස්ත්‍රවූ, විද්‍යාවන්තවූ, ඥානවූ

Philosophy, s. පණ්ඩිතකම, විද්‍යාවන්තකම, ශාස්ත්‍රවන්තකම, සිල්පය

Philter, v. a. පිළිබඳසිත්කරවනවා

Phlegm, s. කඵ, සෙම, සෙමලක්ෂණය

Phlegmatick, a. කඵවූ, සෙම්වූ, සෙලස්මාවූ

Phleme, s. ඊදිකටුව

Phrase, s. කථාවක්, උපමාවක්, භාෂාවේ විධිය

Phrase, v. a. නම්තබනවා

Phraseology, s. වාක්කම

Phrenetick, a. වස්මරරෝගවූ

Phrensy, s. වස්මරරෝගය

Physical, a. *not moral*, ස්වභාවවූ, ජන්මවූ; *medicinal*, බෙහෙසදවූ, ඖෂධවූ, බෙහෙත්වූ

Physician, s. වෛද්‍යාචාර්යයා, චිකිත්සකයා, වෙද

Physick, s. චිකිත්සා, බෙහෙසද, ඖෂධ, බෙහෙත්

Physick, v. a. විරේචනකරනවා, සුවකරනවා

Physiognomy, s. *the face*, මුඛය, මුහුණ; *the art of discovering the temper from the face*, සාමුද්‍රිකලක්ෂණශාස්ත්‍රය

Physiology, s. ලෝකස්වභාවයන් ශාස්ත්‍රය සම්පාදන්කර්ම

Phytivorous, a. තෘණවර්ගකන්නාවූ

Phytography, s. ශාකවර්ගශාස්ත්‍රය

Piazza, s. සාලාවීදිය

Pick, v. a. අවුලනවා, තෝරාගන්නවා, ඇඹිලනවා; *to pick out*, අවුලනවා, ඇහිඳිනවා; *to pick the sense out*, අභිප්‍රාය තෝරනවා; *to pick a bone*, කටුඅරිනවා; *to pick a lock*, කට්ටවෙන් යතුරඅරිනවා; *to pick a quarrel*, දබර කරනවා; *to pick one's tooth*, දත්හාරනවා; *to pick a hole in another's coat*, වරදසොයනවා; *to pick a bird*, පක්ෂියෙක් පියාසර අරිනවා

Pickaxe, s. ගල්කටුව

Picker, s. තෝරාගන්නා; *a tooth-picker*, දත්කටුව

Pickle, s. අච්චාරු; *Port.*

Pickle, v. a. අච්චාරුසාදනවා

Picklock, s. යතුරඅරිනකටුව

Pickpocket, pickpurse, s. මඩියත් කැකඩනාහොරා

Picktooth, s. දත්කටුව

Picture, s. චිත්‍රය, රූපය

Picture, v. a. චිත්‍රකම්මාන්තකරනවා, සිතායම්කරනවා, රූප අඳිනවා

Piddle, v. n. මුත්‍රකරනවා

Pie, s. පේස්තෑල; *Port.*

Piebald, a. නානාවර්ණවූ

Piece, s. කෑල්ල, කෑබැල්ල, කෑවය; *a piece of cloth*, රෙදිකෑබැල්ල; *a piece of money*, මුදලක්; *a piece of work*, වැඩක්; *all of a piece*, සියල්ලම එකාකාරයි; *a field piece*, කාලතුවක්කුව; *a fowling piece*, අත්තුවක්කුව

Piece, v. a. එකතුකරනවා, සන්ධිකරනවා

Piecemeal, ad. වෙන්වෙන්ව

Pier, s. කණුව, කුළුණ

Pierce, v. a. විදිනවා, සිදුරුකරනවා, අනිනවා

Pierce, v. n. ප්‍රවේශවෙනවා, අභ්‍යන්තරවදිනවා, ඇතුලට යනවා

Piercingly, ad. තීක්ෂණලෙස, තියුණුලෙස

Piety, s. දේවභක්තිකම, භක්තිවන්තකම, ධර්මිෂ්ඨකම, සැදැහැවත්කම

Pig, s. සූකරයා, ඌරා

Pig, v. a. ඌරෝපිළදනවා

Pigeon, s. පාරාවත, පරෙවියා; *a wood pigeon*, කොබෙයියා

Pigeon-house, s. පරවගේ, පරවි කූඩුව

Pigmy, s. මිට්ටා

Pike, s. හෙල්ල, ලන්සය

Piked, a. තියුණු වූ, තුඩු ඇතිවූ

Pikeman, s. හෙල්ලදරනසෙබළයා

Pile, s. රැස්කිරීම, ගොඩගැසීම; *pile of buildings*, ගෙවල්සමූහය

Pile, v. a. රැස්කරනවා, ගොඩකරනවා

Piles, s. අර්ශස්රෝගය
Pilfer, v. a. සොරකම්කරනවා
Pilferer, s. සොරා
Pilgrim, s. තීර්ථයාත්‍රිකයා, තීර්ථගමනයකරන්නා, සඤ්චාරිකයා, වන්දනාවටයන්නා
Pilgrimage, s. තීර්ථයාත්‍රාකිරීම, තීර්ථගමනයකිරීම, සඤ්චාරණයකිරීම, වන්දනාවටයෑම
Pill, s. ඖෂධගුලිය
Pill, v. a. ලෙලිඅරනවා, පතුරුගහනවා
Pillage, s. උදුරාගැනීම, කොල්ලකෑම
Pillage, v. a. උදුරාගන්නවා, කොල්ලකනවා
Pillager, s. උදුරාගන්නා, කොල්ලකන්නා
Pillar, s. ස්ථම්භ, කණුව
Pillow, s. හිසඔබාතබනතැන, කොට්ටෙව
Pillow, v. a. කොට්ටෙටඋඩසතබනවා
Pillow-case, s. කොට්ටෙඋරය
Pilot, s. නැවැහියා
Pilot, v. a. නැවැහියම්කම්කරනවා
Pimenta, s. මිරිස්වගයක්
Pimp, s. අඹුකාන්තෝරුවා; P.
Pimp, v. a. අඹුකාන්තෝරුකම්කරනවා
Pimping, a. කුඩාවූ
Pimple, s. බිබිල, කුරුලෑව

Pin, s. අල්පෙනෙත්තය; Port. *a wooden pin*, ලීඇණය; *an iron pin*, යකඩඇණය
Pin, v. a. අල්පෙනෙත්තිගහනවා
Pincase, s. අල්පෙනෙත්තිකොපුව
Pincers, s. අඬුව
Pinch, v. a. කොනගහනවා
Pinch, s. කෙනෙටීම
Pincushion, s. අල්පෙනෙත්තිකොට්ටෙට
Pine, v. n. ක්ෂයවෙනවා, දුර්වලවෙනවා, කෘශවෙනවා
Pineapple, s. අන්නාසි
Pinfold, s. පට්ටිය
Pinion, s. පිලපත; *for the hand*, අත්විලංගුව, අත්මාවුව
Pinion, v. a. පියාසරබඳිනවා, අත්මාවුදමනවා; *see the noun*
Pinnace, s. කුඩාඔරුවක්
Pinnacle, s. මස්තකය, මුදුන, කොත
Pioneer, s. පයිනේරුකාරයා; E.
Pious, a. දේවභක්තිවූ, සම්භාවන්තවූ, ධර්මිෂ්ඨවූ, සැදැහැවත්වූ
Piously, ad. දේවභක්තිලෙස, සම්භාවන්තලෙස, ධර්මිෂ්ඨලෙස, සැදැහැවත්ලෙස
Pipe, s. *a tube of any kind*, නල; *an instrument of music*, නලාව; *for smoking*, දුම්නල; *a cask*, පීප; *Por. windpipe*, උගුරුදණ්ඩ
Pipe, v. a. නලාපිඹිනවා

Piper, *s.* නලාපිඹින්නා
Pipetree, *s.* බදාගස
Pipkin, *s.* වලද
Piquant, *a.* තියුණුවූ, තිත්තවූ
Pique, *s.* ඊර්ෂ්‍යාව, කෝපය
Pique, *v. a.* ඊර්ෂ්‍යාකරනවා, කර කරනවා; *to value one's self on,* තමන්ගේ ගුණ ගැන ආඩම්බර කරනවා
Piracy, *s.* උදුරාගැනීම, කොල්ල කෑම
Pirate, *s.* උදුරාගන්නා, කොල්ල කාරයා
Pirate, *v. a.* උදුරාගන්නවා, කොල්ලගන්නවා
Piratical, *a.* උදුරාගන්නාවූ, කොල්ලගන්නාවූ
Piscation, *s.* මසුන් ඇල්ලීම
Pisces, *s.* මීනලග්නය
Pish, *interj.* ඉස්
Pismire, *s.* රතුකූඹියා
Piss, *v. n.* මුත්‍රකරනවා
Piss, *s.* මුත්‍ර
Pistillation, *s.* මෝල්කොටීම
Pistol, *s.* අත්තුවක්කුව; පිස්තෝලේ; *Por.*
Pistol, *v. a.* අත්තුවක්කුවෙන් වෙඩිතබනවා
Pit, *s. a hole in the ground,* වල; *the pit of the stomach,* ආමාශ කොන්ත; *the arm-pit,* කිහිල්ල
Pit, *v. a.* වලගාරනවා
Pitapat, *s.* ගැහුම
Pitch, *s.* කීල්; *degree, rate,* ක්‍රමය, පිළිවෙල
Pitch, *v. a.* කින්ගානවා; *to fix* හිටුවනවා; *to order, to appoint,* නියමකරනවා; *to cast forward,* විසිකරනවා; *to pitch a tent,* වස්තුකූඩාරම් හිටුවනවා; *to pitch the camp,* කඳවුරු බඳිනවා; *to pitch upon a time,* දවසක් නියමකරනවා; *to pitch upon a thing,* යමක් තෝරාගන්නවා
Pitcher, *s.* කලය, පැන්කලය
Pitchy, *a.* කීල්වූ
Piteous, *a.* ශෝකවූ, දුක්ඛිතවූ, කණගාටුවූ, ලතවූ
Piteously, *ad.* ශෝකලෙස, දුක්ඛිතලෙස, කණගාටුලෙස, ලතවූලෙස
Pith, *s. the marrow of plants,* මදය, මොල; *strength,* බලය, ශරය
Pithiness, *s.* ශරකම, බලකම
Pithless, *a.* දුර්වලවූ, වයක්නැතිවූ
Pithy, *a.* මදයවූ, මොලවූ, ශරවූ, බලවූ; *see the noun.*
Pitiable, *a.* කරුණාවට සුදුසුවූ
Pitiful, *a. melancholy,* දුක්ඛිතවූ, ශෝකවූ, ලතවූ, කණගාටුවූ, *compassionate,* දයාවූ, කරුණාවූ; *contemptible,* නීචවූ, නින්දිතවූ
Pitifully, *ad.* දුක්ඛිතලෙස, ශෝකලෙස, ලතවූලෙස, කණගාටුවූලෙස, දයාවූලෙස, කරුණාවූලෙස, නීචලෙස, නින්දිතලෙස; *see the adj.*
Pitiless, *a.* අනුකම්පානැතිවූ, කරුණානැතිවූ
Pittance, *a.* බෙලය, කලිය, පංගුව;

Pitted, *a.* කැලැති ; *with the small pox,* වසූරිලෙඩකැලැලු

Pity, *s.* අනුකම්පාව, ලෙංගතුකාරකම, කරුණාව

Pity, *v. a.* අනුකම්පාකරනවා, දයාකරනවා, කරුණාකරනවා

Pivot, *s.* වත්තුලයකරකැවෙනඇණය

Placable, *a. see implacable*

Placability, *s.* සමාදානයවීම

Placard, placart, *s.* ප්‍රසිද්ධපත්‍රය, දැන්වීම්පත්‍රය

Place, *s.* ස්ථානය, තැන, භූමිය, පළ; *office,* ව්‍යාපාර, තනතුරු, විලාස, වැඩ; *a market place,* කඩපළ; *out of place,* අනිසම් ස්ථානයෙහි තිබෙනවා; *in place of it,* ඒක උදෙසා; *to take place,* සිද්ධවෙනවා

Place, *v. a.* පත්කරනවා, තබනවා

Placid, *a.* සමාදානවූ, මුදුගුණයුතුවූ, නොකලබල්වෙනවූ, නිස්චලවූ

Placidly, *ad.* සමාදානයෙන්, මුදුගුණලෙස, නොකලබල්වන්නලෙස

Plagiarism, *s.* ග්‍රන්ථචෞරත්වය

Plague, *s.* උසන්නගතරෝගය, වදුරුරෝගය

Plague, *v. a.* උසන්නගතරෝගයෙවෙනවා; *to vex,* කරදරකරනවා, කරච්චල්කරනවා

Plaguy, *a.* කරච්චල්වූ, කරදරවූ

Plain, *a. level,* සමවූ, සමතලාවූ; *distinct,* පැහැදිලිවූ, එළිවූ; *void of ornament,* වාන්වූ

Plain, *s.* සමභූමිය, සමතලාබිම

Plain, *v. a.* සමකරනවා, සමතලාකරනවා, හමන්නනවා

Plain dealing, *s.* සාධාරණවූගනුදෙනුකිරීම

Plainly, *ad.* සමලෙස, සමතලාලෙස, වාන්ලෙස, පැහැදිලිලෙස, එළිලෙස; *see the noun*

Plaint, *s.* පැමිණිල්ල

Plaintiff, *s.* පැමිණිලිකාරයා, පැමිණෙන්නා

Plaintive, *a.* සෝකවූ, ලතවූ

Plait, *s.* ගෙතීම, අකුලීම

Plait, *v. a.* ගොතනවා, අකුලනවා

Plan, *s. a scheme, a plot,* මන්ත්‍රණය; *a form, a moddle,* ඇඳීම, ආදර්ශය, ආකාරය, අන්දම

Plan, *v. a.* මන්ත්‍රණයකරනවා, අඳිනවා, ආදර්ශයකරනවා, ආකාරයකරනවා, අන්දම්කරනවා; *see the noun*

Plane, *s. level ground,* සමභූමිය, සමතලාබිම; *carpenter's tool,* යතුකැටය

Plane, *v. a.* සමතලාකරනවා, යතුගානවා; *see the noun*

Planet, *s.* ග්‍රහයා

Planetary, *a.* තාරකාවූ, ග්‍රහයින්වූ

Plank, *s.* පෝරුව, ලෑල්ල

Plank, *v. a.* ලෑලිගහනවා, පෝරුඇල්ලනවා

Plant, *s.* සාඛාව, පැලය

Plant, *v. a.* රෝපණයකරනවා, ඉඳුවනවා, හිටුවනවා, වවනවා

Plantain, *s.* කදලි, රඹ, කෙසෙල් *or* කෙහෙල්ගහ

Plantation, *s.* පැලභූමිය

Planter, *s.* රෝපණයකරන්නා, වවන්නා, හිටුවන්නා

Plash, *v. a.* සාඩාගෙතනවා, අතුපැටිකලනවා

Plashy, *a.* ගොහොරුවූ, දියහිරවූ

Plaster, *s.* බදාම, පදනම

Plaster, *v. a.* බදාමගානවා, පදනම්ගානවා

Plasterer, *s.* බදාමගාන්නා, පදනම්ගාන්නා

Plat, *v. a.* ගොතනවා, වියනවා

Plat, *s.* බිම

Plate, *s.* පිඟාන

Plate, *v. a.* රිදීගානවා

Plat-form, *s.* තට්ටුව

Platter, *s.* පිඟාන්

Plaudit, *s.* වර්ණනාව, ප්‍රසංසාව

Plausible, *a. approvable*, ගුණවූ, සුදුසුවූ; *specious*, උපායවූ, උපාවූ

Play, *v. n.* ක්‍රීඩාකරනවා, කෙලනවා, සෙල්ලන්කරනවා; *to play the flute*, නලාපිඹිනවා; *to play with one*, යමෙකුට කවටකම්කරනවා; *to play the fool*, මෝඩකම්කරනවා; *to play the knave*, රැවටිලිකම්කරනවා; *to play one a trick*, යමෙකුට වඩාවක් කරනවා, යමෙකුට කැළඹකමක්කරනවා

Play, *s.* ක්‍රීඩාකිරීම, සෙල්ලන්කිරීම, සෙල්ලම; *jocularity*, කවටකම

Player, *s.* ක්‍රීඩාකරන්නා, සෙල්ලන්කරන්නා, කෙලින්නා; *of an instrument*, තන්ත්‍රීවයන්නා

Playfellow, *s.* කෙලිගෙසි සමා සම්කාරයා

Playful, *a.* සෙල්ලන්වූ

Playhouse, *s.* ක්‍රීඩාගාරය

Playsome, *a.* කෙලිවූ

Plaything, *s.* කෙලිබඩු

Plea, *s. pleading*, කාරනාදීම; *excuse*, නිකාරුව

Plead, *v. n.* විවාදකරනවා, කාරනාදෙනවා

Pleader, *s.* විවාදකරන්නා, කාරනාදෙන්නා

Pleading, *s.* කාරනාදීම

Pleasant, *a.* ප්‍රියවූ, ප්‍රසන්නවූ, සන්තෝෂවූ, සතුටුවූ, මනාපවූ

Pleasantly, *ad.* ප්‍රියලෙස, ප්‍රසන්නලෙස, සන්තෝෂලෙස, සතුටුලෙස, මනාපලෙස

Pleasantry, *s.* සෙල්ලන්කිරීම

Please, *v. a.* ප්‍රියකරනවා, ප්‍රසන්නකරනවා, මනාපකරනවා, සන්තෝෂකරනවා, සතුටුකරනවා; *if you please*, කරුණාකරලා, තමුන්නාන්සේ මනාපනම් *or* තමුසේ සන්තෝෂ නම්; *be pleased to send him*,

කරනොකර ඔහු එළඹ මි නෙ; *I please myself with it,* ඒ ගැන මම ප්‍රසන්නවෙනවා

Pleasingly, *ad.* ප්‍රියලෙස, සන්තුෂ්ටලෙස, මනාපලෙස

Pleasure, *s.* ප්‍රසන්නය, සෙල්ලම; *he takes pleasure in reading,* ඔහු පොත්කියවීමෙන් ප්‍රසන්න ගන්නවා, ඔහු පොත්කියවීමේදී සෙල්ලම්ගන්නවා; *according to his pleasure he does that,* ඔහුගේ මනාපය පරිද්දෙන් ඔහු ඒකකරනවා

Pledge, *s.* උගස, උකස

Pledge, *v. a.* උගස්දෙනවා, උකස්තියනවා

Plenary, *a.* සම්පූර්ණවූ, පිරුනාවූ

Plenipotentiary, *s.* කාර්‍යාධිකාරී

Plenitude, *s.* සම්පූර්ණකම, පිරුණුකම, සංපූර්ණකම

Plentious, plentiful, *a.* අධිකවූ, අතිකවූ, බොහෝවූ, බොහොමවූ

Plentiously, plentifully, *ad.* අධිකලෙස, අතිකලෙස, බොහෝලෙස

Plenty, *s.* අධිකවීම, අධිකවීම, බොහෝවීම

Pliable, pliant, *a.* මෘදුවූ, හැඩිඅනුගු, නැමෙන්නාවූ

Pliableness, pliancy, *s.* මෘදුකම, නැවුනකම, නැමෙනසුළුකම

Pliers, *s.* අඬුව

Plight, *v. a.* උගස්දෙනවා

Plight, *s.* උගස, උකස

Plod, *v. n.* උත්සාහකරනවා

Plodder, *s.* උත්සාහකරන්නා

Plot, *s.* කුමන්ත්‍රණය, කපටයුර්ගය, උපායය; *of ground,* කෑලි, බිම්කෑබෙල්ල

Plot, *v. a.* කුමන්ත්‍රණයකරනවා, කපටයුර්ගයකරනවා, උපායකරනවා

Plough, *s.* නගුල

Plough, *v. a.* හානවා

Ploughman, *s.* හාන්නා

Ploughshare, *s.* නගුල්දත

Pluck, *v. a.* උදුරනවා, නෙලනවා, කඩනවා, සිඳිනවා; *to pluck up by the roots,* මුලින්උදුරනවා; *to pluck off the hair,* කෙස්සිඳිනවා; *to pluck flowers,* මල්නෙලනවා; *to pluck off a bird's feathers,* පක්ෂියෙකුගේ පියාපත්සිඳිනවා

Plug, *s.* ඇබයගැසීම, ඇබය

Plug, *v. a.* ඇබයගහනවා, ඇතුලටරනවා

Plumage, *s.* පියාපත, පිහාටු

Plumb, *s.* ලම්බය, ලම්බකටුව

Plumb, *v. a.* ගැඹුරුමනිනවා, ලම්බකරනවා

Plume, *s.* පියාපත, පිහාටු

Plume, *v. a.* පියාපත්සිඳිනවා, පිහාටුපරණනවා

Plummet, *s. for finding the depth,* බරුව; *used by the mason,* ලම්බකටුව, ලම්බය

Plump, *a.* සවුලවූ, තරවූ

Plunder, *v. a.* පැහැරගන්නවා, උදුරනවා, කොල්ලකනවා

Plunder, *s.* පැහැරගැනීම, උදුරා ගැනීම, කොල්ලකෑම

Plunderer, *s.* පැහැරගන්නා, උදුරාගන්නා, කොල්ලකන්නා

Plunge, *v. n.* ගිලෙනවා, කිඳෙනවා

Plunge, *s.* ගිලීම, කිඳීම

Plunger, *s.* ගිලෙන්නා, කිඳෙන්නා

Plural, *a.* බහුල, බොහෝ; *but when used in contradistinction to the singular number,* බහුලදීය කාඵය, *or* බහුවචනය

Plurality, *s.* බහුවචනකම, බොහෝකම; *see the adj.*

Ply, *v. a.* උත්සාහයෙන්කරනවා, නිතරමෙහෙකරනවා; *to solicit earnestly,* ඕනෑකමින් ඉල්ලනවා

Pock, *s.* කැලල

Pocket, *s.* පසුම්බිය, පයිය; සාක්කුව; *Port*; *to pocket up,* පයියෙදමනවා, සාක්කුවෙදමනවා

Pod, *s.* කරල්

Poem, *s.* සෙලෝකය, කාව්‍යම, කවිය

Poet, *s.* සෙලෝකකාරයා, කාව්‍යකාරයා

Poetical, poetick, *a.* කාව්‍යකාරවූ

Poetry, *s.* සෙලෝකය, කාව්‍යපදබැඳීම

Poignant, *a.* තිව්රවූ, කැසිනාවූ, පැස්සනාවූ, තියුණුවූ

Poiniard, *s.* කඩුවයී කරයක්

Point, *s.* තුඩ, කොන්ගල, කොන, අග; *a small point of land, a promontory,* තුඩුව; *the point of a pen,* පෑනේකොනේතුඩ; *the point of a sword,* කඩුතුඩ; *at the point of death,* මරණාසන්නයෙහි; *to gain one's point,* යමෙක්ගේ කැමැත්ත කරගන්නවා; *the point in hand,* කලින්කියී කාරණාව; *to pursue one's point,* යමෙක් මනාපය සොයනවා; *point of honor,* නම්බුවෙට අයුවට කාරණාවක්; *to bring the matter to a point,* කාරණාව හින්දුකරනවා

Point, *v. a. to show by the finger,* අඟිල්ලෙන්පෙන්නනවා; *to direct the attention,* පෙන්වනවා, ලක්ෂකරනවා, ඔවාතනවා; *to sharpen,* මුවහත්කරනවා

Pointed, *a.* තියුණුවූ, මුවහත්වූ

Pointedly, *ad.* තියුණුලෙස, මුවහත්ලෙස

Pointer, *s.* පෙන්වන්නා, ලක්ෂ්‍යකරන්නා

Poison, *s.* හලාහල, විස, විෂ, විස

Poison, *v. a.* විසදෙනවා, විසකරනවා

Poisonous, *a.* හලාහලවූ, විසවූ, විසවූ, විෂවූ

Poisonously, *ad.* හලාහලලෙස, විසලෙස, විසලෙස, විෂලෙස

Poize, *s.* තරාදිය, පරිබරකම

Poize, *v. a.* කිරනවා, පරිබර කරනවා

Poke, *v. a.* අතපතගාබලනවා

Poker, *s.* අඟුරුකටුව

Pole, *s.* *a staff*, පොල්ල

Polecat, *s.* ගඳබිඩාලය, උරු ලෑවා

Polemical, polemick, *a.* විවාදකර නාවූ, තරගකාරවූ

Polestar, *s.* *in Hindoo astronomy is called*, ධ්‍රුව; *who according to their mythology was the son of* ඕත්ත නාපාද, *and consequently the grandson of the first Menu*

Police, *s.* නුවරආඥාකිරීම

Policy, *s.* *the art of government*, රාජනීති, රාජධර්ම, ආඥාකිරීම; *art, cunning*, උපාය, උපායිය

Polish, *v. a.* ඔපදමනවා, ඔපල නවා, ඔප්නගනවා, ඔපකර නවා, මිටිටන්කරනවා

Polish, *s.* ඔපදැම්ම

Polisher, *s.* ඔපදමනපා

Polite, *a.* සුදු වවූ, ආචාරවන්ත වූ, හොඳවගුත්තෑ

Politely, *ad.* සුදුවමලෙස, ආචාර වන්තලෙස

Politeness, *s.* සුදුවකම, ආචාර වන්තකම, හොඳකුලකම

Political, *a.* රාජනීතිවූ, රාජධර්ම වූ, මන්ත්‍රවූ, ආඥාකිරීමවූ

Politician, *s.* රාජනීතිපණ්ඩිතයා, රාජධර්මපණ්ඩිතයා, මන්ත්‍රා ලෝචකයා, ආඥාකිරීමෙහි සමර්ථයා

Politicks, *s.* රාජ්‍ය ආඥාකිරීම

Poll, *s.* හිස්වටිවෙලේ

Poll, *v. n.* හිස්වටිවෙර්වලින් නාවා

Poller, *s.* උදුරාගන්නා

Pollute, *v. a.* ධූෂකනාවා, මලින කරනවා, අපවිත්‍රකර නවා, කිලුටුකරනවා

Pollution, *s.* ධූෂකකරම, මලින කිරීම, අපවිත්‍රකිරීම, කිලු ටුකිරීම

Polygamist, *s.* අනේකවිවාහයා, බහුභාර්යයා, ස්ත්‍රීන්දෙනා නාඅටිනියා

Polygamy, *s.* අනේකවිවාහව, බහුභාර්යාවූබව, ස්ත්‍රීන්දෙ දෙනාහාඅටිබව

Polyglot, *a.* බහුභාෂාවූ, බො හෝබස්වූ

Polysyllable, *s.* බහුසන්ධිවාක්‍ය

Polytheism, *s.* බහුදේවශාස්ත්‍රය

Polytheist, *s.* බොහෝදෙවියන් අදහන්නා

Pomegranate, *s.* දෙළුම, දෙළුන්

Pommel, *s.* ගුලිය, ගුලිය

Pommel, *v. a.* පොඩිපලසකගනවා

Pomp, *s.* *royal splendour*, රාජශ්‍රී වර; *a procession*, පෙරහැර, පු රිවර

Pomposity, *s.* *pride or haughtiness*, අහංකාරකිරීම, ආඩම්බරකිරී ම

Pompous, *a.* රාජශ්‍රීවවූ, පෙල හරවූ, පිරිවරවූ; *see the noun*

Pond, *s.* පුෂ්කරණිය, තටාකය, පොකුණ

Ponder, v. a. මෙනෙහිකරනවා, සිතිකරනවා, කල්පනාකරනවා

Ponderer, s. මෙනෙහිකරන්නා, කල්පනාකරන්නා

Ponderous, a. *heavy, weighty,* අධිභාර, ගුරුබරවූ; *important,* ප්‍රධානවූ, වැදගැම්මවූ

Ponderously, ad. ගුරුබරලෙස

Ponent, a. බටහිරවූ, බස්නාහිරවූ

Poniard, s. කිරිසය, කිරිච්චිය

Poniard, v. a. කිරිසෙයන් අනිනවා

Pontiff, s. පූජකයා

Pontifical, a. පූජකකමට අයිතිවූ

Pony, s. කුඩා අශ්වයා

Pool, s. පුස්කරණිය, තටාකය, පොකුණ, වැව, විල

Poor, a. නිර්ධනවූ, දරිද්‍රවූ, නිවත්වූ, දිළිඳුවූ, දුප්පත්වූ; *lean,* කෘශවූ, කෙට්ටුවූ, කෙසට්ටුවූ; *as ground,* සාරනැතිවූ

Poorly, ad. *without wealth,* නිවත්ලෙස, දුප්පත්ලෙස; *unsuccessfully,* ප්‍රයොජනවත්නොවලෙස; *indifferently,* අයහපත්ලෙස, හොඳනැතිලෙස; *indisposed,* අපාසුවලෙස

Poorspirited, a. නිවටයින්වූ

Pop, v. a. *to raise the head, or body quickly,* ගැස්සෙනවා; *to come by surprise,* ගැස්සිලාවෙනවා; *to go out unexpectedly,* ගැස්සීලායනවා; *to pop in and out,* ඇතුළට පිටට ගැසෙනවා

Poplar, s. අර්බොරන්ගස

Populace, s. සාමාන්‍යජනයෝ, රටවැසියෝ, ජනවාසීන්

Popular, a. සාමාන්‍යජනවූ, රටවැසියන්වූ, ජන්ද සන්වූ; *beloved, esteemed by the people,* සකලප්‍රියවූ, ජනප්‍රියවූ, සම්මතවූ

Popularity, s. සකලප්‍රියකම, ජනප්‍රියකම, සම්මතකම, ප්‍රසිද්ධසන්නාවීම

Popularly, ad. සකලප්‍රියලෙස, ජනප්‍රියලෙස, සම්මතලෙස, ප්‍රසිද්ධසන්නාලෙස

Populate, v. a. ජනගහනයවෙනවා, මනුෂ්‍යයින්බෝවෙනවා

Population, s. රටවාසීන්, ජන්දසියන්

Populous, a. අනේකවාසීන්වූ, ජනගහනවූ

Porch, s. දොරටුව

Porcupine, s. ඉත්තෑවා

Pore, s. රෝමකූප, ලොමසිදුරු, සිදුරු

Pore, v. n. මෙනෙහිකරනවා, විභාගකරනවා

Poreblind, a. ක්‍ෂුද්‍රදෘෂ්ටිය, දුරපෙනෙනොපෙනීම

Pork, s. සූකරමාංස, ඌරුමස්

Porous, a. සිදුරුසිදුරුවූ

Porpoise, porpus, s. ජලසූකර, මල්ලෑ

Port, s. ඇතුල්වරාය, වරාය, තොට

Portable, a. ලඝුභාර, ඉසිලීමේ බරවූ, ගුරුලඝුබරවූ

Portal, *s.* දොරටුව

Portend, *v. a.* නිමිති කියනාවා, ලකුණුදක්වනාවා

Portension, *s.* නිමිතිකීම, ලකුණු කීම

Portent, *s.* දුෂ්නිමිති, නපුරුලකුණු

Portentous, *a.* දුෂ්නිමිතිදක්වන්නාවූ, නපුරුනිමිතිකියන්නාවූ

Porter, *s. doorkeeper,* දොරටුපාලයා, වාරපාලයා; *carrier of burdens,* බරඋසුලන්නා, කුලිකාරයා

Portico, *s.* චංක්‍රමනය, ශාලාව

Portion, *s.* දායාදය, දීවැද්ද, කොටස, පංගුව, උරුමය

Portion, *v. a.* දායාදදෙනාවා, දීවැද්දදෙනාවා, උරුමකරනාවා

Portly, *a.* ශූරවූ, සුන්දරරූපවූ, සපුලවූ, තරවූ

Portmantea, *s.* ගමන්පෙට්ටිය

Portrait, *s.* මුනසිතුව, රූපය

Portray, *v. a. to paint representations of any kind,* මුනසිතුවම ගන්කරනාවා, රූපයසිත්තම් කරනාවා; *to describe the qualities,* ගුණකියනාවා

Pose, *v. a.* නවත්වනාවා

Position, *s. situation,* අන්දම, ආකාරය; *a principle laid down,* කාරනාව

Positive, *a.* සත්‍යවූ, ශබ්ධවූ, නිරුත්තරවූ, ප්‍රකාශනවූ

Positively, *ad.* සත්‍යලෙස, ශබ්ධලෙස, නිරුත්තරලෙස, ප්‍රකාශලෙස

Possess, *v. a.* හිමිකරනාවා, අත්අයිතිකරනාවා, බුත්තිවිදිනාවා, වැඩවිදිනාවා, උරුමකරනාවා; *they went in and possessed the land,* ඔවුන් ගොස් දේසය හිමිකරගත්තෝය; *he possesses a house and garden,* ඔහු ගෙයක් සහ වත්තක් බුත් විදිනාවා; *to possess one of a thing,* යමෙක්නට යමක් හිමිකරනාවා; *to possess one's self of a thing,* යමෙක් යම්දෙයක් අයිතිකරගන්නාවා; *possessed by the devil,* යමෙකුට යක්ෂයා වැහෙසනාවා

Possession, *s.* පරිභෝගය, හිමිකම, උරුමය, අයිතිකම

Possessive, *or genitive case in grammar,* සම්බන්ධ

Possessor, *s.* පරිභෝගියා, ස්වාමියා, හිමියා, උරුමක්කාරයා, අයිතිකාරයා, දායාදකයා

Possibility, possible, *a.* ශක්තවූ, වෙන්ඩපුළුවන්වූ, කලහැකිවූ, කරන්ඩපුළුවන්වූ

Possibly, *ad.* ශක්තිලෙස, කලහැකිලෙස, වෙන්ඩපුළුවන්ලෙස, කරන්ඩපුළුවන්ලෙස, සමහරවිට; *possibly you think so,* සමහරවිට තමුසේ එආකාර කල්පනාකරනාවා; *if I can possibly,* මට පුළුවන් නම්

Post, *s. a messenger,* පණිවිඩකාර

යා ; *situation, office, employment,* ව්‍යාපාරය, නිලය, වැඩය; *military station,* කඩවත, මුර පල ; *a piece of timber,* කණුව

Post, *v. a. to fix on a post, &c.* අලවනවා ; *to travel with speed,* කඩිසරකමින්යනවා, ඉක්මනින් ගමන්යනවා

Postboy, *s.* තැපැල්ගෙනයන්නා

Poster, *s.* පණිවිඩකාරයා

Posterior, *s.* පස්ස, පිටිපස්ස

Posterity, *s.* වංශය, ජාතිය, ජන්මය, පසුපරම්පරාව

Postern, *s.* කුඩාදොර, සුළුදොර

Postehaste, *a.* කඩිසරව දුවන්නා වූ

Posthumous, *a.* මරණින්පසු ප්‍රකාශවූ

Postoffice, *s.* තැපැල්ගෙය *or* තැපැල්කන්තෝරුව ; *Port.*

Postpone, *v. a.* අත්හිටවනවා, ප්‍රමාදකරනවා

Postcript, *s.* පහලලියනසටහන

Posture, *s.* ඉරියව්ව, ප්‍රකාරය, අන්දම, ආකාරය ; *to be in a posture,* අන්දමෙහිසිටිනවා

Posy, *s.* මල්පොකුර

Pot, *s.* කලස, කලය, මුට්ටිය, හැලිය ; *water-pot,* වතුරකලය ; *to go to pot,* නාස්තිවෙනවා

Pot, *v. a.* කලේවත්කරනවා

Potash, *s.* අළුකාර, *this is a preparation made by burning the branches of the cocoa-nut tree, and used in bleaching and washing linen*

Potatoe, *s. Europe,* රටබතල ; *country,* බතල ; *yam,* අල

Potch, *v. a.* උණුවතුරෙහිතම්බනවා

Potency, *s.* පරාක්‍රමය, බලය, ශූරය, ශක්තිය

Potent, *a.* පරාක්‍රමවූ, බලවූ, ශක්තිවූ, ශූරවූ

Potentate, *s.* පරාක්‍රමයා, බලවත්තයා, ආඥාකාරයා

Potential, *a.* ශක්තිවූ, බලවත්වූ ; *mode in grammar, see mood*

Potentiality, *s.* ශක්තිකම

Potentially, *ad.* ශක්තිමත්ලෙස, ශූරලෙස

Pothecary, *s.* ඖෂධකාරයා, බෙහෙත්දෙන්නා, බෙහෙත්විකුණන්නා

Pother, *v. a.* ඝෝෂාකරනවා, කලහකරනවා

Potion, *s.* වරකටබොනබෙහෙත්

Potsherd, *s.* කැබිලිත්තක්

Pottage, *s.* ආහාරවිශේෂයක්, භෝජනවිශේෂයක්

Potter, *s.* කුම්භකාරයා, බඩහැලයා

Pouch, *s.* මඩොක්කුව, මල්ල

Poverty, *s.* නිර්ධනකම, දුප්පත්කම, දිළිඳුකම, දුක්පත්කම

Poulterer, *s.* කුකුළන්වෙළෙන්දා

Poultice, *s.* කයිලම

Poultice, *v. a.* කයිලමදමනවා

Poultry, *s.* කුකුළෝ

Pounce, *s. talons,* පක්ෂිපාද ; *powder for sprinkling the writing* දුම්මලකුඩු

Pounce, *v. a. to pierce,* සිදුරුකරනවා ; *to sprinkle, with pounce.*

හැලෙනවා; *to seize with talons*, අල්ලනවා

Pound, *s.* රාජකාලෙ. *Port.*

Pound, *v. a.* චූර්ණකරනවා, සුනුකරනවා, කොටනවා

Pounder, *s.* චූර්ණකරන්නා, සුනුකරන්නා, කොටන්නා

Pour, *v. n.* වගුරවනවා, වක්කරනවා; *to pour in*, ඇතුළත් කරපට වගුරනවා, *or* ඇතුළට වක්කරනවා; *to pour out*, උඩතවිත්කරනවා; *it pours down rain*, වරුෂාවවැස්ස වැටෙනවා

Pourer, *s.* වගුරුවන්නා, වක්කරන්නා

Pout, *v. a.* දුම්බකරනවා, මූහුනඇඹුල්කරනවා

Powder, *s.* චූර්ණ, සුනු, කුඩු; *gun powder*, වෙඩිබෙහෙත්

Powder, *v. a.* චූර්ණකරනවා, සුනුකරනවා, කුඩුකරනවා; *to sprinkle with*, හලනවා, ඉසිනවා

Power, *s.* පරාක්‍රමය, ශක්තිය, බලේ, ශූරය

Powerful, *a.* ශක්තිවූ, පරාක්‍රමවූ, බලයවූ, ශූරවූ

Powerfully, *ad.* ශක්තිලෙස, පරාක්‍රමලෙස, ශූරලෙස, බලය ලෙස

Pox, *s. small*, වසූරිරෝග, උසූරිරෝග, *but commonly called*, මහලෙඩ; *chicken pox*, පැපොල; *venereal disease*, උපදංශ, ඛණ්ජනාර, උපසර්ගරෝග

Practicable, *a.* ක්‍රියාකලහැකිවූ, කරන්ඩපුළුවන්වූ

Practicably, *ad.* ක්‍රියාකලහැකිලෙස, කරන්ඩපුළුවන්ලෙස

Practical, *a.* ක්‍රියාකිරීමට අයත්වූ

Practically, *ad.* ක්‍රියාකිරීමට අයත්කිලෙස

Practice, *s. the act of doing any thing*, කම්මාන්තකිරීම, ක්‍රියාකිරීම; *use, custom*, ව්‍යවහාරය, සිරිත, භාවිතාව, පුරුද්ද

Practise, *v. a.* කම්මාන්තකරනවා, ක්‍රියාකරනවා, කරනවා; *to accustom to any thing*, ව්‍යවහාරකරනවා, භාවිතාකරනවා, සිරිත්කරනවා, පුරුදුකරනවා

Practiser, *s.* ක්‍රියාකරන්නා, පුරුදුකරන්නා

Practitioner, *s.* කම්මාන්තකරන්නා, ක්‍රියාකරන්නා, පුරුදුලෙස ක්‍රියාකරන්නා

Pragmatical, *a.* මැදිවෙන්නාවූ

Praise, *s.* වර්ණනාකිරීම, ප්‍රසංසාකිරීම, ස්තුතිකිරීම

Praise, *v. a.* වර්ණනාකරනවා, ප්‍රසංසාකරනවා, ස්තුතිකරනවා

Praiseworthy, *a.* වර්ණනීයවූ, ප්‍රසංසනීයවූ, ස්තුතිකිරීමට සුදුසුවූ

Prance, *v. n.* පිම්පනිනවා

Prank, *s.* කවටකම, සෙල්ලම

Prate, prattle, *v. n.* නිරාර්ථකථාකරනවා, නිෂ්ඵලවචනකියනවා

Prater, prattler, *s.* බේරාඩිකථා කථාකරන්නා, හිස්වලුවදෙඩවන්නා

Prawn, *s.* ඉස්සන්වර්ගයක්

Pray, *v. n.* යාච්ඤාකරනවා, ඉල්ලනවා

Prayer, *s.* යාච්ඤාව, ඉල්ලීම

Preach, *v. n.* *publickly to proclaim any thing*, ප්‍රසිද්ධකරනවා, ප්‍රසිඩකරනවා; *to pronounce public discourses on sacred subjects*, දේශනාකරනවා

Preacher, *s.* දේශනාකාරයා

Preamble, *s.* මුලාරම්භය

Precarious, *a.* අනුමානවූ

Precariously, *ad.* අනුමානලෙස

Precaution, *s.* උපාය, පූර්වසම

Precaution, *v. a.* අවවාදකරනවා, දැනීම්හඟවාදෙනවා

Precede, *v. n.* ප්‍රථමයෙන්වෙනවා, ඉස්සරවෙනවා, මුල්වෙනවා, ඉදිරිවෙනවා

Precedence, precedency, *s.* ප්‍රථමයෙන්වීම, ඉස්සරවීම, මුල්වීම, ඉදිරිවීම, ප්‍රධානවීම

Precedent, *s.* පූර්වආදර්සයක්

Precept, *s.* ආඥාවාක්‍යය, සිපිත, විධිය

Preceptive, *a.* සිපිතදෙන්නාවූ

Preceptor, *s.* ආචාර්යයා, ගුරා, උගන්වන්නා

Precinct, *s.* සීමාව, ඉම

Precious, *a.* අනර්ඝවූ, අනගිවූ, වටින්නාවූ

Preciously, *ad.* අනර්ඝලෙස, අනගලෙස, වටිනාවූලෙස

Precipice, *s.* ප්‍රපාතය, පාදුල

Precipitance, precipitancy, *s.* හදිස්සිකම, ඉක්මන්කම, කඩිසරකම

Precipitantly, *ad.* හදිස්සිලෙස, ඉක්මන්ලෙස, කඩිසරලෙස

Precipitant, *a.* හදිස්සිවූ, ඉක්මන්වූ, කඩිසරවූ

Precipitate, *v. a.* *to throw headlong*, විසිකරදමනවා; *to hurry on*, හදිස්සිකරනවා, ඉක්මන්කරනවා

Precipitate, *a.* හදිස්සිවූ

Precipitately, *ad.* හදිස්සිලෙස, ඉක්මන්ලෙස, කඩිසරලෙස; *see the noun*

Precise, *a.* *exact*, හරිවූ, සූතුවූ; *finical*, අහාරවූ

Precisely, *ad.* හරිලෙස, සූතුලෙස

Precision, *s.* හරිවීම

Preclude, *v. a.* බාධාකරනවා, අහෝසිකරනවා, තහනම්කරනවා

Preconceive, *v. a.* පූර්වකල්පනාකරනවා, ඉදිරියෙසිහිකරනවා

Preconception, *s.* පූර්වකල්පනාව, ඉදිරිඥාන

Precursor, *s.* ප්‍රථමයෙන්දුවන්නා, පෙරටුවදුවන්නා

Predatory, *a.* මංපහරන්නාවූ, කොල්ලකන්නාවූ, උදුරාගන්නාවූ

Predecessor, *s.* පළමුගියලා, පූර්වයෙහි සිටියා, ඉදිරියෙන්වන්නා

Predestinate, predestine, *v. a.* පූර්වයෙන් නියෝගකරනවා, ඉ

... ප්‍රකාශකරනවා

Predestination, *s.* ප්‍රථමයෙන්නියම කිරීම, ඉදිරිපත්කිරීම

Predetermine, *v. a.* ප්‍රථමයෙන්නියම කරනවා

Predicament, *s.* ප්‍රකෘතිය

Predicate, *v. a.* ප්‍රකෘතිකාරකම් යනවා

Predicate, *s.* ධාතු

Predict, *v. a.* ශාස්ත්‍රකියනවා, අනාගතවාක්‍යකියනවා, දිවස්කියනවා

Prediction, *s.* ශාස්ත්‍රකීම, අනාගතවාක්‍යකීම, දිවස්කීම

Predictor, *s.* ශාස්ත්‍රකියන්නා, අනාගතවාක්‍යකියන්නා

Predilection, *s.* ප්‍රථමප්‍රියකම, ඉදිරිපටන්ආපකම

Predispose, *v. a.* ප්‍රථමමනාපකරනවා, ඉදිරිපටසතුටුකරනවා

Predominate, *a.* උසස්වූ, ප්‍රධානවූ

Predominate, *v. n.* උසස්වෙනවා, ප්‍රධානවෙනවා

Pre-eminence, *s.* උසස්කම, උතුම්කම, ප්‍රධානකම

Pre-eminent, *a.* උසස්වූ, උතුම්වූ, ප්‍රධානවූ

Pre-engage, *v. n.* ප්‍රථමයෙන්පොරොන්දුවෙනවා, ඉදිරියෙන් බැඳිනවා

Pre-exist, *v. n.* පූර්වයෙහිපටන් ජීවත්වෙමින්නවා

Preface, *s.* මුලාරම්භය

Preface, *v. a.* මුලාරම්භකරනවා

Prefect, *s.* ආඥාකාරයා

Prefer, *v. a.* වඩාසලකනවා, වඩාහොඳව හෝරාගන්නවා, වැඩිදියුණුකරනවා; *to exalt*, උතුම්කරනවා, උසස්කරනවා; *to exhibit*, ප්‍රසිද්ධකරනවා

Preferable, *a.* වඩාසලකන්නාවූ, වඩාඅගනාවූ

Preference, *s.* වඩාසලකාගැනීම, වඩාහොඳටතෝරාගැනීම

Preferment, *s.* ශ්‍රේෂ්ඨවීම, උත්කෘෂ්ටවීම, උතුම්වීම, උසස්වීම, වැඩිතනතුරටපත්වීම

Prefigure, *v. a.* පූර්වආදර්ශයකරනවා, ප්‍රථමලකුණුපෙන්වනවා

Prefix, *v. a.* ප්‍රථමයෙන් නියමකරනවා, ප්‍රථමයෙන් නියමකරනවා, ඉදිරියෙන්පත්කරනවා; *to place as a kind of preface*, මුල්කොටතබනවා

Prefix, *s.* මුලුනිපාතය

Pregnancy, *s.* ගර්භිණිවීම, ගැබ්හටගැනීම, බඩදරුවීම

Pregnant, *a.* ගර්භිණිවූ, ගැබ්හටගත්තාවූ, බඩදරුවූ; *abounding*, පූර්ණවූ, අධිකවූ

Prejudge, *v. a.* ප්‍රථමයෙන්විනිශ්චයකරනවා, ඉදිරියෙන්විභාගකරනවා, පූර්වකල්පනාකරනවා

Prejudice, *s.* *a favourable prepossession*, පාක්ෂිකකම, පැත්තකට ඇලුම්කම, පූර්වකල්පනාකිරීම; *ill will*, පූර්වද්වේෂකම, නොදුරුකාමොකම; *mischief, injury*, අනර්ථය, අලාභය, නාස්තිය

Prejudice, *v. a.* *to prepossess the mind*, පූර්වකල්පනාවකතබනවා

වා, පූර්වොපදේශකාරීකරණවා, ප්‍රථමයෙන් සිත් අනුමානකර නවා; *to injure, to hurt,* අපකාරකරනවා, අලාභකරනවා, නාසුරකරනවා

Prejudicial, *a.* අපකාරකරන්නාවූ, අලාභකරන්නාවූ, නාසකරන්නාවූ

Prelacy, *s.* පාදිදක්ෂකකම

Prelate, *s.* පාදිදක්ෂකයා

Preliminary, *a.* පූර්වවූ, ප්‍රථමවූ, ඉදිරියෙහිවූ

Prelude, *s.* අනාගතදක්ෂනය, පූර්වලක්ෂණ

Premature, *a. unseasonable,* අකාල්වූ, අසමයවූ; *ripe too soon,* නොබරවූ, ළමුන්වූ

Prematurely, *ad.* අකාලෙලෙස, අසමයෙලෙස, නොබරලෙස; ළමුන්වූලෙස; *see the adj.*

Premeditate, *v. a.* පූර්වයෙන්මෙනෙහිකරනවා, ප්‍රථමයෙන් කල්පනාකරනවා, ඉදිරියෙන්සිතනවා

Premeditation, *s.* පූර්වයෙන් මෙනෙහිකිරීම, ප්‍රථමයෙන්කල්පනාකිරීම, ඉදිරියෙන්සිතීම

'Premices, *s.* අගස්, නාවුලපල

Premier, *a.* ආරම්භවූ, මුලවූ, ප්‍රධානවූ

Premise, *v. a.* පූර්වයෙන්විස්තරකරනවා, අත්පිටකියනවා

Premises, *s. antecedent proposition,* පූර්වයෙන්විස්තරකිරීම, අත්පිටකීම; *houses or lands,* හිමිකම්, උරුමය

Premium, *s.* අත්පිටදීම

Premonish, *v. a.* ප්‍රථමයෙන්සැලකරනවා, පළමුවෙන්අවවාදකරනවා, ඉදිරියෙන් දන්වනවා

Premonition, *s.* ප්‍රථමයෙන්සැලකිරීම, පළමුවෙන්අවවාදකිරීම, ඉදිරියෙන්දැන්වීම

Prenominate, *v. a.* ඉදිරියෙන්නම්කරනවා

Prenunciation, *s.* ඉදිරියෙන්දැන්වීම, අත්පිටකීම

Preoccupate, *v. n.* ඉස්සරින්බුත්තිවිදිනවා

Preoccupation, *s.* ඉස්සරින්බුත්තිවිදීම

Preoccupy, *v. n.* ප්‍රථමයෙන්බුත්තිවිදිනවා

Preordain, *v. a.* ප්‍රථමයෙන්නියෝගකරනවා, ඉදිරියෙන්පත්කරනවා

Preparation, *s.* සූදානම්කිරීම, පිළියෙලකිරීම

Preparative, *a. preparing,* සූදානම්කරන්නාවූ, පිළියෙලකරන්නාවූ; *previous,* පූර්වවූ, ප්‍රථමවූ

Preparatively, *ad.* පූර්වලෙස, ප්‍රථමලෙස

Preparatory, *a.* පූර්වවූ, ප්‍රථමවූ, ඉදිරිවූ

Prepare, *v. a.* සූදානම්කරනවා, පිළියෙලකරනවා

Preparer, *s.* සූදානම්කරන්නා, පිළියෙලකරන්නා

Prepense, prepensed, *a.* පූර්වකල්පිතවූ, ප්‍රථමසිත

Preponderance, preponderancy, *s.* අධිකබරකිරීම, වැඩිබරවීම

Preponder, preponderate, *v. n.* අධිකබරකරනවා, වැඩිබරකරනවා

Preposition, *s.* නිපාතය

Prepossess, *v. a.* පූර්වකල්පනාවක බනවා, පූර්වාස්වකම්කරනවා, පළමුවෙන්සිත්ඇල්ලීම කරනවා

Prepossession, *s.* පූර්වකල්පනාවීම, පූර්වාස්වකම්වීම, පළමුවෙන් සිත්ඇල්ලීම

Preposterous, *a.* වැරදිවූ, අයුක්තවූ

Preposterously, *ad.* විපරීතලෙස

Prepuce, *s.* අග්‍රචර්මය, පිටාගම

Prerequisite, *a.* පළමුවෙන්ඕනෑවූ, පූර්වයෙන්ඕනෑවූ

Prerogative, *s.* ප්‍රභුත්වය, අධිපතිය, ආණ්ඩුකාරිය, ආණ්ඩලය

Presage, *a.* ලක්ඛණදර්ශන, නිමිත්ත, ලකුණ

Presage, *v. a.* ලක්ඛණදර්ශනයකරනවා, නිමිත්තකියනවා, ලකුණුදක්වනවා

Presbyter, *s.* පාරිදර්ශකයා, දේවගැතියා

Prescience, *s.* අනාගතඥානය, *or* පූර්වඥානය

Prescind, *v. a.* ඡේදනයකරනවා, සිඳිනවා, කපනවා

Prescribe, *v. a.* සිරිත්කරනවා, අණකරනවා; *to direct medically,* බෙහෙත්නියමකරනවා

Prescript, prescription, *s.* ව්‍යවස්ථාව, භාවනාව, සිරිත; *medical direction,* බෙහෙත්නියමය

Presence, *s.* අභිමුඛ, සම්මුඛ, හමුවෙහි, ඉදිරිපිට; *in the presence of God,* දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි; *in his presence,* ඔහුඉදිරිපිට; *it was done in my presence,* මාහමුවෙහි එක කෙරුණේය; *presence of mind,* මනකාවූ, සිහිවූ

Present, *a.* අභිමුඛවූ, සම්මුඛවූ, ඉදිරිපිටවූ; *present time,* වර්තමානකාලය; *a present remedy,* ප්‍රත්‍යක්ෂපිළිවෙත; *at present,* දැනට; *a present,* තෑග්ග

Present, *v. a. to bring into the presence of one;* සම්මුඛකරනවා, ඉදිරිපිටපමුණුවනවා; *to exhibit,* දක්වනවා; *to offer as a gift,* පූජාකරනවා, තෑග්ගදෙනවා

Presently, *ad.* එකෙණෙහිම, දැන්ම, වෙලාවම

Presentment, *s.* දැන්වීම

Preservation, *s.* රක්ෂාකිරීම

Preservative, *a.* රක්ෂාකරන්නාවූ

Preserve, *v. a.* රක්ෂාකරනවා

Preserver, *s.* රක්ෂාකරන්නා

Preside, *v. n.* මූලාදෙනියාවෙනවා

Presidency, *s.* මූලාදෙනිපදවිය

President, *s.* මූලාදෙනියා

Press, *v. a.* තෙරපනවා, මිරිකනවා, ඔබනවා, හදිසිකරනවා; *to constrain, to compel by violence,* බලාත්කාරකරනවා; *to entreat urgently,* බොහෝකර ඉල්ලනවා

Press, *s. an instrument for pressing*, චරක, දඬුමඩුව; *a tumult*, ජනාකෝලාහලය; *wine press*, මුද්‍රිකායන්ත්‍රය; *oil-press*, චරක; පෙසේනාව: *Port.*

Pressingly, *ad.* බලාත්කාරලෙස

Pressure, *s.* මැඩීම, මිරිකීම, එබීම, තදකිරීම: *weight*, බර; *violence*, බලාත්කාරකිරීම; *affliction, distress*, වේදනාව, විපත, දුක්ඛය

Presume, *v. n. to suppose*, කල්පනාකරනවා, සිතනවා; *to affirm without immediate proof*, අවසාන් සිතාවූ ඇතැනැතියනවා; *to venture without positive leave*, නොකැඳවා ඇතුල්වෙයනවා, වාරෙනොකිමලෙස ඇතුලටයනවා

Presumption, *s.* කල්පනාවීම, සිතීම, අවසාන් සිතූ අනුමානීම, අහංකාරවීම, වාරෙනොකිවීම; *see the verb*

Presumptive, *a.* කල්පනාවූ, සිතිවලිදූ, අහංකාරවූ, අවචාරෙවූ; *see the verb*

Presumptuous, *a.* අහංකාරවූ, ආචාරවිනාශනාවූ, අවචාරෙවූ, අගෞරවවූ, අවිනීතවූ

Presumptuously, *ad.* අහංකාරලෙස, ආචාරවිනාශනාවූලෙස, අවචාරලෙස, අගෞරවලෙස, අවිනීතලෙස; *see the verb*

Presuppose, *v. a.* ප්‍රථමයෙන්කල්පනාකෙරනවා

Pretence, *s.* ව්‍යාජපෙන්වීම, බොරුකීම, ප්‍රයෝජනකීම, වචාකීම

Pretend, *v. a.* ව්‍යාජපෙන්වනවා, බොරුකියනවා, ප්‍රකාශකරනවා, උඩාකරනවා

Pretender, *s.* වචාවෙන් අයකාර ශනයා

Pretension, *s.* වචාවූඅයකිරීම, බොරුවූපෙන්වීම

Preterimperfect, *s.* අතීතකාලය

Preterit, *s. past*, පසුගියාවූ; *the preterite of a verb is termed*, අතීතකාලය

Pretermit, *v. n.* පසුකොටයනවා

Preternatural, *a.* ආශ්චර්යවූ, දුර්ලභවූ; ස්වභාවනොවූ

Preterperfect, *a.* අතීතක්‍රියාවූ

Preterpluperfect, *s.* අතීතක්‍රියාවූ

Pretext, *s.* බොරුපෙන්වීම, අය සැවූකීම

Prettily, *ad.* සෝභනලෙස, අලංකාරලෙස, ලක්ෂණලෙස, ප්‍රියලෙස

Pretty, *a.* සෝභනවූ, අලංකාරවූ, ලක්ෂණවූ, ප්‍රියවූ

Pretty, *ad.* ටිකලප, මද, වක; *pretty well*, වතාත්හොඳ; *pretty early*, වේලාපහ, කල්ඇතිවා; *pretty fine*, මදක්ලක්ෂණ

Prevail, *v. a.* සිරිබලත්වෙනවා, බලවත්වෙනවා; *to overcome*, ජයගන්නවා, යටහත්කරනවා; *to persuade*, පොළඹවනවා, මිනාපකරනවා

Prevailing, *a.* මුලාදෑවිවූ, ඝනකම්වූ, බලවත්වූ

Prevalence, prevalency, *s.* මූලාදෑනිවීම, ශක්තිවීම, බලවත්වීම

Prevalent, *a victorious,* ජයගන්නාවූ, යටත්කරන්නාවූ, බලවත්වූ: *predominant,* මූලාදෑනිවූ; *powerful,* ශක්තිවූ

Prevalently, *ad.* ජයගන්නාලෙස, බලවත්ලෙස, යටහත්ලෙස, මූලාදෑනිලෙස, ශක්තිලෙස; *see the adj.*

Prevaricate, *v. a.* ඇත්ත සඟවා කියනවා

Prevarication, *s.* ඇත්ත සඟවා කීම

Prevent, *v. a.* *to go before,* ඉදිරියට යනවා; *to hinder,* බාධාකරනවා, වලක්වනවා, තහනම්කරනවා

Preventer, *s.* බාධාකරන්නා, වලක්වන්නා, තහනම්කරන්නා

Prevention, *s.* බාධාකිරීම, වැළැක්වීම, තහනම්කිරීම

Preventive, *a.* බාධාකරන්නාවූ, වලක්වන්නාවූ, තහනම්කරන්නාවූ

Previous, *a.* පුරාතනවූ, පූර්වයෙහිවූ, ප්‍රථමවූ, ආදිවූ

Previously, *ad.* පුරාතනලෙස, පූර්වයෙහිලෙස, ප්‍රථමලෙස, ආදිලෙස

Prey, *s.* ඛාද්‍ය, ගෝචර, ගොදුර, කොල්ල

Prey, *v. a.* ඛාද්‍යගන්නවා, ගෝචරගන්නවා, ගොදුරගන්නවා, කොල්ලගන්නවා, උදුරාගන්නවා; *to waste,* නාශකරනවා, නැතිකරනවා

Price, *s.* අගය, ගණන, මිල

Prick, *v. a. to give pain,* ඇනනවා, විදිනවා, රිදවනවා: *to set erect,* නැඹුරුකරනවා

Prick, *s.* කටුව, උල

Prickle, *s.* කටුව

Pride, *s.* අහංකාරය, ආඩම්බරය

Prier, *s.* විභාගකරන්නා, සොයන්නා

Priest, *s.* පූජකයා

Priesthood, *a.* පූජකභාවය

Prig, *s.* පාරවටුව

Prim, *v. a.* පළඳිනවා, අඳිනවා

Primarily, *ad.* පුරාතනලෙස, ප්‍රථමලෙස, ආරම්භයලෙස

Primary, *a.* ප්‍රථමවූ, ආරම්භවූ, ප්‍රධානවූ, මූලාදෑනිවූ

Prime, *a., beginning,* ආරම්භය, පටන්ගැන්ම; *of life, the early days,* යෞවනවයස, තරුණවයස; *the best the most perfect part of any thing,* ශ්‍රේෂ්ඨ, අග්‍රශීස, උත්තම

Prime, *v. a. as a gun,* කණ්ඩෙට බෙහෙත්දමනවා

Primeval, primevous, *a.* පුරාතනවූ, ආරම්භවූ

Primitive, *a.* පුරාතනවූ, පෞරාණවූ, පූර්වයෙහිවූ, ආරම්භයෙහිවූ, ආදිවූ; *a primitive word,* ධාතුව, මූල

Primitively, *ad.* පුරාතනලෙස

Primogeniture, *a.,* කුලැදුල්වූ, ප්‍රථමඋපන්නාවූ

Prince, *s.* යුවරාජ, රාජකුමාරයා

Princely, *ad.* රාජකුමාරලෙස

Princess, *s.* රාජකුමාරිකාවී, රාජානාවි

Principal, *a.* ප්‍රධානවූ, මුඛ්‍යාදීසවූ; *a principal*, අධිකාරියා, ප්‍රධානියා, මූලාදෑනියා; *of money*, මුල්මුදල

Principality, *s.* කුමාරකම; රාජදේශය

Principally, *ad.* ප්‍රධානලෙස, වැඩිතරම්ලෙස

Principle, *s.* *the constituent part*, ධාතුව; *the original cause*, ආරම්භය, මුල; *fundamental truth*, ශුභංචාවිච; *the ground of action*, ස්වභාවය, ගතිය; *motive*, කාරණාව

Print, *v. a.* මුද්‍රාකරනවා, හානාග ගහනවා, අච්චුගහනවා

Printer, *s.* අච්චුගහන්නා

Prior, *a.* ප්‍රථමවූ, ආදිවූ, මත්තෙන් සිදුවූ

Priority, *s.* ප්‍රථමිකාව, ආදිකම

Prison, *s.* බන්ධනාගාරය, හිරගෙ, දහකත

Prison, *v. a.* සිරකරනවා

Prisoner, *s.* සිරකාරයා

Pristine, *a.* පුරාතනවූ, ප්‍රථමවූ, පූර්වවූ

Privacy, *s.* ගැඹුරුකම, රහස්කම, අප්‍රසිද්ධකම

Private, *a.* ගැඹුරුනාවූ, රහස්වූ, අප්‍රසිද්ධවූ

Privately, *ad.* රහස්ලෙස, අප්‍රසිද්ධලෙස, ගැඹුරුවලෙස

Privation, *s.* අලාභවීම, කඩවීම, නැසෙනිවීම

Privatives, *a. are formed sometimes by prefixing certain particles to words such as.* අ, න, අන, *and sometimes by affixing as* නැ, නැත, නැතිව, නැති; *&c. see dis*

Privilege, *s. advantage*, ලාභය; *leave*, අවසරය; *immunity, right*, නියමය, බලය; *there are many privileges attached to that office*, ඒ නිලයට අයිති බොහෝ ලාභතිබෙන්නේය; *he had the privilege of passing through his neighbour's ground to his residence*, ඔහුට ඔහුගේ අසල්වාසියාගේ භූමියෙන් ඔහුගේ වාසස්ථානයට යෑම අවසර තිබුණේය; *this chief claimed the privileges which belong to the family of the ancient kings of this country*, මේ මුලාදෑනියා මේ රටේ පුරාන රජුන්ගේ පවුලට අයිතිවූ නියමය ඉල්ලමකලේය; *by that law foreigners obtain the privilege of becoming citizens*, ඒ පනතෙන් විදේශීන් පුරවාසීන් වෙනබලය ලබාගන්නාය

Privily, *ad.* රහස්ලෙස

Privy, *s. a garden house*, කකුස *P.*

Prize, *s. a reward gained by contest*, තෑග්ග, දිනුම; *plunder or things taken by adventure*, කොල්ලකෑ

දෙය, උපුරාගත්දෙය; *reward gained by any performance,* විපාක, ප්‍රතිඵල

Prize, *v. a. to rate,* අගයකරනවා, මිලකරනවා; *to esteem,* අනාගි හගකොටසිතනවා, වටිනාකෙල සැලකපනාකරනවා

Pro and con, සම්හිව, එදිරිව

Probability, *s.* සත්‍යාකාරවීම

Probable, *a.* සත්‍යාකාරවූ, සම්භවවූ; *it is probable,* වෙන්ඩ පුළුවන; *see perhaps*

Probably, *ad.* සත්‍යාකාරලෙස, වෙන්ඩපුළුවන්ලෙස; *probably it is so,* සම්භරවිට ඒ හැටිලෙසය

Probate, *s.* ශිවසුම්සාක්සියක්

Probation, *s. proof,* සාක්සිවීම, ඔප්පුව; *act of proving,* සාක්සි විභාගකිරීම; *a time or season of proving,* සොයනා දසවාර, විභාගකරනාකාලය

Probationer, *s.* විභාගවීම පිණිස සිටින්නා

Probe, *s.* වණය සෝදිසිකරනා දෙයක්

Probe, *v. a. a wound,* වණසොයනවා; *to search,* විභාගකරනවා

Probity, *s.* සත්පුරුෂකම, නාබුකම

Problem, *s.* ප්‍රශ්නය, ඇටීම

Problematical, *a.* ප්‍රශ්නවූ, අනුමානවූ

Proboscis, *s.* සොඬය

Procedure, *s. the manner of doing a thing,* සමත්කරනඅන්දම; *conduct,* කල්ක්‍රියාව; *the act of proceeding,* වැඩිදුවුනුකිරීම; *process,* ක්‍රියාකිරීම

Proceed, *v. n. to go on without interruption,* නොනවතිනවා, අන්තරකරනවා; *to pass on,* යනවා; *to come from any one,* පැමිණෙනවා; *to issue from,* නික්මෙනවා; *to be produced from,* ඉපදෙනවා; *to proceed against one,* යමෙකුට එදිරිව පැමිනිලි කරනවා. *to proceed well,* යහපත්ලෙසයනවා

Proceeds, *s.* ඵලය, ලාබය

Proceeding, *s. progress from one thing to another,* කල්යැවීම, පැවැත්ම, නොනැවැත්ම; *a series of conduct,* කල්ක්‍රියාකිරීම; *a legal process,* නඩුවිභාගකිරීම

Process, *s. judicial,* නඩුවිභාගකිරීම; *of time,* කාලගෙවීක්‍රමය, කල්යැවීම; *methodical management of any thing,* විධානකිරීම, කලමනාකිරීම

Procession, *s.* පෙරහැර, පෙලහර

Proclaim, *v. a.* ඝෝෂනායකරනවා, ප්‍රසිඬකරනවා, ප්‍රකාසකරනවා, එළිදරවුකරනවා

Proclamation, *s. the act of proclaiming,* ඝෝෂනායකිරීම, ප්‍රසිඬකිරීම, ප්‍රකාසකිරීම, එළිදරව්කිරීම; *a proclamation,* ප්‍රසිඬපත්‍රය, දැන්වීම්පත්‍රය

Proconsul, *s.* දිසාපතියා

Procrastinate, *v. n.* ප්‍රමාදකරනවා, පසුබටකරනවා

Procrastination, *s.* ප්‍රමාදකිරීම, පසුබටකිරීම

Procreate, *v. a.* ජනිතකරනවා, හටගන්වනවා, උපදවනවා

Procreation, *s.* ජනිතකිරීම, හටගැන්වීම, ඉපදවීම

Procreative, *a.* ජනිතකරන්නාවූ, හටගන්වන්නාවූ, උපදවන්නාවූ

Procreator, *s.* ජනිතකරන්නා, උපදවන්නා

Proctor, *s.* වාසවසම්පවෙවිසිදුසෘ ජා, නඩුදානක්කාරයා; *the word universally used is* ප්‍රොකදෝරුවා; *Port.*

Procumbent, *a.* ඇලවෙවන්නාවූ, නැමෙන්නාවූ

Procurable, *a.* සපයාගත්හැකිවන්වූ

Procure, *v. a.* සපයාගන්නවා, සම්භාරගන්නවා, උපයාගන්නවා

Procurer, *s.* සපයාගන්නා, සම්භාරගන්නා, උපයාගන්නා

Prodigal, *s.* නිෂ්ඵලවියදම්කරන්නා, බොහෝවියදම්කාරන්නා, පමණෙනොදැනවියදම්කරන්නා

Prodigality, *s.* නිෂ්ඵලවියදම්කිරීම, බොහෝවියදම්කිරීම

Prodigious, *a.* ආශ්චර්යවූ, විශ්මයජනක්වූ, පුදුමවූ, මහත්වූ

Prodigy, *a.* ආශ්චර්යය, විස්මය, පුදුමය, භයය

Produce, *v. a.* *to exhibit*, දක්වනවා, පෙන්වනවා; *to generate*, ජනිතකරනවා, හටගන්වනවා; *to bear, to bring forth*, උපදවනවා, හටගන්වනවා

Produce, *s.* ඉපදවූදෙය, ලාභ, ප්‍රයෝජන

Producer, *s.* ජනිතකරන්නා, උපදවන්නා

Product, *s.* ලාභය, ප්‍රයෝජනය, ඉපදවූදෙය

Production, *s.* ඉපදවීම, ජනිතකිරීම, හටගැන්වීම, ඉපදවූදෙය

Productive, *a. generative*, උපදවන්නාවූ, හටගන්වන්නාවූ; *profitable*, ලාභවූ, ප්‍රයෝජනවූ

Profanation, *s.* දූෂණකිරීම, මිත්‍යාචාරකිරීම, අපවිත්‍රකිරීම, කිලුටුකිරීම

Profane, *a.* දූෂණවූ, මිත්‍යාචාරීවූ, අපවිත්‍රවූ, කිලුටුවූ, දුෂ්ටවූ, පාපිෂ්ටවූ

Profane, *v. a.* දූෂණකරනවා, මිත්‍යාචාරකරනවා, අපවිත්‍රකරනවා, කිලුටුකරනවා, පවුකරනවා

Profess, *v. a. publickly to acknowledge or own any sentiment*, සැලපනාව ප්‍රකාශකරනවා, සිත්වල් එලිදරවූකරනවා, ප්‍රසිද්ධලෙස කියනවා

Professedly, *ad.* ප්‍රසිද්ධලෙස

Profession, *s. calling, vocation*, ව්‍යාපාරය, ශිල්ප, වෘත්ති; *religious*, ඇදහිල්ල; *a public de-*

claration of sentiment, කැලපනාව, ප්‍රකාසකිරීම, සිත්දිලවිලි දන්වුකිරීම, ප්‍රසිඩකලකිරීම

Professional, *a.* ශිල්පයකඅයිතිවූ, වාසෙඩවඅයිතිවූ

Professor, *s. religious,* දෙවුහතනි වකාරයා, අැදහිලිවනතා; *one who teaches or practises any art or science,* සිල්පකාරයා, සාස්ත්‍රාතාපාලකයනතා, ගෞස්තුවන්තයා

Proffer, *v. a.* පානවා, දීමටකරනවා, දෙනවා

Proffer, *s.* පෑම, දීම, දීමටකිරීම

Proficience, proficiency, *s.* ප්‍රඥාවීම, සමර්ථවීම

Proficient, *s.* පණ්ඩිතයා, සමර්ථයා, උගත්අය

Profile, *s.* අඩ්ජායාව, අඩ්මූහුණ, අඩ්ඩ්‍රූපය

Profit, *s.* ඵල, ලාභ, ප්‍රයෝජනය

Profit, *v. n.* ඵලලැබෙනවා, ලාභයක්වනවා, ප්‍රයෝජනලැබෙනවා

Profitable, *a.* ඵලලැබෙන්නාවූ, ලාභලැබෙන්නාවූ, ප්‍රයෝජනලැබෙන්නාවූ

Profitably, *ad.* ඵලලැබෙනලෙස, ලාභලැබෙනලෙස, ප්‍රයෝජනලැබෙනලෙස

Profligate, *a.* දුෂ්ටවූ, පාපිෂ්ටවූ, නපුරුවූ

Profound, *a. deep,* ගාම්භීරවූ, ගැඹුරුවූ; *learned,* මහාඥාණවූ, බොහොපණ්ඩිතවූ, බොහෝඋගත්වූ

Profoundly, *ad.* මහාඥාණදෙනලෙස, අතිපණ්ඩිතලෙස, බොහෝඋගත්ලෙස

Profoundness, profundity, *s.* ගාම්භීරය, ගැඹුර

Profuse, *a.* අධිකවූ, බොහෝ, බොහෝවූ; *prodigal,* බොහෝසෝවිය දක්කරනනාවූ

Profusely, *ad.* අධිකලෙස, බොහොලෙස, බොහෝසෝලෙස, බොහෝසෝවියදක්කරනනාලෙස

Profusion, *s.* අධිකවීම, බොහොවීම, බොහෝසෝවීම, බොහෝසෝවිය දක්වීම

Prog, *s.* අහාරය, කෑම

Progenitor, *s.* පූර්වපුරුෂයා, කුලයේ මූලයා, වැඩිමහල්ලා

Progeny, *s.* කුලය, ගෝත්‍රය, වංශය, වංශය

Prognosticate, *v. a.* අනාගතවාක්‍යකියනවා, ජ්‍යෝතිෂ්කියනවා, මතුලබාහැකිදේපෙනවනවා

Prognosticator, *s.* අනාගතවාක්‍යකියනනා, ජ්‍යෝතිෂකියනනා, මතුලබනාපෙන්වනනා

Progress, *s. course, or changing from place to place,* ගමනාව, යෑම; *advancement in general,* වැඩිදියුණුවීම; *advancement in learning,* ධාරණාවවීම, ප්‍රඥාවීම, ගුණනීම

Progression, *s.* ධාරණාවවීම, ප්‍රඥාවීම, වැඩිදියුණුවීම

Progressive, *a. advancing in learning,* ධාරණාවෙවන්නාවූ, ප්‍රඥාවෙවන්නාවූ, වැඩිදියුණුවෙ

න්නාවූ; *going forward*, ක්‍රමක්‍රමයෙන්යන්නාවූ -

Progressively, *ad.* ක්‍රමක්‍රමයෙන්, අඩියෙන්අඩිය, ටික්ටික

Prohibit, *v. a.* බාධාකරනවා, වලක්වනවා, තහනම්කරනවා

Prohibiter, *s.* බාධාකරන්නා, වලක්වන්නා, තහනම්කරන්නා

Prohibition, *s.* බාධාකිරීම, වැලැක්වීම, තහනම්කිරීම

Prohibitory, *a.* බාධාකරන්නාවූ, වලක්වන්නාවූ, තහනම්කරන්නාවූ

Project, *s.* උපාය, අභිප්‍රාව

Project, *v. a. to jut out as the branches of a tree,* විහිදීතිබෙනවා, දික්වීතිබෙනවා; *as a rock or promontory,* නෙරාතිබෙනවා; *to throw forward,* විසිකරනවා; *to plan, to scheme,* උපායයොදනවා, ආකාරය කරනවා, අභිප්‍රායකරනවා

Projection, *s.* විහිදීම, දික්වීම, නෙරීම, විසිවීම; *see the verb*

Projector, *s.* සිතන්නයොදන්නා, ආදලෑසිතියම්කරන්නා

Prolifically, *ad.* ඵලධරලෙස, සඵලලෙස, ගබ්බිනීලෙස, ප්‍රයෝජනලෙස; *see the adj.*

Prolifick, *a. fruitful,* ඵලධරවූ; *flourishing,* සම්පූර්ණවූ; *pregnant,* ගබ්බිනිවූ; *gainful,* ප්‍රයෝජනවූ

Prolix, *a. long, not concise,* දීර්ඝවූ, දිගවූ; *tedious,* ප්‍රමාදවූ, කාලගතවූ

Prolixity, *s.* දීර්ඝකම, දිගකම; *see the adj.*

Prolocutor, *s.* මූලාරම්භයකියන්නා

Prologue, *v.* මූලාරම්භයකීම

Prolong, *v. a. to lengthen out,* දීර්ඝකරනවා, දිගකරනවා; *to put off to another time,* ප්‍රමාදකරනවා, පසුබටකරනවා, අනාගතකරනවා

Prominent, *a.* විහිදුනාවූ, නෙරාවාවූ

Prominence, prominency, *s.* විහිදීම, නෙරීම

Promiscuous, *a.* මිශ්‍රවූ, හාමුහුවූ, හවුල්වූ, පැටලුනාවූ

Promiscuously, *ad.* මිශ්‍රලෙස, හාමුහුලෙස, හවුල්ලෙස, පැටලුනාවූලෙස

Promise, *s.* ප්‍රතිඥාව, පොරොන්දුව

Promise-breach, *s.* ප්‍රතිඥාකඩකිරීම, පොරොන්දුකැඩීම

Promise-breaker, *s.* ප්‍රතිඥාකඩකරන්නා, පොරොන්දුකඩකරන්නා

Promise, *v. n.* ප්‍රතිඥාවදෙනවා, පොරොන්දුවෙනවා

Promissory, *a.* ප්‍රතිඥාවූ, පොරොන්දුවූ; *promissory note,* පොරොන්දුපත්‍රය

Promontory, promont, *s.* නෙරැවූපව්වාය

Promote, *v. a. to advance,* වැඩිදියුණුකරනවා; *to elevate,* උසස්කරනවා

Promoter, *s.* වැඩිදියුණුකරන්නා, උසස්කරන්නා

Promotion, *s.* වැඩිදියුණුවීම, උසස්වීම, වැඩිතනතුරවපත්වීම

Prompt, *a.* දක්ෂවූ, සමර්ථවූ, කඩිසරවූ, අප්‍රමාදවූ, ඉක්මන්වූ, සූදානම්වූ

Prompt, *v. a.* හඟවනවා, උසාවිකරනවා, උසිගන්වනවා, සිහිකරවනවා

Promptitude, *s.* දක්ෂකම, සමර්ථකම, කඩිසරකම, අප්‍රමාදකම, ඉක්මන්කම, සූදානම්කම

Promptly, *ad.* දක්ෂලෙස, සමර්ථලෙස, කඩිසරලෙස, අප්‍රමාදලෙස, ඉක්මන්ලෙස, සූදානම්ලෙස.

Promulgate, promulge, *v. a.* ප්‍රකාසකරනවා, දක්වනවා, ප්‍රසිද්ධකරනවා, එළිදරව්කරනවා

Promulgator, promulger, *s.* ප්‍රකාසකරන්නා, ප්‍රසිද්ධකරන්නා, දක්වන්නා, එළිදරව්කරන්නා

Prone, *a.* නැමෙන්නාවූ, ඇලවෙන්නාවූ, සිත්අදින්නාවූ

Proneness, *s.* නැමෙනකම, ඇලවෙනකම, සිත්අදිනකම.

Prong, *s.* උල, කටුව

Pronoun, *s.* සර්වනාම

Pronounce, *v. a.* *to speak, to utter,* කියනවා, කතාකරනවා; *to articulate,* ශබ්දදෙනවා, ශබ්දකරනවා; *to pronounce sentence,* විනිශ්චයපට මුගන්වියකියනවා; *to pronounce words clearly,* ප්‍රසිද්ධලෙස වචනශබ්දකරනවා

Pronunciation, *s.* ශබ්දදීම, ශබ්දකිරීම; *see the verb*

Proof, *s.* *evidence,* සාක්ෂිය, ඔප්පුව; *experiment,* විභාගය; *impenetrability,* සවිරය, ශරය, සදය

Prop, *v. a.* බලපානවා, අඩපානවා, නඩත්තුකරනවා, කරුපානවා

Prop, *s.* කරුව, බලය

Propagate, *v. a.*, *to disperse abroad,* පතළකොටහරිනවා, කටිනකටවිසිකරනවා; *to generate,* ජනනකරනවා, ජන්මකරනවා; *to increase,* වර්ධනයකරනවා, බොහෝකරනවා

Propagation, *s.* පතළකොටහැරීම, ජනනකිරීම, ජන්මකිරීම, වර්ධනයකිරීම, බෝකිරීම; *see the verb*

Propagator, *s.* පතළකොටහරින්නා, ජනනකරන්නා, ජන්මකරන්නා, වර්ධනයකරන්නා, බෝකරන්නා; *see the verb*

Propel, *v. a.* පන්නවනවා

Propension, propensity, *s.* සිත්පොලඹවීම, ඇලවීම, සිත්ඇලවීම, මනාපවීම

Proper, *a.* කාමිතව්‍යවූ, යෝග්‍යවූ, යුක්තවූ, යුතුවූ, සුදුසුවූ, හරිවූ, කටයුතුවූ

Properly, *ad.* කාමිතව්‍යලෙස, නිසිමලෙස, යුක්තලෙස

Property, *s.* ධනය, සම්පත, වස්තුව, අඩුවැඩිය, දේපල, බඩු

Prophecy, *s.* අනාගතවාක්‍යය, නිමිතිකම

Prophesy, *v. a.* අනාගතවාක්‍යය කියනවා, නිමිතිකියනවා, ඉදිරිපත්වෙනදේකියනවා, මතුවෙනදෙයකියනවා

Prophet, *s.* අනාගතවක්තෲන්, නිමිතිකියන්නා; *the word* ප්‍රොපේතා; *is much in use among the Natives*

Prophetic, prophetical, *a.* අනාගතවාක්‍යකියන්නාවූ

Propitiate, *v. a. to appease by offerings or sacrifices,* තුෂ්ටියාගකරනවා, යාගපූජාකරනවා; *to conciliate,* රොෂවනාදුරුවනවා, ශාන්තිකරනවා, මනාපකරවනවා

Propitiation, *s.* තුෂ්ටියාගකිරීම, යාගපූජාකිරීම, රොෂවනාදුරුවීම, ශාන්තිකිරීම, මනාපකිරීම; *see the verb*

Propitiator, *s.* තුෂ්ටියාගකරන්නා, යාගපූජාකරන්නා, රොෂවනාදුරුවන්නා, ශාන්තිකරන්නා, මනාපකරන්නා; *see the verb*

Propitiatory, *a.* තුෂ්ටියාගකරන්නාවූ, යාගපූජාකරන්නාවූ, රොෂවනාදුරුවන්නාවූ, ශාන්තිකරන්නාවූ, මනාපකරන්නාවූ; *see the verb*

Propitious, *a.* අනුකූලවූ, වාසනාවෙන්නාවූ, මනාපවෙන්නාවූ

Proponent, *s.* දක්කරන්නා, ඇදනානා

Proportion, *s.* සමප්‍රමාණය, උපයුක්තය, යෝග්‍යය, සදෘශය, සමානකම

Proportion, *v. a.* සමප්‍රමාණකරනවා, උපයුක්තකරනවා, යෝග්‍යකරනවා, සදෘශකරනවා, සමානකරනවා

Proportionable, *a.* සමප්‍රමාණවූ, සමානපමණවූ, යුතුවූ

Proportionably, *ad.* සමප්‍රමාණලෙස, සමානපමණලෙස, යුතුලෙස

Proposal, *s. a scheme or design propounded for consideration,* ප්‍රතිඥාව; *an offer,* පොරොන්දුව

Propose, *v. a. to offer,* දෙනවායයි කියනවා; *to propose a question,* ප්‍රශ්නඅහනවා, ඇසීමඅහනවා; *to propose terms of peace,* සමාදානවීමට පොරොන්දුකරනවා

Proposition, *s. a sentence,* වාක්‍යය; *a proposal,* ප්‍රතිඥාව

Propound, *v. a. to exhibit,* දක්වනවා, පානවා; *to propose as a question,* ප්‍රශ්නඅහනවා, ඇසීමඅහනවා

Proprietor, *s.* ස්වාමියා, හිමියා, අයිතිකා

Propriety, *s. exclusive right,* ස්වාමිකම, අයිතිකම; *consistency,* යෝග්‍යකම, යුතුකම, සුදුසුකම

Prorogation, *s.* පැවැත්වීම, ප්‍රමාදකිරීම, පසුබටකිරීම

Prorogue, v. a. පටිත්වී නාවා, දැ මාදුකාරනාවා, පසුබටකරනා වා

Proscribe, v. a. දඬුවමටනියෝග කරනාවා, අවවුවදීමටපත්කා රනාවා

Proscription, s. දඬුවමටනියෝග කිරීම, අවවුවදපත්කිරීම

Prose, s. පාඨය

Prosecute, v. a. *persevere in any thing*, පවත්වනාවා, නොනවත නාවා; *to prosecute in law*, විනිස්චයපමුනුවනාවා, නඩුපැමි ණිලිකාරනාවා

Prosecution, s. පැවතීම, නොන වතීම, විනිස්චයපැමිණීම, න ඩුපැමිණීම ; *see the verb*

Prosecutor, s. විනිස්චයපමුනුව නනා, නඩුපමුනුවන්නා

Proselyte, s. ලබ්ධියන්ත්‍රය

Prosody, s. ඡන්දස

Prospect, s. *scenery*; දිෂ්ටිය, දක් නාය, පෙනීම; *a view into futurity*, මතුලකුණ, ප්‍රාර්ථනා ව, පැතීම

Prospective, a. දිෂ්ටිවූ, දක්නියවූ, පෙනෙනනාවූ, මතුලකුණුවෙ නාසාව, ප්‍රාර්ථනාවෙන්නාවූ; *see the noun*

Prospective-glass, s. සඹුත්තාව

Prosper, v. a. වඩිනායවෙනාවා, වැඩිදියුණුවෙනාවා, සඵලවෙ නාවා

Prosperity, s. වඩිනායවීම, වැඩි දියුණුවීම, සඵලවීම

Prosperous, a. වඩිනායවෙන්නා වූ; වැඩිදියුණුවෙන්නාවූ, සඵ ලවූ

Prostitute, v. a. දුෂ්ටව්‍යවහාරය පවත්වනාවා, වෙශ්‍යාභාවයට හැඩිකරනාවා, වෙසාකම්කාර නාවා

Prostitution, s. දුෂ්ටව්‍යවහාරය පැවැත්වීම, වෙශ්‍යාභාවයට හැඩිකිරීම, වෙසාකම්කිරීම

Prostitute, s. වෙශ්‍යාවී, වෙසී

Prostrate, v. a. නමස්කාරකරනා වා, වදිනාවා, වැදබැගැටිය වෙනාවා

Protect, v. a. සුරක්ෂිතකරනාවා, ආරක්ෂාකරනාවා, රක්ෂාකාර නාවා

Protection, s. සුරක්ෂිතකිරීම, ආ රක්ෂාකිරීම, රැකීම

Protector, s. සුරක්ෂිතකාරන් නා, ආරක්ෂාකාරන්නා, රක් ෂාකාරනානා

Protend, v. a. දිගුකරනාවා, පෑ නාවා

Protest, v. a. *to make a declaration*, ඇත්තැටකියනාවා, සවිකාර කියනාවා; *not to accept*, පිළි නොගන්නාවා; *to protest a bill of exchange*, මිලමාරුකොට න්පත්‍රය පිළිනොගන්නාවා

Protest, protestation, s. ඇත්තැටි කීම, සවිකාරකීම

Protract, v. a. දිගිකරනාවා, ප්‍ර මාදකරනාවා, දික්කාරනාවා, පමාකරනාවා

Protracter, *s.* දීර්ඝකාරන්නා, දික්කරන්නා, ප්‍රමාදකාරන්නා, පමාකරන්නා

Protrude, *v. a.* වැඩිවෙනවා, දික්වෙනවා

Protuberance, *s.* නෙරීම, ඉදිමුම, ඉලිප්පීම

Protuberant, *a.* නෙරෙන්නාවූ, ඉදිමෙන්නාවූ, ඉලිප්පෙන්නාවූ

Protuberate, *v. n.* නෙරනවා, ඉදිමෙනවා, ඉලිප්පෙනවා

Proud, *a.* අහංකාරවූ, ආඩම්බරවූ, උඩඟුවූ

Proudly, *ad.* අහංකාරලෙස, ආඩම්බරලෙස, උඩඟුලෙස

Prove, *v. a.* *to shew by evidence*, සාක්ෂිදෙනවා, ඔප්පුකරනවා; *to try, to bring to the test*, පරීක්ෂාකරනවා, විභාගකරනවා, සෝදිසිකරනවා

Provender, *s.* ආහාර, ගෝචර, ගොදුරු, කෑම

Proverb, *s.* හිතෝපදේසය, උපමාව

Proverbial, *a.* හිතෝපදේසවූ, උපමාවූ

Provide, *v. a.* පිළියෙලකරනවා, යෝජනාකරනවා, පෝෂ්‍යයකරනවා, ලබාදෙනවා, සපයාදෙනවා; *we had to provide for our journey*, අපේ ගමනට භෝජනසපයාගන්ට ඕනෑවුණේය; *to provide against the rainy season*, වර්ෂාකාලයට ප්‍රවේසම්වීන්ස සපයාගන්නවා; *I am not provided with a horse*, මට අශ්වයෙක් නැතුවා; *he is well provided for*, ඔහු ඕනල් ලෙන්ම සපලව හිඳිනාවා; *provided that you come soon*, කම වේලාසග එනවානම්: *provided that*, ඒනම්

Providence, *s.* *divine superintendence*, දෙවියන්ගේ ප්‍රවිචාරම; *the act of providing for*, පෝෂණයකිරීම, රකෂාව, සැපයීම; *foresight, forecast*, දූරදර්ශනය, ප්‍රථමයෙන් ශෑසීම

Provident, *a.* සපයාගන්නාවූ, ප්‍රවේසම්වෙනනාවූ

Providential, *a.* දෙවියන්වහන්සේගේ ප්‍රවේසම්වූ

Providentially, *ad.* දෙවියන්වහන්සේගේ ප්‍රවේසම්ලෙස

Provider, *s.* සපයාගන්නා, ප්‍රවේසම්වෙනනා

Province, *s.* ජනපදය, කෝරළේ, කොටමුවෙන්

Provincial, *a.* ජනපදයට අයිතිවූ, කෝරලයට අයිත්වූ, කොටමුනාංව අයිතිවූ

Provincial judge, *s.* කෝරළේ විනිශ්චකාරයා; *but among the Natives the word* ප්‍රොවින්සියල් නඩුකාරයා *is almost universally used*

Provision, *s.* ඛාද්‍ය, ගෝචර, භෝජනඋපකරණ, කෑමබීම දේ

Provisional, *a.* සමයානුරූපවූ, කාලවිෂයවූ

Proviso, *s.* පොරොන්දුව, ප්‍රකට සම

Provocation, *s.* කෝපඋපදවීම, ක්‍රෝධකිරීම, කරහකිරීම

Provoke, *v. a. to enrage*, කෝපඋපදවනවා, ක්‍රෝධකරනවා, කරහකරනවා; *to excite*, පොලඹනවා, උපදවනවා

Prowess, *s.* වියසිවනානකම, දක්ෂකම, බලවත්කම

Prowl, *v. a.* උදුරාගන්නවා, කොල්ලකනවා

Proximate, *a.* අසලතිබෙන, ලඟතිබෙන

Proximately, *ad.* අසලතිබෙනලෙස, ලඟතිබෙනලෙස

Proxy, *s.* උපදූතයා, ප්‍රතිනියෝජිතයා, දෙවැනියා

Prudence, *s.* බුද්ධිමත්කම, ඥානවන්තකම, ප්‍රවේසම්කම

Prudent, *a.* බුද්ධිමත්වූ, ඥානවන්තවූ, ප්‍රවේසම්වූ

Prudently, *ad.* බුද්ධිමත්ලෙස, ඥානවන්තලෙස, ප්‍රවේසම්ලෙස

Prune, *v. a.* අතුබානවා, කපනවා

Pruninghook, pruningknife, *s.* අතුබානආවුදය

Pry-into, *v. a.* විභාගකරනවා, සොයනවා

Psalm, *s.* ගීතිකාව

Psalmist, *s.* ගීතිකාලියන්නා

Psalmody, *s.* ගීතිකාගීම

Psalter, *s.* ගීතිකාපොත

Pshaw, *interj.* ඡ!

Puberty, *s.* වැඩිවියපැමිණීම

Publican, *s.* සුන්ක්‍රමියකාරන්නා, ආදායම්එකතුකරන්නා

Publication, *s.* ප්‍රසිද්ධකිරීම, ප්‍රකාසකිරීම, එළිදරව්කිරීම

Publick, *a.* ප්‍රසිද්ධවූ, ප්‍රකාසවූ, එළිදරව්වූ

Publick, *s. the general body of the people of a Nation*, මහජනයෝ; *in the open view*, ප්‍රසිද්ධවීම, එළිදරව්වීම

Publickly, *ad.* ප්‍රසිද්ධලෙස, ප්‍රකාසලෙස, එළිදරව්වූලෙස

Publish, *v. a.* ප්‍රසිද්ධකරනවා, ප්‍රකාසකරනවා, එළිදරව්කරනවා

Publisher, *s.* ප්‍රසිද්ධකරන්නා, ප්‍රකාසකරන්නා, එළිදරව්කරන්නා

Pucelage, *s.* කන්‍යාභාවකම

Pucker, *v. a.* අකුලනවා

Pudder, *v. a.* ඝෝෂාකරනවා, කරදරකරනවා, කරච්චල්කරනවා

Pudding, *s.* පුඩින් *is generally used*

Puddle, *s.* මඩගොහොරුව

Puddle, *v. a.* මඩගොහොරුකරනවා, කිලිටුකරනවා

Pudency, *s.* ලැජ්ජකම

Puerile, *a.* ළමාවූ, ළදරුවූ, ළපටිවූ

Puet, *s.* කැදැත්තන්වැනියෙක්

Puff, *s.* සුළඟපිඹීම

Puff, *v. n.* පුළුහා පිඹිනවා, පුම්බනවා; *to boast*, අහංකාර වෙනවා, ආඩම්බර වෙනවා, සිත් උඩඟු වෙනවා

Pugh, *interj.* අශ්

Puisne, *a.* කුඩාවූ, අප්‍රධානවූ, පෙද වනුවූ

Puissant, *a.* බලවන්තවූ

Puke, *s.* වමනය

Puke, *v. n.* වමන කරනවා

Pull, *v. a.* අදිනවා, උදුරනවා; *to pull in pieces*, සිරා අරිනවා; *to pull off one's clothes*, තමන්ගේ ඇඳුම් ගලවාදමනවා; *to pull down*, ඇදදමනවා, උඩ රාදමනවා, පෙරළාදමනවා

Pull, *s.* ඇදීම

Pullet, *s.* කුකුල්පැටියා

Pully, *s.* සෝබාව, කප්පිය

Pulmonary, pulmonick, *a.* පෙනහළුවට අයිතිවූ

Pulp, *s.* මද

Pulpit, *s.* දේසනාපුටුව

Pulpous, pulpy, *a.* මදයවූ

Pulsation, *s.* නාඩිගැස්ම

Pulse, *s.* නාඩි; *to examine the pulse*, නාඩිඅල්ලනවා; *to feel one's pulse*, යමෙකුගෙ සිතබලා යනවා

Pulverize, *v. n.* චූර්ණ කරනවා, සුණු කරනවා, කුඩු කරනවා

Pumice, *s.* දැලිපොතුසුණු

Pummel, *see pommel*

Pump, *s.* ජලයන්ත්‍රය; වතුර බොම්බය; *Port.*

Pump, *v. a.* ජලයන්ත්‍රයෙන් වතුරඅදිනවා, බොම්බකරනවා

Pun, *s.* කවටපදය

Pun, *v. a.* දෙඅර්ථ ගෙනෙන වචනකියනවා

Punch, *v. a.* සිදුරු කරනවා, විදිනවා

Punch, *s.* බොනකුණියන

Punctilio, *s.* ආචාරවන්තකම

Punctilious, *a.* ආචාරවන්තවූ

Punctual, *a.* සත්‍යවාදීවූ, සත්‍යවාදීවූ, නියමකාලයෙවූ, හරිආකාරවූ; *to be punctual in business*, හරිආකාරෙට වැඩකරනවා

Punctually, *ad.* සත්‍යවාදී ලෙස, සත්‍යවාදී ලෙස, නියමකාලයේ ලෙස, හරිලෙස

Puncture, *s.* සිදුර

Pungent, *a.* කාපැවූ, තියුණුවූ, කටුකවූ, දැවිළුවූ

Punic, *a.* අසත්‍යවූ

Punish, *v. a.* දඬුවම් කරනවා, අඩවු කරනවා, තලනවා

Punishable, *a.* දඬුවමට සුදුසුවූ, අඩවු කිරීමට සුදුසුවූ

Punishment, *s.* දඬුවම්කිරීම, අඩවු කිරීම, තැළීම

Punk, *s.* වෙසගැහැනී, වේසි

Puny, *a.* කුරුඩුවූ, පුංචිවූ, කුඩාවූ

Pup, *v. n.* වදනවා, පැටවුගහනවා

Pupil, *s. of the eye*, කළුඉඟිරියාව; *a scholar*, ශිෂ්‍යයා, ගෝලයා

Puppet, *s.* රූකඩ, සෙල්ලම, බෝනික්කා; *Port.*

Puppetshow, *s.* රූකඩසෙල්ලම, කෝලම්සෙල්ලම

Puppy, *s.* *a fop*, ආඩම්බරකාරයා; *a whelp*, බලුපැටවා

Puppy, *v. n.* බලුපැටවුන්හානවා

Purblind, *a.* මන්දදෘෂ්ටිවූ, දුර නොපෙනෙනාවූ

Purchase, *v. a.* ක්‍රයකරනවා, මිලේටගන්නවා

Purchase, *s.* ක්‍රයකාලදෙය, මිලේටගත්දෙය

Purchaser, *s.* ක්‍රයකරන්නා, මිලේටගන්නා

Pure, *a.* නිර්මලවූ, පවිත්‍රවූ, පිරිසිදුවූ, සුද්ධවූ

Purely, *ad.* නිර්මලලෙස, පවිත්‍රලෙස, පිරිසිදුලෙස, සුද්ධලෙස; *merely*, ප්‍රමාණ, පමණ, විතර

Pureness, *s.* නිර්මලකම, පවිත්‍රකම, පිරිසිදුකම, සුද්ධකම

Purgation, *s.* පවිත්‍රකිරීම, විරේචනකිරීම, විරේකකිරීම

Purgative, *a.* විරේචනකරනාවූ, විරේකකරන්නාවූ

Purge, *v. a.* විරේචනකරනවා, පාවනකරනවා, බඩඋළලවනවා, විරේකදෙනවා

Purge, *s.* විරේචන, විරේක

Purification, *s.* නිර්මලකිරීම, ශුද්ධදෙසකිරීම, පවිත්‍රකිරීම

Purifier, *s.* පවිත්‍රකරන්නා

Purify, *v. a.* ශුද්ධදෙසකරනවා, නිර්මලකරනවා, පවිත්‍රකරනවා, සුද්ධකරනවා

Purity, *s.* ශුද්ධදෙස, නිර්මල, පවිත්‍ර, සුද්ධ

Purl, *v. n.* දෙලෙන්බහිනවා

Purloin, *v. a.* සොරකම්කරනවා

Purloiner, *s.* සොරකම්කරන්නා

Purple, *a.* අඳුරුවර්ණ, වයිනාවර්ණ, දුඹුරුපාට

Purple, *v. a.* අඳුරුවර්ණකරනවා, වයිනාවර්ණකරනවා, දුඹුරුවර්ණකරනවා

Purport, *s.* අර්ථ, කාරනාව

Purport, *v. n.* අර්ථයදෙනවා, කාරනාවපෙන්වනවා

Purpose, *s.* අදහස, සැලපනාව, මනස; *to that purpose*, ඒකාරනාවනිසා; *to speak to the purpose*, අර්ථයුක්තකථාකරනවා; *done on purpose*, සැලපනාවපරිද්දෙන්කරා; *to no purpose*, නිරර්ථකව; *he spoke to the same purpose*, ඔහු එප්‍රකාර මකථාකරා

Purpose, *v. n.* අභිප්‍රාකරනවා, අදහස්කරනවා, සැලපනාකරනවා, හිතනවා

Purposely, *ad.* අභිප්‍රාලෙස, අදහසලෙස

Purse, *s.* පසුම්බිය, පයිය

Purse-proud, *a.* ධනපූරුමෙත්වූ

Purse, *v. a.* පයියෙදමනවා

Pursuance, *s.* ඇබිරිම, එලවීම

Pursuant, *a.* පරිද්දෙන්

Pursue, *v. a.* *to chase*, ලුහුබඳිනවා, එලවනවා; *to endeavour to attain*, වියසිකරනවා, උත්සාහකරනවා

Pursuer, *s.* ලුහුබඳින්නා, එලවන්නා
Pursuit, *s.* ලුහුබැඳීම, එලවීම
Purvey, *v. a.* සපයාගන්නවා
Purveyor, *s.* පෝශ්‍යකාරන්නා, සපයාගන්නා
Purulent, *a.* ඕජස්වලෙහොමනාවූ
Pus, *s.* ඕජස, සැරව
Push, *v. a.* තල්ලුකරනවා, උගාගමනවා
Push, *s.* තල්ලුකිරීම, උහාගැමීම
Pushing, *a.* වියසිවත්වූ, ජිඛිකාවූ
Pusillanimous, *a.* හීනසිත්වූ, ජඩසිත්වූ
Puss, *s.* බළලුලා, බිලලා
Pustule, *s.* කෂේඩය, බිබිලු
Put, *v. a.* තබනවා, දමනවා; *to put it down*, එතනදමනවා; *to a put question to one*, ප්‍රශ්නඅහනවා, කාගෙන්නෙත්අහගැනීමක් අහනවා; *to put back*, නැවතනනවා, පසුබටකරදමනවා; *to put away*, අයින්කරදමනවා; *to put by*, අයින්කරතබනවා, or දමනවා; *to put forth a book*, පොතක් අච්චුගස්සනවා, or ප්‍රසිද්ධකරනවා; *to put forth one's hand*, අතදෙනවා; *to put in for a place*, තනතුරක් ලබාගැනීමට වෑයමකරනවා; *to put forth leaves*, දළුදමනවා, ලියලනවා; *to put in heart*, ධෛර්‍යකරනවා, or සවිකරනවා, හයිගෙනවෙන්නාකියාලාකිය ගනවා; *to put himself into the habit of a shepherd*, එඬේරාසැලුම්අඳිනවා; *to put off*, අකප්‍රකරනවා, ප්‍රමාදකරනවා, පුනාහුකරනවා; *to put off one's clothes*, ඇඳුම්ගලවනවා, අරිනවා, ලිහනවා; *to put off one's hat*, තොප්පියගලවනවා; *to put off one's shoes*, මිරිවැඩි, or සපත්තුගලවනවා; *to put off a thing cunningly*, ප්‍රයෝගයෙන් අත්අරිනවා; *put on your hat*; තොප්පිය දමාගනින්; *put on your coat*, කබාය ඇඳගනින්; *to put on*, ඉස්මනාට ඇඳිනවා; *to put one out*, කලබැසැහිකරනවා; *to put the candle out*, ඉටිපන්දම නිවනවා, පාන or එළියනිවනවා; *to put out the eyes*, ඇස් අන්ධකරනවා; *to put out of hope*, ප්‍රාර්ථනාවනැතිකමපෙළවනවා; *to put out of fear*, භයනැතිකරනවා; *to put up with an injury*, අපහාසකටකමාවෙනවා; *to put up a sword*, කඩුවදමනවා; *to put to sea*, යාත්‍රාවපටන්ගන්නවා; *to put up*, පියනවා, වසනවා; *to put forth*, දහරකරදමනවා, ප්‍රසිද්ධකරනවා; *to put a trick upon one*, යමෙක්කුටුවපනවා, යමෙකුට කපටිකම්කරනවා; *to put one in passion*, යමෙක් ක්‍රෝධකරවනවා; *to put forward*, ඉදිරියටදමනවා; *to put in mind*, සිහිකරවනවා; *to put in fear*,

භාගකාරවනවා, මහත්කරනවා; *to put out of joint,* සන්ධි ගලවනවා; *to put one to much pain,* යමෙකුට බොහෝ රිදවනවා; *to put to the sword,* මිරනාපත්කරනවා, මරනවා; *to put a stop,* නවත්වනවා; *to put a good construction upon a thing,* යම්දෙයක්ගැන හොඳ වකල්පනාකරනවා

Putid, *a.* නරවූ

Putrefaction, *s.* කුණුගතිය

Putrefy, *v. n.* කුණුවෙනවා, දිරනවා, නරක්වෙනවා

Putrescent, putrid, *a.* කුණුවූ, දිරාවූ, නරක්වූ

Putty, *s.* බදාම

Puzzle, *v. a.* නිරුත්තරප්‍රශ්නඅහනවා, කරදරකරනවා

Puzzler, *s.* නිරුත්තරප්‍රශ්නඅහනනා, කරදරකරන්නා

Pygmy, *s.* අඟුටුවා, කුරා, මිට්ටා

Pyramid, *s.* සොහොන්පල

Q

Quack, *v. a.* තාරාවාඅඬනවා

Quack, *s. doctor,* පාරවට්ටුවෙදා

Quadrangle, *s.* සිවුකොන්, හතරැස්

Quadrangular, *a.* සිවුකොන්වූ, හතරැස්වූ

Quadrate, *a.* සතරැස්සමානවූ

Quadrate, *v. n.* යෝග්‍යවෙනව, ගැලපෙනවා

Quadrilateral, *a.* සතරපැතිවූ

Quadruped, *s.* චතුස්පාද, සිවුපාවා

Quadruple, *a.* සතරවරක්වූ

Quaff, *v. a.* අත්‍යාපානයකරනවා, බොහෝබොනවා

Quagmire, *s.* හැලපත, ගැලෙ

Quail, *s.* විටුවෝවටුරන්

Quaint, *a.* අභිමානිනාරිත්වූ, අමුතුගතිවූ

Quaintly, *ad.* අභිමානිනාරිත්ලෙස, උඩඟුලෙස

Quake, *v. n.* හීම්, කම්පාවෙනවා, වෙව්ලනවා

Quake, *s.* කම්පාවීම, වෙව්ලම

Qualification, *s.* යෝග්‍යකම, දක්ෂකම, විභාගකම, සමත්තාකම

Qualify, *v. a. to make fit for any thing,* යෝග්‍යකරනවා; *to make clever,* දක්ෂකරනවා, විශාගකරනවා; *to give authority,* බලදෙනවා, සමර්ථකරනවා; *to moderate, to abate,* මධ්‍යස්ථවෙනවා, මැඩෙනවා, අඩුකරනවා

Quality, *s.* ස්වභාව, ගුණය, කමෙ, පදම, ශක්‍ය

Quality, *s.* උත්තමාධිපතියන්

Qualm, *s.* කලාන්තවීම

Qualmish, *a.* කලාන්තවූ

Quandary, *s.* අනුමානය, අමාරුව

Quantity, *s.* තරම, සිල්වාරම; *a large quantity of goods,* මහත් බඩුසිල්වාරමක්; *a small quan-*

tity, ප්‍රමාණය, එකත්, *how much in quantity*, කොයිතරම් කද

Quantum, *s.* තරම

Quarrel, *s.* විවාදය, කෝලාහලය, දබරය, සඩහුව

Quarrel, *v. n.* විවාදකරනවා, කෝලාහලකරනවා, දබරකරනවා, සඩහුකරනවා

Quarrelsome, *a.* විවාදවූ, කෝලාහලවූ, දබරවූ, සඩහුවූ

Quarry, *s.* ගල්වල, ගල්කපනතැන

Quarry, *v. n.* ගල්හාරනවා, ගල්ගොඩලනවා

Quartan, *s.* චතුර්ථජ්වරය, සතරදවසින්ගන්නාලන

Quarter, *s. the fourth part*, කාල හතරෙන්පංගුව; *region*, දිසාව; *temporary lodgings*, නවාතැන්ගෙය; *a quarter of an hour*, පැයකාල; *four quarters of the heavens*, අහසෙසතරදිසාව; *to give quarter*, කරුණාවදෙනවා, ක්ෂමාකරනවා; *to cry for quarter*, ක්ෂමාවප්‍රාර්ථනාකරනවා, කරුණාවඉල්ලනවා; *into all quarters*, සියළුදිසාවටම; *in these quarters*, මේදිසාවල්හි; *the quarters*, විශ්‍රාමසාලාව, නවාතැන්ගෙය

Quarter, *v. a. to take up a lodging, to reside*, නවාතැන්කරනවා, පදිංචිවෙනවා; *to divide into four parts*, හතරටබෙදනවා

Quarterdeck, *s.* නැවෙවැඩතට්ටුව

Quarterly, *ad.* කාලෙන්කාලට

Quash, *v. a.* මඩිනාශකරනවා, මිරිකනවා, මඩිනවා, නවතනවා

Quaternion, quaternary, *s.* සතර

Quaver, *v. n. to shake the voice when singing, or as the Priests when repeating the poetry in the Banna*, ලෙලවනවා; *to tremble, to vibrate*, කම්පාවෙනවා, ගැහෙනවා, වෙවුලනවා

Quay, *s.* පැමිණිලිගන්නාවෙදනා පාලම

Queen, *s.* රාජමහේසිකාව, බිසවුනාන්සේ

Queer, *a.* පුදුමවූ, සමච්චල්වූ

Quell, *v. a.* නලවනවා, නවතනවා

Queller, *s.* නලවන්නා, නවත්වන්නා

Quench, *v. a. as fire*, නිවනවා; *as thirst*, පිපාස සන්සිඳුවනවා; *as the passions*, නවත්වනවා

Querimonious, *a.* පැමිණිලිවූ

Querist, *s. questioner*, ප්‍රශ්නඅහනනා, ඇහුම්අහන්නා; *an examiner*, විභාගකරන්නා

Querulous, *a.* බරාබැරී

Query, *s.* ප්‍රශ්නඅසීම, ඇහුම්අසීම

Query, *v. a.* ප්‍රශ්නඅහනවා, ඇහුම්අහනවා

Quest, s. විභාගකිරීම, සෝදිසිකිරීම, සෙවීම

Question, s. ප්‍රශ්නය, ඇසීම; *to ask questions*, ප්‍රශ්නඅහනවා, වගඅහනවා; *the matter in question*, විභාගයෙහි සම්බන්ධ කාරණාව; *out of question*, සිදුවෙන්ඩබැරිවූ; *to call in question* අනුමානකරනවා; *to give up the question*, විවාදයනිමකරනවා

Question, v. n. ප්‍රශ්නකරනවා අහනවා, ඇදුමිඅහනවා, වගඅහනවා

Questionable, a. අනුමානවූ

Questionary, a. විභාගවෙන්නාවූ

Questioner, s. ප්‍රශ්නඅහන්නා, වගඅහන්නා, ඇහැමිඅහන්නා

Questionless, ad. අනුමානනැතිලෙස, සැබැලෙස

Quibble, v. n. වචනපෙරළනවා, *or* හරවනවා

Quibbler, s. වචනපෙරළන්නා, වචනහරවන්නා

Quick, s. *speedy*, ශීඝ්‍රවූ, ඉක්මන්වූ, සඩසරවූ, විගස්ගෙන්, *or* විගසට; *clever*, දක්ෂවූ, චමත්වූ, උගත්වූ, හපන්වූ; *living*, ජීවමානවූ, ප්‍රාණවත්වූ

Quicken, v. a. *to hasten*, සැඩිසර කරනවා, ඉක්මන්කරනවා; *to impart life*, ජීවත්කරනවා, ප්‍රාණයදෙනවා

Quickly, ad. සීඝ්‍රලෙස, දක්ෂලෙස, ඉක්මන්ලෙස, සාවසරලෙස

Quicksand, s. කසාරවැල්ල

Quickset, v. a. පැල වවනවා

Quicksighted, a. තීක්ෂණදෘෂ්ටි ඇත්තාවූ, සියුම්බැල්මඇත්තාවූ

Quicksilver, s. රසදිය

Quiescence, s. නිවාඩුව

Quiescent, a. නිවිගෙන, නිවාඩුව

Quiet, a. නිශ්ශබ්දවූ, නොසෙලවෙන්නාවූ

Quiet, s. නැවතීම, නිවාඩුවීම

Quiet, v. a. නලවනවා, ශෝකනවතනවා, නිශ්චලකරනවා, නැවත්වනවා; *to be quiet*, නිශ්චලවඉන්නවා, නිකම්ඉන්නවා, කථානොකරඉන්නවා

Quietly, ad. නිශ්චලලෙස, නිශ්ශබ්දලෙස, නිකම්ලෙස

Quietness, s. නිශ්චලභාවය, නිශ්ශබ්දභාවය, නිකන්බව

Quietude, s. නිශ්චලවීම, නිවාඩුවීම

Quill, s. පිහාටුව; පෑන; *Port.*

Quilt, s. ඇතිරිල්ල

Quinquangular, s. පස්කොන, පස්මුල්ල

Quinsy, s. ගලපුහාය

Quintessence, s. සුධම්මවූ, පස්ගුණයත්වූ

Quintuple, a. පස්වරක්

Quip, s. කපටිකම

Quire, s. *of paper,* කඩදාසිපොත; *of singers,* ගායනාකාරසමූහය

Quirk, s. කපටකම, ප්‍රයෝගය

Quit, v. a. අත්අරිනවා, නිදහස්කරනවා; *you are not quit yet,* තවම නිදහස්වූයේනැත, or ගැලවුණේනැත; *I quitted him just now,* දැන්තමයි ඇරලාආවෙ; *I shall be quit with you,* මම උඹෙන් පලිගන්නෙමි; *to quit one's ground,* පසුබටවෙනවා, පරාජයවෙනවා

Quite, ad. සම්පූර්ණ, මුළුමනින්ම, හොඳටම

Quittance, s. නිදහස්වීම, ලදුවට්ටුව

Quiver, s. ඊතලකූඩුව, හීදෙරේ, ඊත්කොපුව

Quiver, v. n. කම්පාවෙනවා, ගැහෙනවා, වෙව්ලනවා, සෙලවෙනවා

Quoit, s. පෙන්ද

Quoit, v. n. පෙන්දෙන්කෙලිනවා

Quorum, a. විනිස්චයකාරයා

Quota, s. කොටඨාසය, භාගය, පංගුව

Quotation, s. සංග්‍රහය, අන්‍යප්‍රබන්ධයකින්ගත්පදය

Quote, v. a. *as a writer,* සංග්‍රහකරනවා, අන්‍යප්‍රබන්ධයකින්ගත් පදයකියනවා; *as a speaker,* අනිකෙකුගේ ගෙනහැර කියනවා

Quotidian, a. දිනෙන්දින, දවස්පතා

R

Rabbet, v. a. කන්තුවලට හාරනවා

Rabbit, s. සාවජාතියක්, or රටහාවා

Rabble, s. සුළුජනයෝ, නීචජනය, බාලජනය

Rabid, a. රෞද්‍රවූ, රුද්‍රවූ

Race, s. *generation, family,* වංශය, ගෝත්‍රය, පරම්පරාව, වර්ගය; *particular breed or sort,* ජාතිය, වර්ගය; *course,* ධාවනය, දිවීම

Racer, s. ධාවනයකරන්නා, දුවන්නා

Rack, s. *instrument of torture,* තාඩනදෙනයන්ත්‍රය; *pain,* වේදනාව, රුජාව, රිදුම; *wooden grate,* මැස්ස

Rack, v. a. *to torture, to torment,* පීඩාකරනවා, වදකරනවා, වේදනාකරනවා; *to draw off liquor,* වාසනනවා

Racket, s. කෝෂාව, කෝෂ්ඨය, කෝලාහලය

Radiance, radiancy, s. ප්‍රභාවීම, ජ්වලිතවීම, තේජවන්තවීම, බැබලීම, දිලිසීම

Radiant, a. ප්‍රභාවූ, තේජවන්තවූ, බබලන්නාවූ, දිලිසෙන්නාවූ

Radiate, v. n. ප්‍රභාවෙනවා, ජ්වලිතවෙනවා, තේජවන්තවෙනවා, බබලනවා, දිලිසෙනවා

Radical, *a* මුල්දී, ආරම්භවූ

Radically, *ad.* මුල්දීලෙස, ආරම්භලෙස

To commend one to his face, ඔහු ඉදිරියේ පාරට්ටුකරනවා; *from door to door,* දොරින්දොරට, ගෙයින්ගෙයට; *from morning to evening,* උදයපටන්සවස්වෙනතුරු; *to the best of my power,* මට පුළුවන්පමණට; *you are a child to him,* තමුසේ ඔහුට බාලයා; *to that purpose,* ඒක නිසා *or* ඒනිසා; *as to that,* ඒ ගැන, තමුන්; *to my knowledge,* මම දන්නා පමණට *or* හැටියට; *to day,* අද *or* අද දවසේ; *to night,* අද රාත්‍රී; *to and fro',* මෙබඳ මොබ, එහෙ මෙහෙ; *wounded to death,* මරණ ගායලනා, මරණතුවාලලබා; *to excess,* අසීම, පමණ නොදැන

Toad, *s.* මැඩිවගේසතෙක්

Toadstool, *s.* හතුවිශේෂ

Toast, *v. a.* කරකරනවා; *the native servants generally say,* ටෝස්ට්කරනවා

Toast, *s.* කරකරපු පාන්කෑබෙල්ල

Toast, *s.* සෞඛ්‍යයබීම

Tobacco, *s.* දුන්කොළ

Tobacconist, *s.* දුන්කොළකාරයා

Tobacco-pipe, *s.* දුම්කෝප්ප; *to smoke tobacco,* දුම්බොනවා

Toe, *s.* පයේඇඟිල්ල

Together, *a.* සහ, සමග, කැටුව, එක්ව, එකට; *they went together,* ඔවුන් කැටුව ගියෝය; *to fight together,* හමගපොරල් කරගන්නවා; *to mix together,* එකට මිශ්‍රකරනවා; *to gather together,* රැස්කරනවා

Toil, *s.* උත්සාහය, වෙහෙස

Toil, *v. n.* උත්සාහකරනවා, ව්‍යායාමකරනවා, වෙහෙසවෙනවා

Toilsome, *a.* බොහෝඋත්සාහවූ, මහන්සිවූ, වෙහෙසවූ

Token, *s.* සිහිකරනලකුණ

Told, *pret.* වැදෑරුවා, කීවුවා, කතාකරකීවුවා, එළිදරවූකළා

Tolerable, *a. supportable,* උසුලඹ පුළුවන්වූ, ඉවසඩ පුළුවන් වූ, *midling,* මධ්‍යමතාමවූ

Tolerably, *ad.* උසුලඹපුළුවන් ලෙස, ඉවසඩපුළුවන්ලෙස, පමණක්ලෙස, මධ්‍යමතරම ලෙස; *that was tolerably cheap,* ඒක පමණක් ලාබට තිබු ණා; *this is tolerably good,* මේක මධ්‍යමතර මිහාඳය

Tolerance, *s.* ඉවසීම

Tolerate, *v. a.* සමුදෙනවා, අව සරදෙනවා

Toleration, *s.* සමුදීම, අවසරදීම

Toll, *s.* මගතොටකුලය

Toll, *v. n.* මගතොටකුලීගන්නා වා

Toll, *v. a.* සීනුවනට්ටුකරනවා

Tollgatherer, *s.* මගතොටකුලී ගන්නා

Tomb, *s.* සොහොන්ගල, මිනීව ල, සොහොන්ගැබ

Tombstone, *s.* සොහොන්ගල

Ton, *s.* රාත්තල්දෙදාහස් දෙසීය හතලිහක් බර

Tone, *s* ශබ්ද, නාද, නාද

Tong, *s.* ගැටපරදන; *Port.*

Tongs, *s.* අඬුව

Tongue, *s.* ජිව්හා, දිව; *a language,* භාෂාව, බස; *evil tongue,* නපුරුකටව; *to hold the tongue,* කටපියනවා; *I have the name at my tongue's end,* නාවමගේ දිවඅගම තිබෙනවා

Tongued, *a.* දිවුඅත්තාවූ: *double tongued,* දෙදිවුඅත්තාවූ: *a long tongued fellow,* බොහෝ කතාකරන්නා; *an ill tongued person,* නපුරුකතාකරන්නා

Tonnage, *s. the rate of,* බරඉසිල්ම: *custom duty,* උසුලනතාරමට ගෙවනතීරුව

Too, *ad. above, more than is necessary.* අධික, බොහෝ, බොහෝ සේ, ඉතා; *likewise,* ද, ත්; *too much,* ඉතාවැඩි; *too long,* බොහෝදිග; *you too ought to be there,* තමුසෙත් එයි සිටිඩ ඕනෑය; *wages and batta too,* කුලී සහ බතත්

Took, *pret.* ගත්තා, ලැබුණා

Tool, *s.* අවි, ආවුදය

Tooth, *s.* දතා, දත

Toothache, *s.* දත්කැක්කුම

Toothdrawer, *s.* දත්ගලවන්නා

Toothpick, toothpicker, *s.* දත්කූරුව

Top, *s.* මස්තකය, අග්ගිස, පිට, මුදුන; *the house top,* ගෙයිමස් තකය; *topfull,* සම්පූර්ණවූ

Top-mast, *s.* කුඹ්ම්දෙපාලල

Topaz, *s.* පුෂ්පරාග

Topgallant, *s.* කුඹ උඩපෙල

Topheavy, *a.* මුදුනබරවූ

Topmost, *a.* උඩඋස්වූ

Topsail, *s.* කුඹ මැදපාලමේ රුවල

Toper, *s.* බේබද්දා

Tophet, s. a vallely, ‡ජෙරුසලම්ළඟ මිටියාවතක්; hell, පාතාලය, නිරය, නරකාදිය

Topick, s. කාරණාව

Topographer, s. ‡ස්ථානවිස්තරකරන්නා

Topography, s. ‡ස්ථානවිස්තරකෙරීම

Topsyturvy, a. ‡හාලපහලට පිට පෙරළු

Torch, s. පන්දම, විලක්කුව; තෝච්චය; Eng.

Torchbearer, s. පන්දම් ගෙනියන්නා

Torchlight, s. පන්දම්එළිය

Tore, see the verb to tear.

Torment, v. a. වේදනාකරනවා, පීඩාකරනවා, කරදරකරනවා, කරච්චල්කරනවා

Torment, s. වේදනාකිරීම, පීඩාකිරීම, කරදරකිරීම, කරච්චල්කිරීම

Tormentor, s. වේදනාකරන්නා, පීඩාකරන්නා, කරදරකරන්නා, කරච්චල්කරන්නා

Torn, participle past of tear.

Tornado, s. චණ්ඩමාරුතය, සැඩපවන, තදකුණාටුව

Torpid, a. benumbed, හිරිවූ motionless, නිශ්චල; dull, inactive, අලසවූ, බරබැරිවූ

Torpor, s. හිරිගතිය

Torrent, s. වතුරපාර, දියවැල

Torrid, a. බොහෝසෙයින්ග්‍රීෂ්මවූ, සුස්කාවූ, වියළුණාවූ, දවන්නාවූ, කාලකාවූ

Tortoise, s. the sea, කැස්බා; the river, ‡ඉබ්බා

Tortuous, s. ඇද

Torture, s. පීඩාව, වේදනාව, රිදවීම

Torture, v. a. පීඩාකරනවා, වේදනාකරනවා, රිදවනවා

Torturer, s. පීඩාකරන්නා, වේදනාකරන්නා, රිදවන්නා

Toss, v. a. විසිකරනවා

Toss, s. විසිකිරීම

Total, s. මුළු or මුළුගණන

Totally, ad. මුළුමනින්මලෙස

Totter, v. n. වෙව්ලනවා

Touch, v. a. ඇදිනවා, තට්ටුකරනවා, ස්පර්ශකරනවා

Touch, s. ඇදීම, තට්ටුවීම

Touch-hole, s. කුඩ්ඩකුහර

Touching, a. ගැන; touching it, ඒකාගැන, ඒගැන

Touchstone, s. උරගල

Touchy, a. සුළුදෙයින්කිපෙන්නාවූ

Tough, a. හැඩිවූ, තදවූ, සවිවූ; tough meat, හැඩිවූමස්, සවිවූ මස්; a tough business, තදවැඩ; a tough constitution, තදගතිය, සවිගතිය

Tour, s. භ්‍රමණය, සංචාරය, ඇවිදීම

Tow, s. හණ

Tow, v. a. අදිනවා; to tow a ship, නැවක්අදිනවා

Toward, towards, ad. දිසාවට, දෙසට; toward the right hand, දකු

දිසාවට; *they sailed towards the north,* ඔවුන් උතුරුදෙසට රුවල්කෙළෝය; *it grows towards evening,* සැන්දෑවෙඩිකී වටු*වනවා; *towards the end of the month,* මාසේඅන්තිම ප මනට

Toward, towardly, *a.* කීකරුවූ, මවටවූ

Towel, *s.* අතුපිස්නාකඩ; තුවාලේ; *Port.*

Tower, *s.* කොත

Tower, *v. n.* නගිනවා, උඩනගිනවා; *to tower aloft,* උඩටනගිනවා

Town, *s.* නගර, නුවර

Toy, *s.* සෙල්ලම, සෙල්බඩු

Toy, *v. a.* නිරාවිකෙළෙදයකරනවා

Trace, *s.* අඩිපාර

Trace, *v. a.* අඩිපාරබලනවා

Track, *s.* අඩිපාර

Trackless, *a.* අඩිපාරනැතිවූ

Tract, *s. of land,* දේසය

Tractable, *a.* කීකරුවූ, නැමෙනනාවූ, සීලැවූ, මවටවූ

Trade, *s. commerce,* වෙළඳම; *a particular occupation,* වැඩය

Trade, *v. n.* ක්‍රයවික්‍රයකරනවා, වෙළඳම්කරනවා

Trader, tradesman, *s.* වෙළෙන්දා

Tradition, *s.* ප්‍රඥප්තිය, ව්‍යවහාරය, සිරිත

Traduce, *v. a.* දෝෂාරෝපනායකරනවා, වරදතබනවා

Traducer, *s.* දෝෂාරෝපනායකාරයා, වරදතබන්නා

Traduction, *s.* ඉපදවීම

Traffick, *s.* ක්‍රයවික්‍රයකෙරීම, වෙළඳම්කිරීම

Traffick, *v. a.* ක්‍රයවික්‍රයකරනවා, වෙළඳම්කරනවා

Tragedian, *s.* සොකීකය ලියන්නා, ක්‍රීඩාලියන්නා

Tragedy, *s.* සොකීයලිපිරී, ක්‍රීඩාකිරීම

Tragical, tragick, *a.* ලතවෙන්නාවූ, සෝකවූ

Trail, *v. a.* අදිනවා

Train, *v. a. to entice by artifice,* පොළඹවනවා; *to bring up,* ඇතිකරනවා, පුහුණුකරනවා; *to accustom to any thing, to discipline,* හාවිතාකරනවා, පුරුදුකරනවා; *to draw along,* අදිනවා

Train, *s.* පිරිවර; *a train of artillery,* කාලතුවක්කුස්වාපිරිවර

Trainoil, trainy-oil, *s.* මාළුතෙල්

Trait, *s.* පාර, ලකුණ

Traitor, *s.* ද්‍රෝහියා

Trammel, *s.* වලහුව

Trammel, *v. a.* වලහුව්මනවා

Trample, *v. a.* පඩිනවා, පාගනවා

Trance, *s.* මූර්ඡාව

Tranquil, *a.* නිස්චලවූ, නිවුනාවූ

Tranquillity, *s.* නිස්චලවීම, නිවීම

Transact, *v. a.* කරනවා *or* ක්‍රියා කරනවා

Transaction, *s.* කෙරීම

Transcend, *v. n.* ඉක්මවූහුවෙනවා

Transcendent, *a.* ඉතාඅනාගිසවූ

Transcribe, *v. a.* ලියනවා

Transcriber, *s.* ලියන්නා

Transcript, *s.* පිටපත; කොපිය; *E.*

Transfer, *v. a.* බාරදෙනවා; *to transfer the title of a house,* ගේක සාන්සිපත්‍රයක් බාරදෙනවා; *to transfer a lease,* බදුපත්‍රයක් පාවාදෙනවා

Transfer, *s.* බාරදීම, පාවාදීම

Transfiguration, *s.* වෙසදැරීවීම, අන්වෙස්දැරීම, වෙස්පෙරළීම

Transfigure, *v. n.* වෙසදැරීවෙනවා, වෙස්පෙරලනවා

Transfix, *v. a.* අනිනවා, අමුණනවා

Transform, *v. a. see to transfigure.*

Transformation, *s. see transfiguration.*

Transfuse, *v. a.* ඉගුරුවනවා

Transfusion, *s.* ඉගුරවීම

Transgress, *v. a. to offend, by violating a law,* අපරාධකරනවා; *to violate, to break as a law,* කඩකරනවා

Transgression, *s.* අපරාධකෙරීම

Transgressor, *s.* අපරාධකරන්නා

Transient, *s.* නොපැවතීන, අනිත්‍ය

Transit, *s.* යෑම

Transition, *s,* වෙනස්වීම, මාරුවීම

Transitory, *a.* අනිත්‍යවූ, නොපවතින්නාවූ

Translate, *v. a.* පිටපත්කරනවා

Translation, *s.* පිටපත්කෙරීම

Translator, *s.* පිටපත්කරන්නා

Transmigrate, *v. n. a passing from one place to another,* තැනින්තැනටයනවා; *to pass according to the doctrine of metempsychosis,* පුනර්භවයවෙනවා, ශරීරයකින් ශරීරයකට ආත්මයවෙනස්වියනවා

Transmigration, *s.* තැනින්තැනටයෑම, ආත්මයශරීරයෙන් ශරීරයටවෙනස්වීයාම

Transmission, *s.* ඇරීම, යැවීම

Transmit, *v. a.* එවනවා, අරිනවා, යවනවා

Transmutation, *s.* පරිවර්තිතවීම, වෙනස්වීම

Transmute, *v. a.* පරිවර්තිතකරනවා, වෙනස්කරනවා

Transparency, *s.* විනිවිදපෙනීම

Transparent, *a.* විනිවිදපෙනෙන්නාවූ

Transpire, *v. n.* ප්‍රසිද්ධවෙනවා, ප්‍රකාශවෙනවා

Transplant, *v. n.* නැවතඉඳුවනවා, දෙවනුවවනවා

Transplantation, *s.* නැවතඉඳුවීම, දෙවනුවැවීම

Transport, *v. a. to convey from one place to another,* ගෙනයනවා; *to banish as a felon,* රටනෙරනා

වා, රසවත්පිටදමනාවා or අදි
නාවා; *to put into an extacy*, ප්‍රීති
මත්කාරනාවා, සන්තෝසකා
රනාවා

Transpiration, *s.* රසමෙන්පිටදම
ම, රවනාගෑම

Transpose, *v. a.* තැනමාරුකර
නාවා

Transposition, *s.* තැනමාරුකර
රීම

Transubstantiate, *v. a.* ද්‍රව්‍යය
මාරුකරනාවා

Transude, *v. n.* උනනාවා, වෑහි
නාවා

Transverse, *a.* හරස්වූ

Transversely, *ad.* හරස්ලෙස

Trap, *s.* උගුල, කොටුව

Trap, *v. a.* උගුලෙන්අල්ලනාවා

Trappings, *s.* ආභරණ, අබරණ,
ආයිත්තම

Trash, *s.* අයිතිනැතිදෙය, අයිතු

Travail, *v. n.* විලිරුදාරිනාවා, පර
සරුකමවෙනාවා

Travail, *s.* විලිවේදනාව

Travel, *v. n.* ගමන්යනාවා

Travel, *s.* ගමන්යෑම

Traveller, *s.* ගමන්යන්නා

Traverse, *ad.* හරස්ලෙස

Traverse, *v. a.* *to cross, to go over*,
හරහටයනාවා; *to lay athwart*,
හරහට දමනාවා; *to wander
over*, භ්‍රමණයකරනාවා, සංචා
රනායකරනාවා, ඇවිදිනාවා

Tray, *s.* බන්දේසිය

Treacherous, *a.* ද්‍රෝහීවූ, අපක්ෂ
වාදිවූ, අවිස්වාසවූ

Treacherously, *ad.* ද්‍රෝහිලෙස, අ
පක්ෂවාදිලෙස, අවිශ්වාසලෙ
ස, රැවටිලිලෙස

Treachery, *s.* ද්‍රෝහිකම, අපක්ෂ
වාදිකම, අවිශ්වාසකම

Treacle, *s.* පැණි

Tread, *v. a.* පයින්තලනාවා, පය
වද්දනාවා

Treadle, *s. of a weavers loom*, උපන්
නැර; *the foot that turns the
carpenters throw*, පාවැටු

Treason, *s.* රාජද්‍රෝහිකම

Treasure, *s.* ධනය, ආදායන, ව
ස්තුව, සම්පත

Treasure, *v. n.* ධනයරැස්කරනා
වා, දිස්නුවච්චත්කරනාවා, ස
ම්පත්කැටිකරනාවා; *to trea-
sure up*, රැස්කරනාවා

Treasurer, *s.* භාණ්ඩාගාරිකයා

Treasury, *s.* භාණ්ඩාගාරය, මුදල්
බඩාව

Treat, *v. a.* ගිවිසුම්දෙනුස්නූක
රනාවා *or* ගිවිසිනාවා, සාක
ච්ඡාකරනාවා, උපස්ථානකර
නාවා, සංග්‍රහකරනාවා, *as may
be seen below*; *the envoys were em-
powered to treat for peace*, තානා
පතියෝ සමගිතාවවෙනාපිණි
සම කරනා බලය ලැබුවාහූ
ය; *the preacher treated the sub-
ject most ably*, දේශනාකාරයා
ඉතාසමර්ථලෙස ඒකාරනාව
ගැන සාකච්ඡාකළේය; *great
preparations were made to treat
the guests honourably*, ආගන්තු
කයින්ට නම්බුලෙස සංග්‍රහක

රජාැපිනිස බොහෝ කාලම ආකාරයෙන් තිබුණේය; *it is most ungenerous to treat strangers in such a manner,* අමුත්තෝට මෙ ආකාරකොරිමකරඩ ඉතාඅයුතුය

Treatment, *s.* කාරණාකොරිම: *see the verb*

Treaty, *s.* ගිවිසුම; *see the verb*

Treble, *a.* තුන්වරක්වූ, තුන්වැනිවූ

Treble, *v. a.* තුන්වරක්කරනවා, තුන්වැනිකරනවා, තුන්පටකරනවා

Tree, *s.* වෘක්ෂය, රුක, ගස; *fruit tree,* ඵලවෘක්ෂය

Trellis, *s.* කතුරු කතුරු කොටිම

Tremble, *v. n.* වෙව්ලනවා, ගැහෙනවා

Tremblingly, *ad.* වෙව්ලනලෙස, ගැහෙනලෙස

Tremendous, *a.* භයානකකාරක්නාවූ, බයකාරන්නාවූ

Tremour, *s.* වෙව්ලීම, ගැහීම

Tremulous, *a.* වෙව්ලන්නාවූ, ගැහෙන්නාවූ

Trench, *v. a.* හාරනවා *or* අගල හාරනවා

Trench, *s.* ඇල, අගල

Trencher, *s.* බත්දෙසිය

Trepan, *s.* තොඹුව, මලපුඩුව, උපාව

Trepan, *v. a.* උපායකරනවා, රැවටිලිකරනවා

Trespass, *v. n.* වරදකාරනවා *or* විරුද්ධකරනවා

Trespass, *s.* වරදකොරිම, වැරදිකොරිම

Tresses, *s.* කෙස්පෙලාපය, කොණ්ඩය

Triacle, *s.* ත්‍රියාකලෙ; *Port.*

Triad, *s.* ත්‍රිත්ව

Trial, *s.* විචාරිම, විභාගකොරිම, සෝදිසිකිරිම, පරීක්ෂාකිරිම; *he is ordered to take his trial before the court,* ඔහුට විචාරිම නඩුකාරයාසුදිරියට ගෙනම හුට අණවුණාය; *they underwent a long trial,* ඔවුන්ට දිගීවූ විභාගයක් ලැබුනාය; *the trial of metals by fire,* ගින්නෙන් ලෝහ සෝදිසිකිරිම; *the undertaking was a fair trial of our courage,* ඒකාරය කැපමට අපේ වසිවනකමගැන පුරාවූ ඔප්පුවක්වශයෙන්බුණේය; *the trial of one's faith,* යමෙකුගේ විශ්වාසය පරීක්ෂාකාරිම

Triangle, *s.* තුන්මුළු, තුන්කොන්, තුන්පටන්

Tribe, *s.* ගෝත්‍රය, වංශය

Tribulation, *s.* දුක්ඛිතවිම, දුක්විඳීම, පීඩාවිඳීම

Tribunal, *s.* විනිශ්චයආසනය, නඩුසාලාව

Tributary, *a.* පඬුරුදෙන්නාවූ

Tribute, *s.* පඬුරුම

Trick, *s.* උපාව, උපායය, ප්‍රයෝගය, වංචාව, රැවටිල්ල

Trick, *v. a.* උපායකරනවා උපාව කරනවා, ප්‍රයෝගකරනවා, වංචාකරනවා, රැවටිලිකරනවා

Tricker, *s.* තුවක්කුවේ කොකා

Trickle, *v. n.* වැගිරෙනවා, බින්දු බින්දු වැටෙනවා

Triennial, *a.* ත්‍රිවර්ෂිකවූ

Trier, *s.* විභාගකරන්නා, පරීක්ෂාකරන්නා

Trifle, *v. n.* *to talk foolishly or lightly,* නිස්ඵලකලඵලකථාකරනවා or නිරාර්ථකලඵලකදොඩවනවා; *to perform unimportant acts,* නිෂ්ඵලක්‍රියාකරනවා, නිරාර්ථකදෙය කරනවා; *to mock, to jeer,* සරදම්කරනවා, කවටකම්කරනවා

Trifle, *s.* සුළුදෙය, වැදගත්නොවූදෙය

Trifler, *s.* නිෂ්ඵලදේකරන්නා, වැදගත්නොවූදෙයකරන්නා

Trifling, *a.* නිස්ඵලකලඵලකථාකරන්නාවූ, නිරාර්ථකලඵලකදොඩවන්නාවූ, නිෂ්ඵලක්‍රියාකරන්නාවූ, සරදම්කරන්නාවූ, කවටකම්කරන්නාවූ; *see v.*

Trigger, *s.* තුවක්කුවේකොකා

Trim, *v. a.* පළඳිනවා, සෝභනවත්කරනවා; *to balance,* සමතුලිතකරනවා, සමබරකරනවා

Trinity, *s.* ත්‍රිත්ව

Trinket, *s.* *toys,* සෙල්ලම්බඩු, සෙල්ලම්බඩු; *ornaments,* ආභරණ

Trip, *v. a.* පැත්තාරුවෙනවා, වැටෙනවා; *to trip up one's heels,* පයින් පැත්තාරු කරනවා; *to trip up and down,* එහා මෙහා අවිදිනවා; *to trip along,* ඉක්මණින් යනවා; *to take a trip,* සුළුගමනක්යනවා

Trip, *s.* පැත්තාරුවීම, වැටීම; *a short journey,* සුළුගමන

Tripe, *s.* බොක්ක

Tripedal, *a.* ත්‍රිපාදවූ

Tripetalous, *a.* ත්‍රිපත්‍රවූ

Triple, *a.* තුන්වරවූ, තුන්පටවූ, තුන්ගුණවූ

Triple, *v. a.* තුන්වරකරනවා, තුන්ගුණකරනවා, තුන්පටකරනවා

Triplicate, *v. a.* තුන්වරක්කරනවා

Tripod, *s.* ත්‍රිපාදආසන

Trisection, *s.* තුනටබෙදීම

Trisyllable, *s.* ත්‍රිඅක්ෂරයෝග, එ අක්ෂරයෝගතුන

Trite, *a.* පරණවූ

Trivial, *a.* නිරාර්ථකවූ, වැදගත්නොවූ

Triumph, *s.* *victory,* ජයගැනීම; *the proclamation of victory,* ජයඝෝෂාව

Triumph, *v. a.* ජයගන්නවා or ජයඝෝෂාකරනවා; *see the noun*

Triumphant, *a.* ජයගත්තාවූ, ජයඝෝෂාකරන්නාවූ

Triune, *a.* ත්‍රිත්වකවූ

Trocar, *s.* විද්දනකටුවිශේෂයක්

Trod, trodden, *s.* *see to tread*

Troll, *v. n.* පෙරලෙනවා

Troop, *s.* යුධසමූහව *or* අසුවසේනාව

Troops, *s.* යුධසේනාව

Trooper, *s.* අසුවසේවකයා

Trope, *s.* රූපකාවිවනාය

Trophy, *s.* ජයගැනීමකොලලකත් දෙය

Tropical, *a.* මධ්‍යදේසයෙහිවූ

Tropick, *s.* *the sun's course is called by the singhalese astronomers,* අයන; *and when he arrives at what we call the tropick of cancer the singhalese term it,* උත්තරායනය; *and when he arrives at the tropick of capricorn, they term it,* දක්ෂිනායනය

Trot, *v. a.* සැලිසැලීයනවා, බලැගැල්මේයනවා

Troth, *s.* විශ්වාසය

Trouble, *v. a.* පීඩාකරනවා, පීඩාකරනවා, කනගාටුකරනවා, කරදරවල්කරනවා, බලත්කාරකරනවා

Trouble, *s.* පීඩාකිරීම, පීඩාකිරීම, කරදරකිරීම, කනගාටුකිරීම

Troublesome, troubleous, *a.* පීඩාසැවූ, අමාරුවූ, පීඩාවූ, කනගාටුවූ, කරදරවූ, බලත්කාරවූ, කරදරවල්වූ

Trough, *s.* කානමරුව

Trounce, *v. a.* තලනවා

Trouse, trousers, *s.* කලිසම; *Port.*

Trowel, *s.* කරණ්ඩිය

Truant, *s.* අලසයා, කම්මැලියා, වැඩටනොයන්නා

Truce, *s.* යුධනැවතුම

Truck, *v. n.* මාරුකරනවා

Trudge, *v. a.* පයින්යනවා

True, *a.* සත්‍යවූ, සැබෑවූ; *faithful,* පක්ෂපාතිවූ, විශ්වාසවූ; *exact,* නිත්‍යාතනවූ, හරිවූ

Truism, *s.* නිත්‍යසත්‍යය

Truly, *ad.* සත්‍යලෙස, සැබෑලෙස, හරිලෙස, නිත්‍යාත්මලෙස, නියමලෙස

Trump, *s.* හොරනෑව

Trumpery, *s.* කම්කටොලු

Trumpet, *s.* හොරනෑව

Trumpet, *v. n.* හොරනෑවපිඹිනවා

Trumpeter, *s.* හොරනෑකාරයා

Truncate, *v. n.* කපනවා, කොටකරනවා

Truncheon, *s.* අත්පොල්ල

Trundle, *v. a.* පෙරලනවා

Trunk, *s.* *a box,* පෙට්ටිය, පෙට්ටිය; *the proboscis of an elephant,* හොඬය, හොඬවැල; *the body of a tree,* කඳ, දඬු; *the body deprived of its limbs,* ගාත්‍රකඳ

Truss, *s.* පිටපත

Trust, *s.* විශ්වාසය, සහතිකය

Trust, *v. a.* විශ්වාසකරනවා, භාරකරනවා

Trustee, *s.* විශ්වාසයා

Trusty, *a.* [illegible], හොඳවූ, විස් වාස [illegible], [illegible]

Truth, *s.* සත්‍යතාව, සබැකම, [illegible], ප්‍රත්‍යක්‍ෂතාව, විස්වාසතාව; *a truth, in truth,* [illegible]; *see the adj.*

Try, *v. a. to examine as by experiment* විභාගකරනවා, සෝදිසිකරනවා, පරීක්‍ෂාකරනවා; *to get a knowledge of by experience,* දැනගන්නවා; *to examine as a judge,* [illegible], නඩුඅහනවා, නිශ්චයකරනවා; *to bring to a decision,* [illegible] [illegible], නිර්ණයකරනවා; *to attempt,* උත්සාහකරනවා, [illegible]කරනවා

Tub, *s* හාජනය; බාල්දිය; *P.*

Tube, *s.* නළ

Tubulated, tubulous, *a.* [illegible]වූ

Tuck, *v. a.* අකුලනවා

Tuesday, *s.* කුජදින, අඟහරුවාදා

Tuft, *s.* වල්ල, [illegible], පොකුර, කැටිය; *tuft of grass,* තණවල්ල, තණකොළකැටිය; *tuft of hair,* කොණ්ඩපොකුර; *the tuft on a birds head,* කුරුළු කුඩුම්බිය; *a tuft of trees,* ගස්කැටිය

Tug, *v. a.* අදිනවා

Tug, *v. n.* උත්සහකරනවා

Tuition, *s.* ඉගැන්වීම, පුහුණුකරවීම

Tumble, *v. n.* පෙරළෙනවා, පෙරළෙනවා, [illegible]වා; *to tumble over many books,* පොත් බොහොම පෙරලනවා; *to tumble the bed,* ඇඳ [illegible]කරනවා; *a ship's tumbling or rolling in rough water,* මුහුදේ රළකම්න් නැව පෙරලෙන්තාවවෙනවා

Tumid, *a.* [illegible]වූ, ඉදිමුනු, පුරා

Tumour, *s* [illegible]

Tumult, *s.* [illegible], කෝලාහල

Tumultuous, *a.* [illegible]වූ, කෝලාහලවූ

Tune, *s.* තාලය, [illegible]

Tune, *v. a.* [illegible]කරනවා, [illegible]කරනවා; *out of tune,* [illegible]; *in tune,* [illegible]; *to sing to another tune,* [illegible] [illegible] [illegible]වා

Tuneful, *a.* [illegible]වූ

Tunnel, *s. the passage for smoke,* දුම්කාවූ[illegible]; *a funnel,* [illegible]; *P.*

Tup, *s.* බැටළුවා

Turban, *s.* තලප්පාව

Turbid, *a.* මඩවූ, [illegible]වූ

Turbulence, turbulency, *s.* බලත්කාරකාරීම, [illegible]කාරීම, කෝලාහලකාරීම

Turbulent, *a.* බලත්කාරවූ, [illegible]වූ, කෝලාහලවූ

Turf, *s.* තණ or තණකොළ

Turgid, *a.* [illegible]වූ, ඉදිමුනාවූ

pompous, ආඩම්බරවූ, ආඩම්බරවූ

Turkey, s. තුර්කිකුකුළා

Turn, s. කරකැවීම, හැරීම, වෙනස්වීම, කරකැවීම, කෙළවර, ආකාරය, ස්වභාවය, වර; *a man of a different turn*, වෙනස්වූ ස්වභාවයක මනුෂ්‍යයෙක්; *to take a turn*, වරක්යන්නවා or ඇවිදින්නවා; *by turns*, වරින්වර; *now it is my turn*, දැන් මගේ වර ය; *at every turn*, හැමවිටම; *he gave the sentence a happy turn*, ඔහු ඒ වාක්‍යය හොඳ වැස්තකට පෙරළුවේය; *he did me a good turn*, ඔහු මට හොඳ කාරියක් කළා; *an ill turn*, නපුරු කාරියක්

Turn, v. c. කරකවනවා, පෙරළනවා, හරවනවා, පිටපෙරළනවා, වෙනස්කරනවා, පිටපත්කරනවා, තෝන්තුකරනවා, අකුලනවා, හරවනවා, මඟහරවනවා, මාරුකරනවා, පහකරනවා, පෙරළනවා; *he stands there to turn the wheel round*, රෝදේ කරකවන්ට ඔහු සිටිනවා; *turn the book upside down*, පොත අනිත් පැත්ත පෙරළනවා; *let the leaf be turned over*, කොළේ පෙරළේවා; *to turn a man from the error of his ways*, යමෙක් නපුරුමාර්ගයෙන් හර වනවා; *to turn a thing back*, යමක් ආපසු හරවනවා; *they will turn and rend you*, ඔවුන් ආපසු හැරී ඔබ ඉරාවී; *to turn a house into a stable*, ගෙයක් අශ්වාලයකට වෙනස්කරනවා; *to turn water into wine*, වතුර මිදිපැනට වෙනස්කරනවා; *turn this sentence into singhalese*, මේ වාක්‍යය සිංහල භාෂාවට පිටපත්කරනවා; *such things turn the head*, එබඳුදේවල් ඔලුව තෝන්තුකරනවාය; *never turn the leaves of your book*, කවදාවත් තමුසේගේ පොතේ කොළ නවන්ට එපා; *to turn up the curtain*, තිරය අකුලනවා; *this will turn the edge of the sword*, මෙයින් කඩුවේ මුවහත මොට්ටවේවි; *to turn goods into money, or money into goods*, බඩුවලට මිල මාරුකරනවා, නැත්නම් මිලට බඩු මාරුකරනවා; *to turn out of doors*, දොරෙන් පිටදමනවා; *to turn off a servant*, වැඩකාරයෙක් අහක්කරනවා; *the criminals were turned off the stage*, වරදකාරයෝ එල්ලා තබ්බ වේදිකාවෙන් පිටකළෝය

Turner, s. ලියවන්නා, ලියනවඩුවා

Turning, a. හරවන්නාවූ, කැරකවෙන්නාවූ

Turnkey, *s.* බන්ධනාගාරිකයා

Turpitude, *s.* දුශ්ශභාවය, නොපුරුශකම

Turret, *s.* පිල

Turtle, *s.* *sea-turtle,* කැස්බෑ

Turtle-dove, *s.* කොබෙයියා

Tush, *interj.* ච:, අ:

Tusk, *s.* දළය

Tutelage, *s.* ලහන්නොදුසථාව

Tutelar, tutelary, *a.* රක්ෂාකාරනොවූ

Tutor, *s.* ආචාර්ය්‍යයා, ගුරුනාන්සේ

Twain, *s.* දෙක; *in twain,* දෙකින්

Twang, *v. n.* ශරශබ්දපවත්වනවා

Twang, *s.* සැරශබ්දය

Tweezers, *s.* අඬුව

Twelfth, *a.* දොළොස්වෙනි

Twelve, *s.* ළ දස, දොළහයි

Twelve-month, *s.* දොළොස්මස

Twentieth, *s.* විසිවෙනි

Twenty, *s.* විස්සයි

Twice, *s.* දෙවර, දෙවට

Twig, *s.* රිකිල්ල, ශිරිය

Twilight, *s.* හිරිදිරිය

Twins, *s.* *two at the same birth,* නිවුල්ලු; *gemini,* මිථුනලග්නය

Twine, *v. a.* අඹරනවා, ඹිකනවා, පටලනවා

Twine, *s.* ලනුව

Twinge, *v. n.* වේදනාවෙනවා

Twinge, *s.* වේදනාව

Twink, *s.* ඉලොසිරිම, ඇසිපියහෙළීම

Twinkle, *v. a.* *to sparkle,* බබළනවා, දිලිසෙනවා; *to open and shut the eye by turns,* ඇසිපිය හෙළනවා; *in the twinkling of an eye,* ඇසිපියහෙළනකෙණෙහි *or* ඇසිපියහෙළීමකින්; *the twinkling stars,* බබළන්නාවූ තාරකාවල්

Twirl, *v. a.* කරකවනවා

Twist, *v. n.* ඹිකනවා, පටලනවා, අඹරනවා

Twist, *s.* අඹරීම, ඹිකීම

Twitch, *v. a* ඇඹුරුඇල්ලනවා, උදුරනවා

Twitch, *s.* ඇඹුරුඇල්ලීම; *a painful contraction of the fibers,* ඇඹිලිල්ල, අබස්සිය

Twitter, *v. n.* ගැස්සෙනවා

Twixt, *s.* මධ්‍යයෙහි, මැද

Two, *s.* දෙකයි

Twoedged, *a.* දෙමුවහත්වූ

Twofold, *s.* දෙබඩ, දෙපට, දෙවැන්න, දෙවර

Tye, *s.* *a knot,* ගැටෙ, බැඳීම; *an obligation,* නියමයෙන්බැඳීම, කෘතඥපකාරයෙන් බැඳීම

Tyger, *s.* ව්‍යාඝ්‍රයා; *see tiger.*

Tymbal, *s.* පිත්තලදවුල

Tympanum, *s.* සෝත්‍රෙන්ද්‍රිය

Type, *s.* *a printing letter,* අච්චු අකුරු; *an emblem,* ආදුසය

Typical, *a.* ආදර්ශපෙන්වන්නාවූ

Typically, *ad.* ආදර්ශපෙන්වනලෙස

Typify, *v. n.* ආදර්ශයපෙන්වනවා

Typographer, *s.* අච්චුගහන්නා

Tyranise, *v. a.* බලත්කාරයෙන් ආඬුකාරකරනවා

Tyranny, *s.* රෞද්‍රලෙස ආඬුකෙරීම, බලත්කාරයෙන් ආඬු කෙරීම

Tyrant, *s.* රෞද්‍රආඥාකාරයා, නපුරුආඬුකාරයා, බලත් කාරආඬුකාරයා

V

Vacancy, *s.* *empty, space,* හිඩස, හිඩෑර, හිස්බව; *an employment unsupplied,* නිදහස; අබෑකීතුව; *P. leasure,* නිස්කාලන්තය, නිවාඩුව; *emptiness of thought,* නිස්හැලෑකම, මනකානැතිකම, සිහිනැතිකම

Vacant, *a.* හිඩවූ, හිස්වූ, හිඩසි බෙන්නාවූ, නිදහස්වූ, නිස්කාලන්තවූ, නිවාඩුවූ, අබෑකීතුවූ, සිත්සැලැලෑවූ, මනකානැතිවූ, සිහිනැතිවූ; *see the noun*

Vacate, *v. a.* හිස්කරනවා, නිදහස්කරනවා, අත්අරිනවා

Vacation, *s.* නිවාඩුව

Vacination, *s.* උඩුරා එලදවීම

Vacillancy, *s.* අනැස්ථිරවීම, චලවීම

Vacillation, *s.* වැනීම

Vacuation, *s.* හිස්කෙරීම, නිදහස්කෙරීම

Vacuity, *s.* ශූන්‍යතාකම, හිස්කම

Vacuum, *s.* ශූන්‍යබව, හිස්බව

Vagabond, *s.* සචාරිකයා, අවලමා, පැදඩා

Vagrant, *s.* සචාරිකයා, අවලමා, පැදඩා

Vague, *a.* ශංකාවූ, අනුමානවූ

Vail, *s.* තිරේ, මූහුනුවැස්ම

Vail, *v. a.* තිරෙන්වහනවා *or* වහනවා

Vain, *a.* නිරාඵල, ආඩම්බර, නිෂ්ඵල, අවැඩ; *in vain,* නිරාඵලකමෙන්, නිස්ඵලයෙන්

Vainglorious, *a.* අහංකාරවූ, ආඩම්බරවූ, උඩඟුවූ

Vainly, *ad.* නිරාඵලකලෙස, නිස්ඵලහැටියේ, අවැඩලෙස

Vale, *s.* නිම්නස්ථානය, පාතාලය

Valediction, *s.* සුභාසිබවෙවයි කීම, ආයුබෝවන්කීම

Valet, *s.* මෙහෙකාරයා

Valiant, *a.* වික්‍රමවූ, විරසිවූ, ධෛර්‍යවූ, සවිඅැතිවූ, ශක්තිඇතිවූ

Valiantly, *ad.* වික්‍රමලෙස, වීරයෙලෙස, ධෛර්‍යලෙස, සවිලෙස, දක්ෂලෙස, ශක්තිලෙස

Valid, *a.* බලඇතිවූ, වටිනාවූ

Validity, *s.* බලඇතිකම, වටිනාකම

Valley, *s.* නිම්නස්ථානය, මිටිතැන

Valour, *s.* වික්‍රම, දක්ෂ

Valuable, *a.* අනාගිසවූ, අගේවූ, වටිනා වූ

Valuation, *s.* අගයකිරීම

Value, *s.* අගය, වටිනාකම

Value, *v. a. to appraise.* මිලකර නවා, අගයතබනවා; *to esteem highly,* අනාඝයකොට සිතනවා, වටිනාලෙසකල්පනාකර නවා; *the house and garden were valued at 5000 Dollars,* ගෙයත් වත්තත් පනාස පන්දාහට මිලවුනාය; *we should be careful how we value the goods of others,* වෙනඅයගේ බඩුවලට අගය තබන්නේ කොයිආකාරදැයි අපි ප්‍රවිසම්වෙන්ඩඕනෑය; *I highly value his friendship,* ඔහුගේ මිත්‍රකම මමඉතා අනාඝ ලෙස සිතනවාය

Valve, *s.* විවරය, ඇරීම

Van, *s.* සේනාවගේ ඉදිරිපිට පහව

Vane, *s.* කුළුන්කොඩිය

Vanguard, *s.* ඉදිරිපිට මුරකාරයා

Vanish, *v. n.* අන්තර්ධානවෙනවා, නොපෙනීයනවා

Vanity, *s. ostentation,* ඩාම්භිර, ආඩම්බර; *fruitlessness,* ව්‍යර්ථකකම, නිෂ්ඵලකම

Vanquish, *v. a.* ජයගන්නවා, දිනනවා

Vanquisher, *s.* ජයගන්නා, දිනන්නා

Vapid, *a.* නිර්ජීවවූ, ඕජසනැතිවූ

Vaporous, *a.* මීදුම්වූ

Vapour, *s.* මීදුම

Variable, *a.* අනිස්ථිරවූ, අචිරවූ, වෙනස්වෙන්නාවූ

Variably, *ad.* අනිස්ථිරලෙස, අචිරලෙස, වෙනස්වෙනලෙස

Variance, *s.* විරුද්ධය, විවාදය

Variation, *s. change, mutation,* අනිස්ථිරවීම; *difference,* වෙනස්වීම; *in grammar the change of the termination of nouns.* වරනැගීම

Variegate, *v. a.* නානාවර්ණකරනවා, නොයෙක්පාටකර නවා

Variegation, *s.* නානාවර්ණකිරීම, නොයෙක්පාටකිරීම

Variety, *s. a difference in things,* විශේෂය, වෙනස; *various,* නානාප්‍රකාර, නොයෙක්; *this is only a variety of the same species,* මේක එමවර්ගයෙහි විශේෂයක් පමණය; *man loves variety,* මනුෂ්‍යයෝ වෙනසට සතුටුකරන්නෝය; *he used a variety of means to accomplish his wishes,* ඔහුගේ මනාපය පූර්ණකරගන්ට නොයෙක් අන්දන්වල ක්‍රියාකළේය

Various, *a.* නොයෙක්, නානාප්‍රකාරවූ

Varnish, *s.* වලිච්චිය

Varnish, *v. a.* වලිච්චිගානවා

Vary, *v. a.* අන්‍යප්‍රකාරකරනවා, වෙනස්කරනවා, මාරුවෙනවා; *to vary one's sentiments*

according to the times, කාලපරිඡේදයෙම්කෑගේ කාලපනාවන් වෙනස්කරනවා

Vary, *v. n.* අන්ප්‍රකාර වෙනවා වෙනස්වෙනවා, මාරුවෙනවා; *to vary from rule*, විධියෙන් වෙනස්වෙනවා; *a varies from the appearence it had when I first saw it*, ඒක පලමුවෙන් මම දුටුහැටියෙන් අන් ප්‍රකාරවතිබෙනවා; *the wind varies*, සුලහමාරුවෙනවා

Vase, *s.* භාජනය

Vas:al, *s.* යටත්කාරයා

Vassallage, *s.* යටහත්භාවය

Vast, *a.* විසාල, මහත්, ලොකු

Vastly, *ad.* අතිශලෙස, ඉතාලෙස, මහත්ලෙස

Vat, *s.* භාජනය

Vault, *s. a cavern*, ගුහාව, වල, ගලෙනා; *a repository for the dead*, සොහොන්පල *or* සොහොන්ගෙය

Vault, *v. n.* පනිනවා

Vaulted, *a.* වකාටුවූ

Vaunt, *v. a.* පාරම්බුකරගන්නවා

Vaunt, *s.* පාරම්බුකරගැනීම

Udder, *s.* බුරුලු

Veal, *s.* වැසුමාංශ

Veer, *v. n.* හැරෙනවා, කැරකෙනවා

Vegetable, *s.* සාකා, පලවුළු

Vegetate, *v. n.* ලියලනවා, වැවෙනවා

Vegetation, *s.* ලියලීම, වැවීම

Vehemence, vehemency, *a.* බලත්කාරය, වේගය, තදය, අතිසයය

Vehement, *a.* බලත්කාරවූ, වේගැවූ, තදවූ, අතිසයින්වූ; *vehement desire*, තදආසාව

Vehemently, *ad.* බලත්කාරලෙස, වේගලෙස, තදලෙස, අතිසයින්ලෙස; *the preacher spoke most vehemently against the vices of the age*, දේසනාකාරයා පස්වාවෙනි නාපුරුකමටවිරුඬව ඉතාබලත්කාරලෙස කථාකලේය; *the stream beat vehemently against that house*, දියපාර ඉතාතදආකාරයෙන් ඒගෙට ගැහුනේය; *they stood and vehemently accused him*, ඔවුන්සිට ඔහුට අතිසයින් බලත්කාරලෙසවරදහැබුවෝය

Vehicle, *s.* වාහන

Veil, *v. a. to cover*, වහනවා; *to hide*, සඟනවා; *to cover with the veil*, මුනාවැස්මදමනවා

Veil, *s.* මුහුනාවැස්ම, තිරය

Vein, *s.* නාහර

Vellum, *s.* හමපත්‍රය

Velocity, *s.* සීඝ්‍රය, ශරන්යෑම

Velvet, *s.* විල්ලුද; *Port.*

Venal, *a.* ක්‍රයවික්‍රයකලහැකිවූ

Vend, *v. a.* ක්‍රයකරනවා, විකුනනවා

Vender, *s.* ක්‍රයවික්‍රයකරන්නා, විකුනන්නා

Venemous, *a.* විසවූ

Venerable, *a.* ආදරණීයවූ, පූජනීයවූ, ගෞරවනීයවූ

Venerate, *v. a.* ආදරනීයවෙනවා, පූජනීයවෙනවා, නැමිදෙනවා, ගරුකරනවා

Veneration, *s.* ආදරණීයවීම, පූජනීයවීම, ගෞරවවීම

Venereal, *a.* උෂ්ණාකරෝගවූ, වනාකරෝගවූ

Venery, *s.* සන්වාසය

Vengeance, *s.* ප්‍රතිවිලගැනීම, එදිරිපිරිමැස්ම, වෛරකිරීම

Vengeance, *s. punishment,* දඬුවම්කිරීම, අවදුදීම; *penal retribution,* ප්‍රතිවිලගැනීම, එදිරිපිරිමැස්ම; *avengement,* වෛරකිරීම

Veniable, venial, *a.* ක්ෂමාවෙන්ඩ සුදුසුවන්වූ

Venison, *s.* මුවමස්

Venom, *s.* විස, වස

Venomous, *a.* විසවූ

Vent, *s.* ගුහා, සිදුර, හිල

Vent, *v. a.* වාසයනවා, පිටඅරවනවා, අරිනවා, එළියටඅරිනවා; *to give vent to one's feelings,* යම්මෙතකෙග් මෝහයකුඩඅරවනවා; *to give the liquor vent,* බිමජනී වාසයනවා; *to take vent,* එළියටඅරවනවා

Ventilate, *v. a.* පවන්ගහනවා

Ventilation, *s.* පවන්ගැසීම

Ventilator, *s.* පවන්ගහන්නා

Ventricle, *s.* බොක්ක

Venture, *v. n.* විශ්‍රානකවෙනවා, උපද්‍රව නොසලකනවා; *to venture out to sea,* උපද්‍රවකොනා සලකා සමුද්‍රයට යනවා; *he ventured all his property in that ship,* ඔහුගේ සියලු වස්තුව හානියකින් ඒ නැවට බාරදුන්නේය; *if you will go I will venture also,* නුඹත් යනොත් මමත් හානියනොවෙ යනවා; *at a venture,* විශ්‍රානව ක්‍රියාවෙන්ම, අනුමානව කිරීමෙන්ම

Venturous, *a.* විශ්‍රානකවූ, උපද්‍රව පමුනුවන්නාවූ, ආපදාව නොසලකා ක්‍රියාකරන්නාවූ

Venus, *s. the planet,* සුක්‍ර, සිකුරා

Veracity, *s.* ඒකාකාරය, සත්‍යය, සැබෑව

Verb, *s.* ක්‍රියාවචන or ක්‍රියාපද; *a verb active,* කර්තෘවාච්‍ය; *a verb passive,* කර්මවාච්‍ය; *a verb neuter,* අකර්මක ක්‍රියාව

Verbal, *a.* වාච්‍යවූ, වාක්‍යවූ, වචනවූ; *verbal noun,* ක්‍රියාවිශේෂනාමය; *a verbal translation,* වචනයෙන් වචනයට පිටපත් කිරීම; *a verbal message,* වචනයෙන්පණිවිඩය

Verbally, *ad.* වාක්‍යයෙන් or වචනයෙන්

Verbatim, *s.* වචනයෙන්වචනයට

Verberate, *v. n.* තද්දරනවා

Verbose, *a.* බහුභාෂ, බහුවාක්‍යවූ, වචනවලින් පිරුණාවූ

Verdant, s. නිල්වන්නේ, අමුපාට

Verdict, s. නින්දුව, කඩුතන්දුව, නඩුතීන්දුව

Verdigris, s. එනිකලමල

Verdure, s. පලාවන්නේ

Verge, s. කිරය, කෙර, කාට, අහ බඩ, අඥ

Verge, v. n. ඊරයට ඇවෙනවා, කෙරට ළංවෙනවා, අඥට ළංවෙනවා

Verify, v. a. සත්තකකරනවා, සැබෑකරකියනවා

Verily, ad. ඒකාන්තයෙන්ම, සැබවින්ම

Verity, s. සත්‍යභාවය, සැබෑක ම

Vermifuge, s. කුමිබෙහෙත්

Vermil, vermilion, s. සිංහල, සාදිලිංගන්

Vermine, s. කීටාදිසතුන්

Vermiparous, a. පනුපදවන්නාවූ

Vernacular, a. ස්වදේශවූ, ජන්මරටවූ

Vernal season, a. වසන්තකාලවූ

Versatileness, versatility, s. වෙනස්වීම, පෙරළීම, කරකැවීම

Verse, s. පද; *a piece of poetry*, පෙළකවිය, ගාථාව; *to be versed*, සමත්වෙනවා; *he is versed in arithmetic*, ඔහු ගණිත ශාස්ත්‍රයෙහි සමත්වෙනවා

Versification, s. පෙළකාපදබැඳීම

Versify, v. n. පෙළකවිකරනවා, පදබඳිනවා

Version, s. පිටපත්කිරීම

Vertex, s. මුදුන

Vertical, a. මුදුනේවූ

Vertigo, s. කරකැවිල්ල

Very, a. නියමවූ, සැබෑවූ, බොහොම; *these very people*, මේ මනුෂ්‍යයෝ; *against his very friend*, ඔහුගේ හිතවත්තාට විරුද්ධව; *a very desolation*, සම්පූර්ණ නාස්තිකිරීම; *very little*, ඉතා ස්වල්ප; *very well*, ඉතා හොඳයි; *very lately*, මෑතක; *the very same day*, ඒ කියන දවස

Vessel, s. පාත්‍රය, බාජනය; *a ship*, නැව; *blood vessels*, ලේනහර

Vest, s. වස්ත්‍රය, ඇඳුම

Vest, v. a. වස්ත්‍රඅඳිනවා, ඇඳුම අඳිනවා

Vestige, s. අඩිපාර or ලකුණ

Vestment, s. වස්ත්‍රය, ඇඳුම

Vesture, s. වස්ත්‍රය, ඇඳුම

Veteran, s. මහළුසේවකයා

Vex, v. a. හිංසාකරනවා, කරදරකරනවා, පීඩාකරනවා, කෝපවූකරනවා, හිරිහැරකරනවා

Vexation, s. හිංසාකිරීම, පීඩාකිරීම, කරදරකිරීම, හිරිහැරකිරීම

Vexatious, a. හිංසාවූ, පීඩාවූ, කරදරවූ, හිරිහැරවූ, කෝපවූ

Ugly, a. අපිරිවූ, විරූපවූ, අවලක්ෂණවූ

Vial, *s.* කුප්පිය

Viand, *s.* අහාර, භෝජන

Vibrate, *v. n.* දෙදරනවා

Vibration, *s.* දෙදරීම

Vicar, *s.* උත්තුංව කෙනෙකුවෙනුවට ඉන්නියා

Vicarious, *a.* වෙනුවටවූ

Vice, *s.* දුසාස, දුෂ්ට, අපරාධ, නාරක, නාපුර, විරුද්ධ; *a kind of small iron press*, දඬුඅඩුව; *when this word means one who is second in order* දෙවෙනි; *as Vice Treasurer*, දෙවෙනි භාණ්ඩාගාරයා *or as Vice President*, අනුනායකයා; *but when in composition it signifies serving instead of another it is*, වෙනුව; *as Vice Roy*, රජවෙනුවේ නායකයා

Vicegerent, *s.* දෙවෙනියා

Vicinity, *s.* අහල, අසල

Vicious, *a.* දුසාසවූ, දොසවූ, නරක්වූ, නපුරුවූ

Vicissitude, *s.* පරිවර්තන, මාරුවීම, හැරවීම, වෙනස්වීම

Victim, *s.* බිල්ල

Victor, *s.* ජයගන්නා

Victorious, *a.* ජයගත්තාවූ

Victory, *s.* ජයගැනීම

Victual, victuals, *s.* ආහාර, භෝජන, කෑම

Victual, *v. a.* ආහාරදෙනවා, භොජුන්දෙනවා, කෑමදෙනවා

Videlecet, එනම්

Vie, *v. n.* වාදකරනවා, අපෙරාකරනවා

View, *v. a.* දර්ශනයකරනවා, බලනවා, දකිනවා

View, *s.* දර්ශනයවීම, දෘෂ්ටවීම, දැකීම, බැලීම; *intention or design*, අදහස, කල්පනාව; *at first view*, ප්‍රථමදැක්මෙ; *to be in view*, දර්ශනයවෙනවා, පෙනෙනවා; *to keep a thing continually in view*, යමක් නිතරම කල්පනාවෙහි තබාගන්නනවා; *if such are their views*, ඔවුන්ගේ කල්පනාව එසේ වෙනොත්; *I had no other end in view*, මගේ අදහසෙහි වෙන දෙයක් තිබුණේ නැත

Vigilant, *a. circumspect*, ප්‍රවේසම්; *diligent*, උත්සාහය, කඩිසරකම

Vigorous, *a.* ශක්තිවූ, වීර්යවූ, බලවත්වූ; *it will require the most vigorous efforts to complete this work*, මේ වැඩේ නිමවීම සඳහා බලවත්තාවූ උත්සාහයක් ඕනෑවේය; *such things are easy to minds so vigorous*, මේ බඳු වීර්යවන්තයින්ට මෙඅකාරදෙය පහසුව තිබෙන්නේය; *his vigorous body will endure any thing*, ඔහුගේ ශක්තිවූ ශරීරය කිසිවක් නමුත් දරනවා ඇත

Vigour, *s.* ශක්තිය, වීර්යය, බලේ, සමර්ථකම, සවිය

Vile, *a.* නීචවූ, ජඩවූ, අඩුතරම්වූ

Vilely, *ad.* නීචලෙස, ජඩලෙස, අඩුකරම්ලෙස

Vilify, *v. a.* *to debase,* පහත්කරනවා, අඩුකරම්කරනවා, නීචකරනවා; *to defame,* නිගුහකරනවා, නින්දාකරනවා

Villa, *s.* විශ්‍රාමගෘහය

Village, *s.* ගම

Villager, *v. a.* ගම්වැසියා

Villain, *s.* නපුරා, චණ්ඩාලයා, ජඩයා

Villanous, *a.* නීචවූ, ජඩවූ

Villanousness, villany, *s.* දුෂ්ටකම, ජඩකම, නරක්කම, නීචකම, නපුරුකම

Vincible, *a.* ජයගතහැකිවූ

Vindicate, *v. a.* *to justify, to free from the imputation of guilt,* නොදෝසකරනවා, නිරපරාධකරනවා, නිවරැදිකරනවා, නිදොස්කරනවා; *to assert, to claim,* අයකරනවා, නියමයකන්නවා; *to avenge,* ප්‍රතිඵලදෙනවා, එකට එකකරනවා

Vindication, *s.* නිදෝසකිරීම, නිරපරාධකිරීම, නිවරැදිකිරීම, නිදොස්කිරීම, අයකිරීම, නියමකිරීම, ප්‍රතිඵලදීම, එකටඑකකිරීම

Vindicator, *s.* නිවරැදිකියන්නා

Vindictive, *a.* ප්‍රතිඵලදෙන්නාවූ, එකටඑකකරන්නාවූ

Vine, *s.* මුද්‍රිකාලතාව *or* මුද්‍රිකාවැල

Vinegar, *s.* කාඩි; විනාකිරි; *P.*

Vineyard, *s.* මිදිවත්ත

Vintage, *s.* මුද්‍රිකාඵලනෙලනකාලය

Viol, *s.* වීනාව

Violable, *a.* නොකටයුතුකම්කාලහැකිවූ

Violate, *v. a.* *to injure, to hurt,* අඩන්තේත්තන්කරනවා; *to break as an oath,* කඩකරනවා, බිඳිනවා; *to infringe upon,* නොකටයුතුකම් කරනවා; *to ravish,* තන්හිස්නාඩුකරනවා

Violation, *s.* අඩන්තේත්තන්කිරීම, කඩකිරීම, බිදීම, නොකටයුතුකම්කිරීම, තන්හිස්නාඩුකිරීම; *see the verb*

Violator, *s.* අඩන්තේත්තන්කාරන්නා, කඩකරනා, බිඳින්නා, නොකටයුතුකම්කරන්නා, තන්හිස්නාඩුකරන්නා

Violence, *s.* බලාත්කාරකිරීම

Violent, *a.* බලාත්කාරවූ; *to lay violent hands on one's self,* යමෙක් තමනිය ප්‍රාණය නසාගන්නවා

Violently, *ad.* බලාත්කාරලෙස

Violin, *s.* වීනාව; රවුකිංඤෝ; *P.*

Viper, *s.* පොලඟා

Virgin, *s.* කන්‍යාභාවව, කන්‍යාව; *the sign in the zodiac,* කන්නිරාශිය

Virginity, *s.* කන්‍යාභාවය

Virgo, *s.* *in the zodiac,* කන්‍යාරාශිය

Virility, *s.* මිනිසභාවය

Virtual, *a.* ගුණවත්වූ

Virtually, *ad.* ගුණවත්ලෙස

Virtue, *s. moral goodness,* සත්පුරුෂකම, සුචරිතකම, හොඳක්‍රියාව; *medicinal efficacy,* ගුණය, බලය; *efficacy in general,* ආනුභාවය, අනුහස

Virtnous, *a.* ගුණවත්වූ, සත්පුරුෂවූ, යහපත්වූ

Virtnously, *ad.* සත්පුරුෂලෙස, ගුණවත්ලෙස

Virulent, *a. poisonous,* විසවූ; *malignant,* ක්‍රෝධවූ, වෛරවූ

Visage, *s.* මුහුණ

Visceral, *s.* බඩවැල

Viscid, *a.* බදම්වූ

Viscous, *a.* බදම්වූ, ඇලෙන්නාවූ

Visibility, *s.* දෘශ්‍යමානවීම, පෙනුම්වීම

Visible, *a.* දෘශ්‍යමානවූ, දර්ශනීයවූ, පෙනෙන්ඩපුළුවන්වූ, දකින්ඩපුළුවන්වූ, පැහැදිලිවූ

Visibly, *ad.* දෘශ්‍යමානලෙස, දර්ශනීයලෙස, පෙනෙන්ඩපුළුවන් ලෙස, දකින්ඩපුළුවන් ලෙස, පැහැදිලිලෙස

Vision, *s. the act or power of seeing,* දෘෂ්ටිය, දර්ශනය, බැලීම, දැකීම; *a supernatural appearance,* පිසාච, භූත, ප්‍රේත, හැවැකීම; *a dream,* ස්වප්නය

Visionary, *a.* දර්ශනීයවූ, දෘශ්‍යමානවූ; *immaginary,* අනුමානවූ, සිත්ගෙනවූ, හැකාවූ

Visionary, *s.* සිත්විකල්ලයා, කාලබිසාලයා

Visit, *v. a. to go to see,* දකින්ඩයනවා, බලන්ඩයනවා; *to send judicially,* විචාරනවා, සොයනවා; සෝදිසිකරනවා; *there is a difficulty in giving this sense of the word in Singhalese, the following are the best renderings that could be given in the translcting room; and Joseph said unto his bretheren I shall surely die, and God will surely visit you and bring you out of this land,* යෝසෙප් තමන්ගේ සහෝදරයන්ට කියනුයේ මම නසිමිදෙවියන්වහන්සේ වනාහි සැබවින්ම මේ දේසයෙන් තොප ගෙනයනසේකැයි කීයේය; *nevertheless in the day when I visit, I will visit their sin upon them,* එසේදවුවත් යම්දවසෙක්හි මම විචාරනෙපමිද එදවසෙහි ඔවුන් ගේපාපයට ඔවුන්ට ප්‍රතිඵලදෙනෙමියි වදාලසේක; *if these men be visited after the visitation of all men,* මේමනුෂ්‍යයෝ සියළු මිනිසුන්ගේ දඬුවම්පරිද්දෙන් දඬුවම්කාරහු ලබන්නාහු නම්; *and the Lord visited Sarah as he had said,* යෙහෝවාවහන්සේ වනාහි තමන්වහන්සේ කීපරිද්දෙන් සාරාබැලූසේක

Visit, *v. n.* උපස්ථානකරනවා, මඟුලකරනවා

Visitation, *s.* සෝදිසිකරීම, දඬුවම්කරීම; *see the verb*

Visiter, *s.* ආගන්තුකයා

Visor, *s.* වෙස්මුණ

Vital, *a. contributing to life,* ජීවිතය දෙන්නාවූ; *essential,* නිනොවූ, වැදගත්වූ

Vitiate, *v. a.* දූෂ්‍යකරනවා, නරක්කරනවා

Vitious, *a.* දුෂ්ටවූ, දූෂ්‍යවූ, නරක්වූ

Vitriol, *s.* තුත්ත, තුත්තන්

Vivacity, *s.* ප්‍රාණවත්තකම

Vive, vivid, *a.* එලිතවූ, දිලිසෙනනාවූ, කාන්තිවූ; *the lightning was vivid,* දිලිසුනාවූ විදුලිය; *he possesses a vivid imagination,* ඔහුට එලිතවූ සිතක් ඇත්තේය; *a vivid colour,* කාන්තිවූ වර්ණය

Vivify, *v. a.* ජීවත්කරනවා, ප්‍රාණවත්කරනවා

Viviparous, *a. is termed,* ජලාබුජ; *oviparous,* අඩජ

Vixen, *s.* පිටලදේනුව, නරිදෙන; *one possessing a peevish disposition,* කෑකෑකයා, ලඳුසිත්ඇත්තා

Ulcer, *s.* අරම්නාවණ, තදවනෝ

Ulcerate, *v. n.* අරම්නාවනාවෙනවා

Ultimate, *a.* කෙලවරවූ, අන්තිමවූ, නිමවූ

Ultimately, *ad.* කෙලවරලෙස, අන්තිම්ලෙස, නිම්ලෙස

Umbilical, *a.* පෙකණියටඅයිතිවූ

Umbles, *s.* මුවබඩවැල්

Umbrage, *s. a shade, a skreen,* ජාව, හෙවනැල්ල; *resentment, offence,* රොස, වෛරය, අමුනුගුණය

Umbrella, umbrel, *s.* ජත්‍ර, කුඩය

Umpire, *s.* මධ්‍යස්තයා, මැදහත්තා

Un, *when a privative or negative particle is generally expressed by,* අව, අන්, අ, නි, නෑ, *as may be seen under the words to which it prefixed*

Unabashed, *a.* නිලජ්ජවූ *or* ලජ්ජනැතිවූ

Unable, *a.* අසමර්ථවූ, අශක්තිවූ, අපොහොසුවූ

Unacceptable, *a. not pleasing,* අප්‍රියවූ, නොරිස්සුම්වූ; *not to be received,* පිලිනොගත්තාවූ, ජන්තුනොගන්නාවූ

Unaccommodated, *a.* නොසැහෙනනාවූ

Unaccompanied, *a.* සමගින්නවූවාවූ, එකලානැතිවූ

Unaccomplished, *a.* නොනිමවූ, නොසම්පූර්ණවූ

Unaccountable, *a.* විස්තරකලනොහැකිවූ, කියඩබැරිවූ; *I shall note such difficulties as are unaccountable,* එප්‍රකාර විස්තරකල නොකිවූ අමාරුවල් මම කියා දෙන්නෙමි; *the manner by which the soul and body are connected is unaccountable,* ආත්මය සහ ශරීරය එක්ව තිබෙන්නාවූ ප්‍රකාරය තේරුම්කල නොහැකය; *such dispositions*

of mind are really unaccountable, සිතෙහි තිබෙන්නාවූ ඒදැනා රහසිතේරුම්දෙන්ඩබැරිය

Unaccustomed, *a.* පුරුදුනැතිවූ

Unacquainted, *a.* නොහැඳුනන්නාවූ, නොදැනගන්නාවූ

Unadvised, *a.* නොදැනෙන්නාවූ, අනුවණවූ, අප්‍රවේසම්වූ

Unadulterated, *a.* අමිස්‍රවූ, නියමවූ

Unaffected, *a. see affected*

Unaided, *a.* පිහිටනැතිවූ, උපකාරනැතිවූ, උදවුනැතිවූ

Unalienable, *a.* වෙන්කල නොහැකිවූ, බාරදෙන්ඩබැරිවූ

Unalterable, *a.* වෙනස්කලනොහැකිවූ

Unanimous, *a.* එක්සිත්වූ, එකඟවූ

Unanswerable, *a.* නිරුත්තරවූ, උත්තර නැතිවූ

Unapproved, *a.* පිළිනොගත්තාවූ, ඒත්තුනොගත්තාවූ

Unapt, *a.* අසමර්ථවූ

Unarmed, *a.* නිරස්ත්‍රවූ, ආයුධ නැතිවූ

Unasked, *a.* ප්‍රාර්ථනා නැතිවූ, නොඉල්ලුවාවූ

Unaspiring, *a.* ආඩම්බරනූවූ

Unassisted, *a.* උදවුනූවූ, පිහිටනූවූ

Unattainable, *a.* සපයාගතනොහැකිවූ, ලබාගන්ඩබැරිවූ, පමුනුවන්ඩබැරිවූ; *see to attain*

Unattended, *a.* පිරිවරනැත්තාවූ

Unavailable, unavailing, *a.* නිරාර්ථකවූ, නිස්ඵලවූ, අප්‍රයෝජනවූ

Unavoidable, *a.* හැලෙවෙන්ඩබැරිවූ

Unauthorised, *a.* නොකීලවූ

Unaware, unawares, *ad.* හදිස්සියෙන්, හදිසියෙන්, අහම්බෙන්

Unawed, *a.* අගෞරවවූ, නොසලකන්නාවූ, බයනූනාවූ

Unbar, *v. a.* අගුලඅරිනවා

Unbecoming, *a.* අශෝභනවූ, නොසොබනාවූ, අකටයුතුවූ, නොවටින්නාවූ

Unbelief, *s.* අවිශ්වාසකම

Unbeliever, *s.* අවිශ්වාසයා

Unbending, *a.* නොනැමෙන්නාවූ

Unbent, *a.* අවංකවූ, කෙළින්වූ

Unbiassed, unbiast, *a.* අපාසම්වූ, පැත්තකටනොනැමෙන්නාවූ

Unbind, *v. a.* ලිහනවා, උනනවා

Unblamable, *a.* නිරපරාධවූ, නිවැරදිවූ

Unblemished, *a.* අකලංකවූ, නොදෝසවූ, නිමලවූ

Unbolt, *v. a.* අගුලඅරිනවා

Unborn, *a.* නොයිපදුනාවූ, නූපන්නාවූ

Unbosom, *v. a.* එළිදරවුකරනවා; *to unbosom one's self to one,* හිතේ සියල්ල යමෙකුට කියාදෙනවා *or* එළිකරනවා

Unbound, *a.* ලිහූනාවූ, නොබැඳුනාවූ

Unbounded, *a.* සිමක්නැත්තවූ, සීමනැතිවූ

Unbrace, *v. a.* ගලවනවා, ලිහනවා

Unbroke, unbroken, *a.* අවිච්ඡින්නාවූ, භින්නනොවූ, නොබිඳුනාවූ, නොකැඩුනාවූ

Unburied, *a.* තැන්පත්නොකළාවූ

Unburthen, *v. a.* බරබානවා, සැහැල්ලුකරනවා

Unbutton, *v. a.* බොත්තන්ගලවනවා

Uncalled, *a.* නොකැඳවූවාවූ, අඬනොගැසූවාවූ

Uncancelled, *a.* සපිරවූ, බලේඇතතාවූ

Uncertain, *a.* අසත්‍යවූ, සහතිකනැත්වූ, අනුමානවූ, ශංකාවූ

Uncertainty, *s.* අසත්‍යවීම, සහතිකනැතිවීම, අනුමානවීම, සැකවීම

Unchangeable, *a.* සපිරවූ, වෙනස්කලනොහැකිවූ

Unchanged, *a.* ඒකාබද්ධවූ, වෙනස්නූවූ

Uncharitable, *a.* *a want of general benevolence,* අමෛත්‍රීවූ, අසත්පුෂීවූ; *not disposed to acts of charity,* , කාරුණිකනූවූ, දන්නොදෙන්නාවූ; *contrary to pity or compassion,* අකාරුණාවූ, දයානැතිවූ; *censorious,* වරදසොයන්නාවූ

Unchaste, unchasteness, *s.* පතිව්‍රතානූවූ, අපිරිසිදුවූ, අසුබවූ

Uncircumcised, *a.* ජම්බච්ඡේදනූවූ

Uncircumscribed, *a.* සීමාවක්නැත්තාවූ, ඉමක්නැත්තාවූ

Uncivil, *a.* ආචාරවත්නූවූ, රොඩුවූ

Uncivilized, *a.* මිලේච්ඡවූ, රාක්ෂවූ, මුරණ්ඩුවූ

Unclasp, *v. a.* අරිනවා

Uncle, *s. paternal,* ලොකුඅප්පා, කුඩප්පා, බාප්පා; *maternal,* මාමා

Unclean, *a.* අපවිත්‍ර, අසුබ

Uncleanness, *s.* අපවිත්‍රකම, අසුබකම

Unclench, *v. a.* අත්අරිනවා

Uncloath, *v. a.* නග්නකරනවා, නිර්වස්ත්‍රකරනවා ඇඳුම්ගලවනවා

Unclose, *v. a.* අරිනවා

Uncoloured, *a.* අවර්ණවූ, පාට නැත්තාවූ

Uncomely, *a.* අශෝභනවූ, අසුභවූ, අනුරූපවූ, නොහොබිනාවූ

Uncomfortable, *a.* දුක්ඛිතවූ, නොසැනසිලිවූ

Uncommon, *a.* ආශ්චර්යවූ, අපූර්වවූ, පුරුදුනූවූ

Uncommunicated, *a.* සැලනොකළාවූ, කියානුදුන්නාවූ

Uncompounded, *a.* අමිශ්‍රවූ, හාමුහුනූවූ

Unconceived, *a.* අකල්පනාවූ, හිතටනොගත්තාවූ, මතක්නැතිවූ

Unconcerned, *a.* *having no interest*

in a thing, වැදගැන්මනූවූ ; *careless,* අප්‍රවේසම්වූ; *not anxious,* නොසලකන්නාවූ

Unconfined, *a.* නිදහස්වූ

Unconnected, *a.* සම්බන්ධනූවූ, අදාලනූවූ

Unconscious, *a.* නොදන්නාවූ, දැනනොගන්නාවූ

Uncover, *v. a.* වැහුම්අරිනවා

Unconquerable, *a.* ජයගන්ඩබැරිවූ, වසඟකලනොහැකිවූ

Uncouple, *v. a.* යුග්මභේදකරනවා, ජෝඩුවෙන්කරනවා

Uncourteous, *a.* ආචාරවන්තනූවූ

Uncouth, *a.* රොඩුවූ, ඊෂ්වූ

Uncreated, *a.* නොමැවූවාවූ

Unction, *s.* ආලේපය, ගෑම

Uncultivated, *a. not improved by cultivation,* අස්නොවදුන්නාවූ; *uncivilized,* ගුණවත්නූවාවූ; *untaught,* පුහුණුනොකලාවූ, නූගත්තාවූ

Uncumbered, *a.* බරනැතිවූ, පහසුවූ

Undamaged, *a.* අලාභනූවූ, යහපත්වූ, හොඳවූ

Undaunted, *a.* නිර්භීතවූ, දැඩිහිත්වූ, බයනැත්වූ

Undeceive, *v. a.* නොරවටවනවා

Undeceived, *a.* නොරැවටුනාවූ

Undecided, *a. undetermined,* අරමුණුනූවූවාවූ, පැටලිනූවූවාවූ; *unsettled,* නොනිමවූ, සැක්දනූවූ

Undecisive, *a.* නිමනොකරන්නාවූ, තීන්දුනොකරනනාවූ

Undeclined, *a.* වරනොනාමන්නාවූ

Undefiled, *a.* පවිත්‍රවූ, පිරිසිදුවූ, දූඩවූ, නොකිලුවූ

Undefined, *a. not circumscribed,* නොනිමවූ, ඉමනැතිවූ; *not explained, by definition,* සන්නානොකලාවූ, විස්තරනොකලාවූ, තේරුන්නුදුන්නාවූ

Undefinable, *a.* විස්තරකලනොහැකිවූ

Undeniable, *a.* නිරුත්තරවූ, වලහඩබැරිවූ

Under, *a. in a state of subjection,* යටහත්වූ, වසහවූ: *beneath,* පාතාලවූ, පහත්වූ, යට; *less than,* අඩුවූ, හීනවූ; *it will require a few examples to show how this word in its various acceptations is translated. The army is under the command of an able general,* යුද්ධසේනාව සමර්ථවූ සේනාධිපතියෙකුගේ ආඥාව යටතෙහි සිටින්නේය; *to bring under proper discipline,* යුතුවූ පුහුණුකිරීමක් යටතට පමුණුවනවා; *to bring under as an animal,* හීලෑකරනවා, මට්ටුකරනවා; *to keep under,* ආඩුකරනවා; *under the earth,* පෘථිවියයට, *under water,* වතුර යට; *it has fallen under the table,* ඒක මේසෙන් පහත or යට වැටුනා; *under what it cost,*

ගණන්මිලට අඩු; *those that are under ten years of age*, දහයවු රැඳුකාට බාල ඇත්තෝ; *over or under*, අඩිවැඩිව: *under age*, බාලවයස; *under his own hand*, ඔහුගේ අත්අකුරෙන්ම ලියාදුන්; *he lies under a distemper*, ඔහු ලෙඩින් ඉන්නවා *or* රෝගයෙන් ඉන්නවා; *under your favour*, තමුසේගේ නාමයෙන් *or* උපකාරයෙන්; *it is under lock and key*, ඇතුලේ දීමා යතුරකින් පියාතිබෙනවා; *this comes under consideration*, මේ කාරනා කල්පනාකරබලඹියුතුය; *the country lies under water*, රටට ජලප්‍රවාහය වී තිබෙනවා; *a ship under sail*, රුවල් ගසාපු නැව; *to be under restraint*, වසගෝවීසිටිනවා; *to tread under foot*, පයින්ගහනවා; *under pain of death*, මරණඅවවුවට පත්වෙනලෙස

Underfurnish, *v. a.* අඩුවෙන්සපයනාදීම

Undergo, *v. a.* උසුලනවා, දරනවා

Underground, *a.* පෘථුවියයට, පොලවයට

Underhand, *ad.* රහස්ලෙස, රැවටිල්ලෙස, ප්‍රයෝගලෙස, සැගවිලිලෙස

Underling, *s.* පීචයා, රජයා

Undermine, *v. a. to dig under*, යටහාරනවා; *to injure by clandestine means*, ප්‍රයෝගයෙන් කොලගනවා

Undermost, *a.* ඉතාපහත්වූ, ඉතායටවූ

Underneath, *ad.* පහල

Underprize, *v. a.* අඩුගණනේ මිලකරනවා

Underprop, *v. n.* යටට අඩපානවා

Underrate, *v. a.* අගෙන්අඩුකරනවා, වටිනාකම මදිකරනවා

Undersecretary, *s.* දෙවනිලේකම

Understand, *v. a.* අභිප්‍රායහැගෙනවා, තේරුන්වෙනවා, තේරෙනවා

Understanding, *s. the intellectual powers*, චිත්තය, සිත; *intelligence*, බුද්ධිය, ඥානය, නුවණ

Understanding, *a.* තේරුන්වෙන්නාවූ

Understood, *pret.* තේරුන්ගත්, දැනගත්

Undertake, *v. a.* පිළිගන්නාවා, බාරගන්නාවා, බාරගන්නවා

Undervalue, *v. a.* අගයපහත්කරනවා, වටිනාකම අඩුකරනවා, මිලඅඩුකරනවා

Underwent, *pret.* දැරුවා, ඉවසුවා, විඳ

Undescribed, *a.* පෙනිවාතුදුන්නාවූ, එලිදරවූනොකලාවූ

Undeserved, *a.* අනුපයුක්තවූ, යෝග්‍යනුවූ, නොවටින්නාවූ

Undeserving, *a.* අනුපයුක්තකමෙන් නාවූ, යෝග්‍යනොවෙන්නාවූ

Undesigning, *a.* අප්‍රයෝගවූ, ලු සංවිදානූවූ

Undetermined, *a. unsettled,* සිද්ධ නොකලාවූ, නියමිනොකලාවූ; *undecided in the mind,* අරමුණු නොකලාවූ, පැටලුණුවූ

Undiminished, *a.* කෂයනූනාවූ, අඩුනූනාවූ

Undiscernible, *a.* අදෘශ්‍යමානාවූ, නොපෙනෙනනාවූ

Undiscerning, *a.* අසමර්ථවූ, අනුවණවූ

Undisciplined, *a.* දුශ්ශික්ෂනොකලාවූ, ශික්ෂත්නාවූ

Undiscovered, *a.* නුදුටුවාවූ, නොපෙනුනාවූ

Undisguised, *a.* අප්‍රයෝගවූ, පිරිසිදුවූ

Undismayed, *a.* නිර්භීතවූ, බයනැතිවූ, වියතිවූ, ශක්තිදඩිවූ

Undisputed, *a.* අනුමානනූවූ, පැහැදිලිවූ

Undissembled, *a.* අප්‍රයෝගවූ, රැවටිලිනූවූ, ප්‍රසිඩවූ

Undistinguishable, *a.* වෙනාසදැනගඬනූප්‍රැවත්

Undistinguished, *a. not seen,* අදෘශ්‍යවූ, නොපෙනෙන්නාවූ; *not plainly and separately discried,* ප්‍රභේදනොකෙරුන්නාවූ, වෙනස්නොවෙන්නාවූ

Undisturbed, *a.* නිස්චලවූ, නිරවුල්වූ

Undividable, *a.* ප්‍රභේදකලනොහැකිවූ, වෙන්කලනොහැකිවූ

Undivided, *a.* ප්‍රභේදනූනාවූ, වෙන්නූනාවූ, නොබෙදුවාවූ

Undo, *v. a. to ruin,* විනාසකරනවා, නාස්තිකරනවා, නැතිකරනවා

Undone, *a. not done,* නොකලාවූ; *ruined,* නාස්තිවුනාවූ

Undoubted, *a.* සත්‍යවූ, අනුමානනැතිවූ, නිසැකවූ

Undoubtedly, *ad.* සත්‍යලෙස, නිසැකලෙස

Undress, *v. a.* ඇඳුම්ගලවනවා

Undried, *a.* අමුවූ, නොවියලුනාවූ

Undulate, *v. n.* ඔබමොබසැලෙනවා

Unduly, *ad.* අයෝග්‍යලෙස, අයුක්තලෙස

Unduteous, undutiful, *a.* නොකීකරුවූ, අකීකරුවූ

Uneasily, *ad.* අපහසුලෙස, කනගාටුලෙස, කරදරලෙස, සිත්චවලලෙස

Uneasiness, *s.* අපහසුකම, කනගාටුකම, කරදරකම, සිත්චවලකම

Uneasy, *a.* අපහසුවූ, කම්පාවූ, කනගාටුවූ, කරදරවූ

Unemployed, *a.* නිදහස්වූ

Unengaged, *a.* නිස්කාලංකාවූ

Unenlightened, *a.* දීප්තිනූවූ, එලියනූවූ, ආලෝකනූවූ

Unequal, *a. disproportionate,* විප්‍රකාරවූ, අසමානවූ; *inadequate,*

අසමත්වූ; *I am unequal to the undertaking,* ඒ භාරකාරීත්වයට මම අසමත්ය

Unequally, *ad.* අසමානලෙස, විප්‍රකාරලෙස; *the estate was unequally divided in the family,* පවුලේවස්තුව අසමානලෙසබෙදුනේය; *be not unequally joined together,* ඒකාකාරනොහිලෙස සම්බන්ධ නොවෙව; *people unequally married are seldom happy,* අසමානලෙස විවාහකල මනුෂ්‍යයින් වාසනාවන්තවෙ සිටීම දුලබය

Unequitable, *a.* අයෝග්‍යවූ, අයුතුවූ

Unequivocal, *a.* විප්‍රකාරනොහිවූ, අනුමානනොහිවූ

Unerring, *a.* මුලානොහිවූ, නොවරදින්නාවූ

Unessential, *a.* වැදගත්නොවන්නාවූ

Uneven, *a.* අසමවූ, සමතලානොහිවූ

Unexampled, *a.* ආදර්ශනොවූ, සමානනොහිවූ; *a man of unexampled goodness,* අසමානවූ යහපත්කම් ඇත්තාවූ මනුෂ්‍යයෙක්; *during the whole compaign he showed unexampled bravery,* යුද්ධය මුළුල්ලේදීම ඔහු ආදර්ශනොවූවාවූ වීර්යයක්පෙන්නුවේය

Unexceptionable, *a. a.* නිර්මලවූ, නිවරදිවූ

Unexempt, *a.* නිදහස්නොවූ

Unexhausted, *a.* *not to be emptied,* හිස්වියනොහැකිවූ; *not spent,* කෙළවරක්වීය නොහැකිවූ, වෙහෙසනොවූ

Unexpected, *a.* *unthought of,* නොපැතුවාවූ, නොසිතුවාවූ; *sudden,* හදිස්සිවූ

Unexplored, *a.* විභාගනොකලාවූ, නොවිචාරණවාවූ, නොසෙවූවාවූ

Unfading, *a.* මලානිකනොවන්නාවූ, පරණනොවන්නාවූ, ක්ෂයනොවන්නාවූ

Unfair, *a.* අයෝග්‍යවූ, අයුතුවූ, නුසුදුසුවූ

Unfaithful, *a.* අපක්ෂපාතීවූ, ද්‍රෝහීවූ, අවිශ්වාසවූ, රැවටිලිවූ; *an unfaithful subject,* අපක්ෂපාතීවූ වැසියා; *an unfaithful friend,* මිත්‍රද්‍රෝහියා; *an unfaithful husband,* අවිශ්වාසවූ පුරුෂයා

Unfashionable, *a.* නොසිරිත්වූ, ව්‍යවහාරනොහිවූ

Unfasten, *v. a.* ලිහනවා, බුරුල්කරනවා

Unfathomable, *a.* *immeasurable,* මනින්නබැරිවූ; *not to be known,* විචාලියනොහැකිවූ, සොයන්නබැරිවූ, දැනගන්නනොපුළුවන්වූ

Unfavourable, *a.* අවාසනාවන්තවූ, අකුසල්වූ, අප්‍රියවූ, අයෝග්‍යවූ, නුසුදුසුවූ; *an unfavourable event,* අවාසනාවූ or අකුසල්වූ සිද්ධිය; *unfavourable weather,* අප්‍රියකාලය; *this season is very unfavourable,* මෙ

කෑමට අයෝග්‍යවූ පානවත්ථු or මිකෑමට නුසුදුසු සම්පත්ය

Unfeeling, a. අකාරුණාවූ, අකම්පිතවූ

Unfeigned, a. අප්‍රයෝගවූ, අවංචකවූ, නොරැවටිලිවූ, පිරිසිදුවූ

Unfelt, a. සංවේදිතනොවූවාවූ, නොදැනුනාවූ

Unfetter, v. a. විලංගුගලවනවා, දම්වැල්අරිනවා

Unfinished, a. නොනිමවූ, නිම් නොවූ, කම්මුතුනොවූ

Unfit, a. නොසෑහෙන්නාවූ, අයෝග්‍යවූ, නුසුදුසුවූ, නොහොබිනාවූ, අසමර්ථවූ; *he is an unfit person for such an office*, ඔහු එබඳුනිලයකට නොසෑහෙනමනුෂ්‍යයෙක; *food unfit to eat*, අනුභවයට අයෝග්‍ය or කෑමට නුසුදුසු කෑම; *a ship unfit for sea*, මුහුදට නොහොබිනා නැවක්; *on account of indisposition to be unfit for duty*, අප්‍රාණිකම නිසා වැඩට අසමර්ථය

Unfix, v. a. අනිස්ථිරකරනවා, සවිනැතිකරනවා

Unfold, v. a. *to spread*, අතුරනවා, දිගඅරිනවා, විහිදුවනවා, විසුරුවනවා; *to tell*, කියාදෙනවා; *to reveal, to publish*, ප්‍රසිද්ධකරනවා, ප්‍රකාශකරනවා, එළිදරව්කරනවා

Unforeseen, a. ප්‍රථමයෙන් නොදැනුණාවූ

Unforgotten, a. මතකනැතිනොවූවූ

Unforgiving, a. අකාරුණාවූ. ක්ෂමානොවෙන්නාවූ

Unfortunate, a. අවාසනාවන්තවූ, අකුසල්වූ

Unfound, a. සම්භනුනාවූ

Unfrequent, a. අපූරුවූ, දුලභවතාවවූ, මඳවරවූ

Unfrequented, a. උදාකාලාවූ, පාළුවූ; *an unfrequented way*, උදාකාලමාර්ගය; *an unfrequented house*, පාළුගෙදර

Unfriendly, a. අමෛත්‍රීවූ, අමිත්‍රවූ

Unfruitful, a. නිස්ඵලවූ, අඵලවූ, ඵලනොදරන්නාවූ

Unfulfilled, a. ඉෂ්ටනූනාවූ

Unfurl, v. n. විසුරුවනවා, විහිදුවනවා, දිගඅරිනවා

Unfurnished, a. ද්‍රව්‍යනැතිවූ, බඩුනැත්තාවූ

Ungenerous, a. අසත්පුරුෂවූ, නීචවූ, නොවටින්නාවූ

Ungentle, a. රෞද්‍රවූ, ඵෂ්ටවූ, චණ්ඩවූ

Ungird, v. a. බඳපටියලිහනවා

Ungodliness, s. අසද්භාවනත්කකම්, අභක්තිකම

Ungodly, a. අසද්භාවන්තකාවූ, අභක්තිකාවූ

Ungovernable, a. දමනයකඩබැරිවූ, ආඥාකරඩබැරිවූ

Ungraceful, a. අසෝභනවූ, අලංකාරනැතිවූ, නොහොබිනාවූ

Ungracious, *a.* අප්‍රසන්නාවූ, ප්‍රිය නැත්තාවූ

Ungrateful, *a.* අකෘතඥපකාරවූ, උපකාර නොසලකන්නාවූ; කෘතඥ නොදන්නාවූ

Unguarded, *a.* අප්‍රවේසම්වූ

Unhandsome, *a.* අජීවවූ, අවලක්ෂණාවූ; *illiberal,* අසත්පුරුසවූ, අකටඥුවූ

Unhappy, *a.* අපුණ්‍යවන්තවූ, අවාසනාවන්තවූ

Unhealthful, unhealthy, *a.* අසනීප වූ, සැප නැත්තාවූ

Unheard, *a.* නොඇසෙනනාවූ, විභාගනොවෙන්නාවූ, විස්මපත්වූ, පුදුමවූ; *he spake so slowly that most of his discourse was unheard,* ඔහු හෙමින් කතාකළනිසා ඔහුගේ කතාවෙන් බොහොමයක් නෑසුනේය; *the complaint still remains unheard,* පැමිණිල්ල තවම විභාගනොකොට තිබෙනවාය; *unheard of events,* විස්මපත්වූ කාරනාවල් *or* පුදුමවූ සිඬවිමවිල්

Unhinge, *v. a.* අසවුගලවනාවා; *to confuse,* කරදරකරනවා, කරච්චල්කරනවා, කනගාටුකරනවා

Unholiness, *s.* අපවිත්‍රකම, අසුඩකම

Unholy, *a.* අපවිත්‍රවූ, අසුඩවූ

Unhumbled, *a.* යටහත්නුවූ

Unhurt, *a.* නොරිදුවාවූ, අලාභ නැතිවූ

Unicorn, *s.* කඟවේනා

Uniform, *a.* සාදෘසෘවූ, ඒකාකාරවූ, සමානවූ, එකභවූ; *the country has one uniform appearance,* රාජ්‍යය ඒකාකාරවූ පෙනීමක් තිබෙන්නේය; *his character was uniform,* ඔහුගේ ශීලය එකභාය; *to live according to one uniform plan,* එකම සමාන විධියට කල්කරනවා

Uniformly, *ad.* නොවෙනස්ලෙස

Unimportant, *a.* වැදගත්කම්නුවූ, බරපතලනුවූ

Unimproved, *a.* පුහුණුනොකලාවූ, භාවිතානැත්වූ, දියුණුනොකලාවූ, දැනනොගත්තාවූ; *a mind unimproved,* දැනනොගත්තාවූ සිත; *let not our time pass unimproved,* අපේ කාලය භාවිතාවක් නැතුව පසුනුනාවේ

Uninformed, *a.* නොබුඩිවූ, අඥානවූ, නූගත්වූ, දැනනොගත්තාවූ

Uninhabitable, *a.* වාසයකලනොහැකිවූ, පදිංචිවෙඩබැරිවූ

Uninhabited, *a.* ජනගහනනූවූ, වාසයනූවූ, පදිංචිකාරයන් නැත්තාවූ

Uninstructed, *a.* නූගත්වූ

Unintelligible, *a.* නොහැඟෙන්නාවූ, නොතේරෙන්නාවූ

Uninterested, *a.* නොසලකන්නාවූ, අප්‍රවේසම්වූ

Uninterrupted, *a.* නගනාමනැති

වූ, නොකඩවූ, නොනාවතින්නාවූ

Uninvited, *a.* ආමන්ත්‍රණයනොකලාවූ, නොකැඳවූවාවූ

Union, *s.* සන්ධිවීම, එකහවීම එකතුවීම, සමගිවීම

Uniparous, *a.* එකෝත්පාදවූ, එකින්එකාඋපදින්නාවූ

Unison, *a.* එකහාවූ

Unit, *s.* එක

Unite, *v. a. to join together*, සම්බන්ධකරනවා, සමගිකරනවා, එකතුකරනවා, එකහාකරනවා; *to marry*, විවාහකරනවා, සරනපාවාදෙනවා

Unitedly, *ad.* එකහාලෙස

Unity, *s.* සම්බන්ධවීම, එකහාවීම, සමගිවීම

Universal, *a.* සකල, සර්ව, සමස්ත, සාමාන්‍යවූ, මුළු, සියලු, සියලු

Universe, *s. when it means the whole of our system, may be termed*, සක්වල; *when it means our earth only*, ලෝකය

Unjust, *a.* අසාධාරනවූ, අධර්මිෂ්ඨවූ, අයුතුවූ

Unjustifiable, *a.* අපරාධවූ, වැරදිවූ

Unjustly, *ad.* අසාධාරනලෙස, අයෝග්‍යලෙස, අයුතුලෙස

Unkind, *a.* අයහපත්වූ, නිර්දයාවූ, අවකාරුණාවූ

